# අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සතු ඉඩම් හා දේපළ පිළිබඳ හිමිකම්

ඡායා : ටිම් ඩික්කිසන්



**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

**2003 පෙබරවාරි**

# අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සතු ඉඩම් හා දේපළ පිළිබඳ හිමිකම්

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය

2003 පෙබරවාරි

නොවිබ් සංවිධානයේ අරමුදලින් ආරම්භ කරන ලද ව්‍යාපෘතියකි.

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සතු ඉඩම් හා දේපළ පිළිබඳ හිමිකම්

පළමු මුද්‍රණය 2005 අප්‍රේල්

ISBN

කවරයේ ඡායාරූප : **ටිම් ඩික්නිසන්**

පරිගණක අක්ෂර /පිටු සැලසුම : **ලිත්මා ග්‍රැෆික්ස්** ✆ **0114-216740**

මුද්‍රණය :

ප්‍රකාශනය : **විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය**

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය යනු මහජන ප්‍රතිපත්ති පිළිබඳ විවාදයට සිවිල් සමාජයේ දායකත්වය අත්‍යවශ්‍ය මෙන් ම ශක්තිමත් කිරීම අවශ්‍යය යන දැඩි විශ්වාසයෙන් පිහිටුවාගත් ආයතනයකි. එය පර්යේෂණ හා උපදේශක වැඩසටහන් ඔස්සේ රාජ්‍ය පාලනයට හා ගැටුම් සමථයකට අදාළ ප්‍රශ්නවලට සිය අවධානය යොමු කර යි.

වැඩිදුර විස්තර සඳහා මෙහි පහත සඳහන් ලිපිනයෙන් විමසන්න.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, 24/2, 28 වෙනි පටුමග, මල් පාර,
කොළඹ 07, ශ්‍රී ලංකාව.

දුරකථනය : 94-11-2565304/06 ෆැක්ස් : 94-11-4714460
ඊ-මේල්: cpa@sri.lanka.net

# පටුන


හැඳින්වීම 5

සාරාංශය

නිර්දේශ

අවතැන් වීී හා ආපසු පැමිණීමේ රටාව

**1. බිම්බෝම්බ** 33

1.1 කෙටි විස්තරයක්

1.2 එල්ටීටීඊ පාලනයට නතු වී ඇති වන්නි ප්‍රදේශය

1.3 රජයේ පාලන ප්‍රදේශ

1.4 සහයෝගිතාව හා අරමුදල් සැපයීම

**2. සැරිසැරීමේ නිදහස** 37

2.1 කෙටි විස්තරයක්

2.2 නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්ති සහ ඉඩම් නොමැති ජනතාව

2.3 අවතැන් වූ වැසියන් තම මුල් පදිංචි ප්‍රදේශවල පදිංචි කරවීම සඳහා කෙරෙන විවිධ බලපෑම්

2.4 වාර්ගික උණුසුම සහ අවතැන් වූ මුස්ලිම් හා සිංහල පවුල්වලට ආපසු ඒමේදී සිදුවන බාධා

**3. සිදු වූ දේපල හානි සහ පාඩු** 44

3.1 ඉඩම් සහ නිවාසවලට සිදු වී ඇති හානිය

3.2 ඉඩම්වල මායිම් හඳුනාගැනීම

3.3 ජීවනෝපායන් යළි ආරම්භ කිරීම

3.4 රජයෙන් සහ වෙනත් ආයතනවලින් සැපයෙන ආධාර

**4. අවතැන් වූ කාන්තාවන් 54**

4.1 බෙදාහැරීම, අත්කරගැනීම සහ අයිතිය

4.2 ආපසු පැමිණෙන සරණාගතයින් සම්බන්ධයෙන් පැනනගින ගැටළු

**5. දේපල ආපසු පැවරීම 58**

5.1 නීතිවිරෝධී පදිංචිය

5.2 අධි ආරක්ෂිත කලාප සහ යුද හමුදා සහ පොලිස් මුරපල

5.3 එල්ටීටීඊය පදිංචිව සිටීම

**6. දේපල ආපසු පැවරීම - අයිතිය තහවුරු කිරීම 62**

6.1 කෙටි විස්තයක්

6.2 පෞද්ගලික දේපල - ඔප්පු

6.3 රජයට අයත් ඉඩම් - බලපත්‍ර හා බදු

6:4 නීති විරෝධී අයුරින් ඉඩම් පැවරීම.

**7. දේපළ ආපසු පැවරීම - සහන පියවර 68**

7:1 රාජ්‍ය ආයතන හා රාජ්‍ය නො වන සංවිධාන

7:2 එල්ටීටීඊයේ පාලන ප්‍රදේශ

**8. ඉඩම් හා දේපලට අදාල නීතිය 71**

8:1 පෞද්ගලික දේපල

8:2 රජයේ දේපල

**9. ආයතනික ව්‍යුහය : ඉඩම් සහ යළි පදිංචි කිරීම 85**

**10. සංවර්ධනය කිරීම සහ ඉඩම් පරිහරණය 89**

**ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය 92**

**ආශ්‍රිත පොත් 103**

**10 වෙනි ඇමුණුම 116**

**11 වැනි ඇමුණුම 121**

**විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය 126**

# හැඳින්වීම

දශක දෙකක් පුරා දිවයිනේ පැවති යුද්ධය හමාර කිරීමට මඟපාදමින් ශ්‍රී ලංකා රජයත් ඊලාම් විමුක්ති කොටි සංවිධානයත් අතර සටන් විරාම ගිවිසුමක් 2002 පෙබරවාරි 22 වෙනි දින අත්සන් කරන ලදී.

දීර්ඝකාලීන වශයෙන් සාමය පවත්වාගෙන යාම සහතික කර නොමැති මුත් යුද්ධයෙන් විපතට පත් ජනතාවට බලාපොරොත්තු සහිතව ස්වකීය ජීවිත යළි ආරම්භ කිරීමේ අවස්ථාව සටන් විරාම ගිවිසුම මගින් සැලසී ඇත. අර්බුදය නිසා අවතැන් වූ බවට ගණන් බලන ලද පුද්ගලයින් 800,000ක් දෙනා අතුරින් බොහෝ දෙනෙක් ආපසු තම ගම්නිම් කරා පැමිණෙමින් සිටින අතර, තවත් අය ආපසු ඒමේ බලාපොරොත්තුවෙන් කල්ගත කරති. උතුරු-නැගෙනහිර පළාත්වල අවතැන් වූ හා ආපසු ගම්බිම් කරා පැමිණෙන පුද්ගලයින්ගේ දේපොල, ඉඩකඩම් පිළිබඳ ප්‍රශ්න කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම අවශ්‍ය වී තිබේ. ශ්‍රී ලාංකික ජනතාවට ඉඩම් යනු ඉතා වැදගත් දෙයකි. සමහරුන්ට ඔවුන් සතු ඉඩම් ප්‍රමාණය ස්වකීය සමජ තත්ත්වය තක්සේරු කරනු ලබන සාධකයක් වී ඇත. අනෙක් අයට තමන් සතු ඉඩකඩම් අහිමිවීම ස්වකීය අනන්‍යතාව නැතිවීමක් තරමටම බලවත් වේ. එපමණක් නොව, සාම්ප්‍රදායික වශයෙන් කෘෂි ආර්ථිකයක් හිමි ශ්‍රී ලංකාවාසි ජනතාවගේ බහුතරයට සිය ජීවනෝපාය සහ ආරක්ෂාව සඳහා ඉඩම් අගනා වස්තුවක් වී තිබේ. කෙසේ වුවද ඉඩම් සීමිත සම්පතක් බවට පත් වී ඇති හෙයින්, ජනගහනය වැඩිවීමත් සමග ම ඉඩම් සඳහා තරගකාරීත්වය අතිශයින් වැඩි වෙමින් පවතී. උතුරු - නැගෙනහිර පළාත් විනාශයට පත්කළ යුද්ධය සහ ශ්‍රී ලංකා රජය හා එල්ටීටීඊය අතර පවත්නා බල අරගලය හේතුවෙන් භූමිය පිළිබඳ සංකල්පය නිරන්තරයෙන් ම වැදගත් වී ඇත. සෑම පාර්ශවයක් ම තමන්ගේ පාලනයට නතු වී ඇති පෙදෙස්වල ස්වකීය ආධිපත්‍යය පවත්වා ගෙන යාමට සමත් වී ඇති බව පෙනේ. එබැවින් වර්තමානයේ මෙන්ම අනාගතයේ දී ද වාර්ගික අර්බුදය සහ එයට විසඳුම් සෙවීමේදී භූමිය සුවිශේෂ වැදගත් කමක් දරනු ඇත.

## අරමුණ

මෙම කෙටි කාලීන අධ්‍යයනය සතු අරමුණු දෙකකි. දැනට උතුරු හා නැගෙනහිර පළාත්වල ප්‍රධාන වශයෙන් මතු වෙමින් පවත්නා ඉඩම් සහ දේපළ පිළිබඳ ප්‍රශ්න හඳුනාගැනීම ඉන් පළමු වැන්නයි. දෙවනුව, ඉඩම් සහ දෙපළ, නැවත පදිංචි කිරීම, අලුතින් ඉඩම්වල පදිංචි කිරීම, නැවත ගොඩනැගීම සහ කලාපය තුළ සාමාන්‍ය ජන ජීවිතයක් පවත්වාගෙන යාම පිළිබඳ අභියෝගයන්ට මුහුණ දීම සඳහා තීරණගැනීමේ අදාළ බලධාරීන් වෙත ප්‍රායෝගික හා

ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීමය. එබැවින් මෙම වාර්තාව ශ්‍රී ලංකා රජය, එල්ටීටීඊය, ආධාර සපයන ආයතන සහ අර්බුදයට සම්බන්ධ අනෙකුත් සියලු පාර්ශවයන්ට වැදගත් වේ.

## ක්‍රමවේදය

මෙම අධ්‍යයනය 2002 සැප්තැම්බර් සිට එම වසරේ දෙසැම්බර් දක්වා පවත්වන ලදී. එයට පර්යේෂණ අවධි පහක් ඇතුළත් විය. ඉඩම් හා දෙපළ ප්‍රශ්නවලට සම්බන්ධ ආයතනවල ව්‍යුහය, උපයෝගි කරගත හැකි ප්‍රතිපත්ති සහ අදාළ ප්‍රශ්න සම්බන්ධයෙන් වෙනස් ප්‍රවේශයන් ලබාගැනීම සඳහා පර්යේෂණ කණ්ඩායම ආරම්භක මූලික කටයුතු සහ සම්මුඛ පරීක්ෂණ කොළඹදී පවත්වන ලදී. ඉන්පසු උතුරු හා නැගෙනහිර පළාත්වල සති තුනක සංචාරයක් ආරම්භ කරන ලදී. එයට උතුරු පළාතේ රජයේ පාලනයට යටතේ පවත්නා පුත්තලම, වව්නියාව, මන්නාරම සහ යාපනය එල්ටීටීඊයේ පාලනය නතු වී තිබෙන මුලතිව් සහ කිලිනොච්චි යන දිස්ත්‍රික්කත් එල්ටීටීඊයේ පාලනයට නතු වී තිබෙන මන්නාරම සහ වවුනියා දිස්ත්‍රික්වල ඇතැම් ප්‍රදේශත්, එමෙන් ම නැගෙනහිර පළාතේ මඩකලපුව (රජයේ පාලනය යටතේ තිබෙන මුහුදු බඩ ප්‍රදේශ සහ එල්ටීටීඊ පාලනයට නතු වී තිබෙන රට අභ්‍යන්තරය) සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කත් අයත් විය. පර්යේෂණ කණ්ඩායම 'සුබසාධන මධ්‍යස්ථානවල' පදිංචි අවතැන් වූ පිරිස් සහ අලුතින් පිහිටුවන ලද ගම්වල පදිංචියට පැමිණි වැසියන් සහ හදිසියේම තම ගම්බිම් කරා ආපසු පැමිණි කණ්ඩායම් සමඟ සම්බන්ධ සාකච්ඡා පැවැත්විය. ඒ හැරුණ විට මෙරට හා ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධානවල නියෝජිතයින් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ ආයතන, රාජ්‍ය නිලධාරීන්, එල්ටීටීඊ නියෝජිතයින් සහ නීතිඥයින් වැනි වෘත්තිකයින් ගෙන් ද කරුණු විමසන ලදි.

අවතැන්වූවන් ආපසු පැමිණීම සහ අලුතින් පදිංචි කරවීම සහ ඉඩම් සහ දේපල සම්ම්බන්ධ කරුණුවලට බලපාන, මෑතකදී සිදු  වූ දේශපාලන වෙනස්වීම් පිළිබඳ අවබෝධයක් ලබාගනු වස් මාධ්‍ය සමාලෝචනයක් සිදු කරන ලදි. පෞද්ගලික මෙන්ම රජයේ අයිතියට යටතේ දේපළවලට අදාළ නීති පර්යේෂණ කණ්ඩායමේ අගැයුමට ලක්විය.

අවසාන වශයෙන් අවතැන් වූ අති විශාල පිරිස් ආපසු පැමිණීමේ දී මුහුණ පෑමට සිදුවූ ගැටළු සහ ඉඩම් හා දෙපළ වැනි කරුණු තුළින් එල්ලවන අභියෝග සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා යොදාගත් පලදායි හෝ ගැටළු විසඳලීමේ ක්‍රමෝපායන් හඳුනාගැනීමේ අදහසින් අර්බුදයෙන් මිදී සාමය කරා ළඟා වූ කොසෝවෝ, නැගෙනහිර ටිමෝරය සහ ගෝතමාලා වැනි රටවල් පිළිබඳව පර්යේෂණ කණ්ඩායම විසින් තුළනාත්මක අධ්‍යයනයක් කරන ලදී. මෙම තුළනාත්මක පර්යේෂණය මගින් සම්පාදිත තොරතුරු සමුදාය වාර්තාවේ අඩංගු නිර්දේශ තුළ අන්තර්ගතව ඇත. එම තොරතුරු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ www-cpalanka.org වෙබ් අඩවියට ද ඇතුළත් කර තිබේ.

## අධ්‍යයනයේ අන්තර්ගත වැදගත් තොරතුරු

මෙම අධ්‍යයනයට පහත සඳහන් කරුණු ඇතුළත් වී තිබේ: පුද්ගලයින් තම දේපල හා ඉඩකඩම්වල පදිංචිවීම, සන්නද්ධ හමුදා පොලීසිය සහ එල්ටීටීඊය; බිම්බෝම්බ තර්ජනය, විනාශකාරී පුපුරන ද්‍රව්‍ය; අහිමි වි ගිය ලිපි ලේඛන සහ අයිතිය තහවුරු කිරීම; දේපළට සිදුවූ හානි ප්‍රමාණය සහ විනාශය රජයෙන් සිදු වූ අඩුපාඩු සහ අනෙක් ආධාර; මායිම් හඳුනාගැනීමේ

දුෂ්කරතා යනාදිය වේ. තම නිවහන තෝරාගැනීමේ සහ නිදහසේ සැරි සැරීමේ පුද්ගලයකු සතු අයිතිය, ඉඩම් හා දේපළ පිළිබඳ අයිතීන් හා බද්ධවී තිබේ. මුස්ලිම්, දෙමල සහ සිංහල අවතැන් වූවන් සහ ආපසසු පැමිණෙන පිරිසස්වලට පොදු වූ අවිශ්වාසය සහ බිය රැගත් වාර්ගික පැතිකඩක් මින් ගම්‍ය වේ. එබැවින් ස්වේච්ඡාවෙන් යළි පදිංචිවීම සහ අලුතින් පදිංචි කරවීම සම්බන්ධයෙන් මතු වූ ප්‍රශ්න ගණනාවක්ම මෙම වාර්තාවෙන් හුවා දක්වා තිබේ. මේවා හුදෙක් මෙම වාර්තාවේ අවධානයට ලක් වූ දැවෙන ප්‍රශ්නවලින් කීපයක් පමණි. ආයතනික ව්‍යුහය සහ ඉඩම් හා දේපොල සම්බන්ධයෙන් අදාළ කොටස් වඩාත් සවිස්තරව දක්වා ඇත. ඉඩම් සහ දේපොල තුළින් පැන නගින ආයතනික හෝ ව්‍යවස්ථාමය අභියෝග, එයට අදාළ සන්දර්භයන් යටතේ විශ්ලේෂණය කරනු ලැබේ. මානව හිමිකම් අධ්‍යයන මධ්‍යස්ථානයේ සොෆියා එලෙක් සහ හේමශිනී රාමනාදන් මහත්මීන් විසින් කරන ලද පුළුල් ක්ෂේත්‍ර පර්යේෂණ විශාල වශයෙන් කාන්තාවන් පිළිබඳ තොරතුරු ගවේෂණය කිරීමේලා වැදගත් විය.

## පැනවී ඇති සීමාවන්

මෙම වාර්තාව අංග සම්පූර්ණ නිර්මාණයක් නොවනු ඇත. ඉඩම් හා දේපල පිළිබඳ මූලික ගැටලු අවධානයට ලක් කරමින් ඒ සඳහා මෙම වාර්තාව ස්වකීය නිර්දේශ ඉදිරිපත් කරයි. පවතින තත්ත්වය පිළිබඳව අවබෝධයක් ලබාගනු සඳහා හැකි සියලු ක්‍රියාමාර්ගයන් අනුගමනය කළ මුත් අධ්‍යයනය එසේ 4කට සීමා වීම නිසා පර්යේෂණ නිලධාරී පිරිස මත විශාල බරක් පැටවිණි. සාම සාකච්ඡා මධ්‍යයේ ශ්‍රී ලංකා රජයේ නිලධාරීන් සහ එල්ටීටීඊ සංවිධානයේ නියෝජිතයින් මුණ ගැසීම විශේෂයෙන් අසීරු කාර්යයක් විය. එල්.ටීටීඊ නායකත්වය මුණ ගැසීම සඳහා විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය තෙවරක් ම උත්සහ ගත් මුත්, එය සපල නොවී ය. එබැවින් ඉඩම් සහ යළි පදිංචි කිරීමේ විෂයය සම්බන්ධයෙන් එල්ටීටීඊයේ අදහස් විමසා යවන ලද ප්‍රශ්න මාලාවට මෙතෙක් ඔවුන්ගෙන් කිසිදු ප්‍රතිචාරයක් ලැබී නොමැත.

මෙම අධ්‍යයනය ගුණාත්මක බැවින් යුත් දත්ත කෙරෙහි වඩා වැඩි විශ්වාසයක් තබා ඇත. සංඛ්‍යා ලේඛන ඇතුලු අනෙකුත් දත්ත රජයේ දෙපාර්තතමේන්තුවලින් ලබාගත් බැවින් යාවත්කාලීන තොරතුරුවල ඌණතාව නිසා විවිධ අඩුපාඩු තිබිය හැකි ය. අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් සමජාතික කණ්ඩායමකට අයත් නොවේ. මෙම අවතැන් වූ පිරිස්වලට බලපාන ඉඩම් සහ දේපළ පිළිබඳ ප්‍රශ්න එම අවතැන් වූවන්ගේ මුල් පදිංචි ප්‍රදේශ, අවතැන්වූ ප්‍රදේශ, කුලය, පන්තිය වාර්ගීයත්වය, ජීවන දර්ශනය සහ ගැහැනු ද පිරිමි ද යන කාරණා මත ඉඩම් හා දේපල පිළිබඳ ප්‍රශ්න බොහෝ දුරට රඳා පවතී. කෙසේ වුවද, මෙම කෙටි කාලීන අධ්‍යයනය වාර්ගික බේදයකින් තොරව මූලික වශයෙන් සියලු අඩු ආදායම්ලාභී අවතැන් වූ පිරිස් කෙරෙහි යොමු වී ඇති අතර, අවතැන් වූ ජන කොටස්වල විවිධත්වය බැහැර කර ඇත. ප්‍රමාණවත් තොරතුරු නොලැබීම නිසා අවතැන් වූ සිංහල ජනතාව මෙහි දී අඩුවෙන් නියෝජනය වී ඇත.

## ක්‍රියාවලිය

කෙටුම්පත් වාර්තාව සම්පූර්ණ කිරීමෙන් පසු, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපෝෂණය ලබාගැනීම හා ඒ පිළිබඳව අවසාන නිගමනයකට පිවිසීම අරමුණු කරගෙන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය,

එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම සමග එක්වී 2003 ජනවාරි 29 දින කිලිනොච්චියේදී ද පෙබරවාරි 10 සහ 11 වෙනි දිනයන්හි කොළඹ දී ද වැඩමුලු දෙකක් පැවැත්වී ය.

වැඩමුළු දෙකේදී සපුරාලන ලද කාර්යයන් සවිස්තරාත්මකව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ www. cpalanka.org වෙබ් අඩවියට ඇතුළත් කර තිබේ. නිර්දේශයන්හි සාරාංශයක් මෙම වාර්තාවේ දෙවෙනි ඇමුණුමේ අඩංගුව තිබේ.

## ස්තුතිය

වනේසා ගොසිලින්, ඒරන්ති ප්‍රේමරත්න සහ රේණුකා සේනානායක යන පර්යේෂණ නිලධාරීන් තිදෙනා විසින් මෙම අධ්‍යයනය පවත්වන ලදී. රතිනි සෙල්වනායගම් සහ පී.විජයශාන්තන් යන දෙපළගෙන් ඒ සඳහා ඉමහත් සහයෝගයක් ලැබිණි. ජානා රුමින්ගර්, සොෆියා එලෙක්, හේමෂිනී රාමනාදන් සහ මිරාක් රහීම් යන අයගෙන් ලද අනුග්‍රහය සහ දායකත්වය සම්බන්ධයෙන් ඔවුන්ට පර්යේෂණ නිලධාරී වරියගේ ස්තුතිය පිරිනැමේ.

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සතු ඉඩම් හා දේපල පිළිබඳ හිමිකම් යන හිසින් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙහෙයවන ලද ව්‍යාපෘතිය සඳහා අරමුදල් සපැයීම සම්බන්ධයෙන් නොවිබ් ආයතනයට වෙසෙසින් ස්තුතිය පළ වේ.

## සාරාංශය

එදිරිවාදුකම් අත්හිටුවීම, උතුරු - නැගෙනහිර පළාත්වල ජීවන තත්ත්වයන් වැඩි දියුණු වීම සහ වාර්ගික අර්බුදයට විසඳුමක් සෙවීමේ සුබවාදී අපේක්ෂාවත් සමගම ශ්‍රී ලංකාව තුළ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ 800,000කට තම සුපුරුදු ගම්බිම් කරා ආපසු පැමිණීමේ බලාපොරොත්තුව උදා වී තිබේ. සමහර අවතැන් වූ පවුල් සහ ඉන්දියාවේ සිටි සරණාගත පිරිස් දැනටමත් සිය නිවෙස් කරා යළි පැමිණ ඇත. තවත් බොහෝ දෙනෙක් තම ඉඩකඩම් හා දේපළ වෙත පැමිණ ආපසු පදිංචියට ඒමේ හැකියාව විමසා තිබේ.

මෙම තත්ත්වයන් යටතේ අවතැන් වූ පවුල්වල ඉඩම් හා දේපල අයිතිය පිළිබඳ ප්‍රශ්නය දැන් ඉතා වැදගත් මුහුණුවරක් ගෙන තිබේ.

උතුරු - නැගෙනහිර පළාත් යථා තත්ත්වයට පත් කිරීමේදී තම ගේ දොර, ගම්බිම් හා ඉඩකඩම් බලා ආපසු එන ජනතාව, රජය, එල්ටීටීඊය සහ ජාත්‍යන්තර ප්‍රජාව යන මේ සෑම පාර්ශවයකටම ඉඩම් හා දේපල මුල් කරගත් අභියෝග රැසකට මුහුණ පෑමට සිදු වී ඇත. ස්වකීය දේපළ අයිතිකරුවන් වෙත ආපසු පැවරීම, ඉඩකඩමට ප්‍රවේශ වීම, සිදු වී ඇති විනාශය, බිම් බෝම්බ ඉවත් කිරීම, ආධාර සැපයීම සහ නීති ආධාර ලබාදීම යථෝක්ත අභියෝග අතුරින් කීපයක් බවට මෙම වාර්තාව හඳුනාගෙන ඇත.

## බිම් බෝම්බ

බිම්බෝම්බ සහ අනෙකුත් පුපුරණ ද්‍රව්‍ය උතුරු - නැගෙනහිර පළාත් කරා ආපසු පැමිණෙන පදිංචිකරුවන් සහ අවතැන් වූ පිරිස්වලට මුහුණ පෑමට සිදු වී ඇති විශාලතම අනතුර වී

තිබේ. හමුදා මෙහෙයුම් සිදුවන ප්‍රදේශ, එල්ටීටීඊය සහ ශ්‍රී ලංකා යුද හමුදාව හා හමුදා කඳවුරු විසින් තම සීමා මායිම් ලකුණු කර ඇති ප්‍රදේශවල විශාල වශයෙන් බිම්බෝම්බ සවිකර තිබේ. බිම් බෝම්බ සවි කිරීම නිසා කෘෂි කාර්මික සහ හරකුන් තණ කැවීම සඳහා ප්‍රයෝජනවත් විශාල භූමි ප්‍රදේශ ප්‍රයෝජනයට ගත නොහැකිව තිබේ. වර්ගවාදී යුද්ධයට කොටු වී සිටින පෙදෙස්වල බිම් බෝම්බ සවිකර ඇති ස්ථාන හඳුනාගැනීම, සමීක්ෂණය කිරීම, දැනුවත් කිරීම සහ බිම්බෝම්බ ඉවත් කිරීම යනාදී කටයුතු එල්ටීටීඊය ශ්‍රී ලංකා යුද හමුදාව සහ ජාත්‍යන්තර රාජ්‍ය නොවන සංවිධාන විසින් අරඹා ඇත. බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යයේ දී කලාප අතින් සිදුවන ඇතැම් විෂමතා නිරීක්ෂණය වී තිබේ. එල්ටීටීඊ පාලනයට යටත් වන්නි ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කිරීම ඉතා පුළුල් හා ක්‍රමවත් අයුරින් සිදුවෙමින් පවතින අතර, ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව බිම්බෝම්බ ඉවත් කිරීමේ පුහුණුව ලබා දී ඇතත්, යාපන අර්ධද්වීපය හැර රජයේ පාලන ප්‍රදේශවල සහ නැගෙනහිර පළාතේ, බොහෝ සෙයින් ශ්‍රී ලංකා යුද හමුදාව යටතේ බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සැලසුමකින් තොරව ක්‍රියාත්මක වේ. රජයේ පාලන පෙදෙස්වල බිම් බෝම්බ ඉවත් කිරිමේ ක්‍රියාවලිය අඩපණ වීමට එක් හේතුවක් වී ඇත්තේ ආපසු පැමිණෙන වැසියන් බිම් බෝම්බ අනතුරු පිළිබඳ දැනුවත් නොවීම ය. ඔවුන් ආපසු පැමිණීමෙන් පසුව පමණක් එම කාර්යයේ යම් ප්‍රගතියක් ඇතිවන බවක් පෙනේ. දැනගන්නට ලැබී ඇති ආකාරයට ආපසු ගම්බිම් බලා ඒමට පෙර කඳවුරුවලදී හෝ වෙනත් පදිංචි ස්ථානවල දී බිම් බෝම්බ අනතුරු පිළිබඳ දැනුවත් කිරීමක් සිදු නොවේ.

## සැරි සැරීමේ නිදහස

සංවිධානාත්මක වශයෙන් අනාථ වූ පිරිස් ආපසු පැමිණීම අනුමත නොකරන එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම ස්වේච්ඡාවෙන් ආපසු පැමිණෙන අවතැන් වූවන් පිළිබඳව නිරන්තර විමසිල්ලෙන් සිටී.

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් සතු තම රුචිය ප්‍රකාර ඇවිදීමේ නිදහස රජය මෙන්ම එල්ටීටීඊය පවා ගරු කිරීමට කැපවී සිටින බව පෙනෙතත් එය ප්‍රතිපත්තිමය වශයෙන් ක්‍රියාත්මක නොවේ.

ඉඩම් අහිමිව සිටින අවතැන් වූ වැසියන් ඔවුන්ගේ මුල් පදිංචිය අයත් දිස්ත්‍රික්කය හැර අන්‍ය කවර හෝ දිස්ත්‍රික්කයක යළි පදිංචි වීම අනුමත නොකරන රජයේ ප්‍රතිපත්තිය නිසා පුද්ගලයින් සතු සැරි සැරීමේ නිදහසට බාධා පැමිණ ඇත.

බොහෝ ඉඩම් නොමැති අවතැන් වූ පවුල් විශේෂයෙන් ඔවුන් දැනට පදිංචි වී සිටින මන්නාරම් දූපතේ සහ වව්නියා නගරයේ ඉඩම් ලබා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කරති. එබැවින් අවතැන් වූවන් වශයෙන් සැලකෙන උතුරේ පදිංචියට පැමිණි වතුකරයේ දෙමළ ජනතාව, අවතැන් වූ හා ඉඩම් අහිමි නව පරපුර, නිත්‍යානුකූල නොවන අයුරින් හෝ තාවකාලිකව අලුතින් පදිංචි කරවන ලද පුද්ගලයින් සහ වලංගු ලියකියවිලි කිසිත් නොමැති ඊනියා නීති විරෝධී පදිංචි කරුවන්ට රජයේ මෙම ප්‍රතිපත්තිය නිසා කඳවුරුවලට වී සිටීමට හෝ, ගෙයක් දොරක් අහිමි පුද්ගලයින් වශයෙන් ජීවත් වීමට හෝ තමන් අකමැති ප්‍රදේශයක පදිංචියට යාමට හෝ සිදු වී තිබේ.

අවතැන් වූවන් තමන්ගේ මුල් පදිංචි පෙදෙස්වලට පිටත් කරලීම සඳහා විවිධ උපක්‍රම සහ බලකිරීම් සිදු කර ඇත. ආහාර සලාකය අත්හිටුවීම හෝ කඳවුරු සහ පාසල් වැනි අනෙකුත්

පහසුකම් නැති කිරිම ඉන් කීපයකි. සැප්තැම්බර් අවසානය වනවිට මඩු කඳවුර බලධාරීන් විසින් වසා දමන ලද අනෙක් පවුල් 1600කට ස්වකීය මුල් පදිංචි පෙදෙස්වලට යාමට සිදු විය.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන කොටස් දෙකට අයත් අවතැන් වූවන් සහ ආපසු ගම්බිම් කරා පැමිණෙන පිරිස් අතර වාර්ගික උණුසුම ඉතා ඉහළින් පවතී. එය ඔවුන්ට ස්වකීය ඉඩකඩම් හා දේපොල කරා ආපසු අවතීර්ණ වීමට මහත් බාධාවක්ව පවති.

රජයව විසින් නැගෙනහිර පළාතේ ඉඩම් සහ සම්පත් වෙන් කර දීමේ දී තමන්ව කොන් කරන බවට දීර්ඝ කලක සිට දෙමළ ජනතාව අතර හැඟීමක් පවතී. මෙය ජන අනුපාතය වෙනස් කිරීමට ගනු ලබන වෑයමක් වශයෙන් අර්ථ කථනය කොට ඇත. එහි ප්‍රතිපලයක් වශයෙන් සිංහල හා මුස්ලිම් අවතැන් වූවන්ගේ ආපසු පැමිණීම හෝ ප්‍රදේශයේ ජීවත්වීම පිළිබඳ දැඩි අවිශ්වාසයක් හටගෙන ඇත. දිගින් දිගට කෙරෙන හිරිහැර, කප්පන් ගැනීම සහ පැහැර ගැනීම් සිදුවෙමින් තිබෙන අවස්ථාවක ආපසු පැමිණෙන ලෙස එල්ටීටීයෙන් කෙරෙන ඇවිටිලි ගැන කලින් ඔවුන්ගේ ග්‍රහණයට අසු වූ සිංහල සහ මුස්ලිම් අවතැන් වූවෝ සැක පහළ කරති.

## දේපල හානිය

හිංසාවාදී සිද්ධීන්, කොල්ලකෑම් සහ පැහැරගැනීම් වැනි ක්‍රියාවන් නිසා උතුරු-නැගෙනහිර ප්‍රදේශවල දෙපළ හා යටිතල පහසුකම්වලට සිදුවී ඇති විනාශය අතිමහත් ය.

එල්ටීටීඊ පාලනයට යටත් වන්නි ප්‍රදේශවල ස්ථිර ගොඩනැගිලි හුදෙක් කලාතුරකින් පමණක් දැකිය හැකි ය. ඒ වෙනුවට බහුල වශයෙන් දැකිය හැක්කේ පොල් අතු දෙවිලි කළ පැල්පත් ය. රජයේ පාලනයට යටත් ප්‍රදේශවල ස්ථිර ගොඩනැගිලි විශාල වශයෙන් විනාශ වී ඇතිමුත්, සමහර ගොඩනැගිලි තවමත් ඉතිරිව තිබේ.

අවතැන් වූවන්ගේ බොහොමයක් දේපළ කොල්ලකා ඇත. ගොඩනැගිලිවල අත්තිවාරම් පවා අතුරුදහන් වී තිබේ

ආපසු පැමිණෙන වැසියන්ට තම දේපළ හඳුනාගැනීම හා ඒවායේ මායිම් තහවුරු කරගැනීම අපහසු වී තිබේ. දේපළ හිමි වර්තමාන අයිතිකරුවන් මියයාමේ දී ඔවුන්ගේ දරුවන්ට මායිම් නිරවුල් කර තම දේපළ භුක්තිය තහවුරු කරගැනීම අපහසු වනු ඇත.

පාසල්, රෝහල්, විදුලිය, ජලය සහ අනෙකුත් මහජන උපයෝගිතා අඩංගු යටිතල පහසුකම් විනාශ වී තිබේ. යටිතල පහසුකම් විනාශ නොවූ පෙදෙස්වල පිරිස් හා සම්පත් ඌණතාව සේවා සැපයීමේදී බලවත් අවහිරයක් වී තිබේ.

## ජනජීවිතය යළි ආරම්භ කිරීම

අවතැන්වීම සහ අර්බුදය හේතු කොට ගෙන ආර්ථික වත්කම් අහිමිවීම තක්සේරු කළ නොහැකි තරමට ම අති විශාල ය. එබැවින් ආපසු පැමිණෙන පිරිස්වලට හුදෙක් මුල සිටම ජීවිතය ආරම්භ කිරීමට සිදු වේ.

ගොවිජනතාවට ආදායම් අහිමි වූවා පමණක් නොවේ, කෘෂි උපකරණ සියල්ල ද විනාශ වී ඇත. කෘෂි ඉඩම් හැම එකක්ම පාහේ පුනරුත්ථාපනය කළ යුතුව ඇත. ගුවනින් බෝම්බ

හෙළීම නිසා පොල් වගාව විනාශ වී තිබේ. ව්‍යාපෘතිකයින්ට තම දේපළ මෙන්ම, ධීවර ජනතාවට ධීවර ආම්පන්න අහිමි වී තිබේ.

දේපල සහ මූල්‍ය වත්කම් විනාශයට අතිරේකව අවතැන් වූ නව පරපුරේ දක්‍ෂතා, එල්ටීටීඊයේ බදු අය කිරීම, වෙළඳපල ඇදවැටීම, කම්කරුවන්ට රැකියා අහිමිවීම, ධිවර කර්මාන්තයට පැනවී ඇති තහංචි සහ අනන්‍යතාව සහ දේපල අයිතිය තහවුර කිරීම අපහසු වීම උතුරු - නැගෙනහිර ජනතාවට මුහුණ දීමට සිදු වූ අනෙකුත් දුෂ්කරතා වේ.

## ආධාර සැපැයීම

ආර්ථික දුෂ්කරතාවන් හේතුවෙන් ආපසු පැමිණෙන අවතැන් වූ පිරිස්වලට රජයෙන් හෝ රාජ්‍ය නොවන සංවිධානවලින් සහන සේවාවක් ආරම්භ කළ යුතුව තිබේ. රජය ස්වකීය ඒකාබද්ධ ආධාර යෝජනා ක්‍රමය යටතේ නැවත පදිංචි කරවනු ලබන පවුල්වලට මූල්‍ය ආධාර සපයනු ලැබේ. නැවත පදිංචි වීමේදී එක පවුලකට රු. 65,000/- බැගින් අවතැන් වූ පවුල් 227,000කට මෙම ආධාරය භුක්ති විඳීමට අවස්ථාව සැලසේ. එනමුදු රජයට මුහුණපෑමට සිදු වී ඇති මූල්‍ය දුෂ්කරතා නිසා මෙම ආධාර මුදල්වල අඩුවීමක් සිදු වී ඇත.

සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ඩොලර් මිලියන 30ක් ආධාර වශයෙන් ලැබී ඇත. එම මුදල එක් පවුලකට රු. 100,000 බැගින් ලබා දීමේ වැඩසටහනක් රජය සැලසුම් කර තිබේ.

ජීවිත හා දේපල හානිය වෙනුවෙන් දැනට වන්දි ගෙවනු ලබන්නේ ඇතැම් රජයේ සේවකයින්ට පමණි. ආපසු පැමිණෙන වැසියන්ට ආදායම් උපදවන ව්‍යාපෘතියක් ආරම්භ කිරීම සඳහා මුදල් ආධාර සපයනු නොලැබේ. එහෙත් ආපසු පැමිණ ගේ දොර ඉඩකඩම්වල පදිංචි වීමෙන් සය වසකට පසුව ඔවුන්ගේ වියළි ආහාර සලාකය කපා හරිනු ලැබේ.

ආපසු පැමිණෙන සරණාගතයින්ට යළි ලියාපදිංචි වීමෙන් පසු රජයෙන් ආධාර සැපයෙනු ඇත. ග්‍රාමසේවා නිලධාරීන් හරහා දිසාපතිවරුන් විසින් හඳුනාගත් පවුල් සඳහා එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම මගින් ආහාර නොවන සහනාධාර සැපයේ. අවතැන් වූ පෙදෙස්වල අනෙක් සලාකය සඳහා ලියාපදිංචි වන සරණාගතයින්ට මෙම සහනාධාරය නොලැබේ. මෙය සිංහල සහ මුස්ලිම් සරණාගතයින්ට තදින් බලපාන්නකි. ස්වකීය දේපල විනාශ වීම, බිම් බෝම්බ තර්ජනය හෝ තම දෙපළ අන්‍යයන් විසින් භුක්ති විඳීම හේතු කොට ගෙන අසරණ වී සිටින සහ අයිතිකරුවන් නොමැති ඉඩම්වල පදිංචි වී සිටින සරණාගතයින්ට මෙන්ම අනෙකුත් ස්ථිර වාසස්ථානයක් නොමැති පිරිස්වලට ද තාවකාලික නවාතැන් සැපයිය යුතුව තිබේ. ආපසු ගම්බිම් බලා පැමිණෙන ජනයා ගේ පදිංචිය සඳහා රජය විසින් “සුභ සාධන මධ්‍යස්ථාන” පිහිටුවා ඇත.

## ද්විතීයික පදිංචිය

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් සතු දේපල වෙනත් අය භුක්ති විඳිමින් සිටිති. ඔවුහු ඉඳුම් හිටුම් සඳහා පහසුකම් කිසිවක් නොලැබ සිටින්නෝ වෙති. නිත්‍ය අයිතිකරුවන් සහ තාවකාලික පදිංචිකරුවන් යන මේ දෙපාර්ශවය අතර දැනට යහපත් සබඳතා පවතී. ඔවුහු

අනෝන්‍ය ගැටලු මිත්‍ර ලීලාවෙන් විසඳා ගැනීමට සමත් වී සිටිති. අනුන් සතු දේපල නීති විරෝධි අයුරින් භුක්ති විඳින පිරිස් නිසා විවිධ ගැටලු පැනනැගී ඇත. බලහත්කාරයෙන් පදිංචි වී සිටින සමහර පුද්ගලයින්, පදිංචිව සිටින දේපල නිත්‍ය අයිතිකරුවන් වෙත මුදා හැරීම සඳහා වන්දි මුදලක් ඉල්ලා සිටින අවස්ථා නැත්තේ ද නොවේ. තම අයිතිවාසිකම් තහවුරු කරලීම සඳහා නීතියේ පිහිට සොයා යාමට තරම් ඔවුහු දිරිමත් වී සිටිති.

## යුද හමුදාව සහ පොලිසිය ඉඩකඩම්වල පදිංචි වීම

විශේෂයෙන් යාපනය සහ මන්නාරම් දිස්ත්‍රික් ඇතුළු උතුරු - නැගෙනහිර පළාත්වල සැලකිය යුතු භූමි ප්‍රමාණයක් යුද ශ්‍රී ලංකා හමුදාව සහ පොලිසිය පදිංචියට යොදාගෙන නොතිබේ. යුද හමුදාව ස්වකීය අධි ආරක්ෂක කලාප පුළුල් කරන බවට හෝ අලුතින් තනන බවට රාවයක් පැතිර ඇත. අධි ආරක්‍ෂක කලාප හැරුණ විට හමුදා සහ පොලිස් මුරපල විශාල ප්‍රමාණයක් තවමත් බොහෝ පුද්ගලික ඉඩකඩම්වල පිහිටුවා තිබේ. එබැවින් එම ඉඩම්වල අයිතිකරුවන්ට තම දේපළ භුක්ති විඳීමේ අවස්ථාව අහිමි වී තිබේ. හමුදාව විසින් සිය පදිංචිය සඳහා ඉඩම් හිමිකරුවන්ට කුලියක් ගෙවනු ලබන්නේද අක්‍රමවත් අයුරිනි.

අනෙකුත් කරුණු අතර, අධි ආරක්‍ෂක කලාප පිළිබඳ ප්‍රශ්නය සලකා බැලීම සඳහා ප්‍රථම සාම සාකච්ඡා වාරය අවසානයේ දී ගැටුම් අත්හිටුවා රට යථා තත්වයට පත් කිරීමේ මාතෘකාව යටතේ උප කමිටුවක් ද පත්කරන ලදී. එහෙත් වැඩි කලක් නොගොස්ම මෙම කමිටුව අකර්මන්‍ය විය. කෙසේ වුවද, යාපන දිස්ත්‍රික්කය තුළ යළි පදිංචි කරවීම වේගවත් කිරීමේ ක්‍රියාකාරී සැලැස්මක් සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් යම් එකඟතාවකට පැමිණ ඇත. අධි ආරක්‍ෂක කලාපවලට ආසන්න ප්‍රදේශ අත්හැරයාම පිළිබඳ මෙම සැලැස්ම යටතේ කරුණු පරීක්‍ෂා කිරීමට යෝජිතව තිබුණි. සන්නධ හමුදාවල පදිංචිය සම්බන්ධයෙන් මතුවන ගැටලු දැන් දිස්ත්‍රික් මට්ටමින් නිරාකරණය කෙරේ.

## එල්ටීටීඊ සංවිධානය ඉඩකඩම්වල පදිංචි වී සිටීම

විශේෂයෙන් පලවාහරින ලද මුස්ලිම් ජනතාවට අයත් ඉඩකඩම් සහ ඉන්දියාවේ ජීවත්වන සරණාගතයින් සහ විශ්‍රාමිකයින්ට අයත් ඉඩකඩම් ඇතුළු එල්ටීටීඊ ප්‍රදේශවල අතහැර දමන ලද ඉඩම් විශාල වශයෙන් එල්ටීටීඊය විසින් පවරාගෙන ඇත. එම ඉඩම් පසුව කුලිය දී හෝ එල්ටීටීඊ නියෝජිතයන්ගේ පවුල් වෙත පවරා දී තිබේ. එසේත් නැතිනම් එල්ටීටීඊයේ පරිපාලන ආයතන එම ඉඩම්වල මෛ තිබේ. අවතැන්වූවන්ට වෙනත් අයගේ ඉඩම්වල පදිංචි වීම සඳහා එල්ටීටීඊය ඉඩ දී ඇති බව ද වාර්තා වේ. සමහර එල්ටීටීඊ  කඳවුරු අවතැන් වූ වැසියන්ගේ ඉඩම්වල ස්ථාපනය කර තිබෙන බවක්ද පැවසේ. එසේම ආපසු සිය ගම්බිම් බලා පැමිණෙන අයගේ ඉඩම්වලින් ඉවත් වන ලෙස එහි පදිංචිකරුවන්ට එල්ටීටීඊය දන්වා ඇතැයි ද වාර්තා වේ. අවතැන් වූ මුස්ලිම් ජාතිකයින් සතු දේපල ආපසු ඔවුන් වෙත ලබා දීම දැන් ප්‍රශ්නයක් වී ඇත. මුස්ලිම් ජාතිකයින්ට අයත් ඉඩකඩම් රාශියකම එල්ටීටීඊ ආයතන පිහිටුවා ඇති බැවින්, එම ඉඩම් ආපසු ලබා දෙන බවට එල්ටීටීඊය දී ඇති ප්‍රතිඥා කෙරෙහි සැකපහළ වී තිබේ. කිලිනොච්චි නගරයේ පිහිටි තමන්ට අයත් ව්‍යාපාරික දේපලවලින් කුලී ලබාගැනීම සඳහා මුස්ලිම්වරුන් අතලොස්සක් වර්තමාන පදිංචිකරුවන් සමග ගිවිසුම්වලට ඇතුළත් වී ඇතත්, ස්ථිර වශයෙන් එම දේපල මුදා හරිතැයි අපේක්‍ෂා කළ නොහැකි ය.

මෙය ලියන මොහොත වන විට නම්ගම්, පිහිටීම සහ ප්‍රමාණය දැක්වෙන මුස්ලිම්වරුන් සතු දේපල පිළිබඳ ලයිස්තුවක් තමන් වෙත සපයන ලෙස එල්ටීටීඊය මුස්ලිම් කොන්ග්‍රසයෙන් ඉල්ලා ඇත.

## දේපල අයිතිය තහවුරු කිරීම සහ නැති වූ ලේඛන

අවතැන්වීමේ දී දේපොල පිළිබඳ ඔප්පු තිරප්පු හා අනෙකුත් ලේඛන නැතිවීම නිසා නීතිය අනුව දේපල පිළිබඳව හිමිකම් ඇතත්, එහි අයිතිය තහවුරු කිරීම බොහෝ අවතැන් වූ පුද්ගලයින්ට ගැටලුවක් වී තිබේ.

වර්ගවාදී යුද්ධය හෝ ස්වාභාවික විපත් හේතුවෙන් ඉඩම් පිළිබඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල මෙන්ම ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව තිබූ වටිනා ලේඛන විනාශ වීම නිසා, ඒවායේ පිටපත් ලබාගැනීම දුෂ්කර කාර්යයක් වී තිබේ. එහෙත් නැගෙනහිර පළාතේ දේපල පිළිබඳ ලිපි ලේඛන එම කාර්යාල වලම නිරුපද්‍රිතව පවතී. 2002 පෙබරවාරියේ දී අත්සන් කළ සටන් විරාම ගිවිසුමෙන් පසු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවලට සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට වැඩි වෙමින් පවත්නා ඉල්ලුමට සරිලන අයුරින් දේපල පිළිබඳ ලිපිලේඛනවල පිටපත් නිකුත් කිරීම අපහසු වී තිබේ. ජාතික හැඳුනුම්පත් හෝ උප්පැන්න සහතික සහ විවාහ හෝ මරණ සහතිකපත් යනාදිය අහිමිවීමේ හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින්ට දේපල පිළිබඳ ලිපිලේඛනවල පිටපත් ලබාගැනීම වඩාත් දුෂ්කර වී තිබේ. අනවසරයෙන් රජයේ ඉඩම්වල පදිංචි වී සිටි සමහර පුද්ගලයින් එම පදිංචිය නිත්‍යානුකූල කරගැනීම සඳහා ක්‍රියාකරමින් සිටි අතර අවතැන්වීම නිසා එහි ඉදිරි කටයුතු කර ගෙන යාම අපහසු වී තිබේ. එබඳු පුද්ගලයින්ට සහනයක් සැලසීම සඳහා දැනට අනුගමනය කළ යුතු ක්‍රියා පරිපාටියේ වෙනසක් කළ යුතුව තිබේ.

## නීති විරෝධි ලෙස ඉඩම් පැවරීම

රාජ්‍ය මෙන්ම පෞද්ගලික ඉඩම් ද නීති විරෝධී අයුරින් පවරා හෝ විකුණා තිබේ.

අවතැන්වූවන් සතු ඉඩම් වෙනත් අයට අලෙවි කර ඇති අතර විවිධ පුද්ගලයින් සතු ඉඩම් අවතැන් වූ පිරිස් වෙත විකුණා හෝ වෙනත් අයුරින් ලබා දී ඇති අතර ඔවුහු දැන් ඒවාට හිමිකම් කියා සිටිති.

අවතැන් වූ පුද්ගලයින් ආපසු ඒම වැඩිවීමත් සමඟම නීති විරෝධි අයුරින් ඉඩම් පැවරීම බොහෝ ආරවුල්වලට මුල පිරීමට සමත් වනු ඇතැයි විශ්වාස කෙරේ.

අවතැන් වූ පෙදෙස්වල ජීවත් වීමට කැමැත්ත ප්‍රකාශ කළ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පිරිස්වලට නීති විරෝධී අයුරින් ඉඩම් පැවරීම නිසා දුෂ්කරතා ඇතිවිය. ඔප්පුවක් මගින් පර්චස් 10ක අයිතිය තහවුරු කිරීමට හැකි අවතැන් වූ පුද්ගලයින්ට රජය රු. 10,000ක ආධාරයක් සපයන බව ප්‍රකාශකර තිබුණි. කෙසේ වුවද, අවතැන් වූ ජනයා යළි පදිංචි කරවන ලද ඉඩම්වලින් 60%ක් ම කොටස් කර නීති විරෝධී අයුරින් විකුණන ලද රජයේ ඉඩම් වේ.

## සහනය සැලසීම

දිස්ත්‍රික් උසාවි, ශ්‍රී ලංකා නීතිඥ මණ්ඩලය, නීති ආධාර පදනම, මානව හිමිකම් කොමිසම, සමථ මණ්ඩල, නීති ආධාර කොමිසම සහ පොලීසිය ඇතුළු රාජ්‍ය ආයතන මෙන්ම රාජ්‍ය නොවන සංවිධාන ගණනාවක් ම අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින් සතු දේපල ආපසු ඔවුන් වෙත ලබාදීමට කටයුතු කරමින් සිටිති.

මේ ආයතනවලින් සමහරක් නීතිමය ක්‍රියාපටිපාටි අනුව කටයුතු කරන අතර තවත් ආයතන රැසක් මිත්‍රශීලී අයුරින් ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රියාවලියේ නිරතව සිටිති. කෙසේ වුවද මෙම ආයතනවලට වැඩි වෙමින් පවත්නා පැමිණිලි හමුවෙහි ස්වකීය කාර්යභාරය ප්‍රමාණවත් අයුරින් සපුරාලීමට හැකිවේදැයි සැකයක් පවතී.

එල්ටීටීඊ පාලනය පවත්නා ප්‍රදේශවල ඉඩම් හා දේපල පිළිබඳ ප්‍රශ්න රජයේ මෙන්ම එල්ටීටීඊ පරිපාලනය යටතටද ගැනේ. දෙපාර්ශවයේ ප්‍රතිපත්ති හා නීතිය එකිනෙකට වෙනස් බැවින් බොහෝ අවස්ථාවල විවිධ වියවුල් හටගැනේ. සමාන්තර පරිපාලනයක් පවත්වා ගෙන යන එල්ටීටීඊය සතු වෙනම අධිකරණ පද්ධතියක් ද ඇත. දෙමළ ඊලාම් පොලීසිය දේපල ආරවුල් නිරාකරණය කිරීම සඳහා මැදහත් වන අතර එහිදී සමථයකට පත් නොවන නඩු දෙමළ ඊලාම් උසාවි වෙත යොමු කෙරේ.

## අවතැන් වූ කාන්තාවන්

කාන්තාවන්ට බලපාන ඉඩම් හා දේපොල පිළිබඳ ප්‍රශ්න ඔවුන්ගේ මානව හිමිකම් ජීවන තත්ත්වයත්, සහජීවනෝපාය හා සමීපව බැඳී සිටියි. අවතැන් වූ පවුල්වලින් 60%ක් ම කාන්තාව විසින් පෝෂණය කරනු ලබන හෙයින් අවදානම් තත්ත්වයක් මතු වී තිබේ.

ආපසු ගම්බිම්බලා පැමිණෙන සහ සුබසාදන මධ්‍යස්ථානවල නිවැසි කාන්තාවන් මුහුණ දෙන ඉඩම් සහ දේපල පිළිබඳ ප්‍රශ්න සංඛ්‍යාව අධික ය.

ආධාර සහ වන්දි මුදල් ප්‍රමාණවත් නොවීම, ඉඩම් සහ දේපල සඳහා නීත්‍යානුකූල හිමිකම් ලබාගන්නා කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන විවිධ බාධක, භූමිය ශුද්ධ කර නිවසක් යළි තනාගැනීමේ අභියෝගය, පවුල නඩත්තු කිරීමේ තනි වගකීම හා ජීවන බර යනාදිය යටකී ඉඩම් සහ දේපළ පිළිබඳ ප්‍රශ්න අතරට වැටේ.

## සංවර්ධනය සහ ඉඩම් පරිහරණය කිරීමේ ප්‍රතිපත්තිය

සංවර්ධනය සහ ඉඩම් පරිහරණය කිරීමේ රජයේ වර්තමාන ප්‍රතිපත්තිය, අවතැන් වූ ජන කොටස් සාර්ථක අයුරින් යළි පදිංචි කරවීමේ වැඩ සටහනට හරස් වී තිබේ. කුඩා ඉඩම් හිමියන්ට මෙය විශේෂයෙන් බලපා තිබේ.

ලෝක බැංකුවේ නිර්දේශ පරිදි පෞද්ගලිකකරණය කිරීම සහ පිටිසර ගම්වල සිට නාගරික ප්‍රදේශවලට සංක්‍රමණය වීම දිරිගැන්වීමේ රජයේ ප්‍රතිපත්තිය තහවුරු කෙරෙන නෛතික හා ප්‍රතිපත්ති වෙනස්කම් රැසක් හඳුන්වා දීමට යෝජිත ය. ගොවීන්ට දෙනු ලබන සහනාධාර හා වෙනත් උපකරණ උතුර සහ නැගෙනහිර යළි ප්‍රතිසංස්කරණය කිරීම හා පුනරුථාපනය කිරීම

ඇතුලු පෞද්ගලික අංශයේ වැඩි සහභාගිත්වය පිළිබඳ රජයේ ප්‍රතිපත්තියේ සංශෝධනයක් ඉහතින් සඳහන් වෙනස්කම්වලින් අපේක්ෂා කෙරේ.

ආපසු පැමිණෙන ජනතාව අතුරින් විශේෂයෙන් ගොවීන් සඳහා සහනාධාර සහ ඉඩම් ලබාදීම වැනි රජයෙන් සැලයෙන සහන සේවා ඔවුන්ගේ ආර්ථික ක්‍රියාකාරකම් යළි ආරම්භ කිරීම සඳහා වැදගත් වේ.

ඉඩම් සංවර්ධන ආඥාපනත හා ඉඩම් පිළිබඳ උරුමය හවුල් බෝග කරුවන්ගේ අයිතිවාසිකම්වලට හානිදායක ගොවිජන සේවා නීතිය හා ඉදිරියේ දී හඳුන්වා දීමට යෝජිත ජලසම්පත් පිළිබඳ අයිතිය සහ පෞද්ගලිකකරණය ඉලක්ක කරගත් බීජ පනත් සඳහා සංශෝධන අවශ්‍ය සේ සැලකේ.

# බිම් බෝම්බ

## දැනුවත් කිරීම

එල්ටීටීඊ පාලනයට නතු වී ඇති වන්නි ප්‍රදේශයට ඇතුල්වන ස්ථානයන්හි දී මෙන්ම අවතැන්වූවන් යළි පදිංචි කිරීමේදී මුහුණ පෑමට සිදුවන බිම්බෝම්බ අනතුර පිළිබඳව දැනුවත් කරනු ලැබේ.

කඳවුරු හෝ අවතැන් වූවන්ගේ ජනාවාස වෙත පැමිණීමට පෙරාතුව බිම් බෝම්බ අනතුර ගැන දැනුවත් කිරීමක් සිදු නොවේ. එබැවින් සූදානමක් නොමැතිව පැමිණි අවතැන් වූ පිරිස් බිම් බෝම්බ අනතුරුවලට ගොදුරු වූහ. සටන් විරාම ගිවිසුමෙන් පසු සාමාන්‍යයෙන් සතියකට බිම් බෝම්බ අනතුරු දෙකකට වැඩි සංඛ්‍යාවක් වාර්තා වී ඇත.

⋆ අවතැන් වූ ජනයාට ආපසු පැමිණීමට පෙර බිම් බෝම්බ සම්බන්ධයෙන් දැනුවත් කළ යුතුයයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. අනිකුත් කරුණු අතර, අදාළ බලධාරින් විසින් අවතැන්වූවන්ගේ කඳවුරු සහ පාසල්වලදී සම්මන්ත්‍රණ පැවැත්වීම, අවතැන්වූවන් ජීවත් වන ජනාවාස තුළ පත්‍රිකා බෙදාහරීම සහ බිම් බෝම්බ හා අනෙකුත් පුපුරණ ද්‍රව්‍ය පිළිබඳ ජනතාව දැනුවත් කරීම පිණිස ජනමාධ්‍යය යොදා ගැනීම වැදගත්.

## ආවරණය

බිම්බෝම්බ උවදුර බැහර කිරීම (සමීක්ෂණය, හඳුනාගැනීම, දැනුවත් කිරීම හා බිම් බෝම්බ ඉවත් කිරීම) බිම් බෝම්බ තර්ජනයට මුහුණ පා සිටින ප්‍රදේශවල එකම ප්‍රමිතියකට අනුකූලව සිදු කරනු නොලැබේ. එල්ටීටීඊ පාලනයට යටත් වන්නි ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු මනා සම්බන්ධීකරණයකින් යුතුව ජාත්‍යන්තර ප්‍රමිතියකට අනුකූලව ක්‍රියාත්මක කෙරෙන බවක් පෙනේ. එහෙත් එල්ටීටීඊ පාලනයට යටත් නැගෙනහිර ප්‍රදේශයේ බිම්බෝම්බ ඉවත් කිරීම සිදු කරනුයේ ජාත්‍යන්තර ප්‍රජාව යටතේ පුහුණුව නොලත් එල්ටීටීඊ ඉන්ජිනේරුවන් විසිනි. රජයේ පාලනය යටතේ උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල ශ්‍රී ලංකා යුද හමුදාව පමණක් අවම මට්ටමකින් බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු කරනු ලැබේ. යුද හමුදා බලධාරීන්ට ද ජාත්‍යන්තර ප්‍රමිතියකට අනුකූලව පුහුණුවක් ලබා දී නොමැති බැවින් ඔවුන් විසින් බිම් බෝම්බ

ඉවත්කළ බව කියැවෙන පෙදෙස්වල දිගින් දිගටම බිම් බෝම්බ අනතුරු සිදුවන බව වාර්තා වේ.

සමීක්ෂණය කිරීම, අඳුනාගැනීම, දැනුවත් කිරීම සහ බිම් බෝම්බ ඉවත් කිරීම යන ක්‍රියාවලියෙන් බිම් බෝම්බ තර්ජනයකට මුහුණ පා සිටින පෙදෙස්වලට ආරක්ෂාව සැලසීමට හැකිවනු පිණිස, බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කළ යුතු වේ. තවද එල්ටීටීඊයට නැගෙනහිර පළාතේ බිම් බෝම්බ ඉවත් කිරීම සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදීම කෙරෙහි ජාත්‍යන්තර ප්‍රජාවගේ අවධානය යොමු විය යුතු යි. ඒවාගේම බිම් බෝම්බ ඉවත් කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා යුද හමුදාවට ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූල වන පරිදි පුහුණුවක් ලබාදිය යුතුයි.

## බිම්බෝම්බ ඉවත් කිරිම සඳහා වැඩිපුර විදේශාධාර

ආපසු පැමිණෙන අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ගේ සංඛ්‍යාව ඉහළ යන මුත් එයට සරිලන පරිදි බිම් බෝම්බ ඉවත් කිරීම සිදු නොවේ. දැනට කටයුතු සිදුවන ආකාරයට බිම්බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කිරිම සඳහා තව අවුරුදු 3ක් පමණ ගත විය හැකි බැවින් එය වඩා වේගවත් කළ යුතුව තිබේ.

⋆ බිම් බෝම්බ ඉවත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට හැකිවන පරිදි ආධාර සැපයීමේ ජගත් ප්‍රජාව වැඩි වැඩියෙන් විදේශ ආධාර සැපයිය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## සැරි සැරීමේ නිදහස යළි පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය

කිසිම පුද්ගලයකු ඔහුගේ මුල් පදිංචි දිස්ත්‍රික්කය හැර අන්‍ය දිස්ත්‍රික්කයක රජයේ ඉඩමක යළි පදිංචි නොකර වීම රජයේ ප්‍රතිපත්තියයි. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනය (උප ග්‍රන්ථ 11, 2:7) ප්‍රකාර වලංගු වී ඇතැයි රජය පවසයි. පළාත් අතර වාරිමාර්ග හා ඉඩම් සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී හැකිතාක් දුරට පළාතේ ජනගහන රටාවට හානි නොවන පරිදි ක්‍රියා කළ යුතු අතර එය ජනාවාස තුළ ප්‍රජා සංසක්තිය තහවුරු කිරීමේ ප්‍රතිපත්තියටද අනුකූල විය යුතු වේ. මෙම මූලධර්ම වාරි මාර්ග හා සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම නිසා සිදුවන අවතැන්වීම් සම්බන්ධයෙන් අදාළ වනවා මිස, අර්බුද හේතුවෙන් ඇතිවන අවතැන්වීම් සම්බන්ධයෙන් වලංගු නොවේ.

අවතැන්වූ ජනතාව අතරින් සැලකියයුතු සංඛ්‍යාවක් ඉඩම් නොමැති පුද්ගලයෝ වෙති. උතුරට පැන ආ වතුකරයේ දෙමළ ජනතාව, අලුතින් අවතැන්වූ පරපුර සහ අවශ්‍ය ලියකියවිලි කිසිවක් නොමැතිව රජයේ ඉඩම්වල පදිංචි පිරිස් මෙම ගණයට ඇතුළත් වේ. බෙහෝ දෙනෙක් පසුගිය වසර 13ක් පුරා පදිංචිව සිටින වර්තමාන පෙදෙස්වල ම යළි පදිංචි වීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. යළි පදිංචි කිරීමේ වර්තමාන ප්‍රතිපත්තිය සිංහල ජනතාවට බලනොපනා අයුරින් ක්‍රියාත්මක කළ හැකි බැවින් ඒ පිළිබඳව කනස්සල්ල පළ වී ඇත.

⋆ වර්තමාන ප්‍රතිපත්තිය අත්හැර දමා, අවතැන්වූවන් සතු තමන්ගේ පදිංචිය තෝරාගැනීමේ අයිතිය ගරු කළ යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

⋆ අතිරේක වශයෙන් අවතැන් වූ ජනයා යළි පදිංචි කරවීම පහසු කරනු වස් රජයේ ඉඩම් සම්බන්ධයෙන් රජය සමීක්ෂණයක් පවත්වා ඉඩම් බැංකුවක් පිහිටු විය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

දැනට පදිංචිය සඳහා උපයෝගී කරගත හැකි ඉඩම් ප්‍රමාණය සහ ඒවා පිහිටා ඇති ප්‍රදේශ ප්‍රකාශයට පත් කළ යුතු අතර, එම ඉඩම් බෙදා දීමේ දී ඉඩම්ලාභීන් සහ සත්කාරක ප්‍රජාව එයට ඍජුවම සම්බන්ධ විය යුතුයි.

## බලහත්කාරයෙන් අවතැන්වූවන් පිටත්කර හැරීම

සංවිධානාත්මක වශයෙන් අවතැන් වූවන් ආපසු පැමිණීම නොකළ යුතු බවට එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම දිගින් දිගටම උපදෙස් දෙයි. එයට හේතුව වශයෙන් දක්වා ඇත්තේ අවතැන් වූවන්ට ගෞරවාන්විතව මෙන්ම ආරක්ෂාව පිළිබඳ විශ්වාසයක් තබා ආපසු ඒමට තරම් පවත්නා තත්ත්වයන් හිතකර නොමැතිවීමයි. ස්වේච්ඡාවෙන් තමන් කලින් ජීවත් වූ ප්‍රදේශවලට ආපසු ඒම ගැන මධ්‍යම රජය ස්වකීය මනාපය දක්වා තිබේ. කෙසේ වුවද, සැලසුමකින් තොරව හුදෙක් බලහත් කාරයෙන් අවතැන්වූවන් පිටත්කර හැරීමේ අවස්ථා නැත්තේ නොවේ. මඩු දේවස්ථානයේ සුබ සාධක මධ්‍යස්ථානය වසා දැමීම එයට කදිම නිදසුනකි.

⋆ අවතැන්වූවන් සතු තමන් රුචි පරිදි සැරි සැරීමේ නිදහස මැනවින් ගරුකළ යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. අවතැන්වූවන් සිය කැමැත්තෙන් ආපසු පැමිණිය යුතු බවට රජය දරන ස්ථාවරය ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කළ යුතු ය.

## වාර්ගික උණුසුම

වාර්ගික වශයෙන් සුළුතරයක් වූ බෙහෝ අවතැන්වූ පිරිස් ආපසු ඒමට බිය පලකර සිටිති. සුළුජන කොටස්වල අයිතිවාසිකම් නොතකා හෝ ඔවුන්ට අසාධාරණයක් වන අයුරින් ක්‍රියා කිරීම හේතුවෙන් අතීතයේ දී ඇති වූ වර්ගික අසහනය සහ මානව හිමිකම් උල්ලංඝනය කිරීම් වැනි සිද්ධීන් නිසා ඇතැම් අවතැන්වූවන් ආරක්ෂා සහිතව හා ඔවුන්ගේ තත්වය රැකෙන අයුරින් යළිපදිංචි කරවීම අපහසු වී තිබේ.

⋆ සිවිල් සංවිධාන විසින් ප්‍රජා මට්ටමින් අන්‍යොන්‍ය සහයෝගිතා වැඩ සටහන් දියත් කළ යුතු අතර ඒ සඳහා ආධාර සපයන ආයතන පරිත්‍යාගශීලීව අරමුදල් සැපයිය යුතුයැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

⋆ සිංහල හා මුස්ලිම් ජනතාවට ආපසු තම ගම්බිම් බලා එන ලෙස කරන ලද ආරාධනය නිසි අයුරින් ක්‍රියාවට නැංවීම සඳහා එල්ටීටීඊය සුළුතර වැසියන්ගේ ආරක්ෂාව අධීක්ෂණය කිරීමේ දී පරිපාලනමය යාන්ත්‍රණයක් පිහිටුවිය යුතුයි.

එසේ නොමැති නම් ස්වාධීන අධීක්ෂණය සඳහා ඉඩදිය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

### සරණාගතයින්

දැනට ඉන්දියාවේ ජීවත්වන ශ්‍රී ලංකා සරණාගතයින් සතු පෞද්ගලික ලේඛන කිසිවක් නොමැත. තවද, ඉන්දියාවේ උපත ලත් බොහෝ සරණාගත දරුවන්ට ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් උප්පැන්න සහතික නිකුත් කර නැත. අවශ්‍ය ලිපි ලේඛන නොමැතිවීම නිසා සරණාගතයින්ට ආරක්ෂිතව ආපසු පැමිණීම අපහසු වී තිබේ.

⋆ සරණාගතයින්ට ආපසු ශ්‍රී ලංකාවට පැමිණීමට අවශ්‍ය වන සියලු ලිපි ලේඛනාදිය ප්‍රමාදයකින් තොරව බලධාරින් විසින් නිකුත් කළ යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## දේපල හානිය

### සහනාධාර

උතුරු - නැගෙනහිර පළාත්වල ගොඩනැගිලි ද්‍රව්‍යවල අධික මිල ගණන් නිසා දැනට විනාශයට ලක් වී ඇති මෙම ප්‍රදේශ ප්‍රතිසංස්කරණය කිරීමේදී දුෂ්කරතා මතු වී ඇත. යුද්ධයෙන් විපතට පත් පුද්ගලයින් සතුව සම්පත් නොමැති වීමද එබඳු තවත් බාධකයෙකි.

⋆ ගොඩනැගිලි ද්‍රව්‍ය සහනදායක මිලකට රජයෙන් සැපයිය යුතු බවත්, එල්ටීටීඊය ඒ සඳහා බදු අය නොකළ යුතු බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. එපමණක් නොව, ප්‍රතිසංස්කරණ කටයුතු වේගවත් කිරීම සඳහා රජය අඩුපොළී බැංකු ණය ලබා දිය යුතුයි.

### යටිතල පහසුකම්

සරණාගතයින් ආපසු පැමිණීම බොහෝ දුරට පාසල්, රෝහල් සහ ගමනාගමනය වැනි මූලික යටිතල පහසුකම් මත රඳා පවති.

⋆ ප්‍රතිසංස්කරණ වැඩ සටහන ක්‍රියාත්මක කිරීමේදී පාසල්, රෝහල් සහ ගමනාගමනය සඳහා ප්‍රමුඛත්වය දිය යුතු යයි නිර්දේශ කරන විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය, රාජ්‍ය සේවා ආයතනවල සේවය සඳහා සුදුසුකම් ලත් වෘත්තිකයින් පොළඹවාලනු වස් දිරිගැන්වීමේ ක්‍රම හඳුන්වා දිය යුතු බව අවධාරණය කරයි.

### තාවකාලික නැවතීමේ ඉඩකඩ පහසුකම්

ආපසු පැමිණෙන සරණාගයින්ට තම පැරණි දේපලට සිදු වී ඇති විනාශය අතිශය විශාල බැවින් එහි පදිංචි විය නොහැකි ය.

මෙලෙස තම දේපල පදිංචිය සඳහා යොදා ගැනීමට නොහැකිව සිටින සරණාගත පිරිස්වලට ලැගුම් ගැනීම සඳහා ප්‍රතිසංස්කරණ වැඩ සටහන් සැලසුම් කිරීමේ දී ප්‍රජා ගොඩනැගිලි තැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

**ජීවනෝපාය**

විවිධ කරුණු ගණනාවක් හේතුවෙන් උතුරු - නැගෙනහිර පළාත්වල ආර්ථික ක්‍රියාකරකම් යළි ඇරඹීම අපහසු වී තිබේ.

**සහනාධාර**

අවතැන්වීමට පෙර කෘෂිකාර්මික හා ධීවර කර්මාන්තයෙහි නිරතව සිටි බොහෝ අවතැන්වූවන්ගේ උපකරණ හා මෙවලම් ඔවුන්ට අහිමි වී ඇත. එබැවින් ස්වකීය ජීවනෝපායන් යළි ඇරඹීම ඔවුන්ට අපහසු වී තිබේ.

⋆ කෘෂි කර්මාන්තයට අත්‍යවශ්‍ය පොහොර, උපකරණ, බීජ, වැවිලි ද්‍රව්‍ය, ජල පොම්ප ඉසීමේ උපකරණ යනාදිය සහ ධීවර ආම්පන්න සඳහා රජය විසින් සහනාධාර ක්‍රමයක් හඳුන්වා දිය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

**බදු අය කිරීම**

උතුරු - නැගෙනහිර පළාත්වල භාණ්ඩ සහ සේවා වෙනුවෙන් එල්ටීටීඊය බදු අය කිරීම නිසා ආර්ථික ක්‍රියාවලිය පණගැන්වීම අපහසු වී තිබේ. එම බදු අය කිරීම් හේතුවෙන් සේවා සහ භාණ්ඩ නිෂ්පාදන වියදම ඉහළ යමින් පවතී. ගොවීන්, ධීවරයින් සහ වෙළඳුන්ට ශ්‍රී ලංකා රජයත්, එල්ටීටීඊයත් වශයෙන් පාර්ශව දෙකකට බදු ගෙවීමට සිදු වී තිබේ.

⋆ එල්ටීටීඊය විසින් සපයනු ලබන සේවාවන්ටද බලපාන අයුරු අර්බුදයට සම්බන්ධ පාර්ශවයන් දෙකම එකම ආකාරයේ මූල්‍ය ක්‍රියා පරිපාටියක් අනුගමනය කිරීමට එකඟ විය යුතු බවත්, ඒ සමඟ ම උතුරු - නැගෙනහිර පළාත්වල ද්විත්ව බදු ක්‍රමය බැහැර කළ යුතු බවත්, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. අතරතුර, තම එල්ටීටීය තම බදු චක්‍රය ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර එම බදු ප්‍රමාණයන් තම ප්‍රදේශවල ඒකාකාරීව ක්‍රියාත්මක කළ යුතුයි. කප්පන් ගැනීම සහ හිරිහැර කිරීම පිළිබඳ සියලු චෝදනා එල්ටීටීඊය විසින් විභාග කර බලා වගකිව යුත්තන්ට එරෙහිව සුදුසු පරිදි ක්‍රියාකළ යුතුයි.

**යටිතල පහසුකම්**

යටිතල පහසුකම් නොමැති වීම නිසා ව්‍යාපාරික කටයුතු අරඹහ කිරීම අපහසු වී තිබේ.

⋆ යළි පදිංචි කිරීම තිරසාර අයුරින් පවත්වාගෙන යාමේ දී යටිතල පහසුකම් වලින් සැලසෙන සේවාව සැලකිල්ලට ගෙන, වාර්ගික අර්බුදයෙන් විපතට පත් ප්‍රදේශයන්හි යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම සඳහාා රජය ප්‍රමුඛත්වය ලබාදිය යුතු අතර ඒ සඳහා ජාත්‍යන්තර ප්‍රජාව නොමයුරුව ආධාර සැපයිය යුතුයයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

**මූල්‍ය පහසුකම්**

දේශීය ව්‍යාපාර ආරම්භ කිරීම සහ පවත්වා ගෙන යාම සඳහා ප්‍රාග්ධනය සහ අනෙකුත් මූල්‍ය සම්පත් නොමැතිවීම බලගතු දුෂ්කරතාවකි.

⋆ විශේෂයෙන් දේශීය කර්මාන්ත සහ ප්‍රජාවට වාසි අත්වෙන ව්‍යාපෘති ඇතුලුව උතුරු-නැගෙනහිර ප්‍රදේශවල ව්‍යාපාරික ක්ෂේත්‍රය තුළ ස්වකීය ප්‍රතියෝජන වැඩි කිරීමට ව්‍යාපාරික ප්‍රජාව ක්‍රියා කළ යුතුයයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. එමගින් ස්වකීය ජීවනෝපාය යළි ගොඩනැගීමට අවශ්‍ය මූල්‍ය ප්‍රාග්ධනය උපයාගැනීම සඳහා සරණාගත පිරිස්වලට උපකාරී විය හැකි ය.

⋆ ආදායම් උපදවන ව්‍යාපෘතිවලට සහයෝගය ලබා දීමක් වශයෙන් රජය අඩුපොලියට ණය මුදල් ලබාදීමත්, රාජ්‍ය නොවන සංවිධාන අවිච්ඡේද ණය අරමුදල් සහ අනෙක් කුඩා සහ මධ්‍යම පරිමානයේ ණය යෝජනා ක්‍රම ආරම්භ කිරීමක් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

### නිපුණතා අහිමි වීම

රැකියා අවස්ථා අහිමිවීම නිසා බොහෝ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් ගෙන් ස්වකීය නිපුණතා ගිලිහී ගොස් ඇති අතර, අලුත් පරපුර හා වැන්දඹුවන්ට ආදායම් ඉපයීමේ දක්ෂත පිළිබඳ පුහුණුවක් ලැබී නොමැත.

## නැවත පදිංචි කිරීමේ ආධාර සැපයීම

### ඒකාබද්ධ ආධාර යෝජනා ක්‍රමය

ආපසු පැමිණෙන අවතැන් වූ පුද්ගලයින්ට රු.65,000ක නැවත පදිංචි කිරීමේ දීමනාවකට හිමිකම් ඇත. මුදල් දුෂ්කරතාවන් නිසා, අතලොස්සක් පමණ වූ පවුල් හැරුණ විට පොදුවේ අනිකුත් සියලු දෙනාටම මෙම දීමනාව ගෙවිය නොහැකි ය. එය රු. 100000 දක්වා වැඩි කිරීමට රජය අදහස් කරයි. කෙසේ වුවද ප්‍රමාණවත් අයුරු මුදල් නොමැති වීම නිසා මෙම යෝජනා ක්‍රමය යටතේ හුදෙක් පවුල් කීපයකට පමණක් සෙත සැලසේ.

කලින් ආයු මිලදී ගැනීම්, තාවකාලික නැවතුම් පහසුකම් සහ ස්ථිර නිවාස පහසුකම් සැලසීම් වැනි නිශ්චිත කරුණු සඳහා ඒකාබද්ධ ආධාර යෝජනා ක්‍රමය යටතේ කොටස් වශයෙන් මුදල් ලබා දී තිබේ. මුදල් බෙදා දීමේ අනම්‍යශීලී ක්‍රියා පරිපාටිය නිසා, ඒ වායින් උපරිම ප්‍රයෝජනයක් ගැනීම අපහසු වී තිබේ. මුළු පවුලම ආපසු පැමිණෙන අවස්ථාවලදී පමණක් නැවත පදිංචි කිරීමේ දීමනාව ගෙවනු ලැබේ. කෙසේ වුවද, ප්‍රායෝගික වශයෙන් සිදුවන්නේ වෙනත් දෙයකි. පවුලේ පිරිමි උදවිය ප්‍රථමයෙන් පැමිණ ඉඩකඩම් එළිපෙහෙළි කර පදිංචියට ගොඩනැගිලි තනා ආදායම් ඉපැයීමේ මාර්ග යළි අරම්භ කරති. එබඳු පුද්ගලයින්ට සිය පවුලේ සාමාජිකයින් ආපසු ගෙන්වා ගැනීම සඳහා නැවත පදිංචි කිරීමේ දීමනාව ලබාගත නොහැකි ය.

මේ සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.

⋆ රජය ඒකාබද්ධ ආධාර යෝජනා ක්‍රමය රු.200,000 දක්වා වැඩි කළ යුතුයි. අර්ථලාභීන්ගේ අභිමතය පරිදි උපයෝගී කරගැනීම සඳහා එම මුදල් එක්වර ඔවුන් අතර බෙදා දිය යුතුයි.

⋆ මෙම මුදල් බෙදාදීමේදී කාන්තා මූලික පවුල්, වයෝවෘධ පුද්ගලයින් සහ සාමාජිකයින්

වැඩි සංඛ්‍යාවක් සහිත පවුල්වලට ප්‍රමුඛත්වය ලබාදිය යුතුයි.

එසේම ඔවුන් අතිරේක දීමනාවක්ද ලැබිය යුතු වේ.

⋆ තමනට රුචි පරිදි ආපසු ගම්බිම් බලා පැමිණීම සැලසුම් කරන අවතැන් වූ සියලු පිරිස්වලට බේදයකින් තොරව ඒකාබද්ධ ආධාර යෝජනාක්‍රමය භුක්ති විඳීමට ඉඩ සැලසිය යුතු ය.

⋆ නැවත පදිංචි කිරීමේ වර්තමාන පැකේජය දැනට එක පවුලකට සාමාන්‍ය වශයෙන් රු. 13,000ක් පමණක් වෙන්කර දීමට සමත් වී ඇති හෙයින්, එයට ප්‍රමාණවත් පරිදි ආධාර සපයන ප්‍රජාව විසින් අරමුදල් ලබා දිය යුතුයි.

## ආහාර ආධාර ක්‍රමය

ආහාර ආධාර ලබා දීමේ වර්තමාන ප්‍රතිපත්තිය යටතේ ආපසු පැමිණෙන අවතැන්වූ ජනතාවට නැවත පදිංචි වීමෙන් පසු, පවුලේ අවශ්‍යතා කුමක් වුවද මාස හයක කාලයක් පුරා වියලි ආහාර සලාකය පමණක් ලැබීමට හිමිකම් ඇත.

⋆ ආපසු පැමිණෙන අවතැන් වූ පවුල් කොතෙක් දුරට ආහාර අතින් ස්වයං පෝෂිත තත්ත්වයක සිටින්නේ දැයි යන කරුණ සැලකිල්ලට ගනිමින්, එම පවුල්වල අවශ්‍යතා පිළිබඳ ජාත්‍යන්තර ආයතන සමඟ එක් වී ශ්‍රී ලංකා රජය සමීක්ෂණයක් කිරීමෙන් පසුව පමණක් ආහාර ආධාර ක්‍රමය අත්හිටුවිය යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය අවධාරණය කරයි.

## සාධාරණත්වය සහ වාර්ගික උණුසුම

මුදල් හෝ නිවාස යෝජනා ක්‍රම සපැයීම වැනි නැවත පදිංචි කිරීමේ ආදාර ක්‍රම මගින් සියලුම වාර්ගික ජන කොටස්වලට පොදුවේ වාසි සලසා දිය යුතු බව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

# පදිංචිය

## ද්වීතීය පදිංචිය

අවතැන්වූ පිරිස්වලට අයත් ඉඩම්, නිවාස සහ ව්‍යාපරික ස්ථාන වෙනත් අවතැන්වූ පුද්ගලයින්ද ඇතුළු අන්‍ය පිරිස් මෙන්ම සන්නද්ධ හමුදා, පොලීසිය සහ එල්ටීටීඊය විසින් භුක්ති විඳිමින් සිටිති. එහි ප්‍රතිඵලයක් වශයෙන් ආපසු පැමිණෙන අවතැන් වූ ජනයාට තමන් සතු දේපළ යළි ප්‍රයෝජනය සඳහා යොදා ගැනීම අපහසු වී තිබේ.

⋆ නැවත ගොඩනැගීමේ වැඩ සටහන්වල දී ආපසු පැමිණෙන අවතැන් වූ පිරිස්වලට ඉඩකඩ සැලසීම ඉලක්ක කරගත් ප්‍රජා ගොඩනැගිලිවලට ප්‍රමුඛත්වය දිය යුතු බවත්, අනවසරයෙන් පදිංචි වී සිටින පවුල් ඉවත් කිරීමටත් කටයුතු කළ යුතු බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

අධි ආරක්ෂක කලාප සහ යුද හමුදා සහ පොලිස් මුරපලවල් සැලකිය යුතු දේපල ප්‍රමාණයක් සන්නද්ධ හමුදා සහ පොලීසිය භුක්ති විඳිමින් සිටිති. සමහර දේපල අධිආරක්ෂක කලාප තුළ පිහිටා ඇත. මේ හැර මුරපලවල් හා මාර්ග බාධක වශයෙන් සන්නද්ධ හමුදා සහ පොලිසිය මෙම දේපල පාවිච්චියට ගෙන තිබේ. එනිසා අවතැන් වූවන්ගේ ආපසු පැමිණීමේ හැකියාව අල්ප වී තිබේ.

අධි ආරක්ෂක කලාප පිළිබඳ ප්‍රශ්නය දේශපාලන වශයෙන් සංවේදී එකක් බවත් සාම සාකච්ඡාවලදී දිගින් දිගටම අවධානයට ලක්වූ බවත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය දනී. කෙසේ වුවද සාම සාකච්ඡාවලදී විසඳුමකට එලඹෙනතෙක් අදාළ සියලු බලධාරීන් විපතට පත් අවතැන් වූ ජනතාවගේ සුබ සාධනය තහවුරු කළ යුතුයි.

★ දැනට මාර්ග බාධක හා මුරපල වශයෙන් ප්‍රයෝජනයට ගෙන තිබෙන දේපල හැකි සෑම අවස්ථාවලදී අයිතිකරුවන් වෙත මුදා හරින ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සන්නද්ධ හමුදා සහ පොලිසිය වෙත බල කර සිටියි.

★ හමුදා කාලප තුළ පිහිටා ඇති ස්වකීය දේපලට ප්‍රවේශ වීම සඳහා එහි අයිතිකරුවන්ට උපරිම පහසුකම් ලබා දිය යුතු යයි සන්නද්ධ හමුදා වෙත විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කර සිටියි. බොහෝ අවතැන් වූ පිරිස් වලට තම පෞද්ගලික දේපලට සම්බන්ධ වටිනා ලියකියවිලි අහිමි වී ඇති නිසා, ඔවුන් තම දේපළ වෙත ප්‍රවේශවීමේදී එම ලියකියවිලි කොන්දේසියක් කොට නොගන්නා ලෙස විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සන්නද්ධ හමුදාවලින් ඉල්ලා සිටියි.

★ ස්වකීය පැරණි දේපොල දැන් හමුදාව පදිංචියට ගෙන ඇති බැවින්, ආපසු පැමිණෙන පිරිස් සඳහා විකල්ප ඉඩකඩ සැලසිය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. විසඳුමක් නොමැති වුවහොත්, අවතැන් වූ වැසියන් විකල්ප වශයෙන් වෙනස් ස්ථානයක නැවත පදිංචි කරවීමේ හැකියාව රජය විසින් සලකා බැලිය යුතුයි.

★ විපතට පත් සියලු අවතැන් වූ ජනයාට ප්‍රමාණවත් පරිදි කුලී ගෙවීමට රජය ක්‍රියා කළ යුතු යයි ද තම දේපළ හෝ ඉඩම වෙත ආපසු යෑමට නොහැකි බැවින් ඒ සඳහා ඔවුන්ට වන්දි මුදල් ලබාදිය යුතු යයි ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය රජයට බලකර සිටියි.

## එල්ටීටීඊය විසින් පෞද්ගලික ඉඩම් පවරා ගැනීම

විශේෂයෙන් සංක්‍රමණිකයින්, සරණාගතයින් හා මුස්ලිම් සහ සිංහල අවතැන් වූවන්ට අයත් සමහර ඉඩම් එල්ටීටීඊය විසින් පවරාගෙන තම සාමාජිකයන්ට ලබා දී ඇත.

එසේත් නැතහොත් කුලියට දී ඇත. සමහරවිට එල්ටීටීඊය විසින් ම ස්වකීය පරිපාලන හෝ ව්‍යාපාරික ආයතන පවත්වාගෙන යාම සඳහා ප්‍රයෝජනයට ගෙන ඇතිවා නොඅනුමාන ය.

★ වර්තමාන පදිංචිකරුවන්ගේ සුබසාධනය ගැන සැලකිලිමත් විය යුතු අතර, එල්ටීටීඊය විසින් පවරාගෙන ඇති ඉඩකඩම් ඇතුලු වෙනත් දේපල ඒවායේ නීත්‍යානුකූල අයිතිකරුවන් වෙත ආපසු ලබාදිය යුතුයයි ද විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. බොහෝ අවතැන් වූ පිරිස්වලට තම පෞද්ගලික මෙන්ම දේපළ හා සම්බන්ධ ලියකියවිලි අහිමි වී ඇති බැවින්

ඔවුන්ගේ දේපළ ආපසු ඔවුන් වෙත භාරදීමේ දී එම ලියකියවිලි මගින් අයිතිය තහවුරු කරන ලෙස ඉල්ලා නොසිටිය යුතු ය.

⋆ අයිතිකරුවන් වෙත ආපසු භාරදිය නොහැකි දේපළ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පරිදි එල්ටීටීඊය ඔවුන් වෙත වන්දි මුදල් ගෙවිය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## ව්‍යවස්ථා සම්පාදනය

### හවුල් අයිතිය

දැනට ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ රජයේ ඉඩම් ලබා දීමේ දී පවුලේ ප්‍රධානියා ඉඩම් ලාභියා ලෙස සැලකේ. හවුල් අයිතිය පිළිගන්නේ නැත. එබැවින් කාන්තාවකට එම ඉඩම් පිළිබඳ කිසිදු පාලනයක් නොමැත. තවද ඇයට ඉඩම් සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතියක් ද හිමිවන්නේ නැත. එබැවින් දේපළ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයකට ප්‍රවේශ වීමට ඇයට අයිතියක් නොමැත.

⋆ හවුල් අයිතිය පිළිගැනීමටවත් එම හවුල් අයිතිය මගින් අයිතිය තහවුරු කර ගැනීමට හැකිවන පරිදි ඉඩම් සංවර්ධන පනත සංශෝධනය කළ යුතු බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## රජයේ ඉඩම්වල උරුමය

ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදා දෙනු ලබන ඉඩම් තවදුරටත් බෙදා වෙන් කිරීමට නොහැකි බැවින් එකම පුද්ගලයකුට පමණක් අයිතිය හිමි වේ. අයිතිකරු ස්වකීය උරුමක්කාරයන් නම්කර නොමැති අවස්ථාවල දී, අයිතිය පවුලේ වැඩිමහල් පිරිමි දරුවාට හිමි වේ. මෙහි දී ගැහුණු දරුවන්ට ඉඩමේ අයිතිය උරුම වන්නේ නැත.

⋆ කාන්තා අයිතියට හරස් වී සිටින ඉඩම් සංවර්ධන ආඥා පනත අහෝසි කළ යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

### භුක්තියට සව්වීම

වසර දහයක් හෝ ඊට වැඩි කාලයක් යම් පුද්ගලයකු දේපළක් අඛණ්ඩව භුක්ති විඳ ඇත්නම් ඔහුට එම දේපළ පවරා ගැනීමට කාලසීමා, ආඥා පනත යටතේ ඉඩ ලැබේ. මෙම නෛතික විධිවිධාන යටතේ අවතැන් වූවන්ට තම දේපළ සඳහා වූ අයිතිය අහිමි නොවන බව සැබෑ වුව ද, එහි සන්තකය තමන් වෙත පවරා ගැනීම සඳහා දීර්ඝ කාලයක් පුරා විශාල මුදලක් වැය කර නඩු කීමට සිදුවන බව නොකිවමනා ය.

⋆ කාලසීමා ආඥා පනතේ 3 වැනි වගන්තිය 1980 සිට (වාර්ගික අර්බුදය හටගත් කාලය ආවරණය වන අයුරින්) ක්‍රියාත්මක වීම අත්හිටුවිය යුතු බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## අතුරුදහන්වූ පුද්ගලයින්

වාර්ගික අර්බුදය හේතුවෙන් බොහෝ පුද්ගලයින් අතුරුදහන් වී සිටින බවට වාර්තා වේ. එම අතුරුදහන් වූ පුද්ගලයින් වෙනුවෙන් මරණ සහතික ලබාගැනීමට නොහැකිවීම නිසා ඔවුන් සතු දේපළ සම්බන්ධයෙන් කටයුතු කරමින් සිටින පවුල්වලට වන්දි ලබාගැනීම ගැටලුවක් වී තිබේ.

⋆ අතුරුදහන් වූ පුද්ගලයින් වෙනුවෙන් මරණ සහතික ලබාගැනීම සඳහා අවතැන්වූවන්ට හැකිවනු පිණිස දැනට අභාවයට ගොස් තිබෙන 1995 අංක 2 දරන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පනතට සමාන පනතක් ඉදිරිපත් කිරීම මැනැවැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## ආරවුල් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණ

ආපසු පැමිණෙන බොහෝ පුද්ගලයෝ තම දේපළ පිළිබඳ ආරවුල් පෞද්ගලිකව හෝ සිවිල් සමාජයේ උපකාරය ඇතිව අවිධිමත් අයුරින් විසඳා ගැනීමට කල්පනා කරති. එවන් ක්‍රියාමාර්ගයකින් ගැටලු විසඳීමට අපොහොසත් වීමේ දී, විකල්ප වශයෙන් ඉතිරිව ඇත්තේ නීතිය මගින් සහනයක් ලබාගැනීම ය. එය ගැටලු සහගත ය. සාමකාමී සමාජයක යුක්තිය පසිඳලීමේ අරමුණු සාක්ෂාත් කරගැනීමට ඉවහල් වන අයිතිවාසිකම් හා වගකීම් මතය, නීතියේ මූලධර්ම පදනම් වී ඇත්තේ. කෙසේ වුව ද, මෙම නීතියේ මූලධර්ම රට අර්බුදයකට මුහුණ පා සිටින අවධියක ක්‍රියාත්මක වීමේ දී අර්බුදයෙන් විපතට පත් ජන කොටස්වලට සැලකිය යුතු අසාධාරණයක් සිදු වේ. ද්විතීය පදිංචිකරුවන් අසාධාරණ අයුරින් ඉවත් කෙරෙන අතර, භුක්තියට සවිවීමේ ප්‍රතිපත්තිය නිසා අවතැන්වූවන්ට අසාධාරණයක් සිදු වේ.

මේ හැරුණු විට නඩු කීමේ දි සිදුවන අධික වියදම්, අධිකරණය කරා ප්‍රවේශ වීමේ දුෂ්කරතා සහ අර්බුදයෙන් හානියට පත් දිස්ත්‍රික්කයන්හි යටිතල පහසුකම් හා මානව සම්පත් නොමැතිවීම ආදිය නිසා පැමිණිලිකාර පාර්ශ්වයන්ට අධිකරණයේ පිහිට ලබාගැනීමට හෝ පහසුවෙන් සහනයක් ලබාගැනීමට නොහැකි වනවා ඇත.

⋆ බලධාරීන් දැනට පවත්නා ආරවුල් විසඳීමේ යාන්ත්‍රණ උපයෝගී කරගත යුතු අතර විකල්ප යාන්ත්‍රණ ද හඳුන්වා දිය යුතු ය. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය ත්‍රිවිධාකාර ප්‍රවේශයක් යෝජනා කරයි. එනම්,

1. ගම් මට්ටමින් අවිධිමත් යාන්ත්‍රණ ශක්තිමත් කිරීම

2. විපතට පත් ප්‍රදේශ කරා සමථ මණ්ඩල ව්‍යාප්ත කිරීම

3. අර්ධ අධිකරණ ආයතන පිහිටුවීම

### 1. අවිධිමත් මැදිහත්වීම

සිවිල් සමාජයේ වගකිවයුතු පුද්ගලයින්, පොලීසිය සහ රජයේ නිලධාරීන්ගේ ආධාරය ඇතිව දේපළ සම්බන්ධ ආරවුල් ගම් මට්ටමේ අවිධිමත් ක්‍රමෝපායයන් හරහා විසඳනු ලබන

අවස්ථා බොහෝ ය. අවිධිමත් යාන්ත්‍රණ මගින් ඉඩම් හා දේපළ පිළිබඳ ආරවුල් නිරාකරණය කිරීම පමණක් නොව ජනවාර්ගික සබඳතා වැඩි දියුණු කිරීම පවා සිදුකළ හැකි ය.

⋆ ආරවුල් නිරාකරණය කිරීමේ අවිධිමත් යාන්ත්‍රණය නගා සිටුවීම පිණිස මූල්‍යාධාර සහ පුහුණුව ලබාදීම මගින් දැනට පවත්නා උපායමාර්ග ශක්තිමත් කිරීම සහ තවදුරටත් නව මාර්ග බිහි කිරීම උදෙසා ආධාර සපයන ප්‍රජාව, රජය සහ එල්ටීටීඊය කටයුතු කළ යුතු යැයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## 2. සමථ මණ්ඩල

චංචල හා නිශ්චල දේපළ, කොන්ත්‍රාත්තු සහ අනෙකුත් ආරවුල් සම්බන්ධයෙන් ඉදිරිපත්වන පැමිණිලි නිරාකරණය කිරීම සඳහා නීතිමය විධිවිධාන මගින් සමථ මණ්ඩල පිහිටුවා තිබේ.

⋆ ආරවුල් නිරාකරණය කිරීම සඳහා මෙම සමථ මණ්ඩල උතුරු සහ නැගෙනහිර පළාත්වලට ද ව්‍යාප්ත කළ යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. තවද, අනෙකුත් ආරවුල් නිරාකරණය කිරීමේ ආයතන වශයෙන් සැලකෙන දිසාපති, ඉඩම් ලේකම් කාර්යාල, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරු සහ උපත් සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් ගේ සහාය ලබාගැනීමට හැකිවන අයුරින් සමථ මණ්ඩල සතු බලතල ව්‍යාප්ත කළ යුතුයයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## 3. තාවකාලික ඉඩම් හා දේපළ පිළිබඳ කවුන්සිලය

විවිධ වාර්ගික කණ්ඩායම් අතර සිදුවන ආරවුල් හෝ සමථ මණ්ඩල තීරණවලින් පාර්ශ්වයන් අහෝසියට පත්වීම වැනි අවස්ථා සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ දී ඉහතින් සඳහන් කළ මුල් ක්‍රමෝපායන් ප්‍රමාණවත් නොවනු ඇත. ඉහතින් සඳහන් කළ පරිදි අධිකරණ ක්‍රියාමාර්ගයන් කරා පිවිසීම ද ගැටලු සහිත බැවින් අර්ධ අධිකරණ ආයතනයක් පිහිටුවීම මගින් පෙර කී ගැටලු නිරාකරණය කිරීම පහසු වනු ඇත.

ගැටලු නිරාකරණය කිරීමේ යාන්ත්‍රණයක් වශයෙන් සිය කාර්යභාරය මැනවින් ඉටු කරනු සඳහාත්, පවත්නා නීති රීති ඔස්සේ නොගොස් වඩාත් පහසුවෙන් ක්‍රියාකිරීම සඳහාත් යෝජිත අර්ධ අධිකරණ ආයතන පාර්ලිමේන්තු පනතක් මගින් ස්ථාපනය කිරීම වැදගත් ය. මෙවැන්නක් සඳහා එල්ටීටීඊයේ ද එකඟත්වය ලැබෙනු නොඅනුමාන ය. එවිට එය එල්ටීටීඊයේ පාලන පෙදෙස්වල ද ක්‍රියාත්මක කළ හැකි ය. එබැවින් සාම ක්‍රියාවලියේ ප්‍රධාන පාර්ශ්වයන් දෙක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊ යන දෙපළගේ එකඟත්වය පිට එවැනි ආයතනයක් පිහිටුවීම සඳහා කටයුතු කළ හැකි ය.

එබැවින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ අධිකාරි බලය සහිත තාවකාලික ඉඩම් සහ දේපළ පිළිබඳ අර්ධ අධිකරණ බලැති කවුන්සිලයක් පිහිටුවීම නිර්දේශ කරනු ලැබේ.

1. වාර්ගික අර්බුදය හේතුවෙන් මතු වූ ඉඩම් හා දේපළ ආරවුල් පොලිසිය මගින් නිරාකරණය කිරීම. ඉවත් කරන ලද පදිංචිකරුවන්ට තාවකාලික ඉඩකඩ සලසාදීම වැනි ප්‍රායෝගික විසඳුම් ලබාදෙන බවට සහතික වීම.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු කර ඇති නිදහසේ සැරි සැරීමේ අයිතිය සහ අනෙකුත් මානව හිමිකම් පිළිබඳ මූලධර්මවලට අනුකූලව ඉඩම් නොමැති පුද්ගලයින් වෙත රජයේ ඉඩම් වෙන් කර දීම සඳහා නිර්දේශ සැපයීම.

3. ප්‍රාදේශීය පරිපාලනයේ වගකීමක් වන උපත්, විවාහ හා මරණ සහතික සහ දේපළ පිළිබඳ නැති වූ ලියකියවිලි වෙනුවට අලුතින් පිටපත් නිකුත් කිරීමේ ක්‍රියාමාර්ග දැනුම් දීම.

4. අවතැන් වීම නිසා නියමිත කාලය සම්පූර්ණ කිරීමට නොහැකි වූ කොන්ත්‍රාත්තු / බදුදීම් විමර්ෂණයට ලක් කිරීම සහ ඉන් හානියට පත් පුද්ගලයින් සඳහා සාධාරණය ඉටු කිරීම (වන්දි ගෙවීම, විකල්ප ඉඩම් සහ ගොඩනැගිලි යනාදිය)

5. නීති විරෝධී අයුරින් ඉඩම් අත්සතු කිරීම සහ ඉන් හානියට පත් පුද්ගලයින් සඳහා සාධාරණය ඉටු කිරීම (වන්දි ගෙවීම්, විකල්ප ඉඩම් යනාදිය)

ආරවුල්වලට මැදි වූ පිරිස්වලට මෙම කවුන්සිලයේ පිහිට පැතිය හැකි ය. එහෙත් කවුන්සිලයේ තීරණ එය සතු අධිකාරී බලය ඉක්මවා යන අවස්ථාවල දී පමණක් පළාත්බද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කළ හැකි ය.

කවුන්සිලය ස්වකීය අපක්ෂපාතීභාවය තහවුරු කරනු වස් ඉඩම් සහ දේපළ පිළිබඳ කරුණු සම්බන්ධයෙන් විශේෂඥ දැනුමක් ඇති ප්‍රධාන ජන කොටස් දෙක නියෝජනය වන අයුරින් සාමාජිකයන් තිදෙනෙකුගෙන් සහ ජාත්‍යන්තර ප්‍රජාව නියෝජනය කරමින් සාමාජිකයින් කීප දෙනකුගෙන් සමන්විත විය යුතුයි.

මෙම කවුන්සිලය පිහිටුවීම සඳහා හදිසි මානුෂීය සහ පුනරුත්ථාපන අවශ්‍යතා පිළිබඳ උප කමිටුව පුරෝගාමීව කටයුතු කළ යුතුයයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

## ලේඛන

වාර්ගික ගැටුම නිසා අවතැන් වූවන් සතු පෞද්ගලික හා දේපළ පිළිබඳ ලේඛන ඔවුනට අහිමි වී ඇත. ලේකම්වරුන්, රෙජිස්ට්‍රාර්වරුන් සහ නොතාරිස්වරුන් විසින් තබාගන්නා ලද පිටපත් පවා විනාශ වී හෝ නැතිවී ඇති හෙයින් ඇතැම් අවස්ථාවල මුල් ලේඛනවල පිටපත් ලබාගැනීම නොහැකි වී තිබේ. තවද, අනන්‍යතාව සහ උරුම වූ දේපළ පිළිබඳ ලේඛන පවා නැති වී ඇති අවස්ථා එමට ය. ශ්‍රී ලංකාවේ මධ්‍යම ලේඛන කාර්යාලයක් නොමැත.

රජයේ ඉඩකඩම් සම්බන්ධයෙන් රජයෙන් නිකුත් කරන ලද බලපත්‍ර හා අනෙකුත් ලියකියවිලි අස්ථානගත වී හෝ අහිමි වී ඇති අවස්ථාවල දී අයිතිය තහවුරු කිරීමේ එක්තරා ක්‍රියා පරිපාටියක් උතුරු-නැගෙනහිර පළාත්බද ඉඩම් කොමසාරිස්වරයා සහ ප්‍රාදේශීය මට්ටමින් ඉඩම් නිලධාරීන් විසින් දැනට අනුගමනය කරනු ලැබේ. දේපළ අයිතිය සහතික කරනු ලබන පෞද්ගලික ඔප්පු නැති වූ පුද්ගලයින් සඳහා එබඳු සහනදායක වැඩ පිළිවෙළක් මෙතෙක් ක්‍රියාත්මක වී නැත.

⋆ ඔප්පුවල පිටපත් නොමැති පුද්ගලික ඉඩකඩම්වල අයිතිකරුවන්ට දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලයට අයිතිය තහවුරු කෙරෙන පරිදි දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කිරීමට ඉඩ සලසා දිය යුතුයි. අසල්වැසියන්, ග්‍රාමසේවක යනාදී වැදගත් පුද්ගලයින් ඒ සඳහා සාක්ෂි දැරිය යුතුයි.

⋆ බලපත්‍ර ලත් පුද්ගලයින්ට ස්වකීය ලේඛන අහිමි වී ඒවායේ පිටපත් පවා ලබාගැනීමට නොහැකි අවස්ථාවල දී තම අයිතිය තහවුරු කරමින් දිස්ත්‍රික් ඉඩම් ලේකම් කාර්යාලය වෙත දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දිය යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි. අසල්වැසියන් හෝ ග්‍රාම සේවක වැනි වැදගත් පුද්ගලයින් ඒ සඳහා සාක්ෂි දැරීම අවශ්‍ය ය.

⋆ හිමිකම් ඉදිරිපත් කර ඇති අනෙකුත් පුද්ගලයින්ට ඉදිරිපත් වීම සඳහා මෙම දිවුරුම් පෙත්සම් කොයිකාටත් දැකගත හැකි වන ආකාරයට ප්‍රසිද්ධියට පත් කළ යුතු ය. එම සියලු දිවුරුම් පෙත්සම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල දී පමණක් නොව, සරණාගතයින් සහ සංක්‍රමණිකයින් විශාල සංඛ්‍යාවක් සිටින බැවින් මහ කොමසාරිස් කාර්යාලවල සහ රජයේ වෙබ් අඩවියේ ද ප්‍රදර්ශනය කළ යුතු ය. හිමිකම් ඉදිරිපත් කරනු ලබන අනෙකුත් පුද්ගලයින්ගෙන් ලැබෙන දිවුරුම් පෙත්සම් ඉඩම් ලියාපදිංචි කාර්යාල සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත එවිය යුතු අතර එම කාර්යාල විසින් එම ලේඛන තාවකාලික ඉඩම් හා දේපළ පිළිබඳ කවුන්සිලය වෙත යොමු කරනු ඇත. එම කවුන්සිලය විසින් අවසාන දේශපාලන විසඳුමක් ලත් දින සිට දෙවසරක් දක්වා අනෙකුත් හිමිකරුවන්ගේ ඉල්ලීම් භාරගත යුතු ය.

## කාන්තාවන්

වාර්ගික අර්බුදය නිසා ස්ත්‍රී මූලික පවුල් සංඛ්‍යාව ඉහළ ගොස් ඇත. මුළු පවුලේ ම බර ඉසිලීම කාන්තාවන් වෙත පැවරී තිබේ. ආධාර ප්‍රමාණවත් නොවීම සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නවලට ඔවුනට මුහුණ පෑමට සිදු වී තිබේ. ඉඩම් හෙළි කිරීම, නිවාස යළි ගොඩනැගීම, සීමිත රැකියා සංඛ්‍යාවක් සඳහා තරග වැදීම සහ මූලික සෞඛ්‍ය පහසුකම් සැපයීම වැනි ප්‍රායෝගික ගැටලුවලට මුහුණ පෑමට මෙම කාන්තාවන්ට සිදු වී ඇත. දරුවන් සහිත මවුවරුන්ට බිළිඳුන් සඳහා රැකවරණය නොමැත්තේ නම් රැකියාවල නිරත වීම අසීරු ය.

මේ සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය පහත සඳහන් නිර්දේශ ඉදිරිපත් කරයි.

⋆ නිපුනතා පුහුණුව වැනි කාන්තා අවශ්‍යතා සපුරාලීම සඳහා අදාළ සියලු පාර්ශව විසින් ආධාර වැඩසටහන් සැලසුම් කළ යුතු වේ.

⋆ නැවත පදිංචි කිරීම සඳහා සැපයෙනව මූල්‍යාධාර වැඩි කර එය වඩාත් නම්‍යශීලී බවට පත්කළ යුතුයි. එවිට අවශ්‍ය තන්හි කාන්තාවන්ට කුලියට කම්කරුවන් යොදවා ඉඩම් හෙළිකර නිවෙස් තැනිය හැකි ය.

⋆ ණය පහසුකම් සැපයීමේ ක්‍රමවලින් කාන්තාවන්ට ප්‍රයෝජන ගැනීමට හැකිවනු පිණිස ඒවා ලිහිල් කළ යුතු ය. කාන්තා අවශ්‍යතා සපුරාලීම පහසු කරනු වස් අඩු පොලියට ණය ලබාදිය යුතු වේ.

⋆ ළමාරක්ෂක පහසුකම්, සෞඛ්‍ය සහ ප්‍රජනන සෞඛ්‍යාරක්ෂක පහසුකම් සැපයීමේ දී රජය ප්‍රමුඛත්වය ලබාදීම වැදගත් ය.

⋆ කාන්තාවන් වෙත සලසා ඇති ආධාර පිළිබඳව ඔවුන් දැනුවත් කළ යුතුයි.

## ළමුන්

වාර්ගික අර්බුදය නිසා බොහෝ දරුවන් අනාථ වී හෝ දෙමව්පිය රැකවරණයෙන් ගිලිහී ගොස් ඇත. ඔවුන් සඳහා ආරක්‍ෂක වැඩ පිළිවෙළක අවශ්‍යතාවය ඉමහත් ය. ඒ වාගේ ම එම දරුවන් සඳහා ඔවුන්ගේ දෙමව්පියන් සතු දේපළ ද ඇත.

⋆ අනාථ වී ඇති දරුවන් සතු දේපළ උරුමය ආරක්‍ෂා කිරීම වස් ඔවුන්ගේ දෙමව්පියන් හා ඥාතීන් සොයා ගැනීම පිණිස උත්සාහ ගත යුතු යයි විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

⋆ එම දරුවන්ගේ සුබ සිද්ධිය තහවුරු කරනු වස් ඔවුන් වෙත මුදල් ආධාර සැපයිය යුතු අතර දැනට ඔවුන්ට රැකවරණය සලසා ඇති පුද්ගලයින් හඳුනාගත යුතු වේ. වරින් වර එම දරුවන්ගේ සුබ සාධනය විමර්ෂණය කිරීම අත්‍යවශ්‍ය බවට විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය නිර්දේශ කරයි.

වවුනියාව, යාපන අර්ධද්වීපය සහ මන්නාරමේ තවමත් සැහෙන සංඛ්‍යාවක් අවතැන් වී සිටිති. 1990 වසරේ දී දළ වශයෙන් මුස්ලිම් ජාතිකයින් 90,000ක් පමණ උතුරු ප්‍රදේශයේ සිට එල්ටීටීඊය විසින් පළවා හරින ලදි. දැනට ඔවුහු පුත්තලම, අනුරාධපුරය සහ කුරුණෑගල යන පළාත්වල ඉතා දුකසේ ජීවත් වෙති. (පහත සටහන බලන්න.) බහුවාර්ගික ජනගහනයක් ජීවත් වන නැගෙනහිර පළාතේ දෙමළ, මුස්ලිම් සහ සිංහල වැසියන් සියලු දෙනාම පාහේ අවතැන් වී සිටිති. මෙයට හේතු වී ඇත්තේ එල්ටීටීඊය විසින් ඔවුන් ජීවත් වන ගම් ප්‍රදේශවලට පහර දී විනාශ කිරීමයි. බොහෝ පිරිස් ඔවුන් මුලින් පදිංචි වී සිටි දිස්ත්‍රික්කවලම පදිංචිය අරඹා ඇත.

## *උතුරේ අවතැන් වූ මුස්ලිම්වරුන්*

1990 ඔක්තෝබර් තෙවන සතියේදී සියලුම මුස්ලිම්වරුන්ට උතුරු ප්‍රදේශයෙන් පැය 48ක් ඇතුළත පිටවිය යුතු බවටත්, එසේ නොවුවහොත් මරණයට මුහුණ දීමට සූදානමින් සිටිය යුතු බවටත් එල්ටීටීඊය නියෝග කළේ ය. 1990 ඔක්තෝබර් 30 වැනි දින යාපනයේ මුවර් වීදියේ පදිංචිව සිටි මුස්ලිම් වැසියන්ට යාපනයෙන් පිටවීම සඳහා දී තිබූ කාලය පැය 2කි. 90,000ක් පමණ මුස්ලිම් ජනතාව තමන් සතු සියලු වටිනා දේ අතහැර පලා ගියහ. හුදෙක් රු. 300/-ක් සහ අතිරේක ඇඳුම් කට්ටලයක් පමණක් ඔවුනට ගෙනයාමට ඉඩ ලැබුණි. වාහන යොදා ගැනීම සපුරා තහනම් විය. ආවරණයක්, ජලය හෝ ආහාර යන මේ කිසිවක් මුස්ලිම්වරුන්ට සැපයීම දෙමළ ජනතාවට තහනම් බවට එල්ටීටීඊයෙන් නියෝග පැනවිනි. අඩු තරමින් මුස්ලිම්වරුන්ගෙන් තැගි බෝග ලැබීම පවා ඔවුන්ට අකැප විය.

මුස්ලිම්වරු බෝට්ටු මගින් කල්පිටියටත්, ගොඩබිමින් වව්නියාවටත් පැමිණියහ. ඔවුන්ට කිසිවකුගේ හෝ උපකාරයක් නොලැබුණි. අවසානයේ දී මුස්ලිම්වරු අනුරාධපුරය, පුත්තලම සහ කුරුණෑගල වැනි වූ ප්‍රදේශවල පදිංචියට පැමිණියහ. බලයෙන් පලවා හරින තෙක් මුස්ලිම්වරු උතුරේ පදිංචිව සිටි දෙවන විශාල ප්‍රජාවයි. දළ වශයෙන් මුළු ජනගහනයෙන් 5%කි. ඔවුහු සියලුම දිස්ත්‍රික්කවල පදිංචිව සිටි අතර, උතුරු ප්‍රදේශයේ මන්නාරම් දිස්ත්‍රික්කය, යාපන නගරය සහ මුලතිව් නගරයේ ඒකරාශී වී සිටියහ. 62%ක්

වූ මුස්ලිම් බහුතරය මන්නාරම් දිස්ත්‍රික්කයේ පදිංචිව සිටියහ. එහි මන්නාරම් දූපත, මුසාලි සහ මන්තායි ප්‍රදේශවල ඔවුහු ඒකරාශී වී සිටියහ.

## අවතැන්වීමේ හා ආපසු පැමිණීමේ රටාව

### අවතැන්වීම

දැනට ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ගේ සංඛ්‍යාව 800,000 ඉක්මවයි. නොබෝදා එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසමේ සහ ජන ලේඛන හා සමීක්ෂණ දෙපාර්තමේන්තුවේ ආධාරයෙන් පුනරුථාපන, නැවත පදිංචිකිරීම සහ සරණාගතයින් පිළිබඳ අමාත්‍යාංශය විසින් පවත්වන ලද සමීක්ෂණයක දී දිවයින පුරා අවතැන් වී සිටින පුද්ගලයින්ගේ සංඛ්‍යාව දසලක්ෂය ඉක්මවා යන බව හෙළි වී තිබේ. පසුගිය විසි වසරක කාලය තුළ උතුරු නැගෙනහිර පළාත්වල කරන ලද හමුදා මෙහෙයුම් හෝ ගැටුම්වලට භාජනය වී ඇති පෙදෙස්වල හටගත් වාර්ගික සංහාරය බොහෝ දුරට මෙසේ ජනතාව අවතැන්වීමට හේතු වී ඇත. අර්බුදයට සම්බන්ධ සියලුම පාර්ශ්වයන් අතින් සිදුවන මානව හිමිකම් උල්ලංඝණය කිරීම් සහ බලහත්කාරකම් නිසා අවතැන් වීම් සහ ළමා සොල්දාදුවන් වශයෙන් බඳවා ගැනීම් මේ තත්ත්වයට පාදක වී ඇති අනෙකුත් හේතූන් වේ.

භූගෝලීය වශයෙන් දෙමළ ජනතාව වාර්ගික ගැටුම් හටගෙන ඇති පෙදෙස්වලට ඒකරාශීව ජීවත්වීම නිසා, වැඩි වශයෙන් ම විපතට පත් වී ඇත්තේ ඔවුන් ය. වාර්ගික සංයුතිය නිශ්චිත වශයෙන් සඳහන්ව නොමැති මුත්, අවතැන් වූ ජනතාවගෙන් 78%ක් ම දෙමළ ජාතිකයින් වන අතර මුස්ලිම්වරු 13%ක් ද සිංහල ජනතාව 8%ක්ද වශයෙන් ගණන් බලා ඇත.

එල්ටීටීඊ පාලනයට යටත්ව ඇති වන්නි ප්‍රදේශයේ ජනතාවගෙන් 80%ක් අවතැන් වී ඇත. කිලිනොච්චි දිස්ත්‍රික්කයේ සංඛ්‍යාලේඛන අනුව එම ප්‍රදේශයේ පමණක් 91.75% අවතැන් වී



**පුත්තලම සුභ සාධන මධ්‍යස්ථානය**

සිටිති. රජයේ පාලනයට නතු වී තිබෙන උතුරු ප්‍රදේශයේ අවතැන් වූවන්ගෙන් වැඩිම සංඛ්‍යාවක් ස්වකීය මිතුරන් හා ඥාතීන් වෙතින් රැකවරණය ලබා ඇත. හිස් ඉඩම්වල පදිංචිය සලසාගත් අවතැන් වූ පිරිස් ද වූහ. අනෙක් උදවිය රජයේ සුභසාධන මධ්‍යස්ථානවල ජීවත් වෙති. දිවයින පුරා අවතැන් වී සිටින පිරිස්වලට රජය, සුළු සුළු අඩුපාඩු මධ්‍යයේ වුව ද වියළි ආහාර සලාකය සපයා දී තිබේ. විශේෂයෙන් නැගෙනහිර පළාතේ මායිම් ගම්වල පදිංචි, “දිවා රාත්‍රි අවතැන්වූවන්” වශයෙන් හැඳින්වෙන ඇතැම් අවතැන් වූ වැසියන් ඔවුන් කලින් පදිංචි වූ දිස්ත්‍රික්කවල ජීවත් වන අතර දිවා කාලයේ ඔවුන් සතු දේපළ බලාගැනීමට පැමිණෙනවා ඇත.

ශ්‍රී ලංකාවේ අවතැන්වීම තුළ කැපී පෙනෙන ලක්‍ෂණ දෙකකි. එනම්, අවැතන්වී සිටින කාල සීමාව සහ බහුවිධ අවතැන් රටාවයි.

උතුරේ අවතැන් වූ මුස්ලිම් පවුල්වලට දසවසරකට අධික කාලයක් පුරා තම පැරණි නිවෙස් බලා ආපසු පැමිණීමට නොහැකි ව සිටින මුත්, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ ඇතැම් සිංහල පවුල් 1985 සිටම අවතැන්වී සිටිති. කඳවුරුවල ජීවත්වන බොහෝ අවතැන් වූ පිරිස් වසර 5ක් හෝ වැඩි කාලයක් පුරා එම තත්ත්වයේ ම පසුවෙති. 2000 වසරේ දී එල්ටීටීඊය යටතේ පවතින මඩු ප්‍රදේශයෙන් එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම විසින් රැස්කරගන්නා ලද සංඛ්‍යාලේඛනවලින් අවතැන් වූ පවුල්වලින් 22% පස් වසරකට වැඩියෙනුත්, 31%ක් තෙවරකුත් අවතැන්වී සිටින බව පෙන්වා දෙයි.

## *1 වෙනි සටහන*

### උතුරු පළාතේ දිස්ත්‍රික්කවල ලියාපදිංචි අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින්

| දිස්ත්‍රික්කය | අවතැන් නොවූ | ප්‍රාදේශීය වශයෙන් අවතැන් වූ | අනෙකුත් දිස්ත්‍රික්කවලින් අවතැන් වූ | එකතුව |
|---|---|---|---|---|
| මුදා නොගත් ප්‍රදේශ | | | | |
| කිලිනොච්චිය | 27,510 | 53,291 | 67,244 | 1,48,045 |
| මුලතිව් | 51,133 | 28,218 | 84,854 | 1,64,025 |
| මන්නාරම | 3696 | 11,748 | 19,677 | 35,121 |
| වව්නියාව | 244 | 9215 | 461 | 9920 |
| එකතුව | 82,583 | 102,472 | 172,236 | 357,291 |
| | | | | |
| මුදාගත් ප්‍රදේශ | | | | |
| මන්නාරම | 43,984 | 8527 | 11,156 | 63,667 |
| වව්නියාව | 74,876 | 19,288 | 42,040 | 136,204 |
| යාපනය | 456,347 | 85655 | | 542,002 |

**මූලාශ්‍රය** : රටේ ආරක්ෂක තත්ත්වය පිළිබඳ වාර්තාව, වව්නියා දිස්ත්‍රික්කය, 2002 සැප්තැම්බර් 30
**දිසාපති** : 2002.08.31 දිනට යාපනය අර්ධද්වීපයේ ජනගහනය, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, යාපනය

## 2 වෙනි සටහන

නැගෙනහිර පළාතේ ලියාපදිංචි වූ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින්

| **දිස්ත්‍රික්කය** | **අවතැන් වූ පවුල්** |
|---|---|
| මඩකලපුව | 6836 |
| ත්‍රිකුණාමලය | 7626 |

මූලාශ්‍රය : 2002-2005 යළි පදිංචි කිරීමේ වැඩසටහන, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය, දිස්ත්‍රික් කාර්යාලය, නැගෙනහිර සංවර්ධන අමාත්‍යාංශය, වී. ෂන්මුගම්, අතිරේක දිසාපති, මඩකලපුව, 2002 දෙසැම්බර් 02

## ආපසු පැමිණෙන වැසියන්

2002 පෙබරවාරියේ දී සටන් විරාම ගිවිසුම අත්සන් කිරීම, එදිරිවාදිකම් අත්හිටුවීම උතුරු නැගෙනහිර පළාත්වල ජීවන තත්ත්වයන් වැඩි දියුණු කිරීම සහ වාර්ගික අර්බුදය සඳහා ස්ථිරසාර විසඳුමක් ලැබීමේ සුභ ලකුණු පහළවීම හේතුකොටගෙන උන්හිටි ගමන් සමහර අවතැන්වූ පවුල් ආපසු තම වාසස්ථාන කරා පැමිණියහ. අනෙකුත් බොහෝ දෙනා ආපසු පැමිණීමේ හැකියාව තක්සේරු කර බැලීමේ අටියෙන් තම දේපොළ රැක බලා ගැනීමට පැමිණියහ.

එක්සත් ජාතීන්ගේ අවතැන් වූවන් පිළිබඳ ක්‍රියාකාරී කණ්ඩායමේ සංඛ්‍යාලේඛනවලට අනුව 2002 නොවැම්බර් වන විට අවතැන් වූවන් 2,20,762ක් ආපසු තම පැරණි වාසස්ථාන කරා පැමිණ ඇති බවට ගණන් බලා ඇත. 2002 ජූලිවල දී ඉන්දියාවේ වෙසෙන ශ්‍රී ලාංකික සරණාගත පවුල් 200ක් ස්වකීය ජීවිත පරදුවට තබා බෝට්ටුවලින් ශ්‍රී ලංකාවට පැමිණියහ.

## 3 වෙනි සටහන

**උතුරු - නැගෙනහිර දිස්ත්‍රික්කවල ආපසු පැමිණි පුද්ගලයින්**

| දිස්ත්‍රික්කය | දිනය | ආපසු පැමිණි පුද්ගලයන් |
|---|---|---|
| යාපනය | 2002-10-15 | 1134,776 |
| මන්නාරම | 2002-10-15 | 23403, වැඩියෙන්ම ඉන්දියානු සරණාගතයින් හා පුත්තලමේ මුස්ලිම්වරු |
| වව්නියාව | 2002-09-30 | 3244 දෙනකු ඔවුන්ගේ මුල් ගම් පෙදෙස්වලට යවන ලදී |
| කිලිනොච්චිය | 2002-08-23 | 11,388 පවුල් |
| මුලතිව් | 2002-11-28 | 29,396 පුද්ගලයින් |
| ත්‍රිකුණාමලය | 2002-11-30 | වන්නියේ සිටි පවුල් 2951 |
| මඩකලපුව | | හදිසියෙන්ම පැමිණි පුද්ගලයින්ගේ සංඛ්‍යාව නොදනී |

මූලාශ්‍රය : දිසාපතිවරුන්

කෙසේ වුවද, අවතැන් වූවන්ගෙන් බහුතරය ආපසු නොපැමිණීම සැලකිය යුතු කරුණකි. අවිනිශ්චිත දේශපාලන වටපිටාව සහ උතුරු-නැගෙනහිර ප්‍රදේශවල පැතිර පවත්නා තත්ත්වය නිසා අවතැන්වූවන් සංවිධානාත්මක වශයෙන් 'තොගපිටින්' පැමිණීම සුදුසු නොවන බව එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම දිගින් දිගටම පවසා සිටියි. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් පවත්වන ලද සම්මුඛ සාකච්ඡාවලින් පෙනී ගියේ දේපල හිමි අවතැන්වූ පිරිස්වල බහුතරය ආපසු ඒමට කැමත්තෙන් සිටින බවකි. දිවයින පුරා පවත්වනු ලබන සමීක්ෂණයක් මගින් ආපසු පැමිණීමට හෝ නැවත පදිංචිවීමට කැමැත්තෙන් සිටින අවතැන් වූ පිරිස්වල නිවැරදි සංඛ්‍යාව නිර්ණය කළ හැකි ය. ආපසු පැමිණීම ප්‍රමාද වීමට හේතු බොහෝ ය. වාර්ගික කණ්ඩායම්, පවුලේ ප්‍රමාණය, පැරණි සහ වර්තමානයේ පදිංචියට ලැබෙන පෙදෙස්, අවතැන්වීමේ ස්වභාවය සහ දැනට නිරත රැකියාව ඉන් කීපයකි.

ආරක්ෂාව පිළිබඳ උනන්දුව, නිවෙස්වලට සිදු වී ඇති හානිය, යටිතල පහසුකම් සහ ආධාර නොලැබීම, බිම්බෝම්බ සහ ජීවනෝපාය මාර්ග නොමැතිවීම තවදුරටත් බලපාන සාධකයෝයි.

ආපසු ඒමේ බලාපොරොත්තුවෙන් පසුවන පිරිස් කණ්ඩායම් වශයෙන් පැමිණීමට රුචිවෙති. ඔවුහු ස්වකීය ගම්පෙදෙස් පුනරුත්ථාපනය කරන තෙක් ආපසු ඒමේ අපේක්ෂා කල්දමමින් සිටිති. තවත් බොහෝ දෙනෙක් 2003 මුල් භාගයේ එනම් මෝසම් වැසි අවසානයේ ආපසු ඒමට අපේක්ෂා කරති. අවතැන්වූ පිරිස්වලට ආපසු ඒමේ දී මුහුණ පෑමට සිදු වී ඇති බාධක හා දුෂ්කරතා මෙම වාර්තාවේ පැහැදිලිව සඳහන් කර ඇත.

# බිම් බෝම්බ

## 1:1 කෙටි විස්තරයක්

උතුරු - නැගෙනහිර පළාත් කරා ආපසු පැමිණෙන වැසියන්ට හා අවතැන්වූවන්ට මුහුණ පෑමට ඇති ප්‍රධාන අනතුර බිම් බෝම්බ සහ වෙනත් පුපුරණ ද්‍රව්‍යයයි. 2003 ජනවාරියේ දී ගණන් බලා ඇති අයුරු සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු සෑම සතියක් පාසා දෙදෙනකුට වැඩි සංඛ්‍යාවක් බිම් බෝම්බවලින් මියගොස් තිබේ. හදිසියේ තම ගම්බිම් කරා පැමිණෙන පිරිස්, ගේ දොර ඉඩකඩම් ශුද්ධ පවිත්‍ර කිරීමේදී මෙම අනතුරුට පහසුවෙන්ම ගොදුරු වෙති. බිම් බෝම්බ නිසා විශාල ඉඩම් ප්‍රමාණයක් යළි පදිංචි කරවීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා උපයෝගී කරගැනීම හෝ හරකුන්ට තණ කැවීම සඳහා ප්‍රයෝජනයට ගැනීම හෝ අපහසු වී තිබේ. අතීතයේ මෙන්ම වර්තමානයේත් යුධ හමුදාවට වැදගත් වන ප්‍රදේශවල බිම් බෝම්බ ඒකරාශී වී ඇති බව පෙනෙන මුත්, ශ්‍රී ලංකා යුධ හමුදාව හෝ එල්ටීටීඊය විසින් වළලා ඇති බිම් බෝම්බ පිළිබඳ නිවැරැදි සංඛ්‍යා ලේඛන නොමැත. රජයේ වාර්තා අනුව බිම් බෝම්බ ලක්ෂ 13ක් මිල දී ගෙන ඇති අතර, ඉන් 900,000ක් සතුරාට එරෙහිව යොදා ඇත. අඩුපාඩු සහිතව වුවද, බිම් බෝම්බ උවදුර සම්බන්ධයෙන්, බිම් බෝම්බ අටවා ඇති ප්‍රදේශ සමීක්ෂණය කිරීම හා අඳුනාගැනීම, දැනුවත් කිරීම සහ ඉවත් කිරීම යන විශේෂ වැඩ සටහන් විපතට පත් වූ ප්‍රදේශවල අරඹා තිබේ. එල්ටීටීඊයේ පාලනයට යටත් වන්නි ප්‍රදේශවල සමීක්ෂණය, හඳුනාගැනීම, බිම් බෝම්බ අනතුරු පිළිබඳ දැනුවත් කිරීම හා බිම් බෝම්බ ඉවත් කිරීම යන කටයුතු දැනටමත් කෙරීගෙන යනු ලැබේ. ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබඳව මෙරට තෝරාගත් පිරිස්වලට පුහුණුව ලබා දී ඇත. රජයේ පාලනයට යටත් ප්‍රදේශ හා නැගෙනහිර පළාතේ බොහෝ දුරට යුධ හමුදාව විසින් අවශ්‍යතාව පරිදි බිම් බෝම්බ ඉවත් කිරීම සිදු කරනු ලැබේ. බිම් බෝම්බ වළලා ඇති ස්ථාන හඳුනාගැනීම සහ බිම් බෝම්බ අනතුර පිළිබඳ දැනුවත් කිරීම සම්බන්ධයෙන් පවතින අඩුපාඩු නිසා, රජයේ පාලනය පවතින ප්‍රදේශවල බෝම්බ ඉවත් කිරීමේ කාර්යය හරිහැටි ක්‍රියාත්මක නොවේ. මෙය සිවිල් ජනතාවට මහත් තර්ජනයක් වී තිබේ. ඇත්ත වශයෙන් ම අවතැන් වූ පිරිස් පදිංචිය සඳහා තෝරාගත් ප්‍රදේශවල පමණක් බිම් බෝම්බ ඉවත් කිරීම සහ බිම්බෝම්බ අනතුර පිළිබඳව දැනුවත් කිරීම සිදු වේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට දැන ගැනීමට ලැබී ඇති ආකාරයට 2002 දෙසැම්බර්වලදී අවතැන් වූවන්ගේ කඳවුරු හෝ අනෙකුත් පදිංචි වී සිටින ප්‍රදේශවලට බිම් බෝම්බ අනතුර පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර නොමැත.

## 1:2 එල්ටීටීඊ පාලනයට නතුවී ඇති වන්නි ප්‍රදේශය

වන්නි ප්‍රදේශයට අයත් නැගෙනහිර වඩමාරච්චිය, අලිමංකඩ, උතුරේ පල්ලායි, මුලතිව්, උතුරු වව්නියාව සහ මන්නාරමේ ඉදිරි පෙළ ආරක්ෂකවළලු යන ස්ථානවල බිම් බෝම්බ වළලා ඇති බව පෙනේ.

එල්ටීටීඊ පෙදෙස්වල වළලා ඇති බිම් බෝම්බවලින් බහුතරයක් ශ්‍රී ලංකා යුධ හමුදාට අයත් ය. එල්ටීටීඊය විසින් යොදා ගනු ලබන බිම් බෝම්බ අතුරින්, ජොනී 95 බෝම්බවල බැටරිය මාස 6-12 අතර කාලයක් සක්‍රියව පවතී. ජලය නිසා බිම් බෝම්බ අඩපණ වේ. කෙසේ වුවද, මෙම බිම් බෝම්බ නිශ්කාෂනය නොකළහොත් සිවිල් ජනතාවට මහත් තර්ජනයක් වනු ඇත.



***කිලිනොච්චියේ බිම් බෝම්බ ඉවත් කරන එච්ඩීයූ සාමාජිකයින් - ටිම් ඩිකින්සන්***

මයින් ඇක්ෂන් ගෲප් (එම්ජ්ජී) සහ නෝර්වේජියන් පීපල්ස් ඒඩ් (එන්පීඒ) යන විදේශ රාජ්‍ය නොවන සංවිධාන දෙක ‘වයිට් පිජන්’ සහ දෙමළ පුනරුත්ථාපන සංවිධානයේ (ටීආර්ඕ) හියුමැනිටේරියන් ඩිමයිනින් යුනිට් (එච්ඩීයූ) ඒකකයට බිම්බෝම්බ ඉවත් කිරීම සම්බන්ධයෙන් උපකාරී වෙමින් සිටිති. එම්ජ්ජී සංවිධානය බිම් බෝම්බ උවදුර පිළිබඳ දැනුවත් කිරීම හා බිම් බෝම්බ වළලා ඇති ප්‍රදේශ හඳුනා ගැනීම හා කොටුකර තැබීම පිළිබඳවත්, එන්පීඒ ආයතනය ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබඳවත් එච්ඩීයූ සාමාජිකයින්ට පුහුණුවක් ලබා දෙමින් සිටියි. 2002 නොවැම්බර් වන විට බෝම්බ ඉවත් කරන්නන් 130 පුහුණු කර ඇති අතර ඔවුන්ට හෙල්මට් සහ ආරක්ෂිත කබා ලබා දී තිබේ. එච්ඩීයූ බෝම්බ ඉවත් කරන්නන් 600ක් පුහුණු කිරීම සඳහා එන්පීඒ සංවිධානය අවශ්‍ය කටයුතු සම්පාදනය කර තිබුණි. බෝම්බ ඉවත් කිරීම සඳහා ඉතා සරල අයුරින් රේක්ක සහ දැකැති වැනි උපකරණ භාවිතා කරන මුත් ඉතාමත් සාර්ථක හා ආරක්ෂා සහිතව එම කාර්යය ඉටු කෙරෙන බව වාර්තා වේ.



*එච්ඩියූ සංවිධානය විසින් යොදා ගනු ලබන බිම් බෝම්බ ඉවත් කිරීමේ උපකරණ*

සරණාගත පිරිස් ආපසු පැමිණීම පදනම් කරගෙන ටීආර්ඕ සංවිධානය විසින් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු සඳහා ප්‍රමුඛත්වය ලබා දෙයි. රජයේ පාලන පෙදෙස්වල සිට එල්ටීටීඊ පාලනය යටතේ තිබෙන වන්නි ප්‍රදේශයට පැමිණෙන අවතැන් වූ පිරිස් එල්ටීටීඊයේ මාර්ග බාධකවලදී පරීක්ෂාවට ලක් කෙරෙන අතර, වන්නි ප්‍රදේශය තුළ අවතැන් වූවන් ආපසු ඒමේදී එල්ටීටීඊ ප්‍රදේශීය පරිපාලන නියෝජිතයින්ගේ අධීක්ෂණයට ලක් වේ.

## 1:3 රජයේ පාලන ප්‍රදේශ

රජයේ පාලනයට නතු වී ඇති ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කිරීමේ කාර්ය මන්දගාමීව හා අවස්ථාවෝචිතව සිදු කෙරේ.

ශ්‍රී ලංකා යුධ හමුදාව අතහැර දමා ඇති සමහර ප්‍රදේශවල බිම් බෝම්බ ඉවත් කර ඇත. බිම් බෝම්බ ඉවත් කිරීම ජාත්‍යන්තර ප්‍රමිතියට අනුකූලව කර නොමැති බවට හෝ මන්නාරමේ සෙල්වතුරේ වැනි ප්‍රදේශවල බිම් බෝම්බ මෙතෙක් ඉවත් කර නොමැති බවට බිය පල වී ඇත. බෝම්බ ඉවත් කිරීමේදී ශ්‍රී ලංකා යුධ හමුදාව යොදාගන්නා ආරක්ෂක ක්‍රම කෙරෙහි අප්‍රසාදය පළ වී ඇත. එක් රාජ්‍ය නොවන සංවිධානයක් පවසන අයුරු බිම් බෝම්බ ඉවත් කිරීමේ යෙදී සිටි හමුදාභටයින් 90කින් 36 දෙනෙක්ම තුවාල ලබා තිබේ. බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු ජාත්‍යන්තර ප්‍රමිතියට අනුව සිදු කිරීම සඳහා ශ්‍රී ලංකා යුධ හමුදාව පුහුණු කිරීමට අමෙරිකානු යුධ හමුදාව සූදානමින් සිටි මුත් 2002 පෙබරවාරි වන තෙක් එය සිදු වී නැත.

'හේලෝ' සංවිධානය යාපනයේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතුවල නිරතව සිටියි. අනෙක් ප්‍රදේශවල එනම්, නැගෙනහිර පළාතේ සහ මන්නාරම් ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කිරීම හෝ බිම් බෝම්බ අනතුරු සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කෙරෙන බවක් නොපෙනේ. ප්‍රදේශ කීප පොළක බිම් බෝම්බ තිබෙන බව මන්නාරම් කච්චේරියේ බලධාරීන්, නැවත පදිංචි කරවීමේ හා පුනරුත්ථාපනය කිරීමේ අමාත්‍යංශය වෙත දන්වා ඇත. හමුදා කඳවුරු අසල බිම් බෝම්බ තිබෙන බව සැක කරන මුත්, මඩකලපු දිස්ත්‍රික්කයේ වළලා ඇති බිම් බෝම්බ පිළිබඳ සංඛ්‍යා ලේඛන කිසිවක් නොමැත. ස්වකීය පාලනයට නතු වී ඇති පෙදෙස්වල, ශ්‍රී ලංකා යුධහමුදාව විසින් බිම් බෝම්බ ඉවත් කර ඇති බව විශ්වාස කෙරේ. යුනිසෙෆ් හා එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම වැනි ආයතන බිම් බෝම්බ අනතුරු පිළිබඳව දැනුවත් කිරීමට ප්‍රතිඥා දී ඇති මුත්, මඩකලපු දිස්ත්‍රික්කයේ කිසිදු සංවිධානයක් බිම් බෝම්බ ඉවත් කරලීමේ ලා නිරත වූ බවක් පෙනෙන්නට නොතිබුණි. දැනට ත්‍රිකුණාමල දිස්ත්‍රිකයේ බිම් බෝම්බ සමීක්ෂණයක් කෙරෙමින් පවතී. ප්‍රදේශවාසීන්ගේ මඟපෙන්වීම යටතේ යුනිසෙෆ් සංවිධානය බිම් බෝම්බ පිළිබඳ සමීක්ෂණය ආරම්භ කර තිබේ. හේලෝ ආයතනයද එබඳු සමීක්ෂණයක් තිරියාය ප්‍රදේශයේ ආරම්භ කර තිබේ. 1980 ගණන්වල දී ඉන්දියානු සාම සාධක හමුදාව විසින් වළ දමා ඇති බිම් බෝම්බ පිළිබඳ කිසිදු තොරතුරක් දැනගන්නට ලැබී නොමැත.

## 1:4 සහයෝගීතාව සහ අරමුදල් සැපයීම

ශ්‍රී ලංකාවේ බිම් බෝම්බ ඉවත් කිරීමේ කටයුතු කෙදිනක හමාර වේද යන්න කිසිවෙක් නොදනී. බිම් බෝම්බ වළලා ඇති ප්‍රදේශ දැක්වෙන සිතියම් තිබෙන නිසාත්, බොහෝ විට හමුදා කඳවුරු අසල එම බෝම්බ වළලා ඇති බැවිනුත් බිම් බෝම්බ ඉවත් කිරීම පහසුවෙනු ඇතැයි එක්සත් ජාතීන්ගේ සංවිධාන වැඩ සටහන මෙහෙය වන බිම් බෝම්බ ව්‍යාපෘතිය සඳහන් කරයි.

2002 නොවැම්බර් වන විට අඩු තරමින් විවිධ සංවිධාන 18ක් පමණ බිම් බෝම්බ අනතුරු පිළිබඳ දැනුවත් කිරීම, බිම් බෝම්බ ස්ථානගත කර ඇති පෙදෙස් හඳුනාගැනීම සහ ඒවා ඉවත් කිරීමේ කටයු වල නිරතව සිටියහ. යුධ හමුදාව, එල්ටීටීඊය සහ ආධාර සැපයීමේ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් බිම් බෝම්බ ඉවත් කිරීම කොසෝවෝ රටේ සිදු කළාක් මෙන් වසර 2 1/2ක් වැනි කෙටි කලකදී ඉටු කළ හැකි ය. එන්පීඒ සංවිධානය පවසන අයුරු ආධාර ලැබීමේ ප්‍රවනතාව අනුව වසර තුනක් වැනි කාලයක් තුළ දී වන්නි ප්‍රදේශයේ බිම් බෝම්බ ඉවත් කිරීම හමාර කළ හැකි ය. යාපනයේ සියලු ප්‍රදේශ මාස 40ක් තුළ දී බිම් බෝම්බ උවදුරෙන් නිදහස් කළ හැකි බව හේලෝ සංවිධානයේ අපේක්ෂාව වී ඇත. සැප්තැම්බර් 16 දින සාම සාකච්ඡා ඇරඹීමෙන් පසු බිම් බෝම්බ ඉවත් කිරීම සඳහා ආධාර සපයන රටවල් වැඩියෙන් දායක වී සිටිති. බිම් බෝම්බ තහනම් කිරීමේ ගිවිසුම ශ්‍රී ලංකා රජය විසින් අනුමත කරනු ලබන්නේ නම් බිම් බෝම්බ නිස්කාෂණය සඳහා වැඩිවැඩියෙන් ආධාර සැපයීමට විදේශ රටවල් කැමැත්ත ප්‍රකාශ කර තිබේ. ශ්‍රී ලංකා රජය බිම්බෝම්බ තහනම් කිරීමේ ගිවිසුමට අත්සන් කිරීම ශ්‍රී ලංකාවේ ආරක්ෂාවට ඍජුව සම්බන්ධ වී ඇති බව සැලකිල්ලට ගත යුතුව ඇත. බිම්බෝම්බ තහනම් කිරීම වැනි කරුණු ක්‍රියාත්මක වීම සඳහා තවත් කලක් ගතවන බැවින් එතෙක් බිම්බෝම්බ ඉවත් කිරීම සඳහා අවශ්‍ය ආධාර සැපයීම කල් දැමිය යුතු නො වේ.

# 2. සැරිසැරීමේ නිදහස

## 2:1 කෙටි විස්තරයක්

පුරවැසියකුට තම පදිංචිය තෝරා ගැනීමේ සහ නිදහසේ සැරිසැරීමේ අයිතිය ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මඟින් තහවුරු කර තිබේ. අතීත අවසරපත් ක්‍රමය සහ සංවෘත කඳවුරු පද්ධතිය මඟින් ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊ ය අවතැන් වූ පිරිස් සතු නිදහසේ සැරිසැරීමේ හෝ තම කටයුතුවල නිරතවීමේ අයිතිය බෙහෙවින් සීමා කර තිබුණි.

සංවිධානාත්මක වශයෙන් අවතැන් වූ පිරිස් ආපසු පැමිණීම ගැන ප්‍රසාදයක් නො දක්වන එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම ස්වේච්ඡාවෙන් ආපසු පැමිණෙන පුද්ගලයින් පරීක්ෂාවට ලක්කරයි. අවතැන් වූවන් සතු නිදහසේ සැරිසැරීමේ අයිතිය ශ්‍රී ලංකා රජය පිළිගන්නා බව පෙනේ. නිදහසේ සැරිසැරීමේ අයිතිය කෙරෙහි ශ්‍රී ලංකා රජය කැපවී ඇති ආකාරය ප්‍රතිපත්තිමය වශයෙන් පෙන්නුම් නො කෙරේ. කලින් පදිංචි වී සිටි පෙදෙස් කරා ආපසු පැමිණෙන ලෙස එල්ටීටීඊ ය විසින් කර ඇති ඉල්ලීම කෙරෙහි සිංහල සහ මුස්ලිම් අවතැන් වූ පිරිස් සැක පහල කරති. ඉන්දියාවේ වෙසෙන ශ්‍රී ලාංකික සරණාගතයින් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු ව ඇත. මෙම සරණාගතයින් ගේ දරුවන් සඳහා ඉන්දියානු බලධාරීන් විසින් නිකුත් කර ඇති උප්පැන්න සහතික ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය විසින් අනුමත කර ඇත්නම්, ශ්‍රී ලංකා රජය හුදෙක් ඒ මත සටහනක් තැබීම පමණක් සිදු කරනු ඇත.

උප්පැන්න සහතික නො මැතිවීම නිසා දෙමව්පියනට තම දරුවන් ගේ අනන්‍යතාව තහවුරු කිරීම අපහසු වී ඇති බැවින් සරණාගතයින්ට නැවත ශ්‍රී ලංකාවට පැමිණීම දුෂ්කර වී තිබේ.

ස්ථිර සාමයක් ආරම්භ වන තුරු සරණාගතයින් ආපසු ඒමේ බලාපොරොත්තු කල් දමා ඇත. රට තුළ පවත්නා තත්ත්වය ආරක්ෂාව පදනම් වූ ස්ථිර පදිංචිය සඳහා හිතකර නො මැත. බිම්බෝම්බ උවදුර තවමත් ජනතාවට තර්ජනයකි. නිවාස සහ යටිතල පහසුකම්වලට සිදු වී ඇති හානියත්, ගේ දොර ඉඩකඩම් විනාශ වීමත් නිසා නැවත ජීවිතය ආරම්භ කිරීම අවතැන් වූවන්ට මහත් ගැටලුවක් වී තිබේ.

## 2:2 නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය සහ ඉඩම් නොමැති ජනතාව

අවතැන් වූවන් ගෙන් සැලකිය යුතු සංඛ්‍යාවකට ආපසු පැමිණ පදිංචි වීම සඳහා අවශ්‍ය ඉඩකඩම් කිසිවක් නැත. රජයේ නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය ඉඩම් නො මැති අවතැන් වූ පිරිස් සතු නිදහසේ සැරසැරීමේ අයිතියට තර්ජනයක් වී තිබේ.

ඉඩම් අහිමි පුද්ගලයින් විවිධ කාණ්ඩවලට අයත් වේ:

⋆ උතුරු ප්‍රදේශයේ පදිංචි වී, අවතැන් වන තෙක් මූලිකව අඳගොවීන් වශයෙන් කටයුතු කළ කඳුරට දෙමළ ජාතිකයින්

නිදහසින් පසු වරින් වර ඇති වූ වාර්ගික ගැටුම් නිසා කඳුකරය ඇතුළු රටේ දකුණු ප්‍රදේශයේ විසූ දෙමළ ජනතාව ගේ සංක්‍රමණය වීම ආරම්භ විය.

වව්නියාවේ සුභසාධක මධ්‍යස්ථානවල ජීවත්වන 40% - 45% අතර පවුල් සංඛ්‍යාවක් කඳුරට වැසියන් බවට ගණන් බලා ඇත. 1971, 1977, 1981 හා 1983 වසරවල දී කඳුරට ප්‍රදේශයෙන් සංක්‍රමණය වූ ඔවුහු අඳගොවීන් වශයෙන් උතුරේ පදිංචි වූ හ.

පසුකාලයේ දී හටගත් වාර්ගික අර්බුදය නිසා ඔවුහු අවතැන් වූ හ.

⋆ අවතැන්ව සිටිය දී වැඩිහිටියන් බවට පත් එහෙත් දේපළක් නො මැති නව පරපුර

අවතැන් වූ බොහෝ පුද්ගලයින් විවාහපත් වී සිටින මුත් ඔවුන් සතු දේපළක් නො මැත. වසර 12 පුරා අවතැන් වී සිටින මුස්ලිම් ජාතිකයින් සහ 1985 සිට නැගෙනහිර පළාතේ අවතැන් වී සිටින ජනතාව මෙයට කදිම නිදර්ශණයකි. පුත්තලම් ප්‍රදේශයේ ආරම්භයේ සිට අවතැන් වූවන් ගේ සංඛ්‍යාව 14,000 ක් වුව ද, දැනට එය 17,000 දක්වා වැඩි වී ඇත. ආර්.ඩී.එෆ් සංවිධානය පවසන අයුරු පුත්තලමේ වෙසෙන නව පරපුරේ 50% කට ආපසු පැමිණීම සඳහා තමන් සතු ඉඩම් නො මැති අතර උතුරු ප්‍රදේශයේ පදිංචිය සඳහා යාමට ඔවුහු කැමැත්තක් ද නො දක්වති.



*පුත්තලමේ අවතැන් වූ දරු පිරිස්*

⋆නීති විරෝධීව හෝ තාවකාලිකව යළි පදිංචි කරන ලද ඉඩම් අහිමි පුද්ගලයින්

ඇතැම් අවස්ථාවල රජයේ බලපත් ලබා ඇති පුද්ගලයින් (6:3 බලන්න) තම ඉඩම් කොටස් කර අවතැන් වූවන් වෙත ඔවුන් යළි පදිංචි කරවීම සඳහා විකුණා තිබේ. එහෙත් රජයෙන් දෙන ලද ඉඩම් විකිණීම නීති විරෝධී වේ. 1995 දී රාජ්‍ය අනුග්‍රහයෙන් මෙහෙයවන ලද වැඩසටහනක කොටසක් වශයෙන් අවතැන් වූ පිරිස් යළි පදිංචි කරවන ලද ඉඩම්වලින් 60% ක් ම නීති විරෝධී ලෙස ලබා ගන්නා ලද රජය සතු ඉඩම් බව හෙළි වී ඇත. (නීති විරෝධීව අන් සතු කරන ලද ඉඩම් පිළිබඳ 5:4 බලන්න.) දේශපාලන පක්ෂ සහ හමුදා සහායක කණ්ඩායම් විසින් වෙනත් අයට අයත් ඉඩම්වල පිහිටි ජනපද 8 ක ඉඩම් නො මැති අවතැන් වූ පුද්ගලයින් පදිංචිකර ඇත. නිවාස 100 යෝජනා ක්‍රමයේ කොටසක් වශයෙන් දේවස්ථාන ඉඩම්වල යළි පදිංචි කරවා ඇති මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ පිරිස් අවිනිශ්චිත අනාගතයකට මුහුණපා සිටිති. සමහර අවතැන් වූවන් රජය සහ රාජ්‍ය නො වන සංවිධාන විසින් වව්නියා ප්‍රදේශයේ නොයෙක් තැන්වල යළි පදිංචිකර තිබේ. නැවත පදිංචි කිරීමේ ගම් බොහොමයක් හුදෙක් තාවකාලික වැඩපිළිවලක කොටසක් සේ පෙනී යන අතර පදිංචි කරුවන්ට කිසිඳු ලේඛනයක් මෙතෙක් ලබා දී නො මැත.



***මන්නාරමේ නැවත පදිංචි කරන ලද ගමක්***

⋆ ලේඛන කිසිවක් ලබා දී නො මැති පදිංචිකරුවන් සහ ඊනියා “අනවසර පදිංචි කරුවන්” අතරින් සමහරක ගේ පදිංචිය නීත්‍යානුකූල කරමින් තිබිණි. ඒ වන විට ඔවුහු ස්වකීය ගේ දොර ඉඩකඩම් අතහැර දමා ගොස් සිටිය හ.

කලින් රජයේ හෝ පෞද්ගලික ඉඩම්වල පදිංචි වී සිටි ඉඩම් අහිමි අවතැන් වූ පිරිස් තම පැරණි දේපළ යළි ලබා ගැනීම අවිනිශ්චිත වී ඇති බැවින් ආපසු පැමිණීමට බියෙන් සිටිති. සමහර ඉඩම් අහිමි පුද්ගලයින් කලින් තමන් පදිංචිව සිටි ඉඩම් සඳහා ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තු ආඥාපනත යටතේ බලපත්‍ර සඳහා අයදුම් කරමින් සිටිය හ. ඔවුහු තම අරමුණ කෙරෙහි සුභවාදීව බලා සිටින අතර, විකල්ප ඉඩම් ලැබේ ය යන විශ්වාසය ද තබා ගෙන සිටිති. (5:3 බලන්න.)

සමහර අවතැන් වූ පිරිස් තම පැරණි ගම්බිම් කරා ආපසු ඒමේ අපේක්ෂාවෙන් සිටිති. එහෙත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් තොරතුරු විමසීමේ දී බහුතරය පවසා සිටියේ මන්නාරම් දූපත සහ වව්නියාව ඇතුළු තමන් දැනට පදිංචි ප්‍රදේශවලින් ඉඩම් ලබාගැනීමට කැමති බවයි. මෙය එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම විසින් තහවුරු කර ඇත.

එහෙත් රජයේ ප්‍රතිපත්තිය පරිදි අවතැන්වූවන් ඔවුන් ගේ පදිංචි දිස්ත්‍රික්කය හැර අන්‍ය කවර හෝ දිස්ත්‍රික්කයක රජයේ ඉඩම්වල යළි පදිංචි කළ නො හැකි ය. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනය පාදක වී ඇති මෙම ප්‍රතිපත්තිය මඟින් උතුරු හා නැගෙනහිර පළාත්වල වාර්ගික අනුපාතය වෙනසකට ලක්වීම අපේක්ෂා නො කළා විය හැකි යි. බහුවාර්ගික වව්නියාවේ දෙමළ වැසියන් ගේ ජනගහනය වැඩි කිරීම මෙමඟින් අදහස් නො කෙරේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයට අනුව රජයේ මෙම ප්‍රතිපත්තිය අදාළ වන්නේ වාරිමාර්ග සංවර්ධන ව්‍යාපෘති මඟින් සිදුවන අවතැන්වීම සම්බන්ධයෙන් මිස ගැටුම් හෝ අර්බුද නිසා ඇතිවන අවතැන්වීමේ සිද්ධීන්වලට නො වේ. දේශපාලන කරුණු මුල් කරගෙන කරනු ලබන ජනාවාස පිහිටුවීම්වලින් ප්‍රජාව ආරක්ෂා කිරීමේ අටියෙන් මෙබඳු ප්‍රතිපත්තියක් ගොඩනැගුනා විය හැකි මුත් එමඟින් වාර්ගික අර්බුදයෙන් අවතැන් වූ ඉඩම් නො මැති පුද්ගලයින්ට අහිතකර තත්ත්වයක් උදා කර තිබේ.

ඉඩම් නො මැති අවතැන් වූ පවුල් සඳහා වව්නියා දිස්ත්‍රික්කය තුළ නැවත පදිංචි කිරීමේ යෝජනා ක්‍රම කීපයක් ක්‍රියාත්මක කර තිබේ. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් නො මැති අවතැන් වූ පවුල් සඳහා අක්කර 1/4 - 1/2 අතර රජයේ ඉඩම් ප්‍රදානය කෙරිණි. වව්නියා දිස්ත්‍රික්කය තුළ "නැවත පදිංචි කිරීමේ" විශේෂ වැඩසටහන් යටතේ ඉඩම් නො මැති පවුල් 604 ක් නැවත පදිංචි කරන ලදී.

1995 අලුතින් පදිංචි කිරීමේ වැඩසටහනින් පසුව අවතැන්වූවන් සඳහා රජයේ ඉඩම් බෙදා නො දීම ප්‍රතිපත්තිය වී ඇති බව පෙනේ. එහෙත් මෙම ප්‍රතිපත්තියට පිටුපා අවතැන් වූ සිංහල පවුල් 35 ක් අලුතින් පදිංචි කිරීම සඳහා රජයේ ඉඩම් ප්‍රදානය කර ඇති බවට චෝදනාවක් ද වේ. එසේ ම උතුර හැර අන්‍ය දිස්ත්‍රික්වලින් පැමිණි පවුල් සඳහා කල්පිටිය ප්‍රදේශයේ රජයේ ඉඩම් ලබාදීම සඳහා බලපත්‍ර නිකුත්කර ඇත.

අවතැන් වූ ජනතාව ගෙන් බහුතරය කෙතරම් කලක් යම් දිස්ත්‍රික්කයක පදිංචි වී සිටිය ද ප්‍රාදේශීය බලධාරීන් විසින් ඔවුන් ස්ථිර පදිංචිකරුවන් වශයෙන් නො සලකන බැවින් වර්තමාන "යළි පදිංචි කිරීමේ" වැඩසටහන්වලින් ප්‍රයෝජන ලබාගැනීමට හිමිකමක් නො මැත. යම් දිස්ත්‍රික්කයක පුද්ගලයකු ගේ පදිංචිය තහවුරු කිරීමේ එකම සාධකය වන්නේ එම දිස්ත්‍රික්කයේ මැතිවරණ ලයිස්තුවට ඔහු ගේ නම ඇතුලත් වීම ය. මේ නිසා බොහෝ අවතැන් වූ පිරිස් ඔවුන් වෙසෙන දිස්ත්‍රික්කවල හුදෙක් තාවකාලික පදිංචිකරුවන් වශයෙන් පමණක් සැලකේ.

රජය නිල වශයෙන් අවතැන් වූ ජනතාව ගේ මනාපය ගරුකරන මුත්, මෙම අලුතින් පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය නිසා ඉඩම් අහිමි අවතැන් වූ පවුල්වලට කඳවුරුවලට වී සිටීමට හෝ ඔවුන් ගේ කැමැත්තට එරෙහිව වෙනත් ප්‍රදේශයක ජීවත් වීමට සිදු වී ඇත.

යථෝක්ත ප්‍රතිපත්තියේ යුක්ති යුක්ත භාවය තහවුරු කිරීම සඳහා බලධාරීන් විසින් රජයේ ඉඩම් නො මැතිවීම වැදගත් සාධකයක් වශයෙන් ගෙනහැර පානු ලැබේ. දැනටමත් අන් සතු

කර ඇති රජයේ ඉඩම්, පෞද්ගලික අයිතිය යටතේ පවතින ඉඩම්, සහ දැනට රජය සතු පදිංචියක් නැති ඉඩම් පිළිබඳ ව ඉඩම් අමාත්‍යාංශය යටතේ ඇති කුමන හෝ දෙපාර්තමේන්තුවකින් හෝ දිස්ත්‍රික් නිලධාරීන්ගෙන් ඇස්තමේන්තුවක් ලබාගැනීම පවා අසීරු විය. වව්නියා දිස්ත්‍රික්කය තුළ අලුතින් පදිංචි කිරීම සඳහා රජයේ ඉඩම් තිබෙන මුත් අලුතින් පදිංචි කිරීම අවශ්‍ය ඉඩම් ලාභීන් හෝ දැනට ලබාගත හැකි රජයේ ඉඩම් පිළිබඳ ව හෝ සංඛ්‍යා ලේඛන නො මැත. ඉඩම් අහිමි පුද්ගලයින් අලුතින් පදිංචි කිරීමේ දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු සිතියම් සහ සංඛ්‍යාලේඛන නො මැති වීම මන්නාරම් ප්‍රදේශයට සැලකිය යුතු ගැටළුවක් වී තිබේ. එල්ටීටීඊ පාලනයට යටත් වන්නි ප්‍රදේශයේ ඉඩම් නො මැති වැසියන්ට අක්කර 1/4 ටත් 1 ටත් අතර ප්‍රමාණයක්, ඉඩම අවශ්‍ය වී ඇති කාරණය ගැන සලකා බැලීමෙන් ලබා දෙන බව නීතිඥයෙකු ප්‍රකාශ කර තිබේ.

## 2:3 අවතැන් වූ වැසියන් තම මුල් පදිංචි ප්‍රදේශවල පදිංචි කරවීම සඳහා කෙරෙන විවිධ බලපෑම්

අවතැන් වූ වැසියන් ස්වකීය මුල් පදිංචි ප්‍රදේශ කරා ආපසු යැවීම සඳහා හෝ ඒ සඳහා දිරිගැන්වීම පිණිස උපායමාර්ග ගණනාවක් ම යොදන ලදී. වියළි ආහාර සලාකය නැවැත්වීම හෝ කඳවුරු සහ පාසල් වැනි ස්ථානවල පවත්නා කඳවුරු පහසුකම් පැවැත්වීම, යනාදිය ඉන් කීපයකි. 2002 නොවැම්බරයේ දී පේසාලේ සහ ටී - මඩු කඳවුරු වසාදැමීම සඳහා සැලසුම් කර තිබුණි. වව්නියා දිසාපති සහ දෙමළ පුනරුත්ථාපන සංවිධානය උත්හිටිගමන් තම පැරණි ගේ දොර කරා ආපසු පැමිණෙන සරණාගතයින් සඳහා ප්‍රවාහන පහසුකම් සලසා දුන් හ. වියලි සලාකය අඩු කිරීම වනාහී අවතැන් වූ පිරිස් තම මුල් පදිංචි භූමි කරා යැවීම සඳහා පොළඹවාලීමේ ජාතික ප්‍රතිපත්තියක් වශයෙන් සමහරු අර්ථකතනය කර ඇත. 2002 නොවැම්බරයේ දී "විදේශිකයින්" පිරිසක් ජනවාරියේ සිට කඳවුරු අත්හැර යන සේ තමන්ට නියෝග කළ බවට ටී - මඩු කඳවුරේ පදිංචි වී සිටි අවතැන් වූ පිරිස් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත පැමිණිලි කර තිබුණි.

2002 සැප්තැම්බර් අවසාන වන විට මඩු පල්ලියේ සිට පවුල් 1600 ක් මාන්තායි බටහිර සහ කිලිනොච්චිය කරා පැමිණිය හ. වාර්තා වූ ආකාරයට කලින් පුද්ගලයින් 8455 කට රැකවරණ සලසා දුන් මඩු සුභසාධන කඳවුර වසා දමා තිබුණි. මඩු පල්ලියේ සිටි සරණාගතයින් දිසාපතිවරයා විසින් එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමට අයත් ට්‍රක් රථයකින් කිලිනොච්චි දිසාපති කාර්යාලය වෙත ප්‍රවාහනය කරන ලදී. මඩු කඳවුර වැසීමෙන් පසුවත් අතලොස්සක් පමණ පවුල් සංඛ්‍යාවක් නතර වී සිටි මුත් ඔවුන්ට ද දැන් ඉන් පිටත්වන ලෙස දන්වා තිබේ.

## 2:4 වාර්ගික උණුසුම සහ අවතැන් වූ මුස්ලිම් සහ සිංහල පවුල්වලට ආපසු ඒමේ දී සිදුවන බාධා.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජන කොටස් තුනේ සාමාජිකයින්ට එනම් අවතැන් වූ සහ ආපසු පැමිණෙන වැසියන්ට ස්වකීය ඉඩකඩම් හා දේපලට පිවිසීමේ දී විවිධ බාධකවලට මුහුණ පෑමට සිදු වේ. වාර්ගික අර්බුදය නිසාත්, මානව හිමිකම් උල්ලංඝනය කිරීම නිසාත් ජන කොටස් තුනේ ම පිරිස් අවතැන් වූ හ. මේ සඳහා අර්බුදයට සම්බන්ධ දෙපාර්ශ්වය ම වගකිව යුතු වූ හ.

අතීතයේ මෙන් ම වර්තමානයේ දීත් රාජ්‍ය සම්පත් සහ අනෙකුත් ආධාර වෙන්කිරීමේ දී එක් ජන කොටසකට ආසාධාරණයක් සිදුවන අයුරින් කටයුතු කිරීම මෙන් ම ආරක්ෂාව පිළිබඳ සැක මතුවීම වාර්ගික ලන්සුවට හේතු වූ බව ප්‍රකාශ වේ. විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය වෙත සැලකර ඇති එබඳු අවස්ථා කීපයක් මෙහි පහත දැක් වේ.

රජය විසින් නැගෙනහිර පළාතේ ඉඩම් සහ සම්පත් වෙන්කරදීමේ දී දෙමළ ජනතාවට අසාධාරණයක් සිදු වී ඇති බවට දීර්ඝ කාලයක සිට විවිධ අදහස් පල වී තිබුණි. මෙය පළාතේ ජන අනුපාතය වෙනස් කිරීම සඳහා ගන්නා ලද පියවරක් වශයෙන් ද අර්ථකතනය කර ඇත. රජයේ ජනපද ව්‍යාපාර තුළින් අතීතයේ දී වඩාත් ම වාසි ලබන ලද්දේ ඉඩම් නො මැති සිංහල ජනතාවයි. තවද, අවතැන් වූ සිංහල ජනතාවට රජයේ මෙන් ම ශ්‍රී ලංකා යුධ හමුදාවේ ද උපකාරය ලැබුණ බව කියැවේ. ඒවාගේ ම ආරම්භ කරන ලද අලුතින් පදිංචි කිරීමේ වැඩසටහන්වල දී ද ඔවුන්ට වාසි අත් වූ බව සඳහන් වේ.

සාම්ප්‍රදායික වශයෙන් නැගෙනහිර පළාත සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ ප්‍රධානියා මුස්ලිම් දේශපාලකයකු වූ බැවින් සම්පත් වෙන් කරදීමේ දී දෙමළ ජනතාව අභිබවා මුස්ලිම්වරුන්ට වැඩිවාසි ලබා දුන් බවටත්, දෙමළ ජාතිකයින්ට අයත් ඉඩකඩම් මුස්ලිම්වරුන් පදිංචියට ගෙන තිබීම ගැන ඇස් ඇර බැලීමක් නො කළ බවටත් චෝදනා එල්ල වී ඇත. උතුරු සහ නැගෙනහිර පළාත්වල එල්ටීටීඊ ය විසින් බලහත්කාරයෙන් තමන්ට අයත් ගේ දොරපිටි වලින් පන්නා දමන ලද සිංහල සහ මුස්ලිම් ජනතාව, සාමය සඳහා කැප වී සිටින බවට එල්ටීටීඊ නායකත්වය දෙන පොරොන්දු කෙරෙහි විශ්වාසය තැබීමට මැලි වී සිටිති. මුස්ලිම් දේපල ආපසු එම අයිතිකරුවන් වෙත භාරදිය යුතු බවට එල්ටීටීඊය දුන් උපදෙස් එයාකාරයෙන් ක්‍රියාත්මක නො වී ය. ඒ ගැන කළ පැමිණිල්ලකට ප්‍රතිචාරයක් වශයෙන් උතුරු නැගෙනහිර දේපල හිමි මුස්ලිම් ජාතිකයින් ගේ ලැයිස්තුවක් සපයන ලෙස එල්ටීටීඊය ශ්‍රී ලංකා මුස්ලිම් කොන්ග්‍රසයට දන්වා තිබුණි. (5:3 බලන්න) එල්ටීටීඊය කෙරෙහි ඇති අවිශ්වාසය මුස්ලිම්වරුන් ගෙන් කප්පන් ගැනීම හා ඔවුන්ට පීඩා පැමිණවීම වැනි ක්‍රියා නිසා තවතවත් වැඩි වී ඇත. විකල්ප පතිපත්ති කේන්ද්‍රය විසින් පුත්තලමේ දී කරන ලද කරුණු විමසීමක දී අවතැන්වූවෝ අලුතින් පදිංචි කරවූ මුස්ලිම් ජාතිකයින් ගේ බහුතරය ඔවුන් ගේ මුල් පදිංචි ප්‍රදේශය වන මන්නාරම සහ යාපනය වෙත ආපසු යාම සඳහා කැමැත්ත පල කළ හ. කෙසේ වුව ද, 2002 ඔක්තෝබර් වන විට මන්නාරමේ යළි පදිංචි කරන ලද මුස්ලිම් පවුල් 625 ක් හැරුණ විට, යාපනයේ පදිංචිය සඳහා ආපසු පැමිණ ඇත්තේ හුදෙක් මුස්ලිම්වරුන් අතලොස්සක් පමණි. 2002 ඔක්තෝබර් වන විට පවුල් 2837 කින් 34 පමණක් යාපනය නගරය වෙත ආපසු පැමිණ තිබුණි. පවුල් 20 ත් 30 ත් අතර සංඛ්‍යාවක් මුලතිව් වෙත පැමිණිය හ. උතුරේ මුස්ලිම්වරුන් ආපසු පැමිණීමට අකමැත්ත දක්වා ඇත්තේ ප්‍රධාන වශයෙන් ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නය නිසා ය. වාර්ගික අර්බුදයට ස්ථිරසාර විසඳුමක් අවශ්‍ය වන්නා සේ ම මුස්ලිම් ජනතාවට ස්වකීය ආරක්ෂාව තරකර ගැනීම ඉතා වැදගත් වී ඇත.

කොන්දේසි විරහිතව ආපසු පැරණි පදිංචි ප්‍රදේශ කරා යාමට කැමති පුත්තලමේ පදිංචි කිසිඳු අවතැන් වූ මුස්ලිම් ජාතිකයකු විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට මුණගැසී නැත. සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු බොහෝ අවතැන් වූ මුස්ලිම් ජාතිකයෝ තම පැරණි දේෂපාලන ඉඩකඩම් පරීක්ෂා කර බැලීම සඳහා ගොස් තිබුණි.

මන්නාරමේ මූසාලි ප්‍රදේශයේ යළි පදිංචි වීම සඳහා සූදානම් වන මුස්ලිම් ජාතිකයින් ද සක් ම විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයට හමු විය. උතුරුකරයෙන් 1990 දී පලවා හරින ලද කිසිදු සිංහලයෙක් ආපසු යාපනයට පැමිණ නැත. නැගෙනහිර පළාතේ එල්ටීටීඊ පාලනයට යටත් ප්‍රදේශවල පදිංචිව සිටි අවතැන් වූ සිංහල වැසියන් ආපසු යාමට අකමැති වූ අතර වෙනත් ප්‍රදේශවල යළි පදිංචිකරන මෙන් ඉල්ලා ඇත. එල්ටීටීඊ යේ කෲරතර ක්‍රියාවලට ගොදුරු වූ අනාථ පිරිස් ආපසු යාම ප්‍රතික්ෂේප කරන අතර එල්ටීටීඊය සම්පූර්ණයෙන් ම ආයුධ බිම තැබීම ඔවුන් ගේ එක ම ඉල්ලීම වී ඇත. ත්‍රිකුණාමලයේ, මිහිඳුපුරේ පදිංචි අවතැන් වූ සිංහල ජනතාව ආපසු යාම සඳහා ආරක්ෂාව සහතික කරන ලෙස ඉල්ලා ඇත. 2002 දෙසැම්බරයේ දී දල වශයෙන් 300 ක් පමණ වූ පවුල් අතරින්, ආපසු පැමිණ ඇත්තේ හුදෙක් පවුල් 125 ක් පමණි.

# 3. සිදු වූ දේපල හානි සහ පාඩු

## 3:1 ඉඩම් සහ නිවාසවලට සිදු වී ඇති හානිය

සටන් වැදීම, කොල්ලකෑම් සහ නො සලකාහැරීම් නිසා දේපල සහ යටිතල පහසුකම්වලට සිදු වූ හානිය සහ සාම ක්‍රියාවලියේ අවිනිශ්චිත භාවය අවතැන්වූවන් යළි පදිංචි කිරීමේ දී ඇති වන ප්‍රධාන දුෂ්කරතා වශයෙන් හඳුනා ගෙන තිබේ.



***යාපන අර්ධද්වීපයේ චාවාකච්චේරියේ හානියට පත් දේපල***

අවතැන් වූ වාර ගණනට සමාන වාර ගණනක් අවතැන් වූ ජනතාව තම පදිංචි ගේ දොර යළි ගොඩනැගීමට සිදු විය. අතමිට මුදල් ඇති පිරිස් ආපසු තම පැරණි ගේ දොර පදිංචියට පැමිණ ඇත. මුදල් අහේනිය නිසා ආපසු පැමිණීමට නො හැකිව සිටින පුද්ගලයින්ට රජයෙන් හෝ රාජ්‍ය නො වන සංවිධාන මඟින් යම් ආධාර වැඩසටහන් යටතේ වුව කළ යුතුව ඇත. මේ තත්ත්වය වඩාත් උග්‍රවීමට එක් ප්‍රධාන හේතුවක් වී ඇත්තේ ගොඩනැගිලි උපකරණ සඳහා අධික මුදලක් වැය කිරීමට සිදුවීම ය. කොළඹ දී රු. 300 කට මිල දී ගත හැකි සිමෙන්ති

කොට්ටයක් සඳහා යාපනයේ දී රු. 450 ක් පමණ ගෙවීමට සිදු වේ. එල්ටීටීඊය සහ හමුදා සහායක කණ්ඩායම් විසින් බදු පැනවීම්, සහ අනෙකුත් දූෂණ ක්‍රියා ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළ යාමට තවත් එක් හේතුවකි.

## 4 වෙනි සටහන

සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමට පෙර ගඩොල් නිෂ්පාදනය සහ ප්‍රවාහනය සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි නීති විරෝධී අයුරින් බදු පනවා තිබුණි.

| මුදල රු. | බදු අය කරනුයේ කුමක් සඳහා ද | බදු පනවා ඇත්තේ කා විසින් ද යනවග |
|---|---|---|
| රු. 1500 | මාස 9 පුරා ගඩොල් නිෂ්පාදනය කරනු ලබන එක් කණ්ඩායමක් සඳහා | එල්ටීටීඊ |
| රු. 500 | ගඩොල් කැපීමට අවශ්‍ය දර පැට වූ ගොන් කරත්තයක් සඳහා | එල්ටීටීඊ |
| රු. 250 | ට්‍රක් රථයකට පැට වූ ගඩොල් 1000 සඳහා | එල්ටීටීඊය. |
| රු. 15 | ගඩොල් 1000 සඳහා | ප්ලොට් |
| රු. 50 | සෑම පොලිස් මාර්ග බාධකය දී | පොලීසිය |

අර්බුදයට මැදි වූ පෙදෙස්වල බොහෝ නිවාස බෝම්බ දැමීම නිසා විනාශ වී තිබේ. එල්ටීටීඊ පාලනයට යටත් වන්නි ප්‍රදේශයේ සිමෙන්ති හෝ ගඩොල්වලින් තනන ලද ගොඩනැගිලි කලාතුරකින් දැකිය හැකි ය. බොහෝ වැසියෝ පොල් මඩුවල තාවකාලිකව පදිංචිව සිටිති. පරන්තන් හා මාන්කුලම් වැනි නගර බිමට සමතලා වී ඇත. රජයේ පාලනය යටතේ පවතින ප්‍රදේශවල ගොඩනැගිලි වලින් වැඩි සංඛ්‍යාවක් හානියට පත් වී තිබේ. පදිංචියක් නො මැති ගොඩනැගිලිවල වහලක් නැත. සුළු සුළු අලුත්වැඩියාවලින් පසු සමහර ගොඩනැගිලි පාවිච්චියට ගත හැකි වුව ද, බොහෝ ගොඩනැගිලි යළි සම්පූර්ණයෙන් ම තැනිය යුතුව තිබේ. ත්‍රිකුණාමලයේ නිවෙස් 42,896 ක් එක්කෝ හානියට පත් වී ඇත. නැතහොත් විනාශ වී තිබේ. මෙතෙක් නිවෙස් 14,938 ක් පමණක් අලුතින් තනා නිමකර තිබේ. යාපන නගරයේ මුස්ලිම් නිවාස 90% ක් විනාශ වී ඇති බවට ගණන් බලා තිබේ. 2% ක පදිංචි විය හැකි අතර, 890 ක් අලුත්වැඩියා කර තිබේ. අවතැන් වූ පවුල් විසින් අතහැර දමා ගිය ගොඩනැගිලි ද්‍රව්‍ය, ගේ දොර උපකරණ සහ චංචල දේපල එක්කෝ කොල්ල කා තිබේ. නැතහොත් නො සලකා හැරීම නිසා විනාශයට පත්ව තිබේ. ඇතැම් ගොඩනැගිලිවල අත්තිවාරම් පවා අතුරුදහන් වී ඇත.

අත්හැර දමන ලද ඉඩකඩම් ශුද්ධ පවිත්‍ර කළ යුතුව තිබේ.

මාස හයකට පසු මූසාලි පෙදෙසේ මුස්ලිම් ජාතිකයින්ට ශුද්ධ පවිත්‍ර කිරීමට හැකි වී ඇත්තේ සුළු බිම් ප්‍රමාණයක් පමණි. අතහැර දමන ලද ප්‍රදේශවල වල් අලි සැරි සැරීම ආපසු තම ගම්බිම් බලා පැමිණෙන ජනතාවට තර්ජනයක් වී තිබේ.

පාසල්, රෝහල්, ප්‍රජා මධ්‍යස්ථාන, ප්‍රාදේශීය පරිපාලන ගොඩනැගිලි, විදුලිය සහ ජල සම්පාදනය ඇතුළු යටිතල පහසුකම් සම්පූර්ණයෙන් ම විනාශ වී ඇත. පාසල් නො මැති කම, ගමනාගමනය සහ රෝහල් වැනි පහසුකම් නො තිබීම අවතැන්වූවන් ආපසු ඒමට හේතුවක් වශයෙන් දක්වා ඇත. අවතැන්වූවන් ආපසු පදිංචිය සඳහා පැමිණි පෙදෙස්වල පාසල් ගොඩනැගීම සඳහා බලධාරීන් ප්‍රමුඛත්වය ලබා දෙනු ඇත.



*පල්ලායි දුම්රියපල - ටිම් ඩිකින්සන්*

අවතැන්වූවන්ට මුහුණ පෑමට සිදුවන විවිධ දුෂ්කරතා වළක්වාලීම සඳහා යටිතල පහසුකම් යළි ගොඩනැගීම සහ පුනරුත්ථාපනය කිරීම සැලසුම් කිරීමේ දී අවතැන් වූ පිරිස්වල සහභාගිත්වය අවශ්‍ය වේ. යටිතල පහසුකම් හානියට පත් නොවී ඇති අවස්ථාවල දී වුව ද, පිරිස් බලය සහ සම්පත් ඌණතාව නිසා සේවා සැපයීමට බාධා සිදු වේ.

වව්නියා, මන්නාරම, කිලිනොච්චි සහ මුලතිව් යන දිස්ත්‍රික් හතරේ 600,000 ක ජනගහනයකට සේවය සලසන වව්නියාව මූලික රෝහලේ ඇඩි කාර්යය මණ්ඩල සහ වෛද්‍ය උපකරණ හිඟයක් පවතී. 34,142 ක ජනගහනයකට සෞඛ්‍ය පහසුකම් සැලසීම සඳහා එල්ටීටීඊ පාලනයට නතු වී තිබෙන මන්නාරම ප්‍රදේශයේ සේවය සඳහා ඇත්තේ එක් වෛද්‍යවරයෙක් පමණි.

## 3:2 ඉඩම්වල මායිම් හඳුනා ගැනීම.

ඇතැම් ආපසු පැමිණි අවතැන් වූ පිරිස්වලට තම පැරණි දේපලට අයත් මායිම් හඳුනා ගැනීම අපහසු වී තිබේ. ගොඩනැගිලි විනාශ වීම හා කැලෑවෙන් වැසී යාම මෙයට හේතුවයි. බොහෝ අවතැන් වූ වැසියෝ තම ඉඩම්වල මායිම් වශයෙන් විවිධ ගස් වර්ග යොදා ගනිති.

බෝම්බ හෙළීමෙන් විනාශ වූ බොහෝ මුස්ලිම් වැසියන් සතු නිවෙස් අත්හැර දමා තිබීම නිසා ඒවායේ ගොනඩගිලි උපකරණ සහ අත්තිවාරම්වලට දමා තිබූ කලු ගල් පවා සොරා ගෙන ඇතිබවට වාර්තා විය. ලේඛන ආධාරයෙන් පවා මායිම් තහවුරු කර ගැනීම අපහසු වී තිබේ. මෙය දැනට එතරම් බරපතල ප්‍රශ්නයක් නො වන මුත්, ආපසු පැමිණි පිරිස් සංඛ්‍යාව වැඩි වීමත් සමග තත්ත්වය උග්‍රවීමට බොහෝ විට ඉඩ ඇත. ඒ හැරුණ විට ඊළඟ පරම්පරාවට මායිම් නො මැතිවීම බරපතල ප්‍රශ්නයක් වනු නො අනුමානයි.



**මන්නාරමේ, මුස්ලිම් ප්‍රදේශයේ ආපසු පදිංචිය සඳහා පැමිණි මුස්ලිම් ජාතිකයකු විනාශ වූ තම නිවස තිබූ ස්ථානයේ සිටින අයුරු**

## 3:3 ජීවනෝපායන් යළි ආරම්භ කිරීම

අවතැන් වනතෙක්, උතුරු - නැගෙනහිර ජනතාව මසුන් මැරීම, කෘෂිකර්මය සහ ව්‍යාපාරික කටයුතු වැනි සුපුරුදු ජීවනෝපායන්හි නිරතව සිටිය හ. නැවත සුපුරුදු ජීවනෝපායන් ආරම්භ කිරීමේ දුෂ්කරතාව නිසා සරණාගතයින් ගේ ආපසු පැමිණීම ප්‍රමාද වී තිබේ. අතලොස්සක් පමණ පවුල්වලට ගෙවන පලදායිතා ව්‍යාපාර දීමනාව හැරුන විට ආපසු පැමිණෙන ජනතාවට රජයෙන් වෙනත් ආධාර කිසිවක් නො ලැබේ. (3:4 ඡේදය බලන්න.) ඇතැම් රාජ්‍ය නො වන සංවිධාන විසින් අවතැන් වූවන් සඳහා පසු සම්පත් හෝ නිපුණතා පුහුණුව සපයා දී ඇත. කෙසේ වුව ද, අවතැන් වීම සහ අර්බුදය නිසා ආර්ථික සම්පත් අහිමිවීම විශාල ලෙස සිදු වී ඇති නිසා ආධාර සැපයීම අවශ්‍ය ය. එසේ ම ආපසු පැමිණෙන පිරිස්වල බහුතරයට අලුතින් ම තම ජීවනෝපායන් ආරම්භ කිරීමට සිදු වීම ද ආධාර සැපයීම අවශ්‍ය වීමට තවත් හේතුවකි. අවතැන්වීමේ හේතුවෙන් ආදායම අඩු වීමට අතිරේකව, ගොවීන්ට තමන් සතු පසුසම්පත, කෘෂි උපකරණ, ට්‍රැක්ටර්, කරත්ත, ඉසීමේ උපකරණ, පොහොර යනාදිය ද අහිමි වී ඇත. කෘෂිකර්මය ආරම්භ කිරීම සඳහා ඉඩකඩම් යළි සැකසීම අවශ්‍ය වේ. ගුවනින් බෝම්බ හෙළීම නිසා පොල් වගාවන් විනාශ වී තිබේ. ධීවරයින්ට ස්වකීය ආම්පන්න අහිමි වී ඇත. ව්‍යාපාරිකයින් ගේ බඩු තොග, උපකරණ හා ව්‍යාපාරික ස්ථාන සියල්ලක් ම පාහේ විනාශ වී තිබේ. දේපල පාඩුවලට අතිරේකව, මූල්‍ය අපහසුතා සහ ආධාර නො ලැබීම ඇතුලු විවිධ දුෂ්කරතා රාශියක් උතුරු ප්‍රදේශයේ ජනතාව ගේ ආර්ථික ක්‍රියාදාමයට හරස් වී තිබේ. මේවා ප්‍රමුඛත්වය ආකාර පෙන්වා නො මැත.

- ගමනාගමනය සහ මහාමාර්ග, වාරිමාර්ග පද්ධති, වෙළඳ පොළ සහ විදුලිය සැපයීම ඇතුලු යටිතල පහසුකම් නො මැති වීම.

- දක්ෂතා නො මැති වීම සහ අහිමිවීම. අවතැන්වීම නිසා වර්තමාන පරපුරට සිය දෙමව්පියන් නිරතව සිටි ගොවිතැන හෝ ධීවර කර්මාන්තය වැනි වෘත්තීන්වල යෙදීමට නො හැකි වීම.

බොහෝ දෙනෙකුට හුදෙක් අනියම් කම්කරුවන් වශයෙන් රැකියාව කර ඇති බැවින් පුහුණුවක් අවශ්‍ය ය.

- ★ එල්ටීටීඊය විසින් බදු පැනවීම - ව්‍යාපාර සහ කෘෂිකර්මාන්තය වැනි ආර්ථික කටයුතුවලට එල්ටීටීඊ යෙන් බදු පැනවීම නිසා විශේෂයෙන් මුස්ලිම්වරුන්ට ආපසු පැමිණීම අපහසු වී තිබේ. කුඹුරු අක්කරයකට අය කරන සාමාන්‍ය මුදල රු. 1000 කි. කිලෝ ග්‍රෑම් 50 ක වී මල්ලක් සඳහා රු. 20 කි.

- ★ ආපසු පැමිණි පුද්ගලයින් පදිංචි ප්‍රදේශවල ස්වකීය නිෂ්පාදන අලෙවිය සඳහා වෙළඳපොළක් පිහිටා නො මැත. ප්‍රදේශයේ පදිංචි කරුවන් සහ මෙසේ ආපසු පැමිණි පිරිස් සතු ක්‍රය ශක්තිය හීන වී ඇති නිසා තත්ත්වය වඩාත් උග්‍ර වී ඇත.

- ★ ව්‍යාපාරිකයින් සහ ඉඩම් හිමියන් ගෙන් වැඩ දෙනෙක් ආපසු පැමිණ නො මැති හෙයින් එදිනෙදා කුලී වැඩක් කර ජීවිත්වන පිරිස්වලට රැකියා අවස්ථා අහිමි වී තිබේ.

- ★ ධීවර කර්මාන්තය සඳහා පැනවී ඇති සීමාවන් : සටන් විරාම ගිවිසුම ක්‍රියාත්මක වී ඇතත් ධීවරයින් ගේ මුහුදු යාම ශ්‍රී ලංකා නාවුක හමුදාව විසින් සීමා කර තිබේ.

- ★ ව්‍යාපාරික ස්ථාන පවත්වා ගෙන යාම සඳහා ලබා දී ඇති බදු කාලය හමාර වී ඇතත්, අයිතිකරුවන්ට ස්වකීය පැරණි ව්‍යාපාරික ස්ථාන ආපසු ලබාගැනීම අපහසු වී ඇත. ඒ අනුව කලින් යාපන නගරයේ බදු ක්‍රමය යටතේ ව්‍යාපාරික ස්ථාන ලබාගෙන සිටි මුස්ලිම්වරු එම ස්ථාන ආපසු තමන් වෙත ලබා දෙන ලෙස හෝ ස්වකීය ආරම්භක ආයෝජනය අහිමි වීමේ පාඩුවට වන්දි ලබාදෙන ලෙස හෝ ඉල්ලා සිටි ය හ.

- ★ අනන්‍යතාව සහ දේපල අයිතිය පිළිබඳ අවශ්‍ය ලේඛන නො මැති වීම නිසා බැංකු ණය හෝ රක්ෂණය ලබාගැනීම අපහසු වී තිබේ.

මෙම දුෂ්කරතාවන් නිසා ආපසු පැමිණීමේ අපේක්ෂාවෙන් පසුවන බොහෝ පිරිස් කඩින් කඩ හෝ කණ්ඩායම් වශයෙන් පැමිණෙති. සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු මිහිඳුපුර කඳවුරේ සිටි ඇතැම් සිංහල අවතැන් වූ පිරිස් නාමල් වත්ත සහ විල්ගම්වෙහෙර ප්‍රදේශවල පිහිටි තම කුඹුරු කරා පැමිණ වගා කටයුතු ආරම්භ කිරීමේ අපේක්ෂාවෙන් ඒවා හෙළිපෙහෙළි කරමින් සිටිති. එහෙත් කිසිවෙක් තම වගා කටයුතු ආරම්භ කර නො මැත. ත්‍රිකුණාමල ප්‍රදේශයේ සමහර සිංහල පිරිස් ධීවර කටයුතු ආරම්භ කර ඇතුවා සේ, මුස්ලිම්වරුන් ද යාපන ප්‍රදේශයේ තමන්ට අයිතිව තිබූ දේපල වෙත ආපසු පැමිණ වගා කටයුතු සහ ආදායම් උපයා ගැනීමේ ව්‍යාපාර ආරම්භ කර තිබේ. ආපසු පැමිණෙන පිරිස්වලට රජයෙන් හෝ වෙනත් රාජ්‍ය නො වන සංවිධාන වලින් ආධාර ලැබීම රඳාපවතිනුයේ ඔවුන් තම අවතැන්වීම සිදු වූ දිස්ත්‍රික්කවල ලියාපදිංචිය අවලංගු කිරීම මත ය. එනිසා ඉහතින් සඳහන් කළ ආපසු පැමිණෙන පිරිස්වලට ආධාර ලැබීමට සුදුසුකම් නො මැත. (3:4 බලන්න.) තව ද බොහෝ ආපසු පැමිණෙන පදිංචිකරුවන් ප්‍රජාවක් හෝ ගමක් වශයෙන් ආපසු පැමිණීම අපේක්ෂා කරන බැවින් බලධාරීන් සහ ජාත්‍යන්තර හා දේශීය රාජ්‍ය නො වන සංවිධාන එම ප්‍රජාවන් ගේ අවශ්‍යතාවලට සරිලන පරිදි, ඔවුන් සමඟ සාකච්ඡා කර ඒ ඒ ප්‍රදේශවලට පිවිසීමේ දී ප්‍රමුඛත්වය ලබා දීමට කටයුතු කළ යුතු ය.

## උතුරේ මුස්ලිම්වරු

උතුරු මුස්ලිම්වරු කෘෂිකාර්මික, ධීවරයන්, ව්‍යාපාරික කටයුතුවල නිරතව සිටිය හ. යාපන නගරයේ මුවර් වීථියේ පදිංචිව සිටි මුස්ලිම්වරුන් ගේ සංඛ්‍යාව, යාපන අර්ධද්වීපයේ මුස්ලිම් ජනගහනයෙන් 75% කි.

ප්‍රදේශයේ පදිංචි වැසියන් ගෙන් බහුතරය වෙළඳ කටයුතු සහ සේවා සැපයීමේ කටයුතුවල නිරතව සිටිය හ. මුලතිව් සහ මන්නාරම් දිස්ත්‍රික්කවල මුස්ලිම් වරුන්ගේ ප්‍රධාන ජීවනෝපාය වී තිබුණේ කෘෂිකර්මය, ධීවර කටයුතු, ඇඳුම් මැසීම සහ වෙළඳ හා වාණිජ කටයුතු ය. මුස්ලිම්වරු දකුණු වව්නියාවේ පදිංචිව සිටි අතර සුළුතරයක් කිලිනොච්චියේ ද පදිංචිව සිටියහ.

1991 දී ආචාර්ය එස්.එච්. හිස්බුල්ලා විසින් මෙහෙයවන ලද පෘථුල අධ්‍යයනයක් මගින් පලවා හරින ලද මුස්ලිම්වරු සතු චංචල ස්ථිර ආර්ථික සහ ප්‍රජා වත්කම් පිළිබඳ වැදගත් තොරතුරු රැසක් හෙළිදරව් කර තිබේ; ඉන් සමහරක් මෙසේ ය :-

* මුස්ලිම් ආගමික ස්ථාන, දේවස්ථාන සහ මුස්ලිම් පාසල් සහ කෘෂිකාර්මික ඉඩම්, ගොඩනැගිලි සහ වාහන යනා දී දේපල සහ විවිධ වත්කම්,
* අවම වශයෙන් අක්කර 30,000 පමණ වූ කුඹුරු, පොල් ඉඩම් ඇතුළු අනෙකුත් ඉඩම්, කෘෂි උපකරණ සහ ආම්පන්න සහ පශු සම්පත් හා කුකුළන් වැනි සතුන් සඳහා වූ ආදායම
* ධීවර සහ බෝට්ටු, මෝටර් යන්ත්‍ර සහ මාළු ඇල්ලීමේ දැල් ව්‍යාපාරික ස්ථාන සහ දල වශයෙන් 2395 පමණ වූ වාණිජ හා කාර්මික ආයතන

මුස්ලිම්වරු සතුව තිබූ ආර්ථික වත්කම්, නිවාස, රූපවාහිනී සහ ගුවන්විදුලි යන්ත්‍ර, ශීතකරණ, ලීබඩු, විදුලි සහ විද්‍යුත් උපකරණ සහ වාහන කොල්ලකාගෙන ඇති නිසා හෝ විනාශ වී ඇති බැවින් ආපසු ලබාගැනීමේ හැකියාවක් නැත.



*යාපනයේ, මුවර් වීථියේ විනාශයට පත් මුස්ලිම් දේවස්ථානයක්*

පුත්තලමේ අවතැන්වූවෝ ඉතා අසීරු තත්ත්වයකට මුහුණ පා සිටිති. 1994 වන තෙක් ඔවුන්ට සුළු වශයෙන් රජයෙන් ආධාර ලැබුණි. 1990 දී උතුරු කරයෙන් එල්ටීටීඊය විසින් පලවාහරින ලද මුස්ලිම්වරුන් පුත්තලමට පැමිණීම නිසා එහි ජනගහනය දල වශයෙන් දෙ ගුණ විය. ප්‍රදේශයේ ආර්ථිකයට මෙන් ම රාජ්‍ය සේවා ආයතනවලට ද ඉන් විශාල බරක් පැටවිණි. එ බැවින් රජයේ රැකියා ලබාගැනීමේ දී, අධ්‍යාපනය, සෞඛ්‍යය, සමාජ සේවා සහ සමෘධි ආධාර වැනි කරුණුවල දී මුස්ලිම් වරුන්ට කුඩම්මා ගේ සැලකිලි ලැබිණි. අවතැන් වූ ශ්‍රමිකයින් ගෙන් 78% ක් ම රැකියා නො මැතිව සිටිති.

උතුරේ රජයේ පාලනය පවතින ප්‍රදේශවල මෙන් ම එල්ටීටීඊ පාලනයට නතු වී ඇති ප්‍රදේශවල ද එල්ටීටීඊය විසින් බදු පැනවීම සහ රත්රන්, යකඩ සහ ධීවර කටයුතු සම්බන්ධයෙන් පාලනයක් පවත්වා ගෙන යන බැවින් යළි උතුරේ තම ව්‍යාපාරික කටයුතු පවත්වා ගෙන යා නො හැකි බව බොහෝ මුස්ලිම් වරුන් ගේ අදහස විය. වාර්තා වී ඇති අයුරු වන්නි ප්‍රදේශයේ මුස්ලිම්වරුන් ගේ පොල් වගාවන් පවා එල්ටීටීඊ පාලනයට නතු වී ඇතැ යි වාර්තා වේ.

## 3:4 රජයෙන් හා වෙනත් ආයතනවලින් සැපයෙන ආධාර

ආපසු පැමිණෙන සරණාගතයින් සඳහා රජයේ එක්සත් ආධාර ව්‍යාපෘතිය යටතේ ආධාර සැපයේ. පුනරුත්ථාපන අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදනය කරනු ලබන ආධාර මුදල් ප්‍රාදේශීය පරිපාලනය විසින් ආපසු පැමිණෙන පිරිස් වෙත ලබාදෙනු ලැබේ. 2002 දෙසැම්බර්වල දී ආධාර මුදල රු. 65,000ක් පමණ විය. එහෙත් රජයට මුහුණදීමට සිදු වූ මූල්‍ය දුෂ්කරතා හේතුවෙන්, මූල්‍යාධාර සැපයීම අපහසු විය. මධ්‍යම රජය විසින් සපයන ලද සීමිත මුදල් පවා ප්‍රාදේශීය බලධාරීන් ගේ අභිමතය පරිදි බෙදා දී ඇති බව පහත දැක්වෙන නිදර්ශන වලින් පැහැදිලි වේ.

උතුරු ප්‍රදේශයේ මේ ආධාර මුදල හුදෙක් රු 15,000 කට පමණක් සීමා විය. නැගෙනහිර පළාතේ පවුල් කීපයකට රු. 7000 ටත් රු. 65,000 ටත් අතර මුදල් ප්‍රමාණයක් ලැබී ඇත. පේදුරු තුඩුවේ ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශ 35 න් එක කොට්ඨාසයක සාමාන්‍ය වශයෙන් පවුල් තුනකට රු. 15, 000 ක ආධාරය ලැබී ඇත.

ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශ අංක 401 සහ 403නේ පිළිවෙලින් පවුල් 134 ක් සහ 160 ක් අතුරින් එක් කොට්ඨාශයකින් පවුල් 5 බැගින් රු. 15,000 ආධාර දීමනාව පවුල් 10 ට ලබා දී තිබුණි.

පවුලේ ප්‍රමාණය මෙන් ම ආදායම සැලකිල්ලට ගනිමින් “කලින් පැමිණි අයට කලින් ප්‍රතිචාරය දැක්වීමේ” පදනම මත ග්‍රාමසේවා නිලධාරීන් විසින් අර්ථලාභීන් දස දෙනා තෝරා ගන්නා ලදී.

කිලිනොච්චිය කරා ආපසු පැමිණි පවුල් 11,388 න් පවුල් 1800 ක් පමණක් රජයේ එක්සත් ආධාර ව්‍යාපෘතිය යටතේ රු. 15,000 ආධාර මුදල ලබාගත් හ. දිසාපති පවසන ආකාරයට ආධාර වශයෙන් ආපසු පැමිණෙන පිරිස්වලට ලබාදිය යුතු මුළු මුදල රුපියල් දශලක්ෂ 172 ක් වුවත්, මධ්‍ය රජයෙන් ලැබී ඇත්තේ හුදෙක් රුපියල් දශ ලක්ෂ 29 ක් පමණි.

මඩකලපුවේ, කිරාන් සහ කංකිනොඩි ආදර්ශ ගම්මාන දෙකේ පදිංචි කළ අවතැන් වූ පවුල් සඳහා ස්ථිර නිවාස ඇතුලුව රු. 65,000/= ක මුළු ආධාර මුදලක් ලබා දෙන ලදී. කිරාන් ප්‍රදේශයේ දෙමළ පවුල් 100 ක් සඳහා එක් අයෙකුට පර්චස් 20 බැගින් රජයේ ඉඩම් බෙදාදෙන ලදී. අවතැන් වූ මුස්ලිම් පවුල් නැවත පදිංචි කිරීම සඳහා කන්කිනොඩි ප්‍රදේශයේ පෞද්ගලික ඉඩමක නිවාස 150 ක් තැනෙමින් තිබේ. 2003 ජනවාරි වන විට අවතැන් වූ පිරිස් සඳහා ගෙවීම පිණිස රජයේ එක්සත් ආධාර ව්‍යාපෘතියේ මුදල් කිසිවක් නො තිබුණි.

ත්‍රිකුණාමල ප්‍රදේශයේ ලියාපදිංචි අවතැන් වූ පවුල් 2051 න් දල වශයෙන් 300ක් පමණ තාවකාලික නිවාස රැකවරණය සඳහා රු. 7000/= ආධාර මුදල ලබා තිබුණි. 2001 දෙසැම්බර් මාසයට පෙර ආපසු පැමිණ පදිංචි වූ පවුල් වෙනුවෙන් රු. 59,934,000 ක හිඟ මුදලක් දිසාපති කාර්යාලය විසින් ගෙවීමට තිබීම අවධානයට ලක්විය යුතු කරුණකි.

## 5 වෙනි සටහන

**නැවත පදිංචි කිරීමේ ආධාර මල්ල - උතුරුකරය සඳහා වූ එක්සත් ආධාර ව්‍යාපෘතිය**

| එක්සත් ආධාර ව්‍යාපෘතිය | කලින් | සැලසුම් කළ | දැනට උතුරුකරයේ |
|---|---|---|---|
| පදිංචි කිරීමේ දීමනාව | රු. 2000 | අර්ථලාභීන් ගේ අභිමතය | රු. 2000 |
| නිෂ්පාදන ව්‍යවසාය ආධාරය | රු. 5000 | පරිදි රු. 25,000 ක මුදලක් වැය කළ හැකි ය. | රු. 5000 |
| කෘෂි මෙවලම් | රු. 1000 | | රු. 1000 |
| තාවකාලික නිවාස | රු. 7000 | | රු. 7000 |
| ස්ථිර නිවාස | රු. 50,000 | රු. 75,000 | x |
| එකතුව | රු. 65,000 | රු. 100,000 | රු. 15,000 |

අර්ථලාභීන් නැවත පදිංචි කළ සහ අලුතින් පදිංචි කළ සමහර අවතැන් වූ පිරිස් යළි පදිංචි කළ හා අලුතින් පදිංචි කළ සියලු අවතැන් පිරිස් ආපසු පැමිණෙන්නන් ගේ 3 - 15% සාමාන්‍යය

2002 නොවැම්බර් 25 දින පවත්වන ලද ඔස්ලෝ සාකච්ඡාවෙන් පසු, යළි ගම්බිම් බලා පැමිණෙන පවුලකට ආධාර වශයෙන් රු. 13,000/= ක මුදලක් ලබාදිය හැකි අයුරින් ජාත්‍යන්තර ප්‍රජාව අමෙරිකානු ඩොලර් දශලක්ෂ 30 ක මුදලක් සැපයීමට ප්‍රතිඥා දුන්නේ ය. නැවත පදිංචි කිරීමේ මූල්‍යාධාරය සැපයීමේ දී පවුලේ නායකත්වය ගෙන කටයුතු කරන කාන්තා පක්ෂය සතු වැඩි නම්‍යශීලී භාවයක් තිබීම වැදගත් ය. එය ඔවුන්ට කුලියට මිනිසුන් යොදවා තාවකාලික නිවාස තැනීම, අලුත්වැඩියා කිරීම, හෝ වටාපිටාව හෙළි පහළි කරවීම වැනි කාර්යයන් හි දී බෙහෙවින් ප්‍රයෝජන වන ගුණාංගයකි. අවතැන්වූවන් ගේ අවශ්‍යතා තක්සේරුකර බැලීමේ දී 5 සටහනින් මුදල් වෙන්කර දී ඇති පිළිවෙල වඩාත් නම්‍යශීලී විය යුතු ව ඇත. එය අවතැන් වූ පවුල්වල අවශ්‍යතා සපුරාලීමට සමත්වීම වැදගත් ය.

රජයේ එක්සත් ආධාර ක්‍රමය යටතේ ලබාදෙන ආධාර මුදල රු. 100,000 දක්වා වැඩිකිරීමට පුනරුත්ථාපන අමාත්‍යාංශය සැලසුම් කරමින් සිටී. මෙය සාර්ථක වුවහොත් විපතට පත් පවුල් 227,000 න් 100,000 කට පමණ සෙත සැලසේ. මෙය ලියන අවස්ථාව වන විට ප්‍රතිපාදනය

කර තිබෙන මුදල හුදෙක් එක් පවුලකට රු. 25,000/= බැගින් පවුල් 50,000 කට මුල් වාරිකය ලබාදීමටත්, පවුල් 10,000 කට දෙවන වාරිකය ලබාදීමටත් ප්‍රමාණවත් වේ.

ආධාර මුදල් බෙදා දෙන ආකාරය ගැන රජය මෙතෙක් තීරණයකට බැස නැත. ජීවිත හෝ දේපල අහිමිවීම සඳහා වන්දි ගෙවීමට මුදල් නො මැත.

'ආර් ආර් ඒ එන්' යෝජනා ක්‍රමය යටතේ, ඕනෑ ම පුද්ගලයෙකුට ජීවිත හා දේපලවලට කෙරෙන හානිය සම්බන්ධයෙන් වන්දි ඉල්ලා සිටිය හැකි ය. එය රු. 100,000 හෝ හානියෙන් 20% යන දෙකෙන් අඩු මුදල විය යුතු ය. බොහෝ අවතැන්වූවන් ආපසු නො ඒමටත්, හුදෙක් පවුලේ සාමාජිකයින් අතුරින් පිරිමියා පමණක් ආපසු පැරණි ඉඩකඩම වෙත ඒමටත් හේතුව මෙය බව හඳුනා ගෙන ඇත. පවුලේ සාමාජිකයින් තමන් අවතැන් වූ දිස්ත්‍රික්කවල පදිංචි වී සිට දිගින් දිගට ම වියලි ආහාර සලාකය සඳහා ලියාපදිංචි වී සිටින අවස්ථාවල එම පවුල්වලට අයත් ආපසු පැමිණෙන අනෙක් සාමාජිකයින්ට එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමින් සැපයෙන ආධාර ලැබීමට හිමිකමක් නො මැත.



***ආපසු පැමිණි මුස්ලිම්වරුන් - මුසාලි මන්නාරම් දිස්ත්‍රික්කය***

මෙය විශේෂයෙන් සිංහල සහ මුස්ලිම්වරුන්ට බලපානු ඇත. ඔවුන් ගෙන් බොහෝ දෙනෙක් ස්ථිර පදිංචිය සඳහා හිතකර පසුබිමක් ඇතිවීම කෙරෙහි අපේක්ෂාවෙන් සිටිති. මන්නාරමේ වෙප්පන්කුලම් ප්‍රදේශයට පිරිමින් දස දෙනෙක් ආපසු පැමිණ පදිංචිය සඳහා නිවෙස් තනමින් හා ගොවිතැන් ආරම්භ කරමින් සිටිති. ඔවුහු අවතැන් වූවන් වශයෙන් පුත්තලමේ ලියාපදිංචිවීම නිසා රජයෙන් හෝ වෙනත් සංවිධානයකින් කිසිඳු ආධාරයක් ලබන්නෝ නො වෙති. ඇතැම් මුස්ලිම් සංවිධාන පමණක් ඔවුන් ගේ පිහිටට පැමිණ ඇත.

## හදිසි ඉඩකඩ සැලසීම.

බොහෝ අවතැන් වූ පවුල්වලට ඔවුන් ගේ පැරණි ඉඩකඩම් හා නිවාස වෙත ආපසු යා නො හැකිව තිබේ. ඒවා විනාශ වී තිබීම එයට හේතුවයි. එසේ ම තවත් බොහෝ ආපසු පැමිණෙන පවුල්වලට ඔවුන් පදිංචිව සිටි භූමියෙන් ඉවත් කිරීම, හෝ ඒවායේ අයිතිකරුවන් ආපසු පැමිණීමේ හේතුවත් ඉන් ඉවත් වීමට සිදු වී තිබේ. මේ කාණ්ඩ දෙකට ම පදිංචිය සඳහා භූමියක් නො මැත. ආපසු පැමිණෙන හා පදිංචියට තැනක් නො මැති සරණාගතයින් සඳහා රජය විසින් සුභසාධන මධ්‍යස්ථාන විවෘතකර තිබේ. මෙබඳු පවුල් 301 ක් තාවකාලිකව ත්‍රිකුණාමලයේ ඇලස් ගාර්ඩ්න් සහ නිලාවේලි හි පිහිටුවා ඇති සුභසාධන මධ්‍යස්ථානවල රඳවා තිබීම මෙයට කදිම නිදර්ශණයකි.

ආපසු පැමිණෙන පවුල් සහ පදිංචි භූමියෙන් පලවා හරින ලද පවුල් සඳහා ඉක්මණින් තාවකාලික ඉඩකඩ අවශ්‍ය වී තිබේ. ප්‍රජා ගොඩනැගිලි විනාශ වූ හා වෙනත් එබඳු ගොඩනැගිලි නො මැති ගම් ප්‍රදේශවල මෙම තත්ත්වය උග්‍ර වී තිබේ. යාපනයේ සහ කිලිනොච්චිවල, මුස්ලිම් දේවස්ථාන 24, ප්‍රජා මධ්‍යස්ථාන 17 සහ සුසාන භූමි 5 ක් ඇතුලුව මුස්ලිම් ප්‍රජා දේපල විනාශයට පත්ව ඇත. යාපන නගරයේ පදිංචි වී සිටිය දී පලවා හරින ලද මුස්ලිම් ජාතිකයින් වෙනුවෙන් උතුරේ මුස්ලිම් සංවිධානය, මූවර් වීථියේ ඔස්මානියා විදුහල ලබාදෙන ලෙස යාපන දිසාපතිවරයා ගෙන් ඉල්ලීමක් කර තිබේ.

# 4. අවතැන් වූ කාන්තාවන්

ශ්‍රී ලංකාවේ අවතැන් වූ ජනගහනයෙන් බහුතරය කාන්තාවන් වුව ද ඔවුනට බලපාන ප්‍රශ්න හෝ වෙනත් දේ සම්බන්ධයෙන් මෙතෙක් කිසිවකු ගේ අවධානය ලැබී නො මැත. පවුලේ ප්‍රධානියා ප්‍රමුඛ අනෙකුත් සාමාජිකයින් අහිමිවීම, පවුල ආරක්ෂා කර ගැනීම, බාහිර තර්ජනවලට මුහුණ දීම (දූෂණය හා ලිංගික හිංසන ක්‍රියා ඇතුළුව) මානසික වියවුල්, බලරහිත වීම සහ සමාජයේ කොන් වී සිටීමට ලක්වීම ආදිය ඉන් සමහරකි. ඉඩම් හා දේපල පිළිබඳ ප්‍රශ්න කාන්තාවන් ගේ මානව හිමිකම්, ජීවන තත්ත්වයන් සහ ජීවනෝපාය හා බැඳී සිටී.

අවතැන් වූ පවුල්වලින් 60% ක ම කාන්තාව ගෘහමූලිකයා වශයෙන් වගකීම ඉටුකිරීමේ තත්ත්වයට පත්ව ඇතැ යි වව්නියාවේ රාජ්‍ය නො වන සංවිධාන හමුවක දී ප්‍රකාශවිණි. 1995 දී වැන්දඹුවන් 21,400 වූ බව පැවසේ. අද එය 25,000 ඉක්මවා තිබේ. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ 1983 - 2001 අතර කාලය තුළ අවතැන්වීමට ලක් වූ පවුල් 56745 ක වැන්දඹුවන් පමණක් 8757 ක් සිටි බව පැවසේ. කාන්තාවන්ට බලපාන ප්‍රශ්න සම්බන්ධයෙන් වඩාත් සමීප වීම සඳහා මෙම සංඛ්‍යා ලේඛන තවදුරටත් ප්‍රයෝජනවත් වේ.

සුහසාධන මධ්‍යස්ථානවල ජීවත්වන කාන්තාවන්ට මෙන් ම ආපසු තම ගම්බිම් කරා පැමිණෙන කාන්තාවන්ට මුහුණ දීමට සිදුවන ඉඩම් හා දේපළ පිළිබඳ ගැටලු ප්‍රමාණය විශාල ය. ආධාර සහ වන්දි මුදල් බෙදාදීමේ දී අනුගමනය කරනු ලබන සාධාරණ නො වන ප්‍රතිපත්ති, ඉඩම් ශුද්ධ පවිත්‍ර කර නිවාස තැනීමේ අභියෝගය සහ පවුලේ බර ගෙනයාමේ දී දැරීමට සිදුවන වගකීම් ඉන් සමහරකි. ඉඩම් සහ දේපළ සඳහා නෛතික උරුමය තහවුරු කරගැනීමේ දී කාන්තාවන්ට මුහුණ පෑමට සිදුවන ප්‍රශ්න වඩාත් සංකීර්ණයි.

## 4:1 බෙදාහැරීම, අත්කර ගැනීම සහ අයිතිය

### රජය සහ හදිසි ආධාර / වන්දි ගෙවීම

ආධාර බෙදාදීමේ සහ වන්දි ලබාදීමේ සමහර ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි කාන්තාවක් සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීමේ දී සාධාරණත්වය ඉටු වී නො මැත. දිසාපතිවරයා විසින් එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම වෙත භාරදෙන ලද පවුල් සංඛ්‍යා අඩංගු ලැයිස්තු පවුලේ පිරිමි සාමාජිකයින් මත පදනම් වී ඇත. එ බැවින් ආධාර බෙදාදීමේ දී එය විධිමත් වශයෙන් පවුලේ පිරිමි සාමාජිකයා හරහා සිදුවිය යුතු වේ. එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමේ නියෝජිතයින් අවධාරණය කරනු ලබන්නේ කාන්තාවන් හරහා ආධාර බෙදාදීමේ දී එය වඩාත් ඵලදායී වන බැවින් ඔවුන් එම ක්‍රමය අනුගමනය කරන බවයි. කාන්තාව සතු

කාර්යයභාරය නිල වශයෙන් පිළිගැනීමට ලක්විය යුතු අතර ආධාර බෙදාදීමේ දී පවුල නියෝජනය කිරීමේ පොදු වගකීම ඇය වෙත පැවරිය යුතු වේ. සැමියා ගේ මරණින් පසු බිරිය වන්දි ලබාගැනීමේ දී සැමියා මියගිය ආකාරය තහවුරු කෙරෙන සාක්ෂි රජයට අවශ්‍ය ය. එසේ නො මැති වුවහොත් ඇයට වන්දි ලබාගැනීමට නො හැකි ය. අතුරු දහන්වීම්වල දී සාක්ෂියක් නො මැතිව සිදුවන මරණ සම්බන්ධයෙන් ද කාන්තාවට වන්දි ලබාගත නො හැකි ය. මියගිය පුද්ගලයින් ගේ මෘත ශරීර භාරදීමට පෙර, පවුලේ සාමාජිකයෙකු විසින් මරණය එල්ටීටීඊය හෝ ශ්‍රී ලංකා යුද හමුදාව විසින් නො ව වෙනත් කවුරු හෝ කෙනෙක් අතින් සිදු වූ බව සඳහන් වන ප්‍රකාශයකට බොහෝ විට අත්සන් කිරීමට සිදුවන බව එක් කාන්තාවක් ප්‍රකාශ කළා ය. එ බැවින් වැන්දඹුව ඇතුළු පවුලේ සාමාජිකයින්ට මිය ගිය පුද්ගලයා වෙනුවෙන් වන්දියක් ලබාගැනීමේ ඉඩකඩ වැසී යනු ඇත. මෙබඳු ගැටලු සම්බන්ධයෙන් ස්වකීය අවධානය යොමු කිරීමට දැන් රජයට හැකියාව තිබේ. ආධාර බෙදාදීමේ රජයේ නව වැඩපිළිවෙල යටතේ කාන්තා මූලික පවුල් ද ප්‍රමුඛත්වය මත වන්දි ලබාගැනීමට සුදුසුකම් ලබා තිබේ. කාන්තාවන්ට ගෙවනු ලබන ආධාර මුදල් වැඩිකිරීම සලකා බැලීම ද යෙහෙකි. ආධාර බෙදා දෙනු ලබන ආකාරය පිළිබඳ කාන්තාවන් දැනුවත් කළ යුතු ව ඇත. එසේ නො වුවහොත්, නො දන්නා කම නිසා ම ආධාර ලබාගැනීමේ දී කාන්තාවන් විවිධ ලිංගික අපචාරයන්ට ගොදුරු වීමට ඉඩ තිබේ.

## ඉඩම් හා දේපළ සම්බන්ධ නීත්‍යානුකූල අයිතිය

ඉඩමක් පවරාදීම, ඉඩමක නැවත පදිංචි කරවීම සහ උරුමයෙන් අයිතිය ලැබීම යන මේ කරුණු සම්බන්ධයෙන් නීත්‍යානුකූ අයිතිය ලබාගැනීමේ දී කාන්තාවන්ට විවිධ දුෂ්කරතාවලට මුහුණ පෑමට සිදු වේ. සැම කරුණක් සම්බන්ධයෙන් ම ඉඩමක් සතු නීත්‍යානුකූල අයිතිය තහවුරු වීම වැදගත් ය.

ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ බෙදා දෙනු ලබන ඉඩම්වල අයිතිය ඍජුව ම පවුලේ ප්‍රධානියා නමින් ලේඛන ගත වේ. සැමියා මිය ගිය පවුලක බිරියට මෙබඳු ඉඩමක අයිතිය නීත්‍යානුකූලව හිමිවන්නේ නැත.

හවුල් අයිතිය පිළිගන්නා තෙක් කාන්තාවට ඉඩම සම්බන්ධයෙන් නීත්‍යානුකූල අයිතියක් නැත. නැවත පදිංචි කිරීමේ යෝජනා ක්‍රමවල කාන්තාවට ඉඩම් සඳහා ඇති නීත්‍යානුකූල අයිතිය සම්බන්ධයෙන් පුළුල් ප්‍රචාරයක් දීමෙන් කාන්තාවන් මුහුණ පාන ප්‍රශ්න බොහෝ දුරට අවම කළ හැකි ය.

රජයෙන් ලබා දුන් ඉඩමක අයිතිකරු වන පවුලේ ප්‍රධානියා මිය යාමට පෙර ඉඩමේ අයිතිය සඳහා තම උරුමක්කාරයා වශයෙන් බිරිය ගේ නම ඇතුළත් කර නො මැති අවස්ථාවල දී ඇයට ඒ සඳහා හිමිකමක් නො ලැබෙනු ඇත. රටේ සාමාන්‍ය නීතිය (තේසවලාමෛයි නීතිය) සහ මුස්ලිම් නීතිය යටතේ උරුමයෙන් හිමිවන අයිතිය පිළිබඳ විවිධ ප්‍රශ්න පැන නැඟේ. (8:1 බලන්න.)

## 4:2 ආපසු පැමිණෙන සරණාගතයින් සම්බන්ධයෙන් පැන නඟින ගැටලු

දේපළ අත් කරගැනීම සහ එහි අයිතිය පිළිබඳ ප්‍රශ්න හැරුන විට ආපසු තම භූමිය වෙත පැමිණෙන කාන්තාවන්ට දේපල සහ ඉඩකඩම් හා සම්බන්ධ මානව හිමිකම් සහ ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නවලට මුහුණ දීමට සිදුවනු ඇත.

## ආරක්ෂාව

අවතැන් වූ කාන්තාවන්ට සහ ඔවුන් ගේ පවුල්වලට ස්වකීය පැරණි ගම්බිම් බලා ආපසු ඒමට එරෙහිව ඇති එක් බාධකයක් නම් ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයයි. මෙම කාන්තාවෝ අඩු තරමින් තම සැමියන් තනිවම පැරණි ගේ දොර, ඉඩකඩම් බැලීම හෝ ශුද්ධ පවිත්‍ර කිරීම සඳහා පැමිණීම ගැන ද බියෙන් සැලෙති. පසුගිය කාලවල ඇති වූ 'අතුරුදහන්වීම්' එයට ප්‍රධාන හේතුවයි. එල්ටීටීඊ පාලනයට නතු වී ඇති පෙදෙස්වලට පැමිණීම අනතුරු දායක ය. එයට හේතු වී ඇත්තේ එල්ටීටීඊය දරුවන් බලෙන් පැහැර ගැනීම ය. ඒ හැරුණ විට තාවකාලික නැවතුම් පලවල සිට වරින්වර පැරණි ගේ දොර ඉඩකඩම් කරා යාමේ දී කාන්තාවන්ට විශේෂයෙන් මාර්ග බාධකවල දී ලිංගික අතවරවලට ගොදුරු වීමට සිදු වේ.

## යටිතල පහසුකම්

යුද්ධයෙන් විපතට පත් ප්‍රදේශවල යටිතල පහසුකම් විනාශවීම කාන්තාවන්ට මුහුණ පෑමට සිදු වූ තවත් ඇබැද්දියකි. පාසල් සහ සෞඛ්‍ය පහසුකම් නො මැති වීම නිසා ඒවා ගෙදර දීම සපුරාලීමේ වගකීම කාන්තාව මත පැවරේ. බොහෝ අවතැන් වූ පිරිස් ආපසු පැමිණීමේ බලාපොරොත්තු යටිතල පහසුකම් වැඩිදියුණු කරන තෙක් කල් දමා ඇත. ප්‍රතිපත්ති ප්‍රමුඛත්වයන් සම්බන්ධයෙන් කාන්තාවට හඬක් නැඟීමට නො හැකිවීම නිසා යටිතල පහසුකම් කවදා, කෙසේ ඇති කළ යුතු දැයි යෝජනා කිරීමේ අවස්ථාව අහිමි වී තිබේ.

## බිම් බෝම්බ, ඉඩම පදිංචිය සඳහා ශුද්ධ කිරීම සහ යළි ගොඩනැගීම්

පවුලක් ඉඩමේ යළි පදිංචියට පැමිණීමෙන් පසු, පවුලේ ප්‍රධානියා වශයෙන් ක්‍රියා කරන කාන්තාවන් ඇතුළු, පොදුවේ කාන්තාවන් පිට පැවරෙන අභියෝගයෙකි, ඉඩම ශුද්ධ පවිත්‍ර කර, ගොඩනැගිලි තැනීම. සාම්ප්‍රදායික වශයෙන් වගා කටයුතුවල යෙදීම පවුලේ පිරිමියා ගේ වගකීම වන අතර ඉඩමේ පවත්නා ගොඩනැගිලි නඩත්තුව කෙරෙහි ද ඔහු යොමු විය යුතු යි. සැමියා මිය ගිය පවුල්වල මෙම වගකීම කාන්තාව වෙත පැවරී ඇත.

## ජීවනෝපාය සහ රැකියා අවස්ථා

ජීවනෝපාය සහ රැකියා ක්ෂේත්‍රයෙහි යම් සාධනීය වර්ධනයක් සිදු වී තිබේ. ආදායම ඉපැයිය හැකි විවිධ හා ක්‍රියාකාරකම් හරහා කාන්තාවන්ට රැකියා අවස්ථා ලබා ගැනීම පහසු වී තිබේ. කාන්තාවට සුපුරුදු රැකියා වශයෙන් සලකනු ලබන ඇඳුම් මැසීම, රෙදි වියීම, සතුන් ඇති කිරීම, කෑම පිසීම සහ ආගන්තුක වශයෙන් සැලකෙන යාන්ත්‍රික වැඩ වැනි විෂයයන් සම්බන්ධයෙන් ද රාජ්‍ය නො වන සංවිධාන විසින් පුහුණුව ලබා දෙනු ලැබේ. යටිතල පහසුකම් දියුණු කිරීමේ ලා කාන්තාවට සාම්ප්‍රදායික නිම් වලලු බිඳ දමමින් තම ශ්‍රමය කැපකිරීමට සිදු වී ඇත. ආදායම් ඉපැයීමේ ව්‍යාපෘති කාන්තාව බලාත්මක කිරීමට උපකාරී වී තිබේ. අවතැන් වීමට පෙර හුදෙක් නිවසේ බිත්ති හතරට පමණක් සීමා වී සිටි කාන්තාව දැන් විවිධ සංවිධාන පිහිටුවා ඒවායේ කටයුතුවල නිරත වී සිටින බව එක්තරා පුද්ගලයෙක් පැවසී ය. අද මෙම කාන්තාවෝ රජයේ කර්මාන්තශාලා, රාජ්‍ය නො වන සංවිධාන සහ සාප්පුවල රැකියා කරන අතර, රැස්වීම් සහ සම්මන්ත්‍රණවලට ද සහභාගී වෙති. රැකියාවල නියුතු කාන්තාවන් ගෙන් 65% - 70% ප්‍රමාණයක් සාම්ප්‍රදායික නො වන ක්ෂේත්‍රවල ස්වයං රැකියා කරමින් සිටින

බව වව්නියා ප්‍රදේශයේ පුද්ගලයකු වෙතින් වරක් ප්‍රකාශ විණි. මෙබඳු සාධනීය වර්ධනයන් මධ්‍යයේ වුව ද කාන්තාවට ජීවනෝපාය හා රැකියාව මුල් කරගත් ගැටලුවලට සුපුරුදු පරිදි මුහුණ දීමට සිදු වී තිබේ.

කම්කරු රැකියා අවස්ථා හිඟකම ප්‍රධාන ගැටලුවකි. මෙය කකාන්තාවට විශේෂයෙන් බලපාන්නකි. වව්නියා ප්‍රදේශයේ පිරිමියකුට සාමාන්‍යයෙන් මසකට දින 5 - 15 ප්‍රමාණයක් පමණක් රැකියාවක නිරතවිය යුතු ය. කාන්තාවන්ට රැකියාවක් කිරීමට ඇති ඉඩකඩ ඊට වඩා බෙහෙවින් අඩු ය. ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ 1980 - 98 අතර කාලය තුළ දී ධීවර නිෂ්පාදන කටයුතු ද පහළ වැටී තිබුණි. වගා කටයුතු සහ කිරි නිෂ්පාදනය ද පිරිහීමකට ලක්විය. ක්ෂේත්‍රයේ කම්කරු රැකියා අවස්ථා නිසගයෙන් ම පිරිමින් සඳහා වෙන් වේ. ඒ හැරුණ විට එක ම රැකියාවේ නිරත කාන්තාවට පිරිමියාට වඩා අඩු වේතනයක් ගෙවීම තවත් අසාධාරණ ක්‍රියාවකි. පිරිමියකුට ගෙවන දෛනික වැටුපේ සාමාන්‍යය රු. 170 කි. එහෙත් කාන්තාවකට ලැබෙන්නේ හුදෙක් රු. 90 ක් පමණි. වව්නියා ප්‍රදේශයේ යළි පදිංචි කරන ලද ගම්මානයක පිරිමියකුට ගෙවන වේතනය දිනකට රු. 200 ක් වූ අතර, කාන්තාවකට ලැබුණේ ඉන් අඩක් පමණි.

# 5. දේපල ආපසු පැවරීම

## 5:1 නීති විරෝධී පදිංචිය

ආපසු පැමිණෙන අවතැන් වූ පිරිස් පුද්ගලයින් හා රජයේ ඉඩකඩම්වල පදිංචිවීම නිසා ඉදිරියේ දී විවිධ ගැටලු මතුවීමට ඉඩ තිබේ. මෙම අවතැන් වූ පුද්ගලයෝ විකල්පයක් නො මැති කමින් වෙනත් අය ගේ ඉඩකඩම්වල පදිංචි වෙති. වර්තමානයේ ගැටලු සහගත තත්ත්වයක් මතු වී නැත. එසේ වුව ද සාමකාමීව ගැටලු විසඳා ගැනීම සිදුවෙමින් පවතී. සමහර අවස්ථාවල අවතැන් වූවන් සතු දේපල පරිහරණය කරනු ලබන පුද්ගලයින්ට ඉන් ඉවත් වන ලෙසට කල් දී ඇති අතර, වර්තමාන පදිංචිකරුවන්ට එම දේපල මිල දී ගැනීමට හෝ ඒ සඳහා කුලියක් ගෙවීමට ඔවුන් සමග කතිකා කරගත් අවස්ථා ද නැත්තේ නො වේ. සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසු ත්‍රිකුණාමල ප්‍රදේශයේ සමහර සිංහල දේපල හිමිකරුවන්ට අක්කරයකට රු. 1000/= බැගින් ඒවායේ වර්තමාන පදිංචිකරුවන් විසින් ගෙවා තිබේ. කාරතිව් සහ කයිට්ස් දූපත් කරා ආපසු පැමිණෙන පිරිස් යම් එකගත්වයක් පිට තම අසල් වැසියන් ගේ ඉඩම් වගා කරමින් සිටිති.

ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ මොරවැව ප්‍රදේශයේ සමහර අවතැන් වූ සිංහල පවුල් ප්‍රදේශයේ දෙමළ ජාතිකයින්ට අයත් දේපල භුක්ති විඳිති. මෙය ඉතා සුහද මට්ටමින් සකස් කළ වැඩපිළිවලක් බැවින් මෙතෙක් අර්බුද කිසිවක් පැනනැගී නැත. නීති විරෝධී අයුරින් අන්‍යයන් ගේ දේපල භුක්ති විඳීමේ දී ගැටලු පැනනැගි අවස්ථා බොහෝ ය. (8:1 බලන්න.)

## ගම් මට්ටමින් ආරවුල් නිරාකරණය පහසු කිරීම

### -තලෙයිමන්නාර් සිද්ධිය

වාර්ගික අර්බුදය ආරම්භ වීමට පෙර දෙමළ සහ මුස්ලිම් ජන කොටස් තලෙයිමන්නාරමේ අසල්වැසි ගම්වල ජීවත් වූ හ. පසුව ඔවුහු අවතැන් වූ හ. දෙමළ ගම් ප්‍රදේශයේ නාවුක හමුදාව කඳවුරක් පිහිටුවී ය. ආපසු පැමිණි දෙමළ වැසියන්ට තමන් ගේ ගම්වල විසීමට නො හැකි වීම නිසා මුස්ලිම් ගම්වල පදිංචියට යාමට සිදුවිය. මුස්ලිම් වැසියන් ද දැන් ආපසු ඒමට පටන් ගෙන ඇති අතර ගැටුම් ඇතිවීම වළක්වාලිය නො හැකිව ඇත. දෙපාර්ශ්වයට පොදු වූ ගැටලුවලට පොදු විසඳුම් පතා 'කෝර්ඩයිඩ්'

නම් ඕලන්ද සංවිධානය ඔවුනොවුන් අතර රැස්වීම් ගණනාවක් සංවිධානය කළේ ය. 2002 නොවැම්බර්වල දී දෙපාර්ශ්වය එකතු වී තම අවශ්‍යතා පිළිබඳ ව දිසාපතිවරයා වෙත ලිපියක් යැවීමට කටයුතු කරමින් සිටිය හ.

## 5:2 අධි ආරක්ෂක කලාප සහ යුද හමුදා සහ පොලිස් මුරපොල

විශේෂයෙන් මන්නාරම සහ යාපන දිස්ත්‍රික්ක ඇතුළු උතුරු සහ නැගෙනහිර පළාත්වල ශ්‍රී ලංකා යුද හමුදාව සහ පොලීසිය සැලකිය යුතු භූමි ප්‍රමාණයක් සිය පදිංචිය සඳහා ප්‍රයෝජනයට යොදා ගෙන ඇත.



***පේදුරු තුඩුවේ අධි ආරක්ෂක කලාපය***

සටන් විරාම ගිවිසුම පරිදි අදාළපාර්ශ්වයන් ස්වකීය අධි ආරක්ෂක කලාප සියල්ල ලැයිස්තු ගත කළ යුතු ව තිබේ. එහෙත් අධි ආරක්ෂක කලාප වශයෙන් ලැයිස්තු ගත කර නො මැති ප්‍රාදේශ ශ්‍රී ලංකා යුද හමුදාව සිය ප්‍රයෝජනයට යොදා ගෙන තිබේ. ශ්‍රී ලංකා යුද හමුදාව අධි ආරක්ෂක කලාප පුළුල් කරන බවට හෝ අලුතින් පිහිටුවන බවට හෝ බිය පල වී ඇත. අධි ආරක්ෂක කලාප හැරුණ විට පුද්ගලික ඉඩම්වල යුද හමුදා සහ පොලිස් මුරපල ගණනාවක් තවමත් ක්‍රියාත්මකව පවතී. අනෙකුත් කරුණු අතර, අධි ආරක්ෂක කලාප පිළිබඳ ප්‍රශ්නය ගැන සලකා බැලීමේ අරමුණින්, ප්‍රථම සාම සාකච්ඡා වටයෙන් පසු උප කමිටුවක් පත් කරන ලදී. එහෙත් උප කමිටුව අක්‍රීය වූ අතර, ගැටලුව තවමත් එයකාරයෙන් ම පවතී. අධි ආරක්ෂක කලාප සමීපයේ පිහිටා ඇති ප්‍රවේශවලින් ඉවත් වී මේ ප්‍රශ්නය ද ඇතුලුව යාපන දිස්ත්‍රික්කයේ ඉක්මණින් ජනතාව යළි පදිංචි කරවීමේ ක්‍රියාකාරී සැලැස්මක් සම්බන්ධයෙන් දෙපාර්ශ්වය ම එකඟත්වය පළ කළ හ. සන්නද්ධ හමුදාවල පදිංචිය සම්බන්ධයෙන් පැනනඟින ආරවුල් දැන් දිස්ත්‍රික් මට්ටමින් විසඳනු ලැබේ.

හමුදාව ඇතැම් ප්‍රදේශවල සිය පදිංචිය අරඹා තිබීම නිසා අවතැන් වූවන්ට ආපසු තම ගම් බිම් කරා ඒම අපහසු වී තිබේ. යළි පදිංචි කිරීම හෝ වන්දි ගෙවීම වැනි සහන දායක වැඩ පිළිවෙලක් බව අවතැන් වූවන් සඳහා ක්‍රියාත්මක කර නැත. බොහෝ අවතැන් වූවන් තම පවුල්වල කාන්තා සාමාජිකයින් ගේ ආරක්ෂාව පතා දැනට පදිංචිව සිටින ස්ථානවල ම තවදුරටත් පදිංචිය කරගෙන යාමට තීරණය කර තිබේ. මන්නාරම් දිස්ත්‍රික්කයේ ද හමුදාව සහ පොලීසිය විවිධ ප්‍රදේශවල පදිංචි වී සිටීම නිසා අවතැන් වූ පිරිස් යළි පදිංචි කරවීම අපහසු වී තිබේ. තලෙයිමන්නාරම, වව්නියාව, මන්නාරම මහ මාර්ගය දෙපස වූ ප්‍රදේශය මුහුදු තීරයේ ඇතැම් ප්‍රදේශ සන්නද්ධ හමුදා විසින් පදිංචියට යොදා ගෙන තිබේ. යාපන අර්ධද්වීපයේ 30% පමණ ප්‍රමාණයක හමුදාව පදිංචි වී සිටින බවට ගණන් බලා තිබේ. ජනතාව යළි පදිංචි කිරීමේ දී පමණක් නො ව ධීවර කර්මාන්තය ඇතුලු ආර්ථික කටයුතුවල දී ද එය බාධාවක් වී තිබේ.

රජය සහ එල්ටීටීඊය පවසන ආකාරයට මඩකලපුවේ, වැඩි වශයෙන් මායිම් ප්‍රදේශ, මුහුදු බඩ ප්‍රදේශ සහ ගුවන් තොටුපල ඇතුලුව නිවාස 200 - 342 ටත් අතර ප්‍රමාණයක් හමුදාවේ පදිංචිය සඳහා යොදවා ගෙන තිබේ. මේ හැරුණ විට කච්චේරිය ඇතුලු රජයේ ගොනැගිලි කීපයක් ම හමුදාවේ පාවිච්චිය සඳහා යොදාගෙන තිබේ. 2002 වසරේ වනයිතිච්හි පැවැති සටන් අත්හිටුවීමේ සහ සාමාන්‍ය කරණය කිරීමේ කමිටු රැස්වීමක දී සාමය ස්ථාපනය කිරීමේ සාකච්ඡා නිමාවට පත්ව නො තිබුණ හෙයින් හමුදා කඳවුරු පවත්නා ආකාරයෙන් තබාගැනීමේ අවශ්‍යතාව දෙපාර්ශවය ම පිළිගත් හ. පසුව වැදගත් කරුණු කීපයක් සම්බන්ධයෙන් ඔවුනොවුන් අදහස් හුවමාරු කරගැනීමෙන් පසුව ජනතාව ගේ ප්‍රයෝජනය තකා මහා මාර්ග කීපයක් ම යළි විවෘත කිරීමට ද එකඟ වූ හ.

යාපන අර්ධද්වීපය තුළ අවස්ථා කීපයකදී ම යුද හමුදාව ස්වකීය අධි ආරක්ෂක කලාපවලට අයත් භූමි ප්‍රමාණය අඩු කළ බව හෝ අයිති කරුවන්ට පැමිණ තම දේපල පරීක්ෂා කිරීමට ඉඩ ලබාදුන් බව වාර්තා වී තිබුණි. අවතැන් වූවන් අධි ආරක්ෂක කලාපවලට පිවිසීමේ දී ඔවුන් සතු දේපල පිළිබඳ අයිතිය හමුදාව වෙත තහවුරු කළ යුතු ව තිබේ. එහෙත් ලේඛන හා අනෙක් අවශ්‍ය ලියකියවිලි අවතැන් වූ බොහෝ පිරිස්වලට අහිමි වී ඇත. (6 ඡේදය බලන්න.) මඩකලපුවේ අවතැන් වූවන්ට හමුදා ප්‍රදේශවලට ඇතුල්වීමට ඉඩ දෙනු නො ලැබේ.

හමුදාව සහ පොලීසිය විසින් ප්‍රයෝජනය සඳහා යොදා ගෙන ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන් නිසි පරිදි කුලී ගෙවීමක් සිදු නො වේ. සමහර ව්‍යාපාරික ස්ථාන සහ ඇතැම් නිවෙස් හිමියන්ට පමණක් ගොඩනැගිලි කුලී ගෙවා තිබේ. මුදල් හිඟකම නිසා පොරොන්දු වූ කුලිය නිසි පරිදි ගෙවනු ලබන්නේ නැත. අධි ආරක්ෂක කලාප තුළ පිහිටා ඇති එහෙත් හමුදාව පදිංචි වී නො සිටින ගොඩනැගිලි වෙනුවෙන් එහි අයිතිකරුවන්ට කුලී ගෙවීමක් සිදු නො වේ.

## 5:3 එල්ටීටීඊය පදිංචිව සිටීම

1990 දී පලවා හරින ලද මුස්ලිම්වරුන්. ඉන්දියාවට පැනගිය සරණාගතයින් සහ වෙනත් සංක්‍රමණය වූ පුද්ගලයින්ට අයත්, දේපල ඇතුලුව අතහැර ගොස් දමා ඇති සියලු දේපල එල්ටීටීඊ යේ භාරයට පත්විය. පසුව අල්ලා ගත් ඉඩම් කුලියට හා එල්ටීටීඊ සාමාජික පවුල්වල ප්‍රයෝජනයට මෙන් ම එල්ටීටීඊ යේ පරිපාලන ආයතන පිහිටුවීම සඳහා යොදා ගන්නා ලදී. සනාථ කිරීම සඳහා සාක්ෂි නො මැති වුව ද, මෙම ඉඩකඩම්වල එල්ටීටීඊ යේ කඳවුරු

පවත්වා ගෙන යන බව විශ්වාස කෙරේ. අවතැන් වූවන්ට වෙනත් අය ගේ ඉඩම්වල පදිංචිවීම සඳහා එල්ටීටීඊය අවසර දී තිබේ. මඩකලපුවේ ඇතැම් මුස්ලිම් ජාතිකයින්ට අයත් ඉඩම්වල ගොවිතැන් කෙරෙමින් පවතී. එය සමහර විට එල්ටීටීඊ යේ අනුදැනුමට සිදුවනවා විය හැකි ය.

**<u>එල්ටීටීඊ යේ පාලන ප්‍රදේශවල අවතැන් වූ මුස්ලිම් ජනතාවට අයත් දේපල ආපසු ලබාදීම.</u>**

උතුරු කරයෙන් මුස්ලිම්වරුන් පලවා හැරීමෙන් පසු ඔවුන් සතු ඉඩම්, නිවාස සහ ව්‍යාපාරික ස්ථාන සියල්ලක් ම පාහේ එල්ටීටීඊය විසින් පවරා ගන්නා ලදී. මුස්ලිම් දේපල භුක්ති විඳින පුද්ගලයින්ට ඉන් ඉවත් වන ලෙස එල්ටීටීඊය දන්වා ඇතැ යි වාර්තා වී ඇත. දැනට මුස්ලිම්වරුන්ට අයත් දේපල භුක්ති විඳින පිරිස් ඒවා මුස්ලිම්වරු වෙත ආපසු පැමිණීමේ දී යළි ලබාදීමට හෝ ඒ සඳහා කුලියක් ගෙවීමට එකඟ වී සිටිති. වෙප්පම්කුලම් හි මුස්ලිම්වරුන්ට අයත් ඉඩම් වගා කරමින් සිටි දෙමළ ජාතිකයින් ආපසු එම ඉඩම් මුස්ලිම්වරුන්ට ලබා දී තිබේ.

වන්නි ප්‍රදේශයේ මුස්ලිම්වරුන් සැරිසැරීම පිළිබඳ ව එල්ටීටීඊය දැඩි විමසිල්ලෙන් සිටී. කිලිනොච්චි ප්‍රදේශයේ ඔවුන්ට පදිංචිය සඳහා එල්ටීටීඊය ඉඩ නො දෙන බවක් හැඟේ. කිලිනොච්චි ප්‍රදේශයේ වර්තමාන දෙමළ පදිංචිකරුවන් මුස්ලිම්වරුන්ට කුලියක් ගෙවීමට එකඟ වී ඇතත්, ස්ථිර වශයෙන් පදිංචි භූමියෙන් ඉවත්ව යන බවක් නො පෙනේ. මුලතිව් ප්‍රදේශයේ පදිංචිය සඳහා මුස්ලිම්වරු නො එන බවට රාවයක් පවතී. මුස්ලිම් අයිතිකරුවන් සතු ඉඩම්වල එල්ටීටීඊය පදිංචි වී සිටී. කමතේනු ප්‍රදේශයේ පිහිටා ඇති එල්ටීටීඊය සතු සංචාරක නිවස අයත් භූමිය මුස්ලිම් ජාතිකයෙකුට අයත් දේපලකි. දැනට මුස්ලිම් ජාතිකයින්ට අයත් එල්ටීටීඊය සහ දෙමළ ජාතිකයින් භුක්ති විඳිනු ලබන වටිනා දේපළ සම්බන්ධ ගැටලුව අධිකරණ ක්‍රියාමාර්ගයකින් තොරව හුදෙක් අවිධිමත් පදනමක් මත විසඳා ගැනීම මැනවැ යි උතුරේ මුස්ලිම් ජනතාව ගේ හිමිකම් සුරැකීමේ සංවිධානය තීරණය කර තිබේ.

ඔස්ලෝ හි පැවති ප්‍රථම වටයේ සාම සාකච්ඡාවේ දී මුස්ලිම් දේපළ ආපසු ලබාදීමට සූදානම් බව එල්ටීටීඊය අවධාරණය කළේ ය. දේපළ අයිතිකරුවන් එහි පිහිටීම හා විශාලත්වය අඩංගු ප්‍රකාශයක් ලබා දෙන ලෙස එල්ටීටීඊය ඉල්ලීමක් කර තිබුණි. මෙම කාර්යය මුස්ලිම් හිමිකම් සුරැකීමේ සංවිධානය වෙත පැවරී තිබේ.

# 6. දේපළ ආපසු පැවරීම අයිතිය තහවුරු කිරීම

## 6:1 කෙටි විස්තරයක්

නීතිය මඟින් දේපළ පිළිබඳ අයිතිය අපේක්ෂා කරනු ලබයි. එහෙත් අවතැන් වීමේ දී දේපළ පිළිබඳ ලේඛන හා වැදගත් ලියකියවිලි අහිමිවීම නිසා තම අයිතිය තහවුරු කිරීම අවතැන් වූ පිරිස්වලට ගැටලුවක් වී ඇත.

වාර්ගික අර්බුදය හෝ ස්වාභාවික හේතූන් නිසා උතුරු - නැගෙනහිර පළාත්වල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාල සතුව පැවැති වටිනා රාජ්‍ය ලේඛන විශාල වශයෙන් විනාශයට ලක්වීම නිසා, පහත විස්තර කර ඇති පරිදි දේපළ පිළිබඳ ලේඛනවල පිටපත් ලබාගැනීම බෙහෙවින් අපහසු වී තිබේ. පුද්ගලයින් සතු ඉඩම් ඔප්පු පිටපත් සහ රජයේ ඉඩම් වෙනුවෙන් නිකුත් කරන බලපත්‍ර මධ්‍යගත වී නො මැත. නැගෙනහිර ප්‍රදේශයේ දේපළ පිළිබඳ ලේඛනවලට හානියක් සිදු නො වී සුරක්ෂිතව පවතී.

ලේඛන විනාශ වී නො මැති තත්ත්වයක පැවැතිය ද ඒවායේ පිටපත් ඉල්ලා ඉදිරිපත් වන ඉල්ලීම් සපුරාලීමට අදාළ කාර්යාලවලට ප්‍රමාණවත් හැකියාවක් තිබේ ද යන්න සැක සහිත ය.

සටන් විරාම ගිවිසුම අත්සන් කිරීමෙන් පසුව සරණාගතයින් ආපසු ඒම ආරම්භ වීම නිසා දේපළ පිළිබඳ ලේඛනවල පිටපත් සඳහා කෙරෙන ඉල්ලීම බෙහෙවින් වැඩිවීමට අවකාශ ඇත. මන්නාරම සහ වව්නියා ප්‍රදේශයන්හි රජයේ කාර්යාලවල ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් නො තිබීම නිසා ගැටලුව තවත් සංකීර්ණ තත්ත්වයට පත්ව තිබේ.

අවශ්‍ය ලේඛනවල පිටපත් ලබාගැනීම වඩාත් අපහසු වී ඇත්තේ සරණාගතයින් සතු හැඳුනුම්පත් හා උප්පැන්න සහතික විනාශ වීම හෝ අහිමි වීම නිසා ය. දේපළ උරුමය පිළිබඳ ව කෙරෙන නීත්‍යානුකූල ඉල්ලීම් සාක්ෂාත් කරගැනීම, විවාහ හෝ මරණ සහතික නො මැති වීම නිසා අඩපණ වී ඇත.

අවශ්‍ය ලේඛනවල පිටපත් ලබාගැනීමේ ක්‍රියාපටිපාටිය බොහෝ අවතැන් වූ පිරිස් දන්න බවක් නො පෙනේ.

## 6 සටහන -

### දේපළ පිළිබඳ විවිධ ලේඛන

| ඉඩම් වර්ගය | ලේඛනය | පිටපත් තබාගනු ලබන්නේ |
|---|---|---|
| පුද්ගලික | ඔප්පුව | අයිතිකරු<br>ප්‍රසිද්ධ නොතාරිස්<br>දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලය |
| | වාර්ෂික බලපත්‍ර / ඉඩම් සංවර්ධන නිලධාරි ගේ බලපත්‍ර | අයිතිකරු<br>ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | ඉඩම් සංවර්ධන නිලධාරී නිකුත් කළ බලපත්‍රය | අයිතිකරු<br>දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලය<br>දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය |
| | බදු ක්‍රමය යටතේ හෝ වෙනත් බලපත්‍ර<br>(රජයේ ඉඩම් ආඥා පනත යටතේ) | අයිතිකරු<br>දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කාර්යාලය<br>දිස්ත්‍රික් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය<br>ඉඩම් කොමසාරිස් කාර්යාලය, කොළඹ. |

### <u>6:2 පුද්ගලික දේපළ - ඔප්පු</u>

පෞද්ගලික දේපළ පිළිබඳ අයිතිය නීත්‍යානුකූල වශයෙන් තහවුරු කරනුයේ ඔප්පුවක් මඟිනි. නොතාරිස්වරුන් විසින් කෙටුම්පත් කරන ඔප්පු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලබන අතර එම ඔප්පුවල පිටපත් දිස්ත්‍රික් ඉඩම් කාර්යාලය, නොතාරිස් සහ අයිතිකරු සන්තකයේ තබාගනු ලැබේ. ශ්‍රී ලංකාවේ මධ්‍යගත ඉඩම් ලියාපදිංචි කාර්යාලයක් නො මැත. රු. 2.50 ක මුදලක් ගෙවා ඔප්පුවල පිටපත් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයෙන් ලබා ගත හැකි ය. අවශ්‍ය අදාළ තොරතුරු සැපයීමට අයිතිකරු සමත් වේ නම් පිටපත් පහසුවෙන් ලබා ගත හැකි ය. නැතහොත් ඒ සඳහා සෑහෙන කාලයක් ගත වේ. ඔප්පු අංකය, නොතාරිස් ගේ නාමය සහ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ ඔප්පුව ලියාපදිංචි වූ දිනය යන තොරතුරු දැන සිටීම පිටපත් ලබාගැනීමේ දී ඉතා වැදගත් වේ.

පිටපත් ලබාගැනීමට නො හැකි අවස්ථා ද ඇත. (7 සටහන බලන්න)

එබඳු අවස්ථාවල දී තම නිශ්චිත දේපළ පිළිබඳ අයිතිය ප්‍රකාශ කරමින් ඉඩම් හිමියා මගින් “ප්‍රකාශිත ඔප්පුවක්” ලියනු ඇත. එය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වීමෙන් පස තම භුක්තිය තහවුරු කිරීමට ඔහුට හැකිවනු ඇත. යමෙක් ඒ සම්බන්ධයෙන් අභියෝගයක් ඉදිරිපත් කළ හොත් එයට මුහුණදීමට අයිතිකරුට සිදු වේ. භුක්තියට හිමිකම් කියන පුද්ගලයින් ඇතුළු යම් දේපළක අවංක හා නිත්‍ය හිමිකරුවකුට මෙබඳු ඔප්පුවක් කෙටුම්පත් කළ හැකි ය.

අයිතිකරු සහ / හෝ ඉඩම් ලියාපදිංචි කාර්යාල වෙතින් ඔප්පුවක් නැති වුවහොත් යම් පුද්ගලයෙකුට ස්වකීය අයිතිය තහවුරු කිරීම සඳහා සඳහන් විකල්ප මාර්ග විවෘතව ඇත.

★ අවතැන් වූ පුද්ගලයෙකුට ඔප්පුවක පිටපතක් අයදුම් කිරීමේ දී තම ඉඩම දෙ පැත්තේ පිහිටා ඇති ඉඩම් දෙකේ ඔප්පු අංකය ප්‍රයෝජනය වනු ඇත.

★ නැති වී ඇති ඔප්පුව කෙටුම්පත් කළ නොතාරිස් වරයා ගෙන් ඔප්පුවේ පිටපතක් ලබාගත හැක. එහෙත් බොහෝ අවස්ථාවල උතුරුකරයේ විවිධ ප්‍රදේශවල එක්කෝ නොතාරිස්වරයා අවතැන් වී සිටී. නැතහොත් ලේඛන අහිමි වී ඇත.

★ තමන් පදිංචි වී සිටි ඉඩම තමා ගේ බව සහතික කරන ප්‍රදේශයේ පදිංචිකරුවන් අවතැන්වීමට පෙර පදිංචිව සිටි ග්‍රාමසේවා නිලධාරී ගෙන් හිමිකරුට සහතිකයක් ලබා ගත හැකි ය.

★ අයිතිය තහවුරු කිරීමේ ලා විදුලිය හා ජල බිල්පත්, මැතිවරණ ලේඛන සහ දේශීය ආදායම් හා ප්‍රාදේශීය සභා වරිපණම් ලේඛන උපකාරී වනු ඇත.

## 6:3 රජයට අයත් ඉඩම් : බලපත්‍ර සහ බදු

ශ්‍රී ලංකාවේ ඉඩම් ප්‍රමාණයෙන් 82% රජය සතු බවට ගණන් බලා ඇත. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් කොමසාරිස් සතු ඉඩම් සමහර පවුල් සඳහා ලබා දෙනු ලැබේ. අලුතින් පදිංචි කරවීමේ හෝ යළි පදිංචි කරවීමේ විශේෂ වැඩසටහන් හැරුණ විට 1995 ජූනි 15 දිනට පෙර ඉඩම්වල පදිංචිව සිටි අයට පමණක් රජයේ ඉඩම් ලබා දිය හැකි ය.

## බලපත්‍ර සහ වාර්ෂික බලපත්‍ර

ඉඩම් නො මැති පවුල් රජයේ ඉඩම් ලබා දෙන ලෙස ග්‍රාම නිලධාරී වෙත අයදුම් කළ යුතු ය. එම අයදුම්පත් තමා වෙත ලැබීමෙන් පසු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නියුතු ඉඩම් නිලධාරීන් බෙදාදීම සඳහා සුදුසු ඉඩම් හඳුනා ගෙන, සුදුස්සන් තෝරා ගැනීම සඳහා ඉඩම් කච්චේරියක් පවත්වන ලෙස පළාත්බද ඉඩම් කොමසාරිස් වරයා වෙත නිර්දේශ කරනු ඇත. ප්‍රාදේශීය ලේකම්, ඉඩම් නිලධාරී සහ ප්‍රදේශයේ අනෙක් වගකිව යුතු පුද්ගලයින් ගෙන් සමන්විත ඉඩම් කච්චේරියේ නිර්දේශ පිට උතුරු නැගෙනහිර ඉඩම් කොමසාරිස් විසින් බලපත්‍ර නිකුත් කිරීම සඳහා අවසර දෙනු ඇත. ගම්බද ප්‍රදේශවල පදිංචි ඉඩම් නො මැති, වසරකට රු. 240,000 ක ආදායමක් ලබන විවාහක පුද්ගලයින් සහ රු. 18,000/= ලබන අවිවාහකයින් අතුරින් අවශ්‍යතාව මත සුදුස්සන් තෝරාගනු ලැබේ. රජයෙන් ලද ඉඩම් ප්‍රයෝනයට යොදා ගැනීමේ දී ඉඩම පරිහරණය සහ සංවර්ධනය මුල් කරගත් කොන්දේසි ගණනාවක් සපුරාලිය යුතුව ඇත. මෙම කොන්දේසි සපුරාලීමට අපොහොසත් වන අවස්ථාවල දී කලින් දෙවරක් දැන්වීමෙන් පසු පළාත්බද ඉඩම් කොමසාරිස්වරයා විසින් බලපත්‍ර අවලංගු කරනු ඇත.

බලපත්‍ර ලාභියකු පහත සඳහන් කොන්දේසිවලට යටත්වීම අවශ්‍ය ය:

- ★ ස්වකීය ඉඩමේ පදිංචි විය යුතු යි.
- ★ සාමාන්‍යයෙන් අනුප්‍රාප්තිකයා වශයෙන් පවුලේ වැඩිමහල් පිරිමි දරුවා හැර වෙනත් කෙනෙකුට ඉඩම විකිණීම හා පැවරීම කළ නො හැකි ය.

- ⋆ බලපත්‍රයේ උපලේඛනයේ සඳහන් පරිදි ඉඩමේ පහත් බිම්වල වී වගාව හා උස් බිම්වල භෝග වගාව සිදු කරමින් ඉඩම සංවර්ධනය කළ යුතු වේ.
- ⋆ ඉඩමේ ස්ථිර ගොඩනැගිලි තැනිය යුතු යි.

කලින් වාර්ෂිකව අලුත් කළ හැකි බලපත්‍ර නිකුත් කරන ලදී. ඒවා අවලංගු කිරීමේ දී කල් තියා දැනුම්දීමක් කිරීම අවශ්‍ය නො වූ අතර, ඉඩම් ලාභීන් විසින් වාර්ෂික කුලියක් ගෙවිය යුතුව තිබුණි.

1990 සිට රජය වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම නවතා තිබූ අතර, එම බලපත්‍ර සාමාන්‍ය බලපත්‍රයක් වශයෙන් නිකුත් කිරීමට කටයුතු යොදා තිබුණි.

## ඉඩම් ප්‍රදානය කිරීම හා බදු ක්‍රමය යටතේ ඉඩම් ලබාදීම

ඉඩම් ලබා දෙන ලද බලපත්‍රයේ සඳහන් කොන්දේසි සපුරාලීමෙන් පසු ඉඩම් ලාභියකුට තම බලපත්‍රය ඉඩම් ප්‍රදානයක් ලෙසට පරිවර්තනය කිරීම සඳහා ඉඩම් කොමසාරිස් වෙත අයදුම් කළ හැකි ය.

ඉඩමක් ප්‍රදානය කිරීම යනු නීත්‍යානුකූල පැවරීමකි. එබඳු ප්‍රදානයක් යටතේ ලැබෙන ඉඩමක්, විකිණීම, කොටස් කිරීම හෝ උකස් කිරීම සපුරා තහනම් වේ. ප්‍රදානයක් වශයෙන් ලැබෙන ඉඩම් විකිණීම සහ පවුලේ වැඩිමහල් දරුවාට ලැබෙන පරිදි අවශ්‍ය නීති කෙටුම්පත් කෙරෙමින් පවතී. රජයේ ඉඩම් ආඥානත යටතේ මැද ආදායම් ලබන පවුල් සහ නාගරික ප්‍රදේශවල පදිංචිකරුවන්ට පදිංචිය, ව්‍යාපාරික කටයුතු හෝ කෘෂිකාර්මික සඳහා හෝ රජයේ ඉඩම් බදු ක්‍රමය යටතේ ලබා ගත හැකි ය. එසේ ඉඩම් ලබාගැනීමේ දී රජයේ කොන්දේසි අනුගමනය කිරීමට ඉඩම් ලාභීන් බැඳී සිටිති.

## අවතැන්වූවන් සතු රජයේ ඉඩම්

අවතැන් වූ පවුල් සතු බලපත්‍ර අවලංගු කිරීම තහනම් කරමින් පසුගිය වසරේ චක්‍රලේඛයක් නිකුත් කර තිබුණි. 1995 ජූනි 15 දින දක්වා ඉඩමේ පදිංචිව සිටි පුද්ගලයින්ට ඒ බව සනාථ කිරීමෙන් පසු, ඔහු ගේ පදිංචිය ක්‍රමවත් කිරීම සඳහා බලධාරීන් වෙත අයදුම් කළ හැකි ය. නීති විරෝධී අයුරින් රජයේ ඉඩම්වල පදිංචි වී සිටින පුද්ගලයින් විසින් තම පදිංචිය නීත්‍යානුකූල කරගැනීම සඳහා අයදුම් කිරීමේ දී ග්‍රාමසේවා නිලධාරීන් හෝ අසල්වැසියන් සාක්කි කරුවන් වශයෙන් කරනු ලබන ප්‍රකාශ උතුරු - නැගෙනහිර ඉඩම් කොමසාරිස්වරයා විසින් පිළිගනු නො ලැබේ.

බදු ක්‍රමය යටතේ ලබාගෙන ඇති ඉඩම්වල පදිංචි අවතැන්වූවන්ට සහ ව්‍යාපාරික හෝ කෘෂිකාර්මික කටයුතු සඳහා ඒ ලෙස ඉඩම් ලබාගත් පුද්ගලයින්ට බලපත්‍ර අලුත් කරවා ගැනීම අසීරු වී තිබේ.

බලපත්‍ර ප්‍රදානය සහ බදු ක්‍රම යටතේ ඉඩම් ලබාදීමේ දී නිකුත් කළ ලේඛනවල පිටපත් ලබාගැනීම

1989 / 90 න් පසු මෙම ලේඛනවල පිටපත් දිස්ත්‍රික් ලේකම්වරුන් විසින් ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත භාරදීම, සහ එය නිසි පරිදි ඉටු නො වීම, සහ විශේෂයෙන් මුලතිව් සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වාර්ගික අර්බුදයෙන් බෙහෙවින් විපතට පත්වීම නිසා එම දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම් කාර්යාල සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තබා තිබූ ඉඩම් පිළිබඳ ලිපි ලේඛනාදිය විනාශ වීම නිසා ද පිටපත් ලබාගැනීම අසීරු කාර්යයක් වී තිබේ.

මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු සිතියම් අව්‍යාජ අයදුම් කරුවන් හඳුනා ගැනීම සඳහා උපකාරී වනු ඇත. පිටපත් අවශ්‍ය වී ඇති අයදුම්කරුවකුට තම අසල්වැසියන් සතු ලේඛන ප්‍රයෝජනයට ගත හැකි ය.

ප්‍රදානය කරන ලද ඉඩම් සම්බන්ධයෙන් නිකුත් කර ඇති ලේඛනවල පිටපත් ඉඩම් ලේකම් කාර්යාලවලින් හෝ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ලබාගත හැකි ය. රජයේ ඉඩම් ආඥාපනත යටතේ ලබා දී ඇති රජයේ ඉඩම් පමණක් කොළඹ, ඉඩම් කොමසාරිස් කාර්යාලයේ ලේඛනගත වී තිබේ.

## *7 සටහන*

## *උතුරු - නැගෙනහිර දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල හානියට පත් හෝ විනාශ වූ ලේඛන*

⋆ **යාපනය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

යාපන දිස්ත්‍රික්කයට අයත් 1940 න් පසු ඉඩම් පිළිබඳ ලේඛන 1986 සිට අටවරක් පෞද්ගලික ගොඩනැගිලි වෙත ගෙන යන ලදී. වරක් මෙම ලේඛන පවත්වා ගෙන යමින් තිබූ ගොඩනැගිල්ලක් එල්ටීටීඊය පදිංචියට ගෙන තිබූ අතර, පසුව එම ඉන්දීය සාම සාධක හමුදාව විසින් 1987 දී අල්ලා ගන්නා ලදී. ඔවුන් අතින් ඒවා විනාශ වූ බව වාර්තා වී ඇත. 1940ට පෙර සියලු ලිපි ලේඛන විනාශ වී ඇති අතර 1940 පසු අවධියට අයත් ලේඛන වෙලුම් 1325 ක් නැති වී තිබේ.

⋆ **කිලිනොච්චි ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

1990 දී කිලිනොච්චි ඉඩම් කාර්යාලය විවෘත වනතෙක් සියලු ඉඩම් පිළිබඳ ලේඛන, යාපනයේ ගබඩා කර තිබුණි. 1990 පෙර කාලයට සම්බන්ධ ලේඛන තවමත් යාපනයේ ගබඩාකර තිබේ. කිලිනොච්චියේ තිබූ ලේඛන 1995 දී ශාන්තිපුරල් වෙත මාරු කරන ලදී. 1990 පෙර කාලයට අයත් ලේඛන ආරක්ෂා වී ඇත. යාපනයේ තබා තිබූ කිලිනොච්චි ලේඛන 1987 දී ඉන්දියානු සාම සාධක හමුදාව අතින් විනාශ විය.

⋆ **මුලතිව් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

1984 මුලතිව් හි දී ආරම්භ කළ ඉඩම් ලේඛන කාර්යාලය 1990 සිදු වූ සටන්වල දී සහමුලින් ම විනාශ වූ බව යාපන සහ වව්නියා ඉඩම් ලියාපදිංචි කිරීමේ බලධාරීහු පවසති.

⋆ **වව්නියා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

1940 පෙර අවධියට අයත් දළ වශයෙන් ලේඛන වෙළුම් 30 ක් පමණ විනාශ වී ඇත.

★ **මන්නාරම් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

දළ වශයෙන් වෙළුම් 30 ක් පමණ විනාශ වී තිබේ.

★ **මඩකලපුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය**

1978 ගංවතුරින් වෙළුම් ගණනාවක් විනාශ වූ මුත් ඉඩම් පිළිබඳ කිසිඳු හෝ ලේඛන නැති වී නො මැත.

★ **ත්‍රිකුණාමල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය.**

වාර්ගික අර්බුදය නිසා ලේඛවලට හානියක් සිදු වී නැත. 1964 සුළිසුළඟ නිසා 1970 පෙර කාලයට අයත් ලේඛන ගණනාවක් විනාශ වී තිබේ. උසාවිය සතුව තිබූ ලේඛන සුළු ප්‍රමාණයක් උසාවි ගොඩනැගිල්ල දෙවරක් ම ගින්නෙන් දැවීයාම නිසා, විනාශ විය.

## 6:4 නීති විරෝධී අයුරින් ඉඩම් පැවරීම.

රජයේ මෙන් ම පෞද්ගලික ඉඩම් ද නීති විරෝධි අයුරින් පවරා හෝ විකුණා ඇත. අවතැන්වූවන්ට අයත් ඉඩම් ද විකුණා ඇති අතර, අවතැන්වූවන්ට නීති විරෝධී අයුරින් ඉඩම් ලබාදුන් අවස්ථා ද ඇත.

පෞද්ගලික ඉඩම් සම්බන්ධයෙන් ඔප්පු ලිවීමේ දී අදාළ ඉඩම පැවරීමේ නීත්‍යානුකූල භාවය හා නීත්‍යානුකූල අයිතිකරු කවුරු ද යන කරුණු මනාව පරීක්ෂා කර බැලීමක් නොතාරිස්වරුන් අතින් සිදු නො වේ: එ බැවින් ඔප්පු දෙවරක් ම ලියාපදිංචි වී ඇති බැව් සොයා ගෙන ඇත. මෙය දිවයින පුරා සිදුවන්නකි

මෙ ලෙස රජයේ ඉඩම් විශේෂයෙන් වව්නියා දිස්ත්‍රික්කය තුළ නීතිවිරෝධී අයුරින් පවරා ඇත. රජයේ බලධාරීන් නො දැනුවත්ව ම රජයේ ඉඩම් නීතිවිරෝධී ලෙස අවතැන්වූවන් අතර බෙදා දී තිබේ. පිටරට ගිය හෝ කොළඹ පදිංචියට පැමිණි පුද්ගලයින් සතු ඉඩකඩම් නීතිවිරෝධී අයුරින් බෙදා දී ඇති බව වව්නියාව අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා පවසයි.

## පුත්තලම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ පිරිස් සහ 1994 පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ වැඩසටහන

අවතැන් වූ මුස්ලිම් පවුල්වලින් බහුතරය පුත්තලම, අනුරාධපුරය සහ කුරුණෑගල යන දිස්ත්‍රික්කවල යළි පදිංචි වී සිටිති. 85% වූ බහුතරය පුත්තලමේ ද, ඉන් 58% ක් ම කල්පිටියේ පදිංචි වූ හ. අතිරේකව, සිංහල පවුල් 1000ක් පමණ පුත්තලමේ සහ කල්පිටියේ පදිංචියට පැමිණිය හ. 1994 න් පසු අවතැන්වූවන් ඉඩම් මිල දී ගැනීම සඳහා පොළඹවන ලදී. පර්චස් 10 ක ඉඩම් කොටසක් සඳහා ඔප්පුවක් හිමි පුද්ගලයෙකුට රජයෙන් රු. 10,000 ක ආධාරයක් ලැබිණි. මේ ක්‍රමය යටතේ පවුල් 14,000 ක් අතුරින් 9000කට ම සෙත සැලසුණි. තවත් පවුල් 1000 කට ස්ථිර නිවාස තනාගැනීම සඳහා රු. 25,000 බැගින් ලැබුණි. පුත්තලමේ අවතැන්වූවන් පදිංචි කරන ලද ඉඩම්වලින් 60% ක් ම නීති විරෝධී අයුරින් පරිහරණයට ගන්නා ලද රජයේ ඉඩම් ය.

අවතැන්වූවන් වැටී සිටින අසරණ තත්ත්වයෙන් අයුතු ප්‍රයෝජන ලබාගන්නා අවස්ථා ද නැත්තේ නො වේ.

# 7. දේපළ ආපසු පැවරීම - සහන පියවර

## 7:1 රාජ්‍ය ආයතන හා රාජ්‍ය නො වන සංවිධාන

අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ට ඔවුන් සතු ඉඩකඩම් ආපසු ලබාගැනීම සඳහා රාජ්‍ය මෙන් ම රාජ්‍ය නො වන සංවිධාන රැසක් ම උපකාර සලසමින් සිටිති. දිස්ත්‍රික් උසාවි, ශ්‍රී ලංකා නිතීඥ සංගමය, නීති ආධාර පදනම, මානව හිමිකම් කොමිසම, සමථ මණ්ඩල, නීති ආධාර කොමිසම සහ පොලීසිය ඉන් කීපයකි. ඔවුන් අතුරින් සමහරු දේපල පිළිබඳ අර්බුද විසඳීම සඳහා දැඩි නෛතික ප්‍රවේශයක් අනුගමනය කළ අතර අනෙකුත් අය සාමකාමී අයුරින් අර්බුද නිරාකරණය කිරීමේ ප්‍රායෝගික මූලධර්ම උපයෝගී කරගත් හ.

ඉඩම් සහ දේපල මුල් කරගත් ආරවුල් විසඳීමේ ලා නම්‍යශීලී හා අවිධිමත් යන්ත්‍රණ යොදා ගැනීම වඩාත් උචිත ය. අර්බුදයේ මූලය හෝ ස්වරූපය ගැන නො තකා හුදෙක් නෛතික ක්‍රියාමාර්ග අනුගමනය කිරීම තව තවත් අර්බුදය උග්‍රවීමට උපකාරී වේ. අවතැන් වූ පවුලක් තම ඉඩම හා දේපල ආපසු ලබාදීම මඟින් ම ප්‍රශ්නය නිරාකරණය නො වන බව මතක තබාගත යුතු යි. වාර්ෂික හෝ පන්ති මට්ටමින් ඉඩම් හා දේපල බෙදාහැරීම ද ගැටලුවට විසඳුමක් නො වේ. එය අසාධාරණයට හා අයුක්තියට මඟපාදන්නකි. විධිමත් අයුරින් දැනට ආරවුල් නිරාකරණය කිරීමේ නිරත ආයතන කීපයක් පිළිබඳ ව කෙටි විස්තරයක් මෙහි පහත දැක් වේ.

## දිස්ත්‍රික් උසාවි

ඉඩම් අයිතිය, කුලී නිවැසියන් ඉවත් කිරීම සඳහා ඉඩම් අයිතිකරුවන් විසින් පනවනු ලබන නඩු රු. 1500/= වැඩි ණය මුදල් ආපසු අයකර ගැනීම වැනි කරුණු සම්බන්ධයෙන් දිස්ත්‍රික් උසාවි ක්‍රියාකරනු ලැබේ. උසාවි නඩු යනු දීර්ඝකාලයක් වැය වන , අවිනිශ්චිත ක්‍රියාමාර්ගයන් ය. ඒවා සම්පූර්ණයෙන් ම ප්‍රායෝගික නැත. තීන්දුවලට විරුද්ධව අභියාචනා ඉදිරිපත් කිරීමට නීතියෙන් ඉඩ ඇති බැවින්, නඩුවක අවසානය දැකීම සඳහා කාලයක් ගතවනු ඇත.

## ශ්‍රී ලංකා නීතීඥ සංගමය, නීති ආධාර පදනම

2001 දී එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමේ අවසරය ඇතිව ශ්‍රී ලංකා නීතීඥ සංගමය දේශීය වශයෙන් අවතැන් වූ පිරිස්වලට උපකාර වශයෙන් නීති ආදාර යෝජනා ක්‍රමයක් දියත් කළේ ය. මසකට රු. 6,000/= අඩු ආදායම් ලබන අවතැන්වූවෝ මෙම ආධාර

ක්‍රමයට සුදුස්සෝ වෙති. මෙය උතුරු නැගෙනහිර ප්‍රදේශවල ක්‍රියාත්මක වෙතත්, එල්ටීටීඊ පාලන බලය පවතින ප්‍රදේශවල ක්‍රියාත්මක වන්නේ නැත. දිස්ත්‍රික්කයට එකම නීතිඥයෙක් පමණක් අනුයුක්ත කිරීම ප්‍රමාණවත් නො වන බව පෙනේ. කෙසේ වුව ද, ආරවුල් නිරාකරණය කිරීම සඳහා මෙම සංවිධාන අනුගමනය කරනු ලබන්නේ අධිකරණමය ක්‍රියාමාර්ගයන් පමණි.

## මානව හිමිකම් කොමිසම

මෙය 1996 අංක 21 දරන පනත මඟින් පිහිටුවන ලද්දකි. ප්‍රශ්නයට මැදහත් වීම මඟින් මෙම කොමිසම මානව හිමිකම් පැමිණිලි නිරාකරණය කරනු ලැබේ. මානව හිමිකම් සුරැකීමේලා මෙම කොමිසම රජය හා එහි දෙපාර්තමේන්තු සමඟ සහයෝගයෙන් ක්‍රියා කරයි. එහෙත් ඉඩම් සහ දේපල පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීමේ කොමිසම සතු බලතල සීමාසහිත ය. එල්ටීටීඊ යට විරුද්ධව නැගෙන චෝදනා සම්බන්ධයෙන් මානව හිමිකම් කමිටුව ක්‍රියා කරන්නේ නැත. යාපන ප්‍රදේශයේ හමුදාව පදිංචි වී සිටින පුද්ගලික දේපල මුදාගැනීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිසම ක්‍රියාකරයි. එල්ටීටීඊය පාර්ශවයක් ලෙස සම්බන්ධ වී සිටින අවස්ථාවන් සම්බන්ධයෙන් මානව හිමිකම් කලාපීය කාර්යාල වෙත ලැබෙන පැමිණිලි මානව හිමිකම් කමිටුවේ ප්‍රධාන කාර්යාලය වෙත යොමු කරනු ලැබේ.

## සමථ මණ්ඩල

මෙය 1988 අංක 72 දරන පනත මඟින් ස්ථාපනය කරන ලදී. ආරවුලක පාර්ශ්වයන් අතර සටහන් ආරවුල් මිත්‍ර ලීලාවෙන් නිරාකරණය කිරීම සමථ මණ්ඩල මඟින් සිදු කෙරේ. ආරවුල් නිරවුල් කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් නිකුත් කෙරෙන සහතිකය ප්‍රකාර අධිකරණය නියෝගයක් පනවනු ඇත. සමථ මණ්ඩල උතුරුකරයේ ක්‍රියාත්මක නො වේ. නැගෙනහිර පළාතේ දැනට සමථ මණ්ඩල 21 ක් තිබේ.

## නීති ආධාර කොමිසම

1978 අංක 27 පනත මඟින් රාජ්‍ය අරමුදලින් ආරම්භ කරන ලද ආයතනයයි. මසකට රු. 5,000/= ට අඩු ආදායම් ලබන පුද්ගලයින්ට නීති ආධාර කොමිසමේ සහය ලබාගත හැකි ය. ගාල්ල, අනුරාධපුරය, මහනුවර, කුරුණෑගල සහ උතුරු - නැගෙනහිර පළාත්වල මෙය ක්‍රියාත්මක වන්නේ නැත.

1999 දී ආරම්භ කරන ලද කොමිසමේ කාර්යාංශයක් මඟින් කාන්තාවන්ට සහ ළමුන්ට උපකාර සලසනු ලැබේ.

## පොලීසිය

නීතිය හා සාමය පවත්වා ගෙනයාම පොලීසිය සතු මූලික වගකීමයි. එ නම්, රටේ අපරාධ නීතියට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමයි. ඉඩම් හා දේපල පිළිබඳ පැමිණිලි සම්බන්ධයෙන් පොලීසිය අදාළ පාර්ශවයන් අතර යම් එකඟත්වයක් ඇති කිරීම මඟින් ආරවුල් නිරවුල් කිරීමට කටයුතු කරන අවස්ථා ඇතත්, ඒවා නීත්‍යානුකූලව ක්‍රියාත්මක කිරීමට පොලීසිය වෙත බලතල පවරා නැති බැවින් පොලීසියේ මැදහත්වීම මඟින් සාර්ථක ප්‍රතිඵල ලබාගැනීම අපහසු වේ.

## 7:2 එල්ටීටීඊයේ පාලන ප්‍රදේශ

සමාන්තර පරිපාලන ව්‍යූහයක් පවත්වා ගෙන යන එල්ටීටීඊ සංවිධානය මෙන් ම රජය වෙත ද ඉඩම් හා දේපල පිළිබඳ ගැටලු යොමු කෙරේ. එල්ටීටීඊ ප්‍රදේශවල ජනතාව අතර පැනනැඟෙන ආරවුල් දිසා ලේකම්, සහ ග්‍රාමසේවා නිලධාරීන් දමිල්ඊලාම් පොලීසියත් සමඟ එක්ව විසඳනු ලබයි. දේපල, ඉඩ කඩම් පිළිබඳ පැමිණිලි ප්‍රථමයෙන් ගම්සභාවට යොමු කෙරේ. ඊලාම් පොලීසියට විසඳීමට නො හැකි ගැටලු ඊලාම් උසාවිය වෙත යොමු කෙරේ. එහි වරකට නීතීඥයෙකු ගේ ගාස්තුව රු. 150/= කි. එල්ටීටීඊය විසින් පවරා ගන්නා ලද පෞද්ගලික දේපල සඳහා ඊලාම් උසාවි මඟින් කවර සහනයක් අයිතිකරුවන්ට ලැබේ දෝයි යන්න කිසිවෙක් නො දනී. දිස්ත්‍රික් උසාවිය හරහා සහනයක් අපේක්ෂා කළ හැකි මුත්, එය එල්ටීටීඊ පරිපාලනයට නතු වී සිටී. එල්ටීටීඊ පාලන ප්‍රදේශවල යම් දේපලක් විසි වසරක් පුරා අයිතිකරුවන් ගේ අවධානයට ලක් නො වී, හුදකලාව තිබේ නම් හෝ ඒ පිළිබඳ ව අයිතිකරු කිසිඳු විමසීමක් කර නැත්නම්, එහි වර්තමාන පදිංචිකරුට භුක්තිය අනුව හිමිකම් කීමට අවකාශ ඇත. එසේ හිමිකම් කීමේ වරප්‍රසාදය හිමි වී ඇත්තේ ආර්ථික සංක්‍රමිකයින්ට පමණි.

# 8. ඉඩම් හා දේපලට අදාල නීතිය

ඉඩම් හා දේපල සම්බන්ධයෙන් අදාළ නීතියේ මූලධර්මයන් මතුකර පෙන්වීම මෙම නෛතික විමර්ශනයේ අරමුණයි. රටේ ව්‍යවහාරයට පත්වී තිබෙන්නේ රෝමානු - ලන්දේසි නීතියයි. මෙය අවස්ථාවෝචිතව ඉංග්‍රීසි නීතිය මඟින් සංශෝධනය වී තිබේ. මේ නීතිවලට යටත්ව වෛවාහක සම්බන්ධතා සහ දේපල උරුමය යනාදිය තේසවාලමෛමෙයි, මුස්ලිම් නීතිය සහ උඩරට නීතිය මඟින් පාලනය වේ. පෞද්ගලික දේපල ආඥාපනත මඟින් සංශෝධන වී ඇති රෝමානු ලන්දේසි නීතිය වෙතින් පාලනය වෙන අතර, රජය සතු දේපල සම්බන්ධයෙන් අදාළ වන්නේ හුදෙක් ආඥාපනත් පමණි.

පෞද්ගලික දේපල සම්බන්ධයෙන් අදාළ අයිතිය, බද්ද සහ අනෙකුත් මූලධර්ම පිළිබඳ ව කෙටි නෛතික විමර්ශණයක් කිරීම මෙම ප්‍රථම කොටසේ පරමාර්ථයයි. රජයේ දේපල සහ සමහර ඉඩම් හා දේපල ප්‍රශ්න සම්බන්ධයෙන් 13 වෙනි සංශෝධනය මඟින් පළාත් වෙත බලතල පැවරීම සහ රජයට දේපල පවරා ගැනීම සහ ඉඩම් අයිතිය බැහැර කිරීම පිළිබඳ ආඥාපනත් දෙවන කොටස මඟින් අවධානයට ලක්කරනු ලබයි.

## 8:1 පෞද්ගලික දේපල

අයිතිය හා බද්ද පිළිබඳ නීති සහ අවතැන්වීම යන සන්දර්භය තුළ පුද්ගලික දේපලට අදාළ අනෙකුත් විවිධ මූලධර්ම විමසා බැලීම මෙම ඡේදයේ අරමුණයි.

### අයිතිය

අයිතියට යටත් හෝ අයිතියට පත් කළ හැකි (නිශ්චල හා චංචල දේපල සහ ස්පර්ශ කළ හැකි හා ස්පර්ශ කළ නො හැකි සියලු ඇ අඩංගුව) සියල්ල දේපල වශයෙන් නීතිය නිර්වචනය කරයි.

අයිතිය පිළිබඳ සංකල්පයට පදනම් වී ඇත්තේ රෝමානු - ලන්දේසි නීතියයි. අයිතිය පිළිබඳ නෛතික සංකල්පයෙන් අදහස් කරනුයේ දේපල අයිතියට පත්කර ගැනීමේ, භුක්ති විඳීමේ සහ නිදහසේ බැහැර කිරීමේ අයිතියයි. දේපල පැවරීමක් මඟින්, ප්‍රාප්තිය මඟින්, බුක්ති නඩුවකින් හෝ අදාළ දේපලට උරුම කීමෙන් කෙනෙකුට අයිතිය පවරා ගැනීමට හෝ යළි පවරා ගැනීමට හැකි වේ.

## දේපල පැවරීම

දේපලක් නෛතික වශයෙන් පැවරීමේ දී දේපල අත්කර ගැනීම සහ ඉඩම් පැවරීම පිළිබඳ උපාචාරයන් ඇතුළත් වේ. ඒවා පහත සඳහන් පණත් සහ ආඥාපනත්වල සංහිතා ලෙස සකස් කර තිබේ.

## ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත

පැවරුම් ඔප්පුවක් ලියූ පසු එම ඔප්පුව අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු යි. මෙය 1927 ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත යටතේ සිදු කෙරන ක්‍රියාවලියකි. ලියාපදිංචි වී ඇති ඔප්පුවක් අයිතිව සිටින පුද්ගලයෙකු ඔහු සතු අයිතිය කවර ආකාරයකින් හෝ නිෂේධ වන තෙක්, වලංගු හිමිකම් ඔප්පුවක අයිතිකරු වශයෙන් සැලකේ.

## නොතාරිස් ආඥාපනත

සංශෝධිත නොතාරිස් පනත පෞද්ගලික ඉඩම් පැවරීම සම්බන්ධයෙන් ක්‍රියා කරයි. ඉඩමේ අයිතිකරු, නොතාරිස් සහ ඉඩම ලියාපදිංචි කිරීමේ කාර්යාලය යන මොවුන් සතුව ලියා හමාර කරන ලද සෑම ඔප්පුවක ම පිටපත බැගින් තිබිය යුතු යි. (31 ඡේදය)

## වංචා වැළැක්වීමේ ආඥාපනත

නිශ්චල දේපල පැවරීම එක්තරා නෛතික නියමයන්වලට අනුකූලව සිදු විය යුතු යයි වංචා වැළැක්වීමේ අඥාපනතේ සඳහන්ව තිබේ. (2 ඡේදය බලන්න.)

**විකිණීමක් මඟින් පැවරීම** - ඉඩම් ඇතුළු අනෙකුත් නිශ්චල දේපල උකස් කිරීම හෝ විකිණීම හෝ පැවරීම යන මේ කරුණු පිළිබඳ ගනුදෙනුව ලිඛිතව සිදු විය යුතු යි. එම ගනුදෙනුව සිදු කරන පුද්ගලයා අත්සන් කළ යුතු අතර සාක්ෂිකරුවන් දෙදෙනකු ගේ අත්සන් ලබා ගැනීමෙන් පසු නෙතාරිස්වරයා විසින් ම සහතික කළ හොත් පමණක් අදාළ පැවරීම වලංගු වේ.

## භාණ්ඩ විකිණීමේ ආඥාපනත

චංචල දේපල සම්බන්ධ ගනුදෙනුවල දී මෙම පනතේ විධිවිධාන අදාළ වේ. භාණ්ඩයක් වශයෙන් යම් දේපලක් කිසියම් මුදලකට විකිණුම්කරු විසින් විකිණීම හෝ පැවරීම (භාණ්ඩ) විකිණීමේ කොන්ත්‍රාත්තුවක් වශයෙන් සැලකේ. (2 වන ඡේදය)

කොන්ත්‍රාත්තුව ලිඛිතව තිබේ නම් හෝ මුදල් ගෙවා ඇත්නම් මිස අනාගතයේ දී නිෂ්පාදනය කිරීමට යෝජිත භාණ්ඩ සම්බන්ධයෙන් කොන්ත්‍රාත්තුවක් අදාළ නො වේ.

## ආබද්ධය

ආබද්ධ ක්‍රමය යටතේ දේපල පවරා ගැනීමේ දී යම් දේපලකට ආබද්ධ කරනු ඇ සියල්ල අයිතිකරු සතු වේ. බී සතු ඉඩමේ ඒ විසින් ගොඩනගන යමක් වෙතොත් එය බී සතු දේපල බවට පත් වේ. ඉඩමේ ස්වාභාවික වශයෙන් වැඩෙන ගහ කොළ ඉඩමේ අයිතිකරු සතු වේ. පල නෙලා නො ගෙන ඇති වාණිජ භෝග මෙම නියමයට ව්‍යාතිරේකයක් සේ සැලකේ.

## භුක්තිය

අන්‍ය පුද්ගලයෙකු සතු දේපල කාලයක් මුළුල්ලේ භුක්ති විඳීම මඟින් පවරා ගත හැකි වේ. මෙම රෝමානු - ලන්දේසි නීති මූලධර්මය ආඥාපනත්වලට ඇතුලත් වී ඇති අතර එය නිශ්චල දේපල කාලසීමාව සම්බන්ධයෙන් අදාළ වේ. රජයේ දේපල සම්බන්ධයෙන් නීතියේ ව්‍යාකූල භාවයක් දක්නට ඇත.

කිසියම් දේපලක් දස වසරක කාලයක් පුර අඛණ්ඩව භුක්ති විඳි බවට යම් පුද්ගලයෙකු ඔප්පු කිරීමට සමත් වුවහොත් කාලසීමා ආඥාපනතේ 3 ඡේදය යටතේ ඔහු එම දේපල අයිතිකරු වශයෙන් සැලකේ. එහෙත් එම ඉඩම සතු තම අයිතිය පිළිබඳ ප්‍රකාශයක් ලබාගැනීම හෝ  අදාළ ඔප්පුව ලියාපදිංචි කිරීම හෝ කළ හැක්කේ ඉඩමේ අයිතිකරු විසින් කරන ලද අභියෝගයක් මත අධිකරණය අඛණ්ඩ භුක්තිය පිළිගෙන දෙනු ලබන තීන්දුවක් මත ය. පනතේ 13 වන ඡේදය ප්‍රකාර බාල වයස්කාරයින්, සිහි බුද්ධිය ඌණ පුද්ගලයින් හෝ රටෙන් පිට වී ජීවත්වන පුද්ගලයින් සම්බන්ධයෙන් අදාළ කාල සීමාව අවුරුදු දහය නො ව අවුරුදු තිහකි.

රජයේ දේපළ සම්බන්ධයෙන් කාල සීමා අයිතිය තහවුරු කිරීමට හැකිවන අවස්ථාවක දී කාල සීමා හිමිකම ඔප්පු කිරීමේ භාරය ඉඩමට හිමිකම් ඉදිරිපත් කරනු ලබන පුද්ගලයා සතු වේ.

## අයිතිකරු සතු නඩු පැවරීමේ අයිතිය

ව්‍යවහාර නීතියේ අඩංගු අයිතිය තහවුරු කිරීමේ විධිවිධාන මඟින් යම් දේපලක අයිතිකරුවකුට ඔහු ගේ අවසරය නො මැතිව එම දේපලෙහි පදිංචිව සිටින පුද්ගලයෙකු ඉන් ඉවත් කළ හැකි ය. මෙම මූලධර්මය මත ඉඩම වෙත අහිංසක අයුරින් ප්‍රවේශ වන පුද්ගලයින් පවා (ඉඩම තමන් ගේ ය නැතහොත් වෙනත් කෙනෙකු ගේ ය යයි සිතා පැමිණෙන පුද්ගලයින්) ඉවත් කළ හැකි ය. වගඋත්තරකරුවන් විසින් සිදුකර ඇති පාඩු සහ විනාශය, අනවසරයෙන් දේපළට ඇතුළු වීම සහ අයිතිකරු ගේ අවසරයක් නො මැතිව තනා ඇති ගොඩනැගිලි ඉවත් කිරීමේ දී වැයවන වියදම අයකරගැනීම සඳහා ක්‍රියාකිරීමට පැමිණිලිකරුට ඉඩකඩ ඇත.

අයිතිකරුවකු නො වන පුද්ගලයකු විසින් දේපලක් සම්බන්ධයෙන් සිදු කරන වැඩිදියුණු කිරීම් සඳහා වැය වූ මුදල ප්‍රතිපූරණය නො කර අයිතිය පවරාගැනීම අසාධාරණ ය. වැඩිදියුණු කිරීම සිදු කරන පුද්ගලයෙකුට අවශ්‍ය වැඩිදියුණු කිරීම් සම්බන්ධයෙන් හිමිකම් තිබේ. අයිතිකරු තමා නො වන බව දැනගෙන, වැඩිදියුණු කිරීම් කරන පුද්ගලයෙකුට ඒ සඳහා හිමිකම් ඉදිරිපත් කළ නො හැකි ය. නිර්ව්‍යාජ භුක්ති කරුවකුට අවශ්‍ය වැඩිදියුණු කිරීම් වෙනුවෙන් හිමිකම් ඉදිරිපත් කළ හැකි ය. (දේපලට වාණිජ වටිනාකමක් එකතු කරන, ඉඩම සඳහා කරනු ලබන වැඩිදියුණු කිරීම්) අයිතිකරුවකු නො වන පුද්ගලයෙකු විසින් සිදු කරනු ලබන වැඩිදියුණු කිරීම් වෙනුවෙන් වන්දි ලබාගැනීම පිණිස නීතිය මඟින් කටයුතු කළ හැකි ය. එසේ නැත්නම්, වන්දිය ලැබෙන තෙක් භුක්තිය තමා වෙත තබා ගත හැකි ය.

භුක්තිය, උත්තර අයිතිය සනාථ කිරීම සහ ඉඩම තුන්වෙනි පාර්ශවයක් සතුවීම යන කරුණු අයිතිය ලබාගැනීම සඳහා නඩු පැවරීමේ දී වැදගත් වන සාධකයෝ වෙති.

## භුක්තිය

භුක්තිය අයිතිය තහවුරු කරන සාධකයෙකි. භුක්තිය හිමිකරු සහ අයිතිකරු හෝ යම් දේපලකට නීත්‍යානුකූල අයිතිය දරන පුද්ගලයා එකම අයෙකු නො විය යුතු යි.

පුද්ගලයින් දෙදෙනාට ම නීතියෙන් හිමිකම් තිබේ.

භුක්තිය අහිමි වූ පුද්ගලයෙකුට එසේ අහිමි වී එක් වසරක් හා එක් දිනක් තුළ දී භුක්තිය පතා නඩුවක් පැවරිය හැකි ය. ඉවත් කරන ලද පැමිණිලි කරුවකු තමා සතු කවර හෝ හිමිකමක් සනාථ කිරීම අවශ්‍ය නො වේ. ඔප්පු කළ යුතු එක ම දෙය ඉවත් කරන ලද අවස්ථාවේ පැමිණිලි කරුවකුට දේපල සම්බන්ධ නිත්‍ය අයිතිය තිබුණ බවත්, පැමිණිලිකරුව ඉවත් කරන ලද බවත් සහ එම ඉවත් කිරීම නීත්‍යානුකූල නො වන බවත් ය.

## ප්‍රාථමික උසාවි ක්‍රියාපටිපාටිය පිළිබඳ පනත

මෙම පනතේ 69 ඡේදය ප්‍රකාර යම් දේපලක අයිතිකරු නො වන, එහෙත් එහි භුක්තිය ඉල්ලා නඩු පැවරීමට පෙර මාස දෙකක කාලයක් පුරා එහි භුක්තිය ලබා සිටි හෝ දේපලක් අහිමි වූ පුද්ගලයෙකුට තම අයදුම්පත මාස දෙකක් ඇතුළත ගොනු කරන ලද්දේ නම් එම දේපලෙහි භුක්තිය ලබාගැනීමට හිමිකම් ඇත.

එසේ ඉදිරිපත් කරන ලද අයදුම් පත්‍රයක් සම්බන්ධයෙන් ප්‍රාථමික උසාවියේ තීරණය අයිතිකරු ගේ අවාසියට ප්‍රකාශ වී ඇත්නම්, ඉඩමේ අයිතිය ඉල්ලා ඔහුට දිස්ත්‍රික් උසාවියේ නඩුවක් පැවරිය හැකි ය.

## උරුමය

පුද්ගලයෙකුට තමන් සතු සියලු දේපල (චංචල හා නිශ්චල) සම්බන්ධයෙන් තමා ගේ මනාපය පරිදි නීත්‍යානුකූලව වලංගු අන්තිම කැමති පත්‍රයක් මඟින් සුදුස්සක් කළ හැකි ය. අන්තිම කැමති පත්‍රයක් නීත්‍යානුකූලව වලංගු වීමට නම් එය අන්තිම කැමති පත්‍ර පිළිබඳ ආඥාපනතේ විධිවිධානයන්ට අනුකූල විය යුතු යි. එ නම්, එය ලිඛිතව පිළියෙල කළ යුතු අතර ප්‍රකාශකරු විසින් අත්සන් කළ යුතු යි. එම දේපලෙන් ලාභ කිසිවක් නො ලබන සාක්ෂිකරුවන් දෙදෙනෙකු සහ නොතාරිස්වරයෙකු විසින් සහතික කළ යුතු වේ. නොතාරිස්වරයෙකු නො මැති අවස්ථාවල දී එකවර පෙනී සිටින සාක්ෂිකරුවන් පස් දෙනෙකු විසින් එය සහතික කළ යුතු වේ.

අන්තිම කැමති පත්‍ර පිළිබඳ ආඥාපනත සියලු පුද්ගලයින්ට අදාළ වන අතර, අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් අදාළ වන පෞද්ගලික නීති සියල්ල අභිබවා යනු ඇත. අන්තිම කැමති පත්‍රයක් ප්‍රකාශයට පත් කරන පුද්ගලයින් එසේ කිරීමට සුදුසුකම් ඇති බවට නෛතික වශයෙන් පිළිගැනීමට ලක්විය යුතු අතර ඔවුන් එ වැන්නක් කරනු ලබනුයේ ඒ පිළිබඳ ව මනා අවබෝධයෙන් හා කිසිඳු බලපෑමකින් තොර තමන් ගේ ම කැමැත්ත පරිදි විය යුතු යි.

අන්තිම කැමති පත්‍රයක් ලියා නො මැතිව කෙනෙකු මිය ගිය අවස්ථාවක දී සාමාන්‍ය නීතිය, මුස්ලිම් නීතිය හෝ තේසවලමෙයි නීතිය අතුරින් ඔහුට අදාළ වන නීතිය ප්‍රකාර ඔහු ගේ දේපල පිළිබඳ උරුමය සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලැබේ.

### උරුමය නො පැවරූ බූදලය - සාමාන්‍ය නීතිය

යම් පුද්ගලයෙකු අන්තිම කැමති පත්‍රයක් නො ලියා මිය ගිය හොත්, ඔහු පාලනය වන සාමාන්‍ය නීතිය ප්‍රකාර, ඔහු සතු චංචල හා නිශ්චල දේපල ඔහු ගේ බිරිය සහ දරුවන්ට උරුම වේ. දේපලෙන් අඩක් බිරියට හිමිවන අතර, ඉතිරිය දරුවන් අතර සමසේ බෙදී යනු ඇත. අවජාතක දරුවන්ට ඔහු ගේ දේපල සම්බන්ධයෙන් පමණක් හිමිකම් ඇත. මව්පිය දෙදෙනාම මියගිය අවස්ථාවල සියලු දේපල දරුවන් අතර සමසේ බෙදී යනු ඇත. මිය ගිය තැනැත්තා ගේ බිරිය හෝ දරුවන් නො මැත්තේ නම්, ඔහු සතු මුළු දේපලවල උරුමය දෙමව්පියන්ට අයිති වේ.

### උරුමය නො පැවරූ බූදලය - මුස්ලිම් නීතිය

අන්තිම කැමති පත්‍රයක් ලියා නො මැතිව මුස්ලිම් නීතිය මඟින් පාලනය වන පුද්ගලයකු මිය ගිය හොත් උරුමය පිළිබඳ මුස්ලිම් නීතිය අදාළ වේ. මුස්ලිම් නීතිය මඟින් පුද්ගයින් පාලනය වීමට නම් ඔවුන් මුස්ලිම් නීතිය ප්‍රකාර වලංගු විවාහයකට ඇතුළත් වී සිටිය යුතු යි. මෙහි දී මුස්ලිම් නීතිය අනුව වලංගු විවාහයක් වශයෙන් සලකනු ලබන්නේ, මුස්ලිම් ජාතිකයින් දෙදෙනකු අතර හෝ එක් පාර්ශවයක් ක්‍රිස්තියානි ලබ්ධියටත්, අනිත් පාර්ශවය ඉස්ලාම් ලබ්ධියටත් අයත් වන අවස්ථාවල දී සිදු වන විවාහයක් වේ. මුස්ලිම් නො වන පාර්ශවය ක්‍රිස්තියානි නො වන විවාහවල දී, මුස්ලිම් නීතිය අදාළ වන්නේ මුස්ලිම් නො වන පාර්ශවය ඉස්ලාම ලබ්ධිය වැළඳ ගත හොත් පමණි.

උරුමය පිළිබඳ මුස්ලිම් නීතිය ප්‍රකාර, මව, පියා, බිරිය/පුරුෂයා සහ දරුවන් යන සියලු දෙනාට ම මියගිය අය ගේ දේපල සඳහා උරුමය හිමි වේ. කෙසේ වුව ද, උරුමක්කාරයින්ට වෙන්කරනු ලබන කොටස් වෙනස් වේ. කොටස් වෙන් කිරීම පුද්ගලයා අයත් ආගමික නිකාය මත රඳා පවතී. මුස්ලිම් නීතිය යටතේ අවජාතක දරුවන්ට මව ගේ හෝ පියා ගේ දේපල කිසිවක් හිමි නො වේ.

## උරුමය නො පැවරූ බූදලය සහ අනෙකුත් මූලධර්ම

### තේසවලමෙයි නීතිය

අන්තිම කැමති පත්‍රයක් නො මැති අවස්ථාවක, උතුරු පළාතේ දෙමළ වැසියන් ගේ උරුමය පිළිබඳ අයිතිවාසිකම් තේසවලමෙයි නීතිය මඟින් පාලනය වේ. දෙමළ වැසියකු වශයෙන් සුදුසුකම් ලැබීමට නම් විවාහය සිදුවන අවස්ථාවේ දී තමා ගේ ස්ථිර පදිංචිය උතුරු පළාතේ ආරම්භ කිරීමට අදහස් කරන බව ඔප්පු කළ යුතු ව ඇත. විවාහයේ දී හා විවාහය වලංගුව පවතිනතාක් සැමියා පාලනය වන පෞද්ගලික නීතියම බිරිය ද පාලනය කරනු ලබයි. එ බැවින් තේසවලමෙයි නීතිය මඟින් පාලනය නො වන කාන්තාවන් විවාහය වලංගුව පවතින කාලය පුරා එයට යටත් වනු ඇත. එහෙත් තේසවලමෙයි නීතියෙන් පාලනය නො වන පිරිමියකු, එම නීතියෙන් පාලනය වන කාන්තාවක් විවාහ කරගත හොත් ඔහු එම නීතියට යටත් නො වේ.

උතුරු ප්‍රදේශයේ පිහිටා ඇති සියලු ඉඩම් සම්බන්ධයෙන් ද තේසවලමෙයි නීතිය අදාළ වේ. මේ නීතියෙන් අපේක්ෂා කරනු ලබන උතුරු ප්‍රදේශයට අයත් භූමිය යාපනය සහ

මන්නාරම අයත් වර්තමාන උතුරු පළාතේ සීමාවන්ට සමාන වේ. තේසවලමෙයි නීතියට යටත් පුද්ගලයින් සතු උතුරු ප්‍රදේශයෙන් එපිට පිහිටා ඇති ඉඩම් සම්බන්ධයෙන් ද තේසවලමෙයි නීතිය අදාළ වේ. තේසවලමෙයි නීතිය යටතේ විවිධ වර්ගයේ දේපළ වෙන් වශයෙන් අඳුනා ගැනේ. එ නම්, බිරිඳ සහ සැමියා විසින් විවාහය පවතින කාලය තුළ දී අත් කරගත් දේපළ සහ එම දේපළ තුළින් ලබාගන්නා ලාභ (තෙඩිය කෙට්ටම්) : දැවැදි දේපළ (විසිනම්): මව් පාර්ශවයෙන් උරුම වූ දේපළ (මුදුසම්) සහ පිය පාර්ශවයෙන් උරුම වූ දේපළ වශයෙනි.

අන්තිම කැමති පත්‍රයක් ලියා නො මැති අවස්ථාවල මිය ගිය සැමියා/බිරිය අත්කර ගෙන තිබූ දේපළින් භාගයක් සැමියාට/බිරියට හිමිවන අතර, ඉතිරිය දරුවන් අතරේ සම සේ බෙදී යනු ඇත. දරුවන් නො මැත්තේ නම් දේපළ දෙමව්පියන් අතරත්, දෙමව්පියන් නො මැති කල සහෝදර, සහෝදරියන් අතර බෙදී යනු ඇත. අවජාතක දරුවන්ට හුදෙක් තම මව ගෙන් පමණක් උරුමය හිමි වේ.

## ඉඩම් හා දේපලට අදාළ තේසවලමෙයි නීතියේ අනෙක් මූලධර්ම

- උතුරු පළාත තුළ පිහිටා ඇති සියලු දේපල සහ තේසවලමෙයි නීතියෙන් පාලනය වන පුද්ගලයින්ට අයත් අන්‍ය ප්‍රදේශවල පිහිටා ඇති දේපල සම්බන්ධයෙන් පූර්ව ක්‍රියාධිකාරය පිළිබඳ නීතිය අදාළ වේ. එ බැවින් කෙනෙකු තමන් සතු දේපල වෙනත් අයට විකිණීමට පෙර සඳහන් මිලට හවුල්කරුවන්ට සහ උරුමක්කාරයින්ට මිලදී ගැනීමේ අවස්ථාව ලබාදිය යුතු ය.

- නිශ්චල දේපලට අදාළ කටයුතු ස්වකීය සැමියා ලේ ලිඛිත කැමැත්ත නො මැතිව කාන්තාවකට කළමනාකරණය කළ නො හැකි ය. අසාධාරණ අයුරින් සැමියාට කැමැත්ත නො දී සිටී නම් හෝ සිරගත වී සිටී නම් හෝ නැති වී සිටී නම්, එම දේපල කළමනාකරණය කිරීම සඳහා කාන්තාවට උසාවි අවසරය අයදුම් කළ හැකි ය.

- තේසවලමෙයි නීතිය ඔට්ටි උකස් කිරීම් සහ තේසවලමෙයි පරවශතාවයන්ට අදාළ වේ.

- හරක් සහ සතුන් කුලියට දීම, ඉඩම් මිල දී ගැනීම් හා විකිණීම් වැනි එක්තරා වර්ගයේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් තේසවලමෙයි නීතිය අදාළ වේ.

## කුලී නිවැසිය

කුලියක් ගෙවීම මත නිවසක හෝ මහල් නිවාසයක භුක්තිය ලබාගැනීම මඟින් කෙනෙක් කුලී නිවැසියකු බවට පත් වේ. ගෙවල් කුලී පනතේ විධිවිධානයන් යටතට වැටීම හෝ ඉන් මිදී සිටීම මත දේපල අයිතිකරු සහ කුලිකරු සතු අයිතිවාසිකම් සහ බැඳීම් රඳා පවතී.

1980 න් පසු තැනූ ගොඩනැගිලි, 1980 තෙක් අයිතිකරු පදිංචි වී සිටි එදිනෙන් පසු කුලියට දී ඇති දේපල, සහ විදේශිකයින් සඳහා කුලියට දී ඇති දේපල (ගෙවල් කුලි පනතේ 2 ඡේදය) ගෙවල් කුලී පනතේ විධිවිධානයන් ගෙන් නිදහස් වේ. එ වැනි දේපල පාර්ශවයන් එකඟ වී ඇති කොන්දේසි ප්‍රකාර කුලියට දිය හැකි ය. ගොඩනැගිල්ල කුලියට දී ඇති නියමිත කාලයට පෙර එය අවසන් කළ නො හැකි ය. අන්‍යෝන්‍ය එකඟත්වය මත හෝ යම් පාර්ශවයක් ගිවිසුම උල්ලංඝණය කර ඇත්නම් පමණක් දෙපාර්ශවය විසින් ගිවිසගත් කොන්ත්‍රාත්තුව

අවසන් කළ හැකි ය. ගොඩනැගිල්ල කුලියට දී ඇත්තේ එක්තරා නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා නො වේ නම්, එක් පාර්ශවයක් විසින් අනෙක් පාර්ශවයට එක් මසක කල්දීමකින් පසු නිවැසිය හමාර කළ හැකි යි.

එක්තරා නිශ්චිත කාල පරිච්ඡේදයක් සඳහා නිවසක් කුලියට දී ඇති අවස්ථාවක දී එම කාල පරිච්ඡේදය අවසන් වීමට පෙර කුලියට ගත් එම ගොඩනැගිල්ලේ පදිංචිකරු මියගිය හොත්, ඔහු ගේ උරුමක්කාරයන්ට කුලියට ගෙන ඇති නිශ්චිත කාල පරිච්ඡේදය අවසාන වනතෙක් ගොඩනැගිල්ලේ පදිංචි විය හැකි ය. මාසික කුලියක් මත ගොඩනැගිල්ල ලබා ගෙන ඇත්නම් අදාළ මාසයේ අවසානය දක්වා ගොඩනැගිල්ලේ පදිංචිය කරගෙන යා හැකි ය.

ගෙවල් කුලී පනතින් පාලනය වන දේපල සඳහා කුලී පාලක මණ්ඩලයෙන් නියම කර ඇති කුලිය ඉක්මවා වැඩි කුලියක් අය කරගත නො හැකි ය. කුලියේ වෙනසක් අවශ්‍ය වන්නේ නම් කුලී පාලක මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතු වේ. දේපල අයිතිකරු අවශ්‍ය අලුත්වැඩියා කිරීමට අපොහොසත් වන අවස්ථාවල දී කුලී කරුට එම අලුත්වැඩියා සිදු කළ හැකි ය. එහෙත් කුලී කරු විසින් අලුත්වැඩියා සඳහා වැය කරන ලද වියදම් ඔහුට නිවාස අයිතිකරු ගෙන් ආපසු ලබාගත හැකි ය.

කුලී ගොඩනැගිල්ලක පදිංචි කරුවකු ඉවත් කිරීම සඳහා ගෙවල් කුලී පනතින් විධිවිධාන සැලසී ඇත.

කුලිය මසකට රු. 100/= ඉක්මවන අවස්ථාවල දී පහත සඳහන් හේතු මත කුලීකරු පදිංචි නිවසින් ඉවත් කළ හැකි ය.

i. කුලී නිවැසියා එක් මසකට වැඩි කාලයක් කුලී නො ගෙවා තිබීම.

ii. ගොඩනැගිල්ල අයිතිකරුට එය ස්වකීය පදිංචිය හෝ වෙළඳාම හෝ ව්‍යාපාරික කටයුතු සඳහා අවශ්‍ය වීම.

iii. කුලී නිවැසියාට ගෙවීම සඳහා ගොඩනැගිල්ල අයිතිකරු වසර 5 ක කුලිය ජාතික නිවාස කොමසාරිස් වෙත තැන්පත් කර තිබීම.

iv. ගොඩනැගිල්ල අයිතිකරු ගේ අවසරය නො මැති වීම, කුලී නිවැසියා වෙනස් පුද්ගලයෙකුට ගොඩනැගිල්ල කුලියට දී තිබීම.

v. මාසයකට කාලයක් සඳහා කුලියට ගත් ගොඩනැගිල්ලක්, කුලී නිවැසියා සය මසකට අධික කාලයක් පදිංචි නො වී හිස්ව තැබීම.

vi. පදිංචිය සඳහා කුලියට ගත් නිවසක් ඒ සඳහා ප්‍රයෝජනයට නො ගෙන, ව්‍යාපාරික කටයුතු සඳහා යොදා ගැනීම නිසා, ගොඩනැගිල්ලේ පදිංචි නො වූවා සේ සලකා අයිතිකරුවකුට කුලී නිවැසියා ගොඩනැගිල්ලෙන් ඉවත් කළ හැකි වේ.

1972 පෙර කුලියට දී ඇති ගොඩනැගිලි සම්බන්ධයෙන්, මිය ගිය කුලී නිවැසියා ගේ ජීවිතුන් අතර සිටින බිරිය/සැමියා සහ ළමයින් මෙන් ම ඔහු ගේ මරණයට තෙමසකට කලින් ඔහු ගේ පවුලේ සාමාජිකයින් වශයෙන් ඔහු ගෙන් යැපුන සහෝදර, සහෝදරියන්ට ද ඉදිරියටත් මෙම කුලී නිවසේ පදිංචි වීමට හිමිකම ලැබේ.

මියගිය කුලී නිවැසියා ව්‍යාපාරික ස්ථානයක් කුලී ගොඩනැගිල්ලේ පවත්වා ගෙන ගියේ නම්, ජීවත්ව සිටින බිරිය/සැමියා, ළමයින් ව්‍යාපාරික හවුල්කරු උරුමක්කාරයා සහ පොල්මඃකාරයා යන අයට එම ගොඩනැගිල්ලේ රැඳී සිට ඉදිරියටත් මියගිය අය ගේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාමට හිමිකම් ලැබේ.

කුලී ගොඩනැගිල්ලේ පදිංචිය සඳහා එක් අයෙකුට වැඩියෙන් හිමිකම් කියන්නේ නම් තීරණයක් සඳහා ඔවුන් කුලී පාලක මණ්ඩලය ඇමතිය යුතු යි. දේපළ හිමිකරුවකු තම මරණයට පෙර කුලී නිවැසියකුට පදිංචියෙන් ඉවත් වෙන ලෙස දන්වා යවන ලද නිවේදනය ඔහු ගේ අනුප්‍රාප්තිකයින් කිසිවකු කෙරෙහි අනුගම්‍ය නො වනු ඇත. දේපල හිමිකරු මිය යාමෙන් පසු, කුලී නිවැසියා අලුත් දේපල හිමිකරු පිළිගත යුතු යි. එසේ කිරීමට ඔහු අපොහොසත් වුවහොත් ඔහුට/ඇයට කුලී නිවැසියකු වශයෙන් නීතියෙන් ලැබී ඇති පිහිට අහෝසි වන අතර, නීති විරෝධී පදිංචිකරුවකු වශයෙන් ඉවත් කළ හැකි ය.

## පෞද්ගලික දේපල පිළිබඳ අනෙකුත් මූලධර්ම

පෞද්ගලික දේපලට අයත් අනෙකුත් මූලධර්ම ගණනාවක් ම අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයින්ට මුහුණ පෑමට ඉඩ ඇති ඉඩම් හා දේපල පිළිබඳ ප්‍රශ්නවලට අදාළ වේ.

### මායිම් ලකුණු කිරීම

මායිම් ලකුණු කිරීම, රෝම ලන්දේසි නීතියෙන් මෙන් ම ව්‍යවස්ථාපිත නීතියෙන් ද පාලනය වේ. රෝම ලන්දේසි නීතිය අනුව සෑම දේපල අයිතිකරුවෙක් ම එහි මායිම් දැන සිටිය යුතු ය. ඒ පිළිබඳ කාර්යය පරිපාටිය සහ විෂය ප්‍රමාණය ව්‍යවස්ථාපිත සහ නඩු තීන්දු නීතියේ අන්තර්ගතව ඇත. කෙනෙකුට තමා ගේ ඉඩමේ මායිම් සුරැකීම සඳහා මායිම් ආඥාපනත මඟින් විධිවිධාන සලසා තිබේ. ඒ අනුව අයිතිකරුවන් විසින් තම හිමිකම් ඔප්පු දිසාපති වෙත ඉදිරිපත් කළ යුතු යි. හිමිකම් ඔප්පු නො මැති නම්, අයිතිකරු ගේ වියදමින් ඉඩම මැනීම සඳහා දිසාපතිවරයා කටයුතු කරයි. ඉන්පසු එම ඉඩමට රජයේ හිමිකමක් නො මැති බවට දිසාපතිවරයා විසින් සහතිකයක් නිකුත් කරනු ලබයි. ලකුණු කළ මායිමක් වෙනස් කිරීම දඬුවම් ලැබිය යුතු වරදකි. මායිම් විග්‍රහ කිරීමට පෙර, තහනම් නියෝගයක් මඟින් ඉඩමේ පදිංචිය වළක්වා ලීමට පැමිණිලිකරුට කටයුතු කළ හැකි ය.

### මුදල් ගනුදෙනු

මුදල් පොලියට ලබාදීමේ පනත මඟින් පොලියට මුදල් දීමේ ගනුදෙනු පාලනය කරනු ලැබේ. ඉතාමත් අසාධාරණ අයුරින් සිදු වූ මුදල් ගනුදෙනුවක් සම්බන්ධයෙන් යළි පරීක්ෂා කර බලා ණයකරුට සහනයක් ලබාදීම සඳහා මෙම ආඥාපනතින් අධිකරණයට බලය ලබා දී තිබේ. (2 වන ඡේදය) බැංකු ගනුදෙනු සහ බලයලත් උකස්කරුවන් සම්බන්ධයෙන් මෙම පනත ව්‍යවහාර නො වේ.

### හානි සඳහා වන්දි ලබාගැනීම

නීතිය මඟින් පවරා ඇති වගකීමක් ඉටු කිරීමට අපොහොසත් වීම සම්බන්ධයෙන් අතෘප්තියට පත් පුද්ගලයාට දිලික්ත නීතිය යටතේ සිදු වූ හානිය සඳහා වන්දි ලබාගැනීමට

ක්‍රියා කළ හැකි ය. වෙළඳ ව්‍යාපාර හා රැකියා සහ කොන්ත්‍රාත්කරු සම්බන්ධයෙන් ඇඟිලි ගැසීම, සහ අනවසරයෙන් දේපලට ඇතුල්වීම දේපල සම්බන්ධයෙන් වගකීම් කඩකිරීම් යනාදිය අයුතු ක්‍රියා ඝණයට අතුළත් වේ. පැමිණිලිකරු සම්බන්ධයෙන් යම් වගකීමක් විත්තිකරු වෙතින් කඩවීමේ චෝදනාව හරි හැටි අධිකරණයේ දී සනාථ වුවහොත්, විත්තිකරුට පැමිණිලිකරුට සිදු වූ හානිය සම්බන්ධයෙන් වන්දි ගෙවීමට සිදු වේ.

නීති විරෝධී අයුරින් දේපලට ඇතුල්වීම උඩ වන්දි ලබාගැනීමේ දී, එසේ නීති විරෝධීව ඇතුල්වීම මඟින් දේපලට හානි සිදු වී ඇති බව පැමිණිලිකරු විසින් ඔප්පු කළ යුතු යි. සිදු වූ හානිය මනිනු ලබන්නේ ප්‍රවේණි පාඩුව පරිදි ය. තක්සේරුකරුවකු විසින් සිදු වූ හානියේ ප්‍රමාණය තීරණය කරනු ඇත.

## 8:2 රජයේ දේපල

අමාත්‍යාංශ ගැසට් නිවේදන මඟින් ප්‍රකාශිත උපකාරක සහ අභ්‍යන්තර රෙගුලාසි මගින් සංශෝධනය කරන ලද ව්‍යවස්ථාපිත නීතියෙන් සියලු ම රජය සතු දේපල පාලනය වේ. පහත දැක්වෙන ඉඩම් රජයේ ඉඩම් වශයෙන් සැලකේ: රජය සතු හිමිකම් සහිත ඉඩම්, රජය විසින් අන් සතු කරනු ලබන ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට පවරා ගන්නා ලද ඉඩම් සහ වෙනත් සංස්ථාපිත ආයතන යනාදියයි.

ඉඩම්, දේපල සහ පුනරුත්ථාපනය පිළිබඳ කරුණු සහ රජයේ ඉඩම් හා දේපල සම්බන්ධ වැදගත් ආඥාපනත් කීපයකට දහතුන් වැනි ආණ්ඩු ක්‍රම සංශෝධනය මඟින් බලය බෙදාහැරීම බලපෑ අයුරු මෙම ඡේදයෙන් විස්තර කෙරේ.

## දහතුන් වැනි ආණ්ඩුක්‍රම සංශෝධනය

රජය සතු ඇතැම් බලතල පළාත් සභා වෙත පැවරීමේ අරමුණින් දහතුන් වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව 1987 දී හඳුන්වා දෙන ලදී. රජයේ සහ පළාත්සභා බලතල යටතේ ගැනෙන විෂයයන් පළාත්සභා ලයිස්තුව, සමගාමී ලයිස්තුව සහ අවධාරිත ලැයිස්තුව වශයෙන් වර්ග කර ඇති අයුරු මෙම සංශෝධනයෙන් පෙන්නුම් කරනු ලැබේ. පළාත්සභා ලැයිස්තුව, අවධාරිත ලැයිස්තුව සහ සමාගාමී ලැයිස්තුව යන මේවා තුළ අඩංගු කරුණු පළාත් සභා, රජය සහ පළාත්සභා සහ රජය යන ආයතනයන් සතු කාර්යය පථය යටතට වැටේ. පළාත්සභා ලැයිස්තුව යටතට වැටෙන කරුණු සම්බන්ධයෙන් අවසාන තීරණයක් ගැනීමේ බලතල පළාත්සභා සතුව ඇතත්, පළාත්සභා වෙත පවරා ඇති සියලු විෂයයන් අභිබවා යන බලතල මධ්‍යම රජය සතුව තිබේ. එ බැවින් ඉඩම්, පුනරුත්ථාපනය, යළි ගොඩනැගීම් සහ අනෙකුත් අදාළ කරුණු පළාත්සභා වන්හි කාර්යය පථය යටතට වැටෙතත්, සියලු කරුණු සම්බන්ධයෙන් සත්‍ය වශයෙන් ම අවසන් තීරණය ගනු ලබන්නේ මධ්‍යම රජය විසිනි. තව ද, තීරණ ගැනීමේ බලතල පළාත්සභා සතුව තිබෙන මුත්, අවශ්‍ය මුදල් ප්‍රතිපාදන ලබාගැනීමේ දී පළාත්සභාවලට මධ්‍යම රජය මත යැපීමට සිදු වී ඇති නිසා සත්‍ය වශයෙන් ම මධ්‍යම රජයේ පාලනයට යටත් වීමට පළාත්සභා පෙළඹී සිටිති.

දහතුන් වන සංශෝධනය යටතේ ක්‍රියාවට නැංවෙන විෂයයන් කීපයකි, ඉඩම් පුනරුත්ථාපන කටයුතු, නැවත ගොඩනැගීම් සහ අනෙකුත් අදාළ කරුණු

ඉඩම් (1 වෙනි ලයිස්තුව සහ උප ග්‍රන්ථය 11 - 13 වෙනි සංශෝධනය)

ඉඩම්, ඉඩම් භුක්තිය, පැවරීම සහ අන්සතු කිරීම, ඉඩම් ප්‍රයෝජනයට යොදා ගැනීම, ඉඩම් නිරවුල් කිරීම සහ ඉඩම් වැඩිදියුණු කිරීම, ඉඩම් පිහිටා ඇති ප්‍රදේශ අයත් පළාත්සභාවේ කාර්යය පථය යටතට වැටේ. කෙසේ වුව ද, රජය සතු ඉඩම් අඛණ්ඩව ජනරජයේ අයිතිය යටතේ පවතින අතර ඒවා අන්සතු කිරීම, පැවරීම යනාදිය සම්මත ක්‍රියාපටිපාටිය අනුගමනය කරමින් ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ගේ නිල මුද්‍රාව යටතේ සිදුවිය යුතු යි. එ බැවින් පළාත්සභාවකට යම් ඉඩමක් අන් සතු කිරීමට හෝ විකිණීමට අවශ්‍ය වුවහොත් එම කටයුත්ත ශ්‍රී ලංකා ජනාධිපතිවරයා ගේ නිළ මුද්‍රාව යටතේ සිදුවිය යුතු යි. තවදුරටත්, ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සහ වාරිමාර්ග ව්‍යාපෘති රජයේ වගකීම වන බැවින් එම ව්‍යාපෘති පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම රජයට පැවරී තිබේ. දහතුන් වෙනි සංශෝධනයේ අඩංගු විධිවිධාන ප්‍රකාර ඉඩම් කට්ටි බෙදාදීම අවශ්‍ය තන්හී, එය ජාතික වාර්ගික අනුපාතයට අනුකූලව සිදු කරනු ලැබේ.

ඉඩම් කට්ටි කර බෙදාදීමේ දී පළාතේ ජනගහන රටාවට හානි නො වන ආකාරයෙන් ක්‍රියා කළ යුතු අතර, ඉඩම් කොටස්වල පදිංචි ජනතාව අතර ප්‍රජා සමගිය සහ හොඳ හිත පලුදු වීමට ඉඩ නො තැබිය යුතු යි. විවිධ ව්‍යාපෘති යටතේ ඉඩම් බෙදාදීමේ දී ව්‍යාපෘතිය ආරම්භ කිරීමේ හේතුවෙන් අවතැන් වූ පවුල්වලට ප්‍රමුඛත්වය ලබාදිය යුතු යි. දෙවනුව, ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශයේ ඉඩම් අහිමි ජනතාව ද අවසාන වශයෙන් පළාතේ ඉඩම් නො මැති පවුල් ද සැලකිල්ලට ලක් කිරීම වැදගති. පළාත්සභා ලැයිස්තුවේ උපග්‍රන්ථය ඉඩම් කොමිසමක් පිහිටුවීම නිර්දේශ කරයි. පළාත්සභාවේ සාමාජිකයින් ගෙන් සමන්විත මෙම කොමිසම රජයේ ඉඩම් පරිහරණයට ගැනීම සම්බන්ධයෙන් ජාතික ඉඩම් ප්‍රතිපත්තියක් සැකසීමේ වගකීම දරයි. මෙම කොමිසමේ බලතල ඒ ඒ පළාත්වල පළාත්සභාව විසින් ක්‍රියාත්මක කරනු ඇත. කෙසේ වුව ද, මෙතෙක් ඉඩම් කොමිසමක් පත්කර නො මැත.

## දේපල

දේපල අත්කර ගැනීම සහ භුක්තිය පවරා ගැනීම සඳහා රජයට මෙන් ම පළාත්සභාවලට ද අවශ්‍ය බලතල ඇත.

## සමාජ සේවා සහ පුනරුත්ථාපනය

සිවිල් ජීවිතය ප්‍රති සංවිධානය කිරීම, එ නම් සහන සේවා සැපයීම, පුනරුත්ථාපනය සහ අවතැන්වූවන් යළි පදිංචි කිරීම රජයේ මෙන් ම පළාත්සභාවල ද වගකීම වන්නේ ය. නගර, ගම්, රාජ්‍ය ආයතන සහ දේපල, කර්මාන්ත, ව්‍යාපාරිකස්ථාන, ආගමික ස්ථාන සහ විනාශ වූ හෝ හානියට පත් අනෙකුත් දේපල ප්‍රතිසංස්කරණය කිරීම, නැවත ගොඩනැගීම, සහ පුනරුත්ථාපනය කිරීම සම්බන්ධයෙන් රජය සහ පළාත්සභා යන දෙපාර්ශවය ම සැලකිලිමත් විය යුතු වේ. පුද්ගලයින්ට හෝ ආයතනයන්ට තම දේපල අහිමිවීම හෝ පාඩු ඇරීමට සිදුවීම ගැන සලකා බලා වන්දි හෝ සහන ලබාදීමේ වගකීම ද රජයට මෙන් ම පළාත්සභා වෙත ද පැවරේ.

## ව්‍යවස්ථාපිත නීතිය

රජයට ඉඩම් පවරාගැනීම් සහ ඉඩම් සහ දේපල අන්සතු කිරීම් පාලනය වන විවිධ ආඥාපනත් පිළිබඳ කෙටි විස්තරයක් මෙහි පහත දැක් වේ. මෙම ආඥාපනත් සියල්ලක් ම පාහේ දැනට

පනවා ඇතත්, සමහර ආඥාපනත් පුළුල් වශයෙන් ක්‍රියාත්මක නො වේ. එ බැවින්, හුදෙක් කෙටියෙන් පමණක් ඒවා විස්තර කර ඇත.

## ඉඩම් අත්කර ගැනීමේ පනත

කෘෂිකර්මය ඇතුලු පොදු මහජන කටයුත්තක් සඳහා ඉඩම් පවරා ගැනීම පිණිස රජය ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ ක්‍රියා කරනු ලැබේ. (2 ඡේදය) වෙනත් ආඥාපනත් යටතේ ඉඩම් අත් කරගනු ලැබූවත්, අත්කර ගැනීමේ ක්‍රියාපටිපාටිය ඉඩම් අතකර ගැනීමේ පනත යටතේ සඳහන්ව ඇත.

## ඉඩම් ප්‍රතිසංස්කරණ නීතිය

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම පිහිටුවා ඇති මෙම නීතිය මඟින් යම් පුද්ගලයෙකුට තමා සන්තකයෙහි තබාගත හැකි උපරිම කෘෂිකාර්මික ඉඩම් ප්‍රමාණය නියම කර ඇත. (2 ඡේදය) අතිරික්ත ඉඩම්, ඉඩම් ප්‍රතිසංස්කරණ සභාව වෙත පවරා ගෙන ඇති අතර ඒක ව්‍යාවස්ථික බද්ද යටතේ පවත්වා ගෙන යනු ලැබේ. (5 ඡේදය). රජය මෙම ඉඩම් ඵලදායීතාව වැඩිකිරීම සහ රැකියා නියුක්තිය ඇති කිරීම පිණිස යොදා ගනු ලැබේ. රජය විසින් ප්‍රයෝජනයට ගනු ලබන ඉඩම් සඳහා පණතේ සඳහන් ප්‍රකාර වන්දි ගෙවනු ලැබේ. (5 ඡේදය).

## ඉඩම් ආපසු පවරා ගැනීමේ ආඥාපනත

රජය විසින් අත් සතු කරන ලද, එහෙත් පසු කාලයක දී අයිතිකරුවන් වසර 8 ක් හෝ ඊට වැඩි කාලයක් අතහැර දමා තිබූ (2 ඡේදය) ඉඩම් ආපසු පවරා ගැනීම සඳහා මෙම ආඥාපනතින් විධිවිධාන සැලසේ.

කෙසේ වුව ද, අයිතිකරු සොයා ගැනීම සඳහා ගත් දැඩි පරිශ්‍රමයකින් පසුව පමණි, රජයට එම ඉඩම් ආපසු පවරාගත හැක්කේ (2 ඡේදය). අදාළ ඉඩම ආපසු පවරාගනු ලබන බව කියැවෙන දැන්වීමක් ඉඩමේ කැපී පෙනෙන ස්ථානයක ප්‍රදර්ශණය කළ යුතු යි. (2 ඡේදය)

**නො මිලයේ ඉඩම් ලබාදීමේ (විශේෂ විධිවිධාන) පනත**

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත දැනටමත් බාරගෙන ඇති, ඉඩම් යළි රජය වෙත ආපසු පවරා ගෙන ඉඩම් නො මැති පුද්ගලයින් වෙත නොමිලේ පවරාදීම සඳහා මෙම පනතින් විධිවිධාන සැලසේ (2,3 ඡේද) මෙම විධිවිධාන ඉඩම් කොමසාරිස් විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. මෙම පනත යටතේ ජනාධිපතිවරයා පවරාදීමේ විශේෂ නියෝගයක් මඟින් ඉඩමක් අහිමි, ඒවාගේ ම ලැබෙන ඉඩම් සශ්‍රීකව සංවර්ධනය කිරීමේ හැකියාව ඇති පුද්ගලයෙකුට ඉඩමක් ලබා දෙනු ඇත. (3 ඡේදය) ඉඩම මැන, පවරාදීමේ නියෝගය දිසාපතිවරයා විසින් ලේඛනගත කිරීමෙන් පසුව පමණක් ඉඩම් ලාභියාට ඉඩම පැවරේ. (8 ඡේදය) ඉඩම මෙසේ පවරනු ලබන්නේ කොන්දේසි කීපයකට යටත්ව ය. (5 ඡේදය) ඉඩම් ලාභියා මියයාමේ දී අනුප්‍රාප්තිකයෙක් නම් කරනු ඇත. (9 ඡේදය)

## ඉඩම් සංවර්ධන ආඥාපනත

ඉඩම් සංවර්ධන ආඥාපනත මඟින් ඉඩම් කොමිසමක් පත්කරනු ලබන අතර, ඉමේ කොමසාරිස් ගේ මාර්ගයෙන් එහි අඩංගු විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදනු

ලැබේ. (3 ඡේදය) රජයේ ඉඩම් ක්‍රමානුකූලව සංවර්ධනය කිරීම සහ අන්සතු කිරීම පිණිස මෙන් ම ඉඩම් අවශ්‍යයෙන් ම ලැබිය යුතු පුද්ගලයින් සඳහා එසේ ඉඩම් ලබාදීම පිණිස බලපත්‍ර නිකුත් කිරීම සහ නොමිලයේ ඉඩම් පැවරීම සඳහා මෙම ආඥාපනතින් විධිවිධාන සැලසේ. මෙසේ අන් සතු කරන ලද ඉඩම්වල අයිතිය යළි රජයට පවරා ගත හැකි ය. (8 ඡේදය) නොමිලයේ ඉඩම් ලබාදීමේ ක්‍රියාපටිපාටිය මෙසේ ආරම්භ වේ. ප්‍රථමයෙන්, යම් පුද්ගලයෙකු රජයේ ඉඩමක පදිංචිය සඳහා බලපත්‍රයක් ලබාගනියි. ඒ සඳහා ඔහු ප්‍රාදේශීය ලේකම් වෙත අයදුම් කළ යුතු යි. මුල දී මෙබඳු බලපත්‍රයක් ලබාගැනීම සඳහා ගෙවීමක් කළ යුතුව තිබුණ ද පසු කාලයේ දී, එම අවශ්‍යතාව බැහැර කරන ලදී.

බලපත්‍රයේ සඳහන් පරිදි පහත සඳහන් ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමෙන් බලපත්‍ර හිමියාට තම බලපත්‍රය ප්‍රදානයක් බවට පරිවර්තනය කරවා ගත හැකි ය.

1. දිසාපතිවරයා සෑහීමට පත්වන අයුරින් තම පදිංචි ඉඩම සංවර්ධනය කිරීම.

2. බලපත්‍රයේ සඳහන් කාල සීමාව තුළ ඉඩමේ නිවසක්, වැසිකිලියක් සහ වැටක් ඉදිකර ඒවා සතුටුදායක අයුරින් නඩත්තු කළ යුතු යි.

3. ඉඩම වගා කිරීම සඳහා නම්, බලපත්‍රයේ අන්තර්ගත උප ලේඛනයේ සඳහන් පරිදි ඉඩම් එළිපහලි කර වගා කළ යුතු යි.

4. ගොවිතැන් කිරීම සඳහා වූ ඉඩමක් නම් අඩු වශයෙන් එහි තුන් අවුරුද්දක්වත් ද, නිවාස තැනීම සඳහා නම් අඩු වශයෙන් එක් අවුරුද්දක් ද පදිංචි වී සිටිය යුතු යි.

5. ඉඩමේ පස සංරක්ෂණය සඳහා අවශ්‍ය පියවර ගත යුතු යි.

6. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු යි.

බලපත්‍රය මගින් ඇතැම් කොන්දේසි ගණනාවක් ද නියම කර ඇත. බලපත්‍රයේ සඳහන් ගොඩනැගිලි පමණක් ඉඩමේ තැනිය යුතු යි. වෙනත් ගොඩනැගිලි තැනීම සඳහා දිසාපතිවරයා ගේ අවසරය අවශ්‍ය වේ. ඉඩම සංවර්ධනය කර නැත්නම්, කොන්දේසි උල්ලංඝණය කර ඇත්නම් බලපත්‍රය අවලංගු කළ හැකි ය. බලපත්‍රය අවලංගු කළ හොත්, බලපත්‍ර හිමියාට දේපල අහිමිවීම ගැන වන්දි ලබා ගැනීමට ක්‍රියා කළ නො හැකි ය. බලපත්‍රය ප්‍රදානයක් බවට පත් කිරීමෙන් පසු, ඉඩම් ලාභියාට තවදුරටත් ඉඩම කට්ටි කළ නො හැකි ය. එසේ ම දිසාපතිවරයා ගේ පූර්ව අනුමැතිය නො මැතිව ඉඩම පවරා දිය නො හැකි ය. අන්‍ය කවර හෝ හිමිකමක් පවරා දීමේ දී මෙන් ම, ඉඩම් ප්‍රදානය කිරීමේ දී ද ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කළ යුතු ය. ප්‍රදානය කරන ලද ඉඩම් ආපසු රජයට පවරා ගත හැක්කේ ඉඩම් අත්පත් කරගැනීමේ පනත මගිනි.

බලපත්‍රයක ආධාරයෙන් ඉඩමේ පදිංචි වී සිටීමේ පදනම මත කිසිඳු පුද්ගලයෙකුට ඉඩම් සංවර්ධන ආඥාපනතේ විධිවිධාන යටතේ කාල සීමා අයිතිය පවරා ගත නො හැකි ය. (161 ඡේදය) දිසාපතිවරයා ගේ අවසරය නො මැතිව රජයේ ඉඩමක බලෙන් පදිංචි වීම දඬුවම් ලැබිය යුතු වරදෙකි. බලපත්‍රයක් මත, ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ අන් සතු කරන ලද ඉඩමක බලෙන් පදිංචි වීම දඬුවම් ලැබිය යුතු වරදකි. (168 ඡේදය)

## 2002 ඉඩම් අයිතිය පිළිබඳ යෝජිත පනත

ඉඩම් අයිතිය පිළිබඳ පනතක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට රජය අපේක්ෂා කරයි. ගැසට් නිවේදනයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරන පරිදි මෙම පනත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවලට සහ ග්‍රාම නිලධාරී කොට්ඨාශවලට අදාළ වනු ඇත. ඉඩම් සංවර්ධන ආඥාපනත සහ ඉඩම් ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ සියලු ප්‍රදානයන් සහ ඉඩම් පවරාදීම් සම්බන්ධයෙන් මෙම පනත ක්‍රියාත්මක වනු ඇත. යෝජිත මෙම පනත යටතේ, ප්‍රදානයක් මඟින් පවරා දී ඇති ඉඩමක් විකිණීමේ තහංචිය ඉවත් කරනු ඇත. එ නම්, බාධාවකින් හෝ අවහිරයකින් තොරව නීත්‍යානුකූල ප්‍රදානකරුට ඉඩම පවරා දීමට හැකිවනු ඇත. තව ද ඉඩම් පැවරීමේ කාර්යය පහසු කිරීම සඳහා යෝජිත පනත මඟින් ඉඩම් අන්සතු කිරීමේ කටයුතු භාර මණ්ඩලයක් පත්කරනු ලබයි.

## රජයේ ඉඩම් (භුක්තිය ආපසු ලබාගැනීමේ) පනත.

රජයේ ඉඩම් අනවසරයෙන් අල්ලා ගෙන හෝ පදිංචි වී සිටින පුද්ගලයින් ගෙන් එම ඉඩම් යළි රජයට පවරා ගැනීම සහ එයට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් ක්‍රියා කිරීම සඳහා මෙම පනතින් විධිවිධාන සැලසේ. පනතේ සඳහන් පරිදි, නීති විරෝධී අයුරින් භුක්තිය ලබා සිටින හෝ ඉඩමේ පදිංචි වී සිටින ඕනෑ ම පුද්ගලයෙකුට ඉඩමෙන් ඉවත් වෙන ලෙස දන්වා නොතීසි නිකුත් කිරීම පිණිස නිසි බලධාරියා වෙත බලතල පැවරී තිබේ. (3 ඡේදය) එ ලෙස පදිංචි වී සිටින හෝ භුක්තිය ලබා සිටින පුද්ගලයාට නිදහසට කරුණු ඉදිරිපත් කිරීමට නො හැකි වුවහොත්, ඔහු එම ඉඩමෙන් ඉවත් කරනු ලැබේ. (11 ඡේදය). වෙනත් ලිඛිත නීතියක කුමක් අන්තර්ගත වී තිබුණ ද, ඒ සියල්ල අභිබවා ක්‍රියා කිරීමට මෙම පනතේ විධිවිධාන මඟින් ඉඩකඩ සලසා ඇතැ යි පනතේ ම සඳහන් වී තිබේ. (17 ඡේදය).

## රජයේ ඉඩම් පිළිබඳ ආඥාපනත

ඉඩම් ප්‍රදානය කිරීම, බදු ක්‍රමය මත ලබාදීම සහ වෙනත් ආකාරයෙන් රජයේ ඉඩම් ලබාදීම සහ එම ඉඩම්වල කළමනාකරණය සහ පාලනය සඳහා රජයේ ඉඩම් ආඥාපනතින් විධිවිධාන සලසා තිබේ. (2 ඡේදය). තාවකාලිකව හෝ ස්ථිර වශයෙන් රජයේ ඉඩම් ලබාදීම, විකිණීම, බද්දට දීම හෝ වෙනත් සුදුසු ආකාරයෙන් ලබාදීමේ බලතල රට වෙනුවෙන් ජනාධිපතිවරයා වෙත පැවරී තිබේ. (2 ඡේදය). ආඥාපනතේ විධිවිධාන යටතේ, රජයේ දේපළ පදිංචි වීම සඳහා පලපත්‍ර නිකුත් කළ හැකි ය. ආපසු භාර දෙනු ලබන ඕනෑ ම ඉඩමක්, රජය වෙනුවෙන් භාරගැනීම සඳහා අවශ්‍ය බලතල පනත මඟින් ජනාධිපතිනිය වෙත පවරා තිබේ. (3 ඡේදය). ඉඩම රජය විසින් ප්‍රාදේශීය බල මණ්ඩලයක් වෙත පවරා ඇත්නම්, ඉඩම් ප්‍රදානය කිරීම හෝ බදු දීම සම්බන්ධ බලතල එම ප්‍රාදේශීය බල මණ්ඩලය වෙත පැවරී තිබේ.

## ගොවි ජන සේවා පනත

වී ගොවිතැනේ නිරත අඳගොවියා ගේ ආරක්ෂාව සඳහා ගොවිජන සේවා පනතින් විධිවිධාන සලසා තිබේ. (2,5 ඡේදය). අඳගොවියා අඳයෙන් ඉවත් කිරීම සඳහා ද පනත මඟින් අවශ්‍ය විධිවිධාන සලසා තිබේ. (6 ඡේදය).

## රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචි වීමේ පනත

බහුල වශයෙන් ක්‍රියාවට නො නන්වන මුත්, රජයේ ඉඩම්වල අනවසරයෙන් පදිංචිවීම වලකාලීම සඳහා මෙම ආඥාපනතින් විධිවිධාන සලසා තිබේ. රජයේ අවසරයකින් තොරව යම් පුද්ගලයෙකු රජයේ ඉඩමකට ඇතුල් වී සිටී නම් හෝ එහි භුක්තිය ලබාගෙන ඇත්නම්, එම පුද්ගලයයාට ඉඩමෙන් ඉවත්වන ලෙස නියෝගයක් නිකුත් කිරීම දිස්ත්‍රික් උසාවිය විසින් කළ යුතු අතර, ඒ සඳහා එම උසාවියට අවශ්‍ය බලතල ද ලැබී ඇත.

# 9. ආයතනික ව්‍යුහය : ඉඩම් සහ යළි පදිංචි කිරීම

## ඉඩම් අමාත්‍යාංශය

**ඉඩම් අමාත්‍යාංශය යටතට ගැනෙන දෙපාර්තමේන්තු රැසක් මෙහි පහත දැක් වේ.**

### ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව

යම් ඉඩම් කට්ටියක් පුද්ගලික හෝ රජයේ අයිතිය යටතේ පවතී ද යන්න අවශ්‍ය පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව තීරණය කිරීමේ කාර්යයභාරය මෙම දෙපාර්තමේන්තුව සතුව පවතී. රජයේ ඉඩමක් නම් ඒ පිළිබඳ සියලු විස්තර ඉඩම් කොමසාරිස් වෙත වාර්තා කරනු ලැබේ. (පහත බලන්න.) ඉඩම පෞද්ගලික අයිතිය යටතේ පවතී නම් එම තොරතුරු ඉඩම් ඇමතිවරයා වෙත සපයනු ලබන අතර, ඔහු එය ගැසට්පත්‍රය මඟින් ප්‍රකාශයට පත් කරනු ඇත. අයිතිය තහවුරු කිරීම සඳහා මෙම ගැසට් නිවේදනය යොදාගත හැකියි. ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ කටයුතු දැනට උතුරු හා නැගෙනහිර පළාත්වල අක්‍රීයව පවතී.

### ඉඩම් පිළිබඳ හිමිකම් සහ අනෙකුත් අදාළ සේවා ව්‍යාපෘතිය

ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලවල ලියාපදිංචි කෙරෙන ඔප්පු මඟින් පුද්ගලයින් සතු ඉඩම් පිළිබඳ අයිතිය තහවුරු නො වීම නිසා, ඔවුන් ගේ බුත්තියට තර්ජනයක් සිදු වීම වළක්වාලීම සඳහා ඔප්පු මඟින් දේපල ලියාපදිංචි කිරීමේ ක්‍රමය වෙනුවට බුත්තිය ලියපදිංචි කිරීමේ නව ක්‍රමය හඳුන්වාදීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ.

ලෝක බැංකුව විසින් සපයන ලද අරමුදලින් ආරම්භ කර ඇති මෙම ව්‍යාපෘතිය දැනට බලංගොඩ, දිවුලපිටිය සහ උඩල පළාත සහ ප්‍රදේශයන්හි ආරම්භ කර ඇති අතර 2004 දී අවසාන කළ යුතුව ඇත. 1999 සිට මේ දක්වා බුක්තිය තහවුරු කෙරෙන සහතික 9895ක් නිකුත් කර තිබේ.

## මිනින්දෝරු දෙපාර්තමේන්තුව

ඉඩමක් ප්‍රදානය කිරීමේ දී හෝ රජයට පවරා ගැනීමේ දී මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත එම ඉඩම මැනීමේ කාර්යයභාරය පැවරේ. දීප ව්‍යාප්ත ඉඩම් මැනීමක් සිදු නො වේ. ඒ වෙනුවට, රජයේ දෙපාර්තමේන්තුවලින් කෙරෙන ඉල්ලීම් පිට එක්තරා ප්‍රදේශවල ඉඩම් මැනීම සිදු කෙරේ. මිනින්දෝරු දෙපාර්තමේන්තුව සතු කලාපීය කාර්යාල ද ඇත. උතුරු - නැගෙනහිර පළාත්වල පිහිටා ඇති එම කාර්යාලවලින් බහුතරය වාර්ගික අර්බුදය නිසා විනාශ වී තිබේ.

## ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය

පසුගිය වසර 3 හෝ 4 තුළ මෙම ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සහ සැලසුම් අංශය විසින් ඉඩම් බැංකු පිළිබඳ දත්ත මධ්‍යස්ථානයක් ආරම්භ කිරීමේ කටයුතුවල නිරතව සිටී. එමඟින් උතුරු - නැගෙනහිර ප්‍රදේශ ආවරණය නො කෙරේ.

## ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම

අක්කර 50 ට වැඩි පෞද්ගලික ඉඩම් රජයට පවරාගැනීම සඳහා මෙම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම 1972 දී පිහිටුවන ලදී. එසේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම වෙත පවරා ගන්නා ලද ඉඩම් පුද්ගලයින්ට සහ සමාගනම්වලට බදු දීමට හෝ ගම් පුළුල් කිරීම සඳහා හෝ යොදාගැනීමට යෝජිතව තිබුණි. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම සතු දිස්ත්‍රික් කාර්යාල 17 ක් දීපව්‍යාප්තව ක්‍රියාත්මක වේ.

## ඉඩම් කොමසාරිස්

1989 වන තෙක් ඉඩම් කොමසාරිස්වරයා සියලු රජය සතු ඉඩම්වල භාරකරු වශයෙන් කටයුතු කළේ ය. 13 වෙනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයත් සමඟ ඔහු සතු බලතල පළාත්බඳ ඉඩම් කොමසාරිස් වෙත පැවරුණි. ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් පිළිබඳ ආඥාපනත සහ ඉඩම් ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත යටතේ රජයේ ඉඩම් අන්සතු කිරීම සඳහා ජනාධිපතිවරයා ගේ අනුමැතිය ලබාගැනීම ඉඩම් කොමසාරිස් වරයා ගේ වගකීම වේ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියුතු ඉඩම් නිලධාරීන් නිල වශයෙන් ඉඩම් කොමසාරිස් සහ පළාත්බද ඉඩම් කොමසාරිස්වරුන් නියෝජනය කරති.

## අදාළ අමාත්‍යාංශ

අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ට සහන සැලසීමේ කාර්යයට පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීමේ, සහ සරණාගතයින් පිළිබඳ අමාත්‍යාංශය, නැගෙනහිර සංවර්ධන අමාත්‍යාංශය සහ වන්නි පුනරුත්ථාපනයට සහය වීමේ අමාත්‍යාංශය ඍජුවම සම්බන්ධ වී සිටිති. පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා සරණාගතයින් පිළිබඳ අමාත්‍යාංශය දිවයින පුරා සරණාගතයින් සම්බන්ධයෙන් වගකිව යුතු වේ. කෙසේ වුව ද, අමාත්‍යාංශය ස්වකීය

පුනරුත්ථාපන, ආපසු පැමිණීමේ සහ අලුතින් පදිංචි කිරීමේ වැඩසටහන් උතුරු ප්‍රදේශය සඳහා යොමු කර ඇත්තේ උතුරේ පුනරුත්ථාපන සහ නැවත ගොඩනැගීමේ අධිකාරිය මගිණි. නැගෙනහිර සංවර්ධන අමාත්‍යාංශයේ වගකීම වී ඇත්තේ එම ප්‍රදේශයේ ආපසු පැමිණීමේ, නැවත පදිංචි කිරීමේ සහ පුනරුත්ථාපනය කිරීමේ කාර්යයභාරය සපුරාලීම පමණි. දැනට පුත්තලම, අනුරාධපපුරය සහ කුරුණෑගල ප්‍රදේශයන්හි පදිංචි උතුරේ අවතැන් වූ මුස්ලිම් ජනතාව සම්බන්ධයෙන් ද එම අමාත්‍යාංශය වගකීම දරයි. ඉහතින් සඳහන් මෙම අමාත්‍යාංශ දෙක අතර මනා සහයෝගීතාක් නො මැති කම හේතුවෙන්, ඔවුන් දෙපලගේ ම උපකාරය අවශ්‍යව සිටින උතුරේ අවතැන් වූ මුස්ලිම් ජනතාව අපහසුවට පත් වී සිටිති.

වන්නි පුනරුත්ථාපන ආධාර අමාත්‍යාංශය ද උතුරේ අවතැන් වූ මුස්ලිම් ජනතාවට ආධාර සපයන අතර ම, උතුරු ප්‍රදේශයේ පුනරුත්ථාපන කටයුතුවලට ද අතහිත දෙයි. එය සතු කාර්යයභාරය මෙන් ම කාර්ය පථය ද පැහැදිලි නැත.

පුනරුත්ථාපන, නැවත ගොඩනැගීම සහ නැවත පදිංචි කිරීම පිළිබඳ ප්‍රතිපත්ති සැලසුම් සම්පාදනය මුල් කරගත් ලේකම් කාර්යාලයක් ද අග්‍රාමාත්‍ය කාර්යාලයේ පිහිටුවා තිබේ.

## උතුරු සහ නැගෙනහිර පළාත්වල පදිංචි මානුෂීය සහ පුනරුත්ථාපන අවශ්‍යතා පිළිබඳ අනු කමිටුව.

2002 ඔක්තෝබර් - නොවැම්බර් අතර කාලයේ තායිලන්තයේ පැවැති ප්‍රථම සාම සාකච්ඡා වටයෙන් පසු උතුරු සහ නැගෙනහිර පළාත්වල හදිසි මානුෂීය සහ පුනරුත්ථාපන අවශ්‍යතා සම්බන්ධයෙන් අනු කමිටුවක් පත් කිරීමට ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊය එකඟ වූ හ.

- ⋆ මානුෂීය සහ පුනරුත්ථාපන අවශ්‍යතා හඳුනා ගැනීම.
- ⋆ මෙම අවශ්‍යතා ප්‍රමුඛත්වයක් මත ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලස්වීම
- ⋆ එම ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය සම්පත් වෙන් කිරීම පිළිබඳ තීරණය කිරීම.
- ⋆ සෑම ක්‍රියාකාරකමක් සඳහා ම කාර්යය සාධන ඒජන්සියක් පිහිටුවීම, යනාදිය යථෝක්ත අනු කමිටුවේ කාර්යයභාරය වශයෙන් හඳුනා ගෙන තිබේ.

මෙම අනු කමිටුව සියලු ම වාර්ගික ජන කොටස් නියෝජනය කරන අතර, රජයේ සහ එල්ටීටීඊ යේ සාමාජිකයින් හතර දෙනෙකු ගෙන් සමන්විත වේ. බර්නාඩ් තිලකරත්න සහ එස්.පී. තමිල් චෙල්වම් යන මහතුන් අනු කමිටුව මෙහෙයවනු ඇත.

## ගැටුම් සමහන් කර යථා තත්ත්වයට පත්කිරීමේ අනුකමිටුව

ප්‍රථම සාකච්ඡා වටයෙන් පසු, නැවත පදිංචි කිරීම, පෞද්ගලික දේපල ආපසු ලබාදීම සහ ආර්ථික ක්‍රියාකාරකම් යළි ආරම්භ කිරීම යන කරුණු සාක්ෂාත් කරගැනීමේ අරමුණෙන් අධි ආරක්ෂක කලාප සහ මහජනතාවට අවතීර්ණ විය නො හැකි අනෙකුත් ආරක්ෂිත ප්‍රදේශ පිළිබඳ ප්‍රශ්නය සලකා බැලීම පිණිස ඉහත අනු කමිටුව ස්ථාපනය කරන ලදී. ප්‍රථම සාකච්ඡා වටයේ හතර වෙනි වාරයෙන් පසු මෙම අනු කමිටුව අක්‍රීය විය. කෙසේ වුව ද, අධි ආරක්ෂක කලාපවලට සමීපව පිහිටා ඇති ප්‍රදේශ අතහැර දැමීම සලකා බැලෙන යාපන දිස්ත්‍රික්කයේ

යළි පදිංචි කිරීමේ ක්‍රියාවලිය වේගවත් කරන්නා වූ ක්‍රියාකාරී සැලැස්මක් සම්බන්ධයෙන් දෙපාර්ශවයම ගිවිස ගත් හ. සන්නද්ධ හමුදා පදිංචි වී සිටීම සම්බන්ධ ආරවුල් දැනට දිස්ත්‍රික් මට්ටමින් නිරාකරණය කරනු ලැබේ.

## නැගෙනහිර පළාතේ කමිටු

බර්ලිනයේ පැවැති සාම සාකච්ඡාවලින් පසු, මුස්ලිම් ජාතිකයින්ට අයත් කෘෂිකාර්මික ඉඩම්වල අනවසරයෙන් පදිංචි වී සිටීම පිළිබඳ ප්‍රශ්නය ගැන සාකච්ඡා කිරීම සහ එම ඉඩම් නීත්‍යානුකූල අයිතිකරුවන් වෙත ආපසු පවරාදීම පහසු කිරීම අරභයා මඩකලපුව, ත්‍රිකුණාමලය සහ අම්පාර දිස්ත්‍රික්වල කමිටු තුනක් පිහිටුවීමට පාර්ශවයෝ එකඟ වූ හ.

# 10. සංවර්ධනය කිරීම සහ ඉඩම් පරිහරණය

ශ්‍රී ලංකා රජයේ සංවර්ධන ප්‍රතිපත්තිය මෙම කෙටි අධ්‍යයනයෙන් පුළුල් විමර්ශණයකට භාජනය කරනු නො ලැබේ. අවතැන් වූ පුද්ගලයින් තිරසාර අයුරින් යළි පදිංචි කිරීම සහ තවදුරටත් පර්යේෂණ කිරීම සම්බන්ධයෙන් ගත යුතු පියවර අධ්‍යයනය කිරීමේ දී සංවර්ධනය සහ ඉඩම් පරිහරණය පිළිබඳ ප්‍රතිපත්ති ද වැදගත් කරුණු වශයෙන් සැලකේ.

රජයේ වර්තමාන සංවර්ධන සහ ඉඩම් පරිහරණය පිළිබඳ ප්‍රතිපත්තිය විශේෂයෙන් කුඩා ඉඩම් හිමියන් ඇතුළු, අවතැන් වූ ජන කොටස් තිරසාර අයුරින් යළි පදිංචි කිරීමට හරස්වනු ඇතැ යි බියක් පල වී ඇත. මෙම ප්‍රතිපත්තියේ මූලික අරමුණු දරිද්‍රතාව ලිහිල් කිරීමේ උපායමාර්ග සහ ඉඩම් පරිහරණය පිළිබඳ ජාතික ප්‍රතිපත්තියේ අඩංගු පරිදි කෙටියෙන් පහත දක්වනු ලැබේ. එම ප්‍රතිපත්ති සහ ආපසු පැමිණෙන සරණාගතයින් ගේ නිත්‍ය සුබසාධනය අතර පවත්නා පරස්පර විරෝධතාවන් ද එහි පැහැදිලිව සඳහන් කර ඇත. ශ්‍රී ලංකා රජය සහ ලෝක බැංකුව විසින් කෙටුම්පත් කරන ලද දුප්පත්කම ලිහිල් කිරීමේ උපාය මාර්ග වැඩපිළිවෙලෙහි කොටසක් වශයෙන් ව්‍යාපාරික කටයුතු සඳහා බඳු දිරිගැන්වීම්, ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණ සහ පෞද්ගලීකරණය ඇතුලු නිදහස් වෙළඳාම නගාසිටුවීම සඳහා ශ්‍රී ලංකා රජය බැඳී සිටී.

"භාණ්ඩ සහ සේවා සැපයීමේ කාර්යය භාරයෙන් ඈත් වී, පෞද්ගලික අංශයේ ආර්ථික ක්‍රියාකාරකම් පහසු කරන්නකු ගේ වගකීම ශ්‍රී ලංකා රජය භාර ගනිමින් සිටී. 'ව්‍යුහමය වෙනස්වීම්' හෝ යැපීම් මට්ටමේ අඩු ඵලදායී කෘෂිකර්මාන්තයක් පදනම් කරගත් ආර්ථිකයක් අධි ඵලදායිතා සේවා සහ කාර්මීකරණය කිරීම කරා පරිවර්තනය වීම හරහා සිදුවන ආර්ථික සංවර්ධනය විසින්ය, දරිද්‍රතාව ලිහිල් කරනු ලබන්නේ."

මෙම අරමුණ සපුරාලීම සඳහා පහත සඳහන් කරුණු දිරි ගැන්වීමේ වගකීම ශ්‍රී ලංකා රජය භාරගනු ලැබේ.

- ⋆ අඩු කෘෂිකාර්මික සම්පත් ප්‍රදේශවල සිට නාගරික ප්‍රදේශ දක්වා සංක්‍රමණය වීම.
- ⋆ තිරසාර වෙළඳපොළ පදනම් වූ වෙළඳ සහ මිල ප්‍රතිපත්තිය.
- ⋆ රජය සතු අතිරික්ත ඉඩම් ලබාදීම මඟින් පෞද්ගලික ඉඩම් අයිතිය පුළුල් කිරීම සහ නිරවුල් ඉඩම් භුක්තිය වැඩිදියුණු කිරීම.

- ★ ගොවිතැනින් පිට වෙනත් රැකියා සැපයීම සහ ග්‍රාමීය විදුලිය යොජනා ක්‍රම
- ★ කෘෂි ව්‍යාපාරික ආයෝජන නඟාසිටුවීම සඳහා ආයෝජන මණ්ඩලයක් පිහිටුවීම.

සෞඛ්‍ය සහ අධ්‍යාපන සේවා ඇතුළත් පෞද්ගලික අංශයේ සහභාගීත්වය සහිත අත්‍යාවශ්‍ය යටිතල පහසුකම් අරමුණු තෝරාගැනීම අනාගත රාජ්‍ය ආයෝජනවල ඉලක්කය වනු ඇත.

දරිද්‍රතාව ලිහිල් කිරීමේ උපාය මාර්ගයට ගැලපෙන පරිදි ඉඩම් අමාත්‍යාංශයේ ඉඩම් පරිහරණය කිරීමේ ප්‍රතිපත්ති සැලසුම් අංශය විසින් කෙටුම්පත් කරන ලද ශ්‍රී ලංකා ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය, ඉඩම් පෞද්ගලිකරණය කිරීමේ වැඩපිළිවෙළ දිරි ගන්වනු ඇත.

"ඉඩම් අයිතිකරු සහ ස්ථාවරයෙන් බැහැර වී කළමනාකරණය පහසුකම් සැලසීමේ වගකීම පවරා ගනිමින් රජය ඉඩම් පිළිබඳ පූර්ණ අයිතිය ජනතාවට ලබා දෙනු ඇත. මෙමඟින් ශක්තිමත් ඉඩම් වෙළඳපොළක් ඇති වීමටත්, නිලධාරී පැලැන්තියේ පාලනය අවම කිරීමටත් සහ විවිධ ආයතන මඟින් ණය ලබා ගැනීමත් පහසු කරනු ලැබේ.

පෞද්ගලික අංශයේ ආයෝජනය දිරිමත් කිරීම සහ ඉඩම් සංවර්ධන ක්‍රියාවලියට සහභාගී කරවා ගැනීම අරභයා පහත සඳහන් ක්‍රියාමාර්ග ගැනීමට යෝජිත ය.

- ★ ප්‍රමාණවත් හා පාරිසරික ආරක්ෂණ විධිවිධාන සහිතව ආර්ථික ඒකක වශයෙන් දීර්ඝකාලීනව ඉඩම් බදු ක්‍රමයක් යටතේ පවරා දීම.
- ★ සියලු ආන්තික සහ වගා නො කළ ඉඩම් වැඩිදියුණු කර සුදුසු ප්‍රයෝජනය සඳහා යොදා ගනු ලැබේ.
- ★ රජයට පවරාගත් ප්‍රයෝජනයට නො ගන්නා ලද හා ඌණ වශයෙන් ප්‍රයෝජනයට ගෙන ඇති ඉඩම්, සංවර්ධනය කිරීම සඳහා ලබා දෙනු ලැබේ.
- ★ ඉඩම් සංවර්ධනය ආඥාපනත සහ ඉඩම් ප්‍රදානය කිරීමේ විශේෂ විධිවිධාන නීතිය යටතේ මහජනතාව වෙත දැනටමත් පවරා දී ඇති ඉඩම්වල පූර්ණ අයිතිය පදිංචි කරුවන් වෙත ලබා දෙනු ලැබේ.

උතුරු - නැගෙනහිර පළාත් යළි ගොඩනැගීම සහ අවතැන් වී සිටින පුද්ගලයින් යළි පදිංචි කිරීම කෙරෙහි පෞද්ගලික අංශය විසින් පාලනය කරනු ලබන වෙළඳපොළ ආර්ථිකය සහ කාර්මීකරණය දැඩි ලෙස බලපෑම් සිදුකර තිබේ. විශේෂයෙන්, දරිද්‍රතාවය ලිහිල් කිරීමේ උපායමාර්ගය විසින් කුඩා ඉඩම් හිමියන් පාරිභෝග කෘෂිකර්මයෙහි නිරතවීම අධෛර්යමත් කිරීම ඉලක්ක කරගෙන ඇති බව පෙනේ. වියළි කලාපයේ වර්තමාන පහසුකම් සලසා ඇති කෘෂිකාර්මික ජනාවාස යටතේ ඉඩම් නැති ගැමි ජනතාව යළි පදිංචි කිරීම, වියළි කලාපයට අයත් ප්‍රදේශවල පැරණි වාරිමාර්ග ජලාශ සහ අනෙකුත් පද්ධතීන් යළි ප්‍රයෝජනයට යොදාගැනීම, කෘෂි ව්‍යාප්ති සේවා සැපයීම, වී සහ අනෙක් කෘෂිකාර්මික නිෂ්පාදන අළෙවියේ දී රජයේ සහාය ලබාදීම, උසස් වර්ගයේ සහතික කළ බීජ වර්ග, පොහොර සහනාධාරය, පහසු කෘෂිකාර්මික ණය යොජනා ක්‍රම, නියං සහ ගංවතුර සහන සේවා, සහ දේශීය වශයෙන් නිෂ්පාදිත කෘෂි භාණ්ඩවලට හානිවන අයුරින් සිදුවන ආනයන කිරීම් සීමා කිරීම යනාදිය 1977 ට පෙර සුළු පරිමානයේ වගා කරුවන් ගේ අභිවෘද්ධිය තකා රජය ක්‍රියාත්මක කළ ප්‍රතිපත්ති සමුදායට අයත්ව තිබූ බව 'මොන්ලාර්' පවසයි. සුළු පරිමාණයේ ගොවීන් ආරක්ෂා කිරීමේ පූර්ව රාජ්‍ය මැදහත්වීම වෙනසකට ලක්කිරීමේ සහ පෞද්ගලීකරණය දිරි ගැන්වීමේ නෛතික හ ප්‍රතිපත්තිමය වෙනස්කම් කීපයක් හඳුන්වා දී තිබේ. මේ නිසා නැවතත් ස්වකීය

ජීවනෝපාය ආරම්භ කිරීමේ පරමාර්ථයෙන් රජයේ උපකාරය පතා ආපසු පැමිණෙන සරණාගත පිරිස්වලට දැඩි ලෙස පහර වැදී ඇත.

වැදගත් යයි හැඟෙන ප්‍රතිසංස්කරණ සහ සංශෝධන කීපයක් මෙහි පහත දැක් වේ.

⋆ ඉඩම් ලාභීන්ට ස්වකීය ඉඩම් කොටස් විකිණීමට හැකිවන පරිදි ඉඩම් සංවර්ධන පනත සංශෝධනය කළ යුතුව තිබේ. ණය බරින් මිරිකී සිටින ගොවීන්ට මෙය මහඟු අවස්ථාවක් වෙතැ යි බොහෝ දෙනා විශ්වාස කරති. ඉඩම් කැබෙලි කිරීම නිසා ගම්බද ප්‍රදේශවල ජීවත්වන ජනතාව නාගරික ප්‍රදේශ කරා සංක්‍රමණය වෙතැයි ද එමඟින් පෞද්ගලික ආයෝජකයින්ට ඉඩම් ලබාගැනීමේ අවස්ථාව එළඹේ යයි ද අපේක්ෂා කෙරේ.

## ⋆ අඳගොවිතැන

අඳගොවියා ගේ ආරක්ෂාවට පණවා තිබූ කුඹුරු පනතක්, ගොවිජන සේවා පනතත් මඟින් සංශෝධනය කිරීම නිසා, අඳගොවියා විසින් වගා කරනු ලබන ඉඩම එම අඳගොවියාට හෝ ඉඩම් අයිතිකරුට මිල දී ගැනීම සඳහා බල කෙරේ. ගෙවීම් කිරීමට අපොහොසත් වන ගොවීන් සතු ඉඩම්, ඉඩම් බැංකුවක් විසින් මිල දී ගනු ඇත.

## ⋆ වාරිමාර්ග ප්‍රතිපත්තිය

දේපලක් වශයෙන් ජලය පිළිබඳ අයිතිය දැක්වෙන සංකල්පය

ලෝක බැංකුව විසින් 1996 දී හඳුන්වා දෙන ලදී. මේ ක්‍රමය යටතේ ජලය පාවිච්චි කිරීම සඳහා ගොවීන් විසින් මුදල් ගෙවිය යුතු වේ. එසේ නැත්නම් ඔවුන්ට ජලය විකිණිය හැකි ආකාරයට හිමිකම් ලබා දෙනු ඇත. මෙම සංකල්පයේ අරමුණ වී ඇත්තේ ගොවීන් තම අයිතීන් විකුණා දැමීම උනන්දු කරවීම හෝ ජලය විශාල වශයෙන් අවශ්‍ය වන වී ගොවිතැනින් බැහැර වී අපනයන භෝග නිෂ්පාදනය වෙත යොමු කිරීම ය.

⋆ සහනදායී මිලට ගොවියා ගේ වී අස්වැන්න අලෙවිකරණ ලද රජයේ වී අලෙවි මණ්ඩලය අහෝසි වී තිබේ. අධික නිෂ්පාදන වියදම් නිසා ණය බරින් මිරිකී සිටින ගොවියා ණය ගෙවා නිදහස් වීම පිණිස හැකි ඉක්මණින් තම අස්වැන්න විකුණා හමාර කරනු ලැබේ. මෙම ඉරණමට දළ වශයෙන් දශ ලක්ෂයක ගොවි ජනතාවක් පාත්‍ර වී සිටිති.

⋆ පෞද්ගලීකරණය අපේක්ෂාවෙන් බීජ පනතක් කෙටුම්පත් කෙරෙමින් තිබේ.

අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පිරිස් ස්ථිර වශයෙන් ස්වකීය ගේ දොර, ඉඩකඩම් වෙත ආපසු පැමිණීම සහතික කිරීමට රජය බැඳී සිටියි. එහෙත් මේ සඳහා ගමෙන් නගරය කරා සංක්‍රමණය වීම සහ පෞද්ගලීකරණය දිරි ගන්වන රජයේ ප්‍රතිපත්තිය දැඩි ලෙස හරස් වී ඇත.

පෞද්ගලික ආයෝජනය දිරිගැන්වීමේ අරමුණින් යටිතල පහසුකම් පුනරුත්ථාපනය කිරීම පිණිස පෞද්ගලික අංශයේ සහභාගීත්වය හෝ ප්‍රතිසංස්කරණ කටයුතු ප්‍රමුඛත්වයක් මත පවත්වා ගෙන යාම කුඩා ඉඩම් හිමියන්ට වැඩදායක වේ දැයි සැකයක් පවතී.

ශ්‍රී ලංකා ශ්‍රම බලකාය නාගරීකරණයට ලක් කිරීමේ සංවර්ධන ප්‍රතිපත්තිය නිසා, ඉඩම් අහිමි අභ්‍යන්තර වශ්‍යයෙන් අවතැන් වූ ජනතාවට රජයේ ඉඩම් ප්‍රදානය කිරීමේ චිරස්ථායී විසඳුම් අනතුරකට ලක් වී ඇත.

# ගැටුම් නිරාකරණය කිරීමේ යාන්ත්‍රණය

★ දේපල අයිතිවාසිකම් පිළිබඳ ආරවුල් අධිකරණය වෙත යොමු කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම)

★ වැඩි වේ යයි අපේක්ෂිත නඩු ප්‍රමාණය සම්බන්ධයෙන් ක්‍රියාකිරීම සඳහා වැඩියෙන් විනිශ්චයකාරවරුන් පත් කිරීම මගින් උතුරු නැගෙනහිර පළාත්වල අධිකරණ කාර්යයභාරය ශක්තිමත් කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම් 1)

★ ප්‍රමාණවත් පරිදි වන්දි ගෙවීම් ආරම්භ කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම් 2)

★ වන්දි ලබාගැනීමේ දී කරුණු සනාථ කිරීමේ භාරය ලිහිල් කිරීම සඳහා නීති සංශෝධනය කළ යුතු අතර, වන්දි ලබාගැනීම සඳහා සාක්ෂි ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය අඩු කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම් 2)

★ උසාවිවල දැනට අනුගමනය කෙරෙන ක්‍රියාපටිපාටි තහවුරු කිරීම සඳහා නීති සංශෝධනය කළ යුතු යි. එනම්, අවිධිමත් ගිවිසුම් කාලසීමා ආඥාපනතේ පිහිට නො පැතිය යුතු ය. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම් 2)

★ දේපල පිළිබඳ ගැටලු නිරාකරණය කිරීම සඳහා ප්‍රදේශයේ ජීවත්වන ප්‍රජාව නියෝජනය වන අයුරින් නීතිඥවරුන් දෙදෙනෙකු ගෙන් හා සාමාන්‍ය වැසියන් දෙදෙනෙකු ගෙන් සමන්විත විශේෂ ඉඩම් කමිටුවක් පිහිටුවිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කමිටුව 3)

★ ආරවුලක් ඇති වූ විට කරුණු පරීක්ෂා කර බලා කල්දැමීමකින් තොරව නියමිත කාල සීමාවන් තුළ තීරණ ප්‍රකාශයට පත් කළ යුතු බවට විශේෂ ඉඩම් කමිටුව හෝ අනෙක් විනිශ්චය මණ්ඩලවලට උපදෙස් ලබාදිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම් 3)

★ කලින් යුගෝස්ලෝවියාවේ සිදු වූ අයුරු, දේපල පිළිබඳ අයිතිය සනාථ කෙරෙන හිමිකම් ඉදිරිපත් කිරීම සඳහා දිනයක් නියම කරමින් නීති පැනවිය යුතු යි. (එන්. රයිට්, එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම කොළඹ, ආරම්භක ප්‍රකාශය)

★ ප්‍රජා මට්ටමින් වාර්ගික ගැටුම් සමනය කිරීමේ යන්ත්‍රණ පිහිටු විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ තෙ වැදැරුම් ප්‍රවේශයක් මගින් ආරවුල් නිරවුල් කිරීමේ විකල්ප යන්ත්‍රණ පිහිටු විය යුතු යි; එය දැනට ගම් මට්ටමින් ප්‍රයෝජනයට ගනු ලබන අවිධිමත් යන්ත්‍රණ ශක්තිමත් කිරීම,

අර්බුද හටගෙන ඇති පෙදෙස් දක්වා සමථමණ්ඩල ව්‍යාප්ත කිරීම, පළාත්බද මහධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමේ වරප්‍රසාදය සහිතව සහ අර්ධ අධිකරණ තාවකාලික ඉඩම් සහ දේපල මණ්ඩලයක් ප්‍රථම අධිකරණයක් වශයෙන් පිහිටුවීම මඟින් ඉහත කරුණු සපුරාලිය යුතු යි.

තාවකාලික ඉඩම් සහ දේපල මණ්ඩලය පාර්ලිමේන්තු පනතක් මඟින් පිහිටුවිය යුතු අතර, එස්අයිඑච්ආර්එන් සංවිධානය හරහා ක්‍රියාත්මක විය යුතු ය. එය ප්‍රධාන වාර්ගික කණ්ඩායම් තුනේ සාමාජිකයින් ගෙන් සහ ජාත්‍යන්තර සාමාජිකයින් ගෙන් සමන්විත විය යුතු අතර දේපල හිමිකම් පිළිබඳ ගැටලු සම්බන්ධයෙන් ක්‍රියා කළ යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ අවතැන්වූවන් පිළිබඳ නඩු ඉක්මන් කළ යුතු බව දන්වමින් ඒ සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස අග්‍ර විනිශ්චයකාර තුමා සහ අධිකරණ සේවා කොමිසම උතුරු සහ නැගෙනහිර පළාත්වල දිස්ත්‍රික් සහ මහධිකරණ විනිශ්චය කරුවන් වෙත උපදෙස් නිකුත් කළ යුතු යි. (යාපනය දිස්ත්‍රික් විනිශ්චයකාර තුමා, යාපනය - කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම් 6)

⋆ අවම ක්‍රියා පටිපාටීන් සහිත ස්වාභාවික යුක්තිය පසිඳලීමේ අධිකරණයක් පිහිටුවීම. (ගරු ස්කන්ධ රාජා විනිශ්චයකාර තුමා)

⋆ වාර්ගික එකඟත්වය පිළිබඳ අවශ්‍යතා, න්‍යායපත්‍රයට ඇතුළත් කළ යුතු ය. වාර්ගික භේද දුරලා නැවත නැගීසිටීම සඳහා ජන කොටස්වලට යම් ක්‍රියාපිළිවෙලක් අවශ්‍ය වී තිබේ. (සුනිලා අබේසේකර)

⋆ පොදු ගැටලු කෙරෙහි අවධානය යොමු කෙරෙන බහුවාර්ගික එකඟතා වැඩසටහන් ආරම්භ කළ යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 4)

⋆ මානව හිමිකම් සහ ආරවුල් නිරවුල් කිරීම සඳහා මැදහත් වී ක්‍රියාකිරීමේ පුහුණුව ලත් බහුවාර්ගික ප්‍රජා නායකයින් මඟින් ප්‍රශ්න විසඳාලීම සඳහා ජාත්‍යන්තර රාජ්‍ය නො වන සංවිධාන, රාජ්‍ය නො වන සංවිධාන සහ ජන කොටස් යොදා ගත යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 2)

⋆ දැනට බෙදා දී ඇති හා ඉදිරියේ දී බෙදාදීමට යෝජිත ඉඩම් සම්බන්ධයෙන් තොරතුරු ප්‍රචාරය කිරීම. (කොළඹ ක්‍රියාකාරී පදනම 2)

⋆ වඩාත් විධිමත්, සහ මැනවින් සකසන ලද ගැටුම් නිරාකරණය කිරීමේ යන්ත්‍රණ ස්ථාපනය කිරීමේ අපේක්ෂාවෙන්, මහ පරිමානයෙන් උපයෝගී කරගැනීම සඳහා දැනට පවත්නා, ගම් මට්ටමේ ගැටුම් නිරාකරණය කිරීමේ යන්ත්‍රණ පිළිබඳ අධ්‍යයන කිරීම. (ඩී. ආනන්ද මයා)

⋆ ඉඩම් පිළිබඳ ප්‍රශ්න නිරාකරණය කිරීමේ දී එල්ටීටීඊය සම්බන්ධ කරගත යුතු යි. (ගරු එස්.විජේරත්න මයා)

⋆ උතුරු - නැගෙනහිර පළාත්වල බහු - වාර්ගික සමථමණ්ඩල පිහිටුවිය යුතු යි. (ගරු. එස්. විජේරත්න මයා.)

⋆ නඩුවක් මාස 6ක් ඇතුළත විසඳිය යුතු බව සඳහන් කරමින් බේරුම්කාර මණ්ඩල පිහිටුවිය යුතු යි. අභියාචනා ඉදිරිපත් කිරීම් වරම අහෝසි කරමින් බේරුම්කාර මණ්ඩලවලින් පිරිනැමෙන

ප්‍රධානයන් මහාධිකරණවල ලියාපදිංචි කළ යුතු යි. ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ලබාදීම සඳහා නිරවුල් කිරීමේ මණ්ඩලවලට බලය පැවරිය යුතු යි. (ගරු එස්. විජේරත්න මයා.)

⋆ විකල්ප ගැටුම් නිරාකරණය සඳහා ප්‍රදේශ වෙන් කරන්න. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 6)

⋆ තෙ වැනි පාර්ශවයක් විසින් පරීක්ෂා කිරීමට හැකිවනු පිණිස පැමිණිලි එක්කාසු කර, ලේඛන ගත කරන්න. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 6)

⋆ උතුරු හා නැගෙනහිර පළාත්වල ද දැනට පවත්නා බේරුම්කාර මණ්ඩල පිහිටුවන්න. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 6)

⋆ ගැටුම් නිරාකරණය කිරීමේ විකල්ප යන්ත්‍රණ පිහිටුවීමේ දී එල්ටීටීඊ ය ද හවුල් කරගන්න.

⋆ එල්ටීටීඊ සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මුලතිව් ප්‍රදේශයට විනිශ්චයකරුවකු පත් කරන ලෙස ඉල්ලන්න. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 6)

⋆ මූලාධාර සහ පුහුණුව ලබාදීම මඟින් පවත්නා ව්‍යුහයන් ශක්තිමත් කිරීම සහ තවදුරටත් ව්‍යුහයන් ඇති කිරීම දිරිගැන්වීම මඟින් ආධාර සපයන රටවල්, ශ්‍රී ලංකා රජය සහ එල්ටීටීඊය විසින් අවිධිමත් ආකාරයෙන් මැදිහත් වී ක්‍රියාකිරීම දිරිගැන්විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ ගැටලු නිරාකරණය කිරීමේ වැඩපිළිවෙලට දිසාපතිවරුන්, ඉඩම් ලියාපදිංචි කාර්යාල, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර්වරුන් වැනි අදාළ අනෙක් පුද්ගලයින් ගේ සහයෝගය ලබාගනුවස් සමථ මණ්ඩල උතුරු සහ නැගෙනහිර පළාත්වලට ද ව්‍යාප්ත කළ යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් අර්ධ අධිකරණ බලතල සහිත තාවකාලික ඉඩම් සහ දේපළ සභාව පත්කළ යුතු යි.

1. පොලීසිය හරහා ක්‍රියාත්මක කළ හැකි පරිදි ඉඩම් සහ දේපල ආරවුල් නිරවුල් කිරීම. තම නිවෙස්වලින් පලවාහරින ලද පුද්ගලයින්ට තාවකාලික නැවතීමේ පහසුකම් සැපයීම වැනි තිරසාර විසඳුම් ලබාදීම.

2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් තහවුරු වී ඇති නිදහසේ සැරිසැරීමේ අයිතිය සහ අනෙකුත් මානව හිමිකම් මූලධර්මවලට අනුකූලව ඉඩම් නො මැති පුද්ගලයින්ට රජයේ ඉඩම් ලබාදීම සම්බන්ධයෙන් නිර්දේශ කිරීම.

3. උපත්, විවාහ, මරණ සහතික හා දේපළ පිළිබඳ ලියකියවිලි හා ලේඛන පිටපත් ලබාදීම සඳහා ප්‍රදේශීය පරිපාලනයට වගකීම පැවරෙන පරිදි නව ක්‍රියාපරිපාටි නිකුත් කිරීම.

4. අවතැන් වීම නිසා නියමිත කොන්ත්‍රාත්තු හෝ බදු කාල සීමා සම්පූර්ණ කිරීමට නො හැකි වූ අවස්ථා විමර්ශණය කර, ඒවාට සම්බන්ධ පුද්ගලයින් සඳහා සාධාරණය ඉටු කිරීම. (වන්දි ගෙවීම, විකල්ප ගොඩනැගිලි සහ ඉඩම් ලබාදීම.)

ආරවුලට සම්බන්ධ පිරිස් මෙම සභාව හමුවට තම ගැටලුව ඉදිරිපත් කරනු ලබන අතර එහි තීරණය සම්බන්ධයෙන් සෑහීමට පත් නො වන අවස්ථාවන් හි දී පළාත්බඳ මහධිකරණයට අභියාචනා ඉදිරිපත් කිරීමේ අයිතිය වලංගුව ඇත.

අපක්ෂපාතීත්වය තහවුරු කිරීම් වස් මෙම සභාව වාර්ගික කණ්ඩායම් තුනේ ම සුදුසුකම්ලත් නියෝජිතයින් සහ ඉඩම් සහ දේපල පිළිබඳ විශේෂඥ දැනුම සහිත ජාත්‍යන්තර ප්‍රජාව ගේ නියෝජිතයින් ගෙන් ද සමන්විත විය යුතු යි. එබඳු සභාවක් පිහිටුවීම සඳහා එස්.අයි.එච්.ආර්.එන්. ආයතනය මුල් වී ක්‍රියා කළ යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ නිශ්චිත කාලයක් සඳහා අධිකරණ සේවා කොමිසම විසින් පත් කරනු ලබන විශ්‍රාම ලත් විනිසුරුවන් දෙදෙනෙකු ගෙන් සමන්විත ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප යන්ත්‍රණයක් වාර්ගික අර්බුදයෙන් විපතට පත් ප්‍රදේශ සඳහා පත්කිරීම. ඉල්ලීම් ගැන පරීක්ෂා කර බලා මණ්ඩලය වෙත වාර්තාවක් සැපයීම පිණිස (උපාධි ධාරියෙක් හෝ ඒ හා සාමන සුදුසුකම් ලත් අය වඩා සුදුසු ය.) නිලධාරීන් පත්කරනු ලැබේ. වැඩි කාර්යක්ෂම භාවයක් තහවුරු කිරීම සඳහා සුදුසුකම් ලත් පුද්ගලයින් නිර්දේශ කරනු ලැබේ.

පරීක්ෂණයේ දී බාල වයස්කාර, රෝගී, මහලු හෝ පහසුවෙන් පැමිණිය නො හැකි පුද්ගලයින් හැර අනෙක් පාර්ශවකරුවන් සඳහා වෙනත් අයට පෙනී සිටීමට ඉඩදෙනු නො ලැබේ. අදාළ පුද්ගලයන් විසින් ම පෞද්ගලිකව තම පැමිණිල්ල ඉදිරිපත් කළ හැකි ය. ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප ආයතනයට සියලු දේපල ආරවුල් විසඳීමටත් සහනය සැලසීමේ තාවකාලික නියෝග නිකුත් කිරීමටත්, විකල්ප ඉඩකඩම්, ඉඩම් හෝ වන්දි නිර්දේශ කිරීමටත් බලතල ඇත. මෙම ආයතනයේ අවසාන තීන්දුව උසාවි නියෝගයක ස්වරූපයෙන් අදාළ දිස්ත්‍රික් උසාවිය වෙත ඉදිරිපත් කරනු ඇත. මෙම ආයතනයේ තීරණයකින් සෑහීමට පත් නො වන පුද්ගලයකුට එය පළාත්බඳ මහධිකරණය හමුවේ අභියෝගයට ලක්කිරීමට ඉඩකඩ තිබේ. සංකීර්ණ නෛතික ගැටලු සහිත අවස්ථාවල දී අදාළ පාර්ශවකරුවන්ව දිස්ත්‍රික් උසාවිය හමු වේ නඩු පැවරීමට හැකිවන අයුරු සහතිකයක් නිකුත් කෙරෙනු ඇත.

ඉහතින් විස්තර කළ ආරවුල් නිරාකරණය කිරීමේ විකල්ප යන්ත්‍රණය සංවේදී දේශපාලන ස්වරූපයක දේපල ආරවුල් විසඳීමට පමාණවත් නො වනු ඇත. මෙවන් අවස්ථාවල ස්වාධීන ජාත්‍යන්තර සාමාජිකත්වය සහිත කමිටුවක් විසින් ගැටලුව නිරාකරණය කිරීම වැදගත් වේ. (එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම / මානව හිමිකම් කමිටුව)

⋆ ඉවත් කරන ලද ද්විතීය පදිංචිකරුවන්ට හෝ ඉඩමේ දිගින් දිගට ම පදිංචි වී නොසිටින බලපත්‍ර හිමිකරුවන්ට විකල්ප ඉඩම් කම්ටු සහ කලින් පදිංචි වී සිටි නිවෙස්වලට වැඩිදියුණු කිරීම සිදුකිරීම සඳහා වන්දි ගෙවීම (එක්සත් ජාතින් ගේ සරණාගත කොමිසම / මානව හිමිකම් කොමිසම)

⋆ බලපත්‍ර හිමියා ගේ අනුප්‍රාප්තිකයාට භුක්තියට ඇති අයිතිය සුරැකීම සඳහා ඔහු වෙත බලපත්‍ර හිමියාට අයත්ව තිබූ ඉඩම හෝ විකල්ප ඉඩමක් ලබාදීම සඳහා පරිපාලනමය වශයෙන් අවශ්‍ය පිළියම් යෙදීම.

# ප්‍රලේඛනය

★ රෙජිස්ට්‍රාර් කාර්යාල සහ කච්චේරි කාර්ය මණ්ඩලය වැඩිකළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 1)

★ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය හරහා 1995 විශේෂ විධිවිධාන පනත යළි හඳුන්වා දිය යුතු යි. ( කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 1)

★ රජයේ ඉඩමක පදිංචිකරුවකු තම ඉඩමේ අයිතිය තහවුරු කිරීමට අපොහොසත් වන අවස්ථාවල දී (කච්චේරි ලේඛන හෝ අන්‍ය කවර හෝ මූලාශ්‍ර මඟින්) ඒ පිළිබඳ ව පරීක්ෂා කර බලා වාර්තා කිරීම සඳහා කණ්ඩායමක් පත් කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 2)

★ පුද්ගලික ඉඩමක පදිංචිකරුවකුට කච්චේරිය මඟින් තම ඉඩමේ අයිතිය තහවුරු කිරීමට නො හැකි වූ විට, වන්දි ගෙවීම සඳහා අයිතිය තහවුරු කරමින් ඉදිරිපත් කෙරෙන දිව්රුම් පෙත්සමක් වලංගු ලේඛනයක් වශයෙන් රජය පිළිගත යුතු යි. කෙසේ වුව ද, අනෙකුත් ඉල්ලුම් කරුවන් ගේ නම් ලැයිස්තුවක් මහජනතාව ගේ දැනගැනීම පිණිස ප්‍රසිද්ධ කළ යුතු යි.

★ නැති වූ ලියකියවිලි යළි නිකුත් කිරීම සඳහා ක්‍රියාමාර්ග ඇති කිරීම. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ තම ලියකියවිලි අස්ථාන ගත වූ රජයේ ඉඩම්වල පදිංචි වී සිටින පුද්ගලයින්ට බලපත්‍ර නිකුත් කිරීම. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ පෞද්ගලික ඉඩකඩම්වල අයිතිය තහවුරු කිරීම සඳහා දිව්රුම් පෙත්සම් යොදාගැනීම. වංචනික ඉල්ලීම්වලින් බේරීම සඳහා, එම දිවුරුම් පෙත්සම් කච්චේරි මහ කොමසාරිස් කාර්යාලයේ සහ ශ්‍රී ලංකා රජයේ වෙබ් අඩවි මඟින් ප්‍රසිද්ධියට පත් කළ යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ ඉඩම් පිළිබඳ අයිතියට සම්බන්ධ ක්‍රියාවලිය සකස් කිරීම. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 6)

★ ලියකියවිලි හා ලේඛන අලුතින් නිකුත් කිරීම සඳහා විධිමත් හා ප්‍රමිතියකට අනුව පිළියෙල කරන ලද ආකෘතීන් උපයෝගී කරගැනීම. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 6)

★ ආපසු පැමිණෙන්නන්ට ශ්‍රී ලංකාව බලා ඒම පහසුකරලීම සඳහා අවශ්‍ය සියලු ලියකියවිලි බලධාරීන් විසින් නිකුත් කළ යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ ඔප්පුවල පිටපත් නො මැති අවස්ථාවල දී පෞද්ගලික දේපල හිමිකරුවන්ට දිස්ත්‍රික් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය වෙත තම හිමිකම් ඉදිරිපත් කරමින් වෙනත් වැදගත් සාක්ෂි කරුවන් ගේ (අසල්වැසියන් සහ ග්‍රාමසේවා නිලධාරීන්) ලිඛිත ලියකියවිලි ආධාරයෙන් දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කිරීමට ඉඩ සලසා දිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ බලපත්‍ර ලාභීන් හෝ නොමිලේ ඉඩම් ලද පුද්ගලයින්ට තමන් ගේ නැති වූ ලියකියවිලිවල පිටපත් නො මැති අවස්ථාවල දී ග්‍රාමසේවා, අසල්වැසියන් වැනි පිළිගත හැකි සාක්ෂි කරුවන්

ගේ සහතිකය මත ස්වකීය ඉඩම්වල අයිතිය ඉල්ලා දිවුරුම් පෙත්සම් ඉදිරිපත් කිරීමේ අවස්ථාව ලබාදිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ ඉඩම්වලට ඇති අයිතිය තහවුරු කෙරෙන දිවුරුම් පෙත්සම් අනෙකුත් තරගකාරී ඉල්ලුම් කරුවන් ගේ දැනගැනීම සඳහා ප්‍රසිද්ධියට පත් කළ යුතු යි.

⋆ අනාථ වූ පිරිස් සහ සංක්‍රමණිකයින් ගේ යහපත තකා මෙම දිවුරුම් පෙත්සම් කච්චේරි, මහකොමසාරිස් කාර්යාල සහ ශ්‍රී ලංකා රජයේ වෙබ් අඩවිය තුළ ප්‍රසිද්ධියට පත් කළ යුතු යි. අනෙකුත් විරුද්ධ අයදුම්කරුවන් විසින් ඉදිරිපත් කර ඇති ඉල්ලීම තාවකාලික ඉඩම් හා දේපල මණ්ඩලය වෙත යොමු කළ යුතු යි. අවසාන දේශපාලන විසඳුමක් කරා ඒමෙන් පසු අනෙකුත් හිමිකරුවන් ගේ ඉල්ලීම ලබාගැනීම සඳහා මණ්ඩලය විවෘතව තැබිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.)

⋆පුද්ගලයින් ගේ පදිංචිය සොයාගත නො හැකි අවස්ථාවන් හි දී මරණ සහතික නිකුත් කිරීම පිණිස උපත් හා මරණ පිළිබඳ ආඥාපනත සංශෝධනය කළ යුතු යි. විකල්ප වශයෙන් මරණ ලියාපදිංචි කිරීම (තාවකාලික විධිවිධාන) පිළිබඳ 1995 අංක 2 දරන පනත යළි හඳුන්වා දිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ ඔප්පුවක් යළි තැනීමට අවශ්‍ය පත්ඉරු ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ නො මැති අවස්ථාවල දී ඉඩම් ලියාපදිංචි කිරීමේ ලේඛන (යළි තනන ලද පත්ඉරු) ආඥාපනත යටතේ, විනාශ වූ පත්ඉරු යළි නිර්මාණය කරන ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාට උපදෙස් දෙන්න. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය).

**<u>සැරිසැරීමේ නිදහස / යළි පදිංචි කිරීම / අන්තර්ග්‍රහණය වීම.</u>**

⋆ අවතැන් වූ වැසියන්ට ඔවුන් තෝරා ගත් ප්‍රදේශවල වාසය කිරීමට ඉඩදිය යුතු යි. ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ XIII සංශෝධනයේ උපග්‍රන්ථ II හි සඳහන් තහංචි අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන්ට අදාළ නො විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.)

⋆ සැරිසැරීමේ නිදහස සහ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ ජනයාට ස්ව කැමැත්තෙන් ආපසු ඒමේ අයිතිය ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාවට නැංවිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.)

⋆ ආපසු පැමිණෙන සරණාගතයින් පිළිගැනීම සහ අධීක්ෂණය කිරීම සඳහා එල්ටීටීඊය විසින් ස්වාධීන යන්ත්‍රණයක් පිහිටුවිය යුතු යි.

⋆ හමුදාව තම දේපල පදිංචියට ගෙන ඇති හෙයින් ආපසු පැමිණීමට නො හැකි වැසියන් සඳහා නැවත පදිංචි කිරීමේ යන්ත්‍රණ පිහිටුවීම සහ ගෙවල් කුලී / වන්දි ගෙවීමේ යන්ත්‍රණය ස්ථාපනය කළ යුතු ය.

⋆ ආපසු පැමිණීමට අකමැති පුද්ගලයින්ට ආපසු පැමිණෙන ලෙස ඉල්ලා සිටින / බල කෙරෙන එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම් ප්‍රතිපත්තිය සහ අධිකාරී බලය වෙනස් කළ යුතු යි. ආපසු පැමිණෙන ජනතාවට සැරිසැරීමේ නිදහස සහ පදිංචිය සඳහා තමන් කැමති ස්ථානය තෝරා ගැනීමේ අයිතිය තිබිය යුතු ය. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 3)

## අධි ආරක්ෂක කලාප

★ දේපල සඳහා පුද්ගලයා සතු අයිතිය අධි ආරක්ෂක කලාප නිසා උල්ලංඝණය වේ. අභ්‍යන්තර වශයෙන් අවතැන්වූවන් ගේ ආපසු පැමිණීමට බාධා සිදු කරන අධි ආරක්ෂක කලාප ඉවත් කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ අවතැන්වූ වැසියන්ට අධි ආරක්ෂක කලාපවලට පිවිසීමේ උපරිම ඉඩකඩ සලසාදිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ එසේ ඇතුල් වීමේ දී දේපල පිළිබඳ අයිතිය ඔප්පු කිරීම කොන්දේසියක් නො විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.)

★ මාර්ග බාධක හෝ මුරපල වශයෙන් යොදාගන්නා පෞද්ගලික දේපලින් හැකි සෑම අවස්ථාවලදී ම ඉවත්වීමට ආරක්ෂක හමුදා වගබලාගත යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ ස්වකීය දේපල සන්නද්ධ හමුදා විසින් ප්‍රයෝජනයට යොදා ගෙන ඇති බැවින් ආපසු පැමිණෙන සරණාගතයින්ට විකල්ප ඉඩකඩ සලසා දිය යුතු යි. එසේ නැතිනම්, ශ්‍රී ලංකා රජය විසින් ඔවුන්ට විකල්ප ඉඩකඩ ලබාදිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ තම පැරණි දේපල හෝ ඉඩම් වෙත යා නො හැකි අවතැන් වූ වැසියන්ට සන්නද්ධ හමුදා විසින් ප්‍රමාණවත් ගොඩනැගිලි කුලියක් / වන්දියක් ලබා දිය යුතු යි.

## නිවාස සහ පදිංචියට ඉඩකඩ සැලසීම.

★ නිවාස පහසුකම් ලබාදීම සඳහා රු. 200,000ක ණය මුදලක් සහ නිවාස තැනීම පිණිස පරිත්‍යාග කිරීම් සඳහා වූ ලෝක බැංකුවේ යෝජනාව ක්ෂණික මානුෂික සහ පුනරුත්ථාපන අවශ්‍යතා සැපයීමේ අනු කමිටුව විසින් අධ්‍යයනය කළ යුතු යි.

## ඉඩම් බැංකු

★ ඉඩම් නො මැති අවතැන් වූ ජනයා සඳහා ඉඩම් ලබාදීම පිණිස ඉඩම් බැංකුවක් පිහිටුවීම සඳහා රජයේ ඉඩම් පිළිබඳ සමීක්ෂණයක් කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 2, කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 4, විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ යළි පදිංචි කිරීම සඳහා රජයේ ඉඩම් සැපයීමේ බැංකුවක් ආරම්භ කිරීම (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය.)

★ දැනට තිබෙන රජයේ ඉඩම් මැනීමෙන් පසු සහ ඉඩම් බැංකුවක් පිහිටුවීමෙන් පසු පමණක් ඉඩම් බෙදාදීමේ ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාවට නැංවිය යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ දැනට හිස්ව ඇති ඉඩම්වල විශාලත්වය සහ එහි පිහිටීම ප්‍රසිද්ධියට පත් කළ යුතු අතර ඉඩම් බෙදාදීමේ ක්‍රියාවලියට ඉඩම් ලාභීන් සහ සත්කාර ප්‍රජා කොටස් සම්බන්ධ විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

## බිම් බෝම්බ සහ වෙනත් පුපුරණ ද්‍රව්‍ය

⋆ දෙමළ පුනරුත්ථාපන සංවිධානයට එල්ටීටීඊ පාලනයට අයත් නැති ප්‍රදේශවල බිම්බෝම්බ ඉවත් කිරීමේ කටයුතු පුළුල් කිරීමට ඉඩ දිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 1)

⋆ බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යය පුළුල් කිරීම සඳහා ආධාර ආයතනවලින් සැපයෙන විදේශාධාර ලබාදිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 1)

⋆ නැගෙනහිර පළාතේ එල්ටීටීඊයට සහ ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවලට ජාත්‍යන්තර මට්ටමේ බිම්බෝම්බ ඉවත් කිරීමේ පුහුණුවක් ජාත්‍යන්තර ප්‍රජාව විසින් ලබාදිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ බිම්බෝම්බ ඉවත්කිරීමේ ක්‍රියාවලියට සම්බන්ධ පුද්ගලයින් / සංවිධාන අතර වඩා යහපත් සම්බන්ධීකරණය පැවැත්වීම.

⋆ ආපසු පැමිණෙන සරණාගත පිරිස් ස්වකීය ගම් බිම්වල පදිංචියට යාමට පෙර බිම්බෝම්බ අනතුරු පිළිබඳ දැනුවත් කිරීම. පාසල්, සුභසාධන මධ්‍යස්ථාන, නැවත පදිංචිකිරීමේ කඳවුරු, ජනමාධ්‍යය හෝ වෙනත් ප්‍රසිද්ධ ස්ථානවල සම්මන්ත්‍රණ පැවැත්විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ බිම්බෝම්බ ඉවත් කිරීමේ කාර්යය වේගවත් කරනු පිණිස ආධාර රටවලින් ලැබෙන ආධාර ප්‍රමාණය වැඩිකිරීම. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

⋆ බිම්බෝම්බවලට ගොදුරු වූවන් පුනරුත්ථාපනය කිරීම. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 1)

⋆ බිම්බෝම්බ සහිත ඉඩම්වල පදිංචි ජනයා සඳහා රක්ෂණ ක්‍රමයක් පිහිටුවීම සහ බිම්බෝම්බවලින් සහ වෙනත් පුපුරන දෙයින් හානියට පත් අයට වන්දි ගෙවීම.

## උගසට තැබූ ඉඩම්

අවතැන්වීම නිසා උගස් කරන ලද ඉඩම්වලට හිමි පොලිය මුල් මුදල ඉක්මවා ගොස් ඇති අවස්ථාවල දී පොලියට මුදල් දීමේ ආඥාපනතේ විධිවිධාන, බැංකුව විසින් ණයට දුන් මුදල් ආපසු අයකර ගැනීම් (විශේෂ විධිවිධාන) පනත සහ ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත ක්‍රියාත්මක වීම අත්හිටුවිය යුතු යි.

## ඉඩම් අහිමි අවතැන් වූ සරණාගතයින්

⋆ ඉඩම් අහිමි ද්වීතීය නිවැසියන් සඳහා තාවකාලික නිවාස යෝජනා ක්‍රමයක් ආරම්භ කිරීම. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම)

⋆ මහ පරිමාණයෙන් සරණාගතයින් ආපසු පැමිණීමට පෙර ඉඩම් නො මැති අවතැන් වූ වැසියන් සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සමීක්ෂණයක් පැවැත්විය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 2)

★ ඉඩම් අහිමි අවතැන්වූ ජනයා සඳහා රජයේ ඉඩම්වල පදිංචිවීමට අවශ්‍ය ලියකියවිලි සපයා දිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ ඉක්මණින් ආපසු තම නිවෙස්වලට යා නො හැකි ආපසු පැමිණෙන වැසියන් වෙනුවෙන් පවුලේ පදිංචිය සඳහා නිවාස තැනීම. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ ඉඩම් නො මැති අවතැන් වූ වැසියන් රජයේ ඉඩම්වල යළි පදිංචි කළ යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 4)

★ අවතැන් වූ වැසියන් මුහුණ පා සිටින දුක්ඛිත තත්ත්වය සම්බන්ධයෙන් ශ්‍රී ලංකා රජය වෙත කරුණු කියාපෑම. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ උඩරට ඉඩම් අහිමි දෙමළ ජනයා ගේ ප්‍රශ්නය අවධානයට ලක්කිරීම. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ ශ්‍රී ලංකා රජයේ වර්තමාන ප්‍රතිපත්තිය වෙනස් කර ඉඩම් හිමි අවතැන් වූ ජනයාට ඔවුන් තෝරා ගත් පෙදෙස්වල පදිංචිවීමට ඉඩහැරීම (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

අතුරුදහන් වූ පුද්ගලයින් / නෑදැයින්

★ පවුලේ නෑයකු අතුරුදහන් වීම, දේපල අයිතිවාසිකම්වලට බලපාන බැවින් නැති වූ පුද්ගලයා ගැන සොයා බැලීම රජයේ වගකීම වේ. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ දැනට ක්‍රියාත්මක නො වන මරණ ලියාපදිංචි කිරීමේ (තාවකාලික විධිවිධාන) පිළිබඳ 1995 අංක 2 දරන පනත, අතුරුදහන් වූ පුද්ගලයින් වෙනුවෙන් අවතැන්වූවන්ට මරණ සහතික ලබාගැනීමට හැකිවනු පිණිස යළි පැනවිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

## චංචල දේපල

★ විශේෂයෙන් පුද්ගලයින් හොර රහසේ ඉන්දියාවට ප්‍රවාහනය කිරීම සඳහා යොදාගත් ශ්‍රී ලංකා ධීවර බෝට්ටු ඇතුලු, නැති වූ චංචල දේපල ආපසු ලබාදීම සඳහා ශ්‍රී ලංකා රජය කටයුතු කළ යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 3)

★ අයිතිකරුවන් ගේ ඉල්ලීම පරිදි ඉඩම් හා දේපල ආපසු ලබාදිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 1)

★ ද්වීතීය පදිංචිකරුවන් දේපල භුක්තිය නීත්‍යානුකූල අයිතිකරුවන් වෙත ලබා දිය යුතු යි. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 1)

★ එල්ටීටීඊය පදිංචිව සිටින දේපල හැකි ඉක්මණින් අයිතිකරුවන් වෙත ආපසු ලබාදිය යුතු යි. එහි දී අයිතිය ඔප්පු කිරීම කොන්දේසියක් නො විය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

★ අයිතිකරුවන්ට ආපසු ලබාදිය නො හැකි එල්ටීටීඊය විසින් පදිංචි වී සිටින දේපල සම්බන්ධයෙන්, එම අයිතිකරුවන් වෙත ප්‍රමාණවත් වන්දියක් (එල්ටීටීඊය විසින්) ලබාදිය යුතු යි.

⋆ ස්වකීය දේපල වෙනත් අය විසින් පදිංචියට ගෙන තිබෙන බැවින් ආපසු පැමිණෙන සරණාගතයින් සඳහා ප්‍රජා ගොඩනැගිලි තැනීම සහ ද්විතීය පදිංචිකරුවන් දේපල පදිංචියෙන් ඉවත්කිරීම සඳහා ප්‍රමුඛත්වය දිය යුතු ය. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

## කාල සීමා ආඥාපනත

⋆ 13 ඡේදය සංශෝධනය කරන්න. එවිට දස අවුරුදු කාල සීමා කොන්දේසියෙන් අර්බුදයෙන් විපතට පත් අවතැන් වූ වැසියන්ට හානියක් සිදු නො වේ. (කිලිනොච්චි ක්‍රියාකාරී කණ්ඩායම 3)

⋆ 1980 සිට බලපාන පරිදි වාර්ගික අර්බුදය පවත්නා කාල පරිච්ඡේදය තුළ කාල සීමා ආඥාපනතේ 3 වෙනි ඡේදය උතුරු නැගෙනහිර පළාත්වල ක්‍රියාත්මක වීම අත්හිටවිය යුතු යි.

⋆ කාල සීමා ආඥාපනත 3 ඡේදය ක්‍රියාත්මක වීම උතුරු හා නැගෙනහිර ප්‍රදේශවලට අදාළ නො විය යුතු යි. හෝ 13 වෙනි ඡේදයේ සඳහන් ව්‍යතිරේඛයන් අර්බුදය ද ඇතුළත් වන සේ පුළුල් කළ යුතු යි. (එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම / මානව හිමිකම් කොමිසම)

## දෙවන පරපුරේ අවතැන් වූ වැසියන්

⋆ දෙවන පුරපුරේ අවතැන් වූ වැසියන් ගේ අයිතිවාසිකම් (අවතැන්ව සිටිය දී උපත ලත් හෝ වැඩුන) අවධානයට ලක් විය යුතු යි. (කිලිනොච්චි නිරීක්ෂණ)

⋆ කච්චේරි හරහා ප්‍රමුඛත්වය ලැබිය යුතු යි. දිස්ත්‍රික් කණ්ඩායම්, දත්ත මූලාශ්‍රයන් ආදිය හරහා තොරතුරු සම්බන්ධීකරණය කිරීම සහ සමාජීය ආර්ථික බලපෑම් කෙරෙහි අවධානයෙන් සිටීම (යූඑන්ඩීපී)

⋆ ශ්‍රී ලංකාව වාර්ගික අර්බුදයට පෙර තිබූ සාමකාමී තත්ත්වයට පරිවර්තනය කිරීමේ දී වාර්ගික අර්බුදය තුළ දී සිදු වූ සමාජීය වෙනස්වීම අවධානයට ලක් කිරීම. (ආචාර්යය ඩී. රාජසිංහම්)

⋆ පළාත්බඳ ආයතන දේශපාලන හා වාර්ගික මතවාදවලින් නිදහස් කළ යුතු යි. (ආචාර්යය ඩී. රාජසිංහම්)

⋆ දේපල අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යයනයවල දී දරිද්‍රතාව සහ ධනය යළි බෙදාහැරීම යන කරුණු ඇතුළත් විය යුතු යි. (ආචාර්ය ඩී. රාජසිංහම්)

⋆ දේපල අයිතිවාසිකම් පිළිබඳ අධ්‍යයනවලට 1983 දකුණේ සිදු වූ භීෂණය සහ කඳුරට දෙමළ ජනතාවට අත්විඳීමට සිදු වූ තාඩන පීඩන පිළිබඳ තොරතුරු ඇතුළත් කළ යුතු යි. (ආචාර්යය ඩී. රාජසිංහම්)

⋆ ඉඩම් යළි බෙදාදීමේ දී දේශපාලනය බැහැර කළ යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 4)

⋆ ප්‍රජා නායකයින්ට ඔවුන් ගේ ප්‍රකාශයන් ගෙන් සහ ක්‍රියාවන්වලින් ඇති වන බලපෑම ඔවුන්ට අවබෝධ කළ යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 4)

⋆ 1983 දී සිදු වූ වාර්ගික කළකෝලාහල පිළිබඳ පත් කෙරුණ ජනාධිපති කොමිසම ප්‍රසිද්ධියට පත් කළ යුතු යි. එහි අන්තර්ගතය සාම ක්‍රියාවලියේ රාමුව වශයෙන් යොදා ගත යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 4)

⋆ ඉඩම් බෙදාදීම හා වන්දි ගෙවීම වාර්ගික මතවාදවලින් නිදහස් විය යුතු යි. (කොළඹ ක්‍රියාකාරී කණ්ඩායම 2)

⋆ සිවිල් සමාජයේ පුරෝගාමීත්වය, යටතේ ආධාර සපයන කණ්ඩායම් විසින් ප්‍රජා මට්ටමින් සමගිය ඇති කිරීමේ වැඩසටහන් වලට අරමුදල් සැපයිය යුතු යි. (විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය)

# ආශ්‍රිත පොත්


දෙමළ ඊලාම් දේශයේ පරිපාලන N. P. සම්මුඛ පරීක්ෂණය, ජී. නඩේසන්

⋆ ලංකාවේ උතුරු - නැගෙනහිර පළාත් සඳහා ක්ෂණික මානුෂීය සහ පුනරුත්ථාපන ආධාර පතා ඉල්ලීමක්

⋆ ස්වේච්ඡාවෙන් ආපසු පැමිණෙන සරණාගතයින් පිළිබඳ දෙසති ලුහුඬු වාර්තා - යාපන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

⋆ Conneclting to growth - Sri lanka's poverty reduction Strategy, Government of Sri Lanka / Development for M. M. Colombo, June 2002

⋆ Crating the dividends of peace, Report of the inter Agency needs Assessment mission to Sri Lanka 21, April, 3 May 2002

⋆ ශ්‍රී ලංකාවේ සාම ක්‍රියාවලියට සහය පතා ප්‍රකාශයක්

⋆ ශ්‍රී ලංකාවේ මුස්ලිම් සරණාගතයෝ - 1990 ඔක්තෝබරයේ දී උතුරු පළාතින් පළවා හරින ලද මුස්ලිම් ජනතාව සතු චංචල හා නිශ්චල දේපළ පිළිබඳ වාර්තාවට හැඳින්වීමක් - ආර්.ඊ.ඊ.එෆ්, 2001 - එස්.එච්. හිස්බුල්ලා

⋆ ශ්‍රී ලංකා නීතිඥ සංගමයේ නීති ආධාර පදනම - ශ්‍රී ලංකා නීතිඥ සංගමය විසින් ප්‍රසිද්ධ කරන ලදී.

⋆ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් සඳහා නීති අත්පොත - එක්සත් ජාතීන්ගේ සරණාගත කොමිසම, ශ්‍රී ලංකා නීතිඥ සංගමය සහ නීති ආධාර පදනම - 2002 ව්‍යාපෘතිය.

⋆ ශ්‍රී ලංකාවේ පොළොන්නරු ප්‍රදේශයේ ගොවීන්ගේ ආහාර ප්‍රතික්ෂේප කර සිටීමේ වර්ජනය

⋆ ශ්‍රී ලංකාවේ ඉඩම් අමාත්‍යංශයේ ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය පිළිබඳ අදහස් හා උදහස් - චොන්ලාර්

⋆ ලෝක බැංකුවේ සහයෝගය ඇතිව, එහෙත් රටවැසි ජනතාවට ආගන්තුක වන අයුරින්, ශ්‍රී ලංකාවේ පෞද්ගලික අංශය විසින් මෙහෙයවනු ලබන ආර්ථිකයට අතහිත දීම සඳහා නීති පද්ධතියේ පුළුල් වෙනසක් ඇති කිරීම - චොන්ලාර්

⋆ ශ්‍රී ලංකාවේ ජාතික ඉඩම් පරිහරණ ප්‍රතිපත්තිය - ඉඩම් අමාත්‍යංශයේ ප්‍රතිපත්ති සම්පාදන අංශය

⋆ මන්නාරම් දිස්ත්‍රික්කයේ අවතැන් වූ/ විපතට පත් පිරිස් පිළිබඳ තොරතුරු - ඒ පතිනාදන්, ව්‍යාපෘති අධ්‍යක්‍ෂ, මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

⋆ 2002 අගෝස්තු 31 දින යාපන අර්ධ ද්වීපයේ ජනගහනය - යාපනයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

⋆ රාජ්‍ය සේවකයින්ගේ දේපළ හානි සඳහා වන්දි ගෙවීම්, 2002 සැප්තැම්බර් 30 දිනට ප්‍රගති වාර්තාවා, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ සරණාගතයින් පිළිබඳ අමාත්‍යංශය

⋆ නැවත පදිංචි කිරීමේ වැඩ සටහන, ත්‍රිකුණාමල දිස්ත්‍රික්කය 2002-2005 නැගෙනහිර සංවර්ධන සහ මුස්ලිම් ආගමික කටයුතු අමාත්‍යංශයේ දිස්ත්‍රික් කාර්යාලය, ත්‍රිකුණාමලය

⋆ වන්නි ප්‍රදේශයේ සිට ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය කරා ආපසු පැමිණෙන පිරිස, ත්‍රිකුණාමල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, 2002 ජනවාරි 30

⋆ රට තුළ සාමාන්‍ය තත්ත්වය යළි ස්ථාපනය කිරීම, ආරක්‍ෂක කටයුතු වැඩි දියුණු කිරීම සහ දේශපාලන කරුණු පිළිබඳව අවධානය යොමු කිරීම

- පළමු වන සාම සාකච්ඡා වටයේ දෙවනවාරය අවසන් කිරීම, රාජකීය නෝර්වේජියානු රජයේ 2002-11-03 දින ප්‍රකාශය

⋆ 2002 සැප්තැම්බර් 30 දිනට ආරක්‍ෂක තත්ත්වය - මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

⋆ 2002 සැප්තැම්බර් 30 දිනට ආරක්‍ෂක තත්ත්වය - වව්නියා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

⋆ ශ්‍රී ලංකාවේ බිම් බෝම්බ අධීක්‍ෂණ වාර්තාව 2001

⋆ ශ්‍රී ලංකාවේ සාම සාකච්ඡා, 2002 සැප්තැම්බර් 16-18, රාජකීය නෝර්වේජියානු රජයේ ප්‍රකාශය - 2002 නොවැම්බර් 03

⋆ ශ්‍රී ලංකාවේ අවතැන් වූවන්ගේ තත්ත්වය පිළිබඳ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර අවතැන්වීමේ ඒකකයේ දූත පිරිස විසින් සම්පාදිත වාර්තාව 2002 අප්‍රේල්

⋆ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් පිළිබඳ අන්තර් එජන්සි ක්‍රියාකාරී කණ්ඩායමේ තිරසර විසඳුම් පිළිබඳ ප්‍රගති වාර්තා අංක 4 - 2002 ජූලි 8 (www. peaceinssrilanka org.)

⋆ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් පිළිබඳ අන්තර් ඒජන්සි ක්‍රියාකාරී කණ්ඩායම, තිරසාර විසඳුම් පිළිබඳ ප්‍රගති වාර්තා අංක 6,4 2002 සැප්තැම්බර් 04 (www. peaceinsgrilanka. org)

⋆ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් පිළිබඳ අන්තර් එජන්සි ක්‍රියාකාරී කණ්ඩායම, තිරසාර විසඳුම් පිළිබඳ ප්‍රගති වාර්තා අංක 7 - 2002 ඔක්තෝබර් 17 (www. peaceinsgrilanka. org)

⋆ එක්සත් ජාතීන්ගේ අභ්‍යන්තර වශයෙන් අවතැන් වූවන් පිළිබඳ අන්තර් ඒජන්සි ක්‍රියාකාරී

කණ්ඩායම, තිරසාර විසඳුම් පිළිබඳ ප්‍රගති වාර්තාව අංක 8 - 2002 නොවැම්බර් 28 (www. peaceinsgrilanka. org)

★ බිම් බෝම්බ ඉවත් කිරීමට යෝජිත ගම් පෙදෙස් - මන්නාරම් දිස්ත්‍රික්කය

මූලකුරුවලින් ප්‍රකාශිත ආයතන/පුද්ගලයින්

සී එෆ් ඒ - සටන් විරාම ගිවිසුම

එෆ්ඩීඑල් - ඉදිරිපෙල ආරක්ෂක වලලු

එෆ්එච්එච් - කාන්තා මූලික නිවෙස්

ජීඒ - දිසාපති

ජීඔඑස්එල් - ශ්‍රී ලංකා රජය

ජීඑස් ඩිවිෂන් - ග්‍රාමසේවා නිලධාරී කොට්ඨාශය

එච්එස් ඉසෙඩ් - අධි ආරක්ෂක කලාපය

අයිඩීපී - අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ පුද්ගලයන්

එල්ඩීඕ - ඉඩම් සංවර්ධන ආඥාපනත

එල්ටීටීඊ - දෙමළ ඊලාම් කොටි විමුක්ති සංවිධානය

එම්ආර්අර්අර් - පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ සරණාගතයින් පිළිබඳ අමාත්‍යාංශය

එන්එෆ්ආර්අයි - ආහාර ද්‍රව්‍ය නො වන සහන විෂයයන්

ප්ලොට් - දෙමළ ඊලාම් ජනතා විමුක්ති සංවිධානය

ආර්ආර්ඒඑන් - උතුරේ පුනරුත්ථාපන සහ නැවත ගොඩනැගීමේ අධිකාරිය

එස්එල්ඒ - ශ්‍රී ලංකා යුද හමුදාව

ටීආර්ඕ - දෙමළ පුනරුත්ථාපන සංවිධානය

යූඒඑස් - එක්සත් සහනාධාර යෝජනා ක්‍රමය

යූඑන්ඩීපී - එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහන

යූඑන්එච්සීආර් - එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම

යූඑක්ස්ඕ - නොපිපිරුණු වෙඩි ද්‍රව්‍ය

1. වාර්ගික අර්බුදය නිසා සිදු වූ අවතැන් වීම් පිළිබඳ එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසම විසින් කරනු ලබන විග්‍රහය, ජූනි 2002 - ප්‍රකාශයට පත්කර නැත.

2. මෙම වාර්තාවේ වන්නිය වශයෙන් හඳුන්වා ඇත්තේ උතුරු පළාතේ දිස්ත්‍රික්කවල එල්ටීටීඊය විසින් පාලනය කරනු ලබන ප්‍රදේශ සහ වව්නියා දිස්ත්‍රික්කයයි.

3. 2002.10.04 දිනැති 'නෝර්ත් ඊස්ටන් හෙරල්ඩ්' සඟරාවේ කිලිනොච්චි ජනගහනයෙන් 90% ටත් වඩා අවතැන් වී ඇත.' වශයෙන් සඳහන්ව තිබේ.

4. ශ්‍රී ලංකාවේ මුස්ලිම් සරණාගතයින්, 1990 ඔක්තෝබරයේ දී උතුරු ප්‍රදේශයෙන් පලවා හරින ලද මුස්ලිම්වරුන් ගේ චංචල හා නිශ්චල වත්කම් පිළිබඳ වාර්තාවට හඳුන්වා දීමක් - එස්.එච්. හිස්බුල්ලා, ආර් ඒජ්එෆ් 2001

5. මන්නාරම් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරුත්ථාපන කටයුතු පිළිබඳ ව්‍යාපෘති අධ්‍යක්ෂ, එම්. පතිනාදන් මයා සමඟ පැවති සම්මුඛ සාකච්ඡාව - 2002 නොවැම්බර් 01

6. එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහන සමඟ 2003 ජනවාරියේ දී පැවැති සම්මුඛ සාකච්ඡාව

7. එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහනේ, බිම්බෝම්බ ඉවත් කිරීමේ අංශයේ ප්‍රධාන තාක්ෂණික සහකාර ඇලෙක්ස් වැන්රෝයි මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 ඔක්තෝබර් 09

8. නෝර්වේජියානු ජනතා ආධාර ආයතනයේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් උපදේශක ලියුක් ඇකින්සන් සමඟ පැවත්වූ සම්මුඛ සාකච්ඡා - 2002 නොවැම්බර් 04

9. එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහනේ බිම්බෝම්බ ඉවත් කිරීමේ අංශයේ ප්‍රධාන තාක්ෂණික සහකාර ඇලෙක්ස් වැන්රෝයි මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 ඔක්තෝබර් 09

10. නෝර්වේජියානු ජනතා ආධාර ආයතනයේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් උපදේශක ලියුක් ඇකින්සන් මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 නොවැම්බර් 04

11. නෝර්වේජියානු ජනතා ආධාර ආයතනයේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් උපදේශක, ලියුක් ඇකින්සන් මයා සහ එච්ඒජී සමඟ පැවැත් වූ සම්මුඛබ සාකච්ඡාව - 2002 නොවැම්බර් 04

12. නෝර්වේජියානු ජනතා ආධාර ආයතනයේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් උපදේශක ලියුක් ඇකින්සන් මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 නොවැම්බර් 04

13. නෝර්වේජියානු ජනතා ආධාර ආයතනයේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් උපදේශක, ලියුක් ඇකින්සන් මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 නොවැම්බර් 04

14. නෝර්වේජියානු ජනතා ආධාර ආයතතනයේ ජ්‍යෙෂ්ඨ මෙහෙයුම් උපදේශක ලියුක් ඇකින්සන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 නොවැම්බර් 04

15. මන්නාරම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරුත්ථාපන කටයුතු පිළිබඳ ව්‍යාපෘති අධ්‍යක්ෂ, එච්. පතිනාදන් මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 නොවැම්බර් 01

16. පුත්තලම අලන්කඩ නැවත පදිංචි කිරීමේ ග්‍රාමයේ නිවැසියකු සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 ඔක්තෝබර් 29

17. මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ, නැගෙනහිර සංවර්ධන සහ මුස්ලිම් ආගමික කටයුතු පිළිබඳ අමාත්‍යාංශයේ උපකාර්යාලයේ එම්.එම්. බෂීර් මයා සහ මඩකලපුව අතිරේක

දිසාපති වී. ශන්මුගම් මහතා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 දෙසැම්බර් 02

18. මඩකලපුව එල්ටීටීඊ දේශපාලන අංශයේ නායක හව්සලියන් මයා සමඟ අම්පාර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ දී පැවැති සම්මුඛ සාකච්ඡාව - 2002 දෙසැම්බර් 02

19. එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහනේ බිම් බෝම්බ ඉවත් කිරීම පිළිබඳ ප්‍රධාන තාක්ෂණික සහකාර ඇලෙක්ස් වැන්රෝයි සමඟ පැවැති සම්මුඛ සාකච්ඡාව - 2002 ඔක්තෝබර් 09

20. සර්වෝදය; ටීආර්ඕ; එස්සීඑෆ්; එක්සත් රාජධානිය; වයිට් පිජන්; ඉන්ටර්ෆෝන්; යුනිසෙෆ්; රොන්කෝ; හියුමැනිටේරියන් ඩිවයිනින් යුනිට්; මයින්ස් ඇක්ෂන් ගෲප්; හේලෝ ට්‍රස්ට්; ඩෑන්චර්ඩ් ඒඩ් (ඩීසීඒ); මයින්ස් අවෙයාර්නස් ට්‍රස්ට් (එච්ඒටී); පෑන්ඩිකුප් ඉන්ටර්නෑෂනල් (එච්අයි-ප්‍රංශය) ස්විස් පෙඩරේෂන් ෆෝ මයින් ඇක්ෂන් (එෆ්එස්ඩී); ඩැනිෂ් ඩීමයිනින් ගෲප් (ඩීඩීජී); නෝර්වේජියන් පීපල්ස් ඒඩ් (එන්පීඒ) අමෙරිකා එක්සත් ජනපද හමුදා විශේෂ බලකාය (යූඑස්එස්එෆ්)

21. එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහනේ බිම් බෝම්බ ඉවත් කිරීමේ අංශයේ ප්‍රධාන තාක්ෂණික සහකාර ඇලෙක්ස් වැන්රෝයි මයා සමඟ පැවැත් වූ සම්මුඛ පරීක්ෂණය - 2002 ඔක්තෝබර් 09

22. ආර්ආර්ආර් මහ ලේකම් කාර්යාලයේ ආචාර්ය කැනසිංහම් මයා ගේ දේශනය - 2003 පෙබරවාරි 10

23. එක්සත් ජාතීන් ගේ සංවර්ධන වැඩසටහනේ බිම් බෝම්බ ඉවත් කිරීමේ අංශයේ ප්‍රධාන තාක්ෂණික සහකාර, ඇලෙක්ස් වැන්රෝයි සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 ඔක්තෝබර් 09

24. මලලාවි හි දී එක්සත් ජාතීන් ගේ සරණාගත කොමිසමේ, ආරක්ෂක නිලධාරී කහින් ස්මයිල් මයා සමඟ 2002 නොවැම්බර් 03 දී පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව සහ මඩු පල්ලියේ දී අවතැන් වූ පිරිස් සමඟ 2002 නොවැම්බර් 02 දින පැවැත් වූ සම්මුහ සාකච්ඡාව

25. පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ පුනරුත්ථාපන කටයුතු පිළිබඳ ව්‍යාපෘති අධ්‍යක්ෂ මොහිදීන් මයා සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාව - 2002 ඔක්තෝබර් 29

